සැ. යු.- මෙම අති විශෙෂ ගැසට් පත්‍රය දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් වෙන වෙනම පළ වේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1875/44 - 2014 අගෝස්තු මස 16 වැනි සෙනසුරාදා - 2014.08.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත

**4 (2) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙහි මින් මතු ‘ආයතනය’යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, ආයතනය විසින් මේ සමග පළකර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් SLFRS 14:නියාමන විලම්බන ගිණුම් සහ SLFRS 15: ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින් වන අයභාරය, සම්මත කර ඇති අතර, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ අරමුණු සඳහා මෙම SLFRS 14: නියාමන විලම්බන ගිණුම් වර්ෂ දෙදහස් දහසය ජනවාරි මස පළමු වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මුල්‍ය ප්‍රකාශන සඳහා සහ SLFRS 15: ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින් වන අයභාරය, වර්ෂ දෙදහස්දාහත ජනවාරි මස පළමු වැනි දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මුල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,<br>ලේකම්.

2014 අගෝස්තු මස 16 වැනි දින,<br>කොළඹ 07,<br>මලලසේකර මාවත,<br>අංක 30 ඒ,<br>ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.


මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 14**

*නියාමන විලම්බන ගිණුම්*

| පටුන | ඡේද |
|---|---|
| **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 14** | |
| ***නියාමන විලම්බන ගිණුම්*** | |
| **අරමුණ** | 1 |
| **විෂය පථය** | 5 |
| **හඳුනාගැනීම, මැණීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම** | 9 |
| **ඉදිරිපත් කිරීම** | 18 |
| **හෙළිදරව් කිරීම** | 27 |
| **පරිශිෂ්ඨ** | |
| අ. නිර්වචිත පද | |
| ආ. ව්‍යවහාරකරණ උපදේශන | |
| ඇ. බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය | |
| ඇ. SLFRS 1 මුල් වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීමට අනුෂංගික සංශෝධන | |

**ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත - SLFRS 14**

***නියාමන විලම්බන ගිණුම්***

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 14 *නියාමන විලම්බන ගිණුම්* (SLFRS 14) මෙහි 1 - 36 දක්වා ඡේදවල සහ පරිශිෂ්ඨ අ - ඈ හි නියම කර ඇත. සෑම ඡේදයකට එක හා සමාන අධිකාරි බලයක් ඇත. **තද කළු** අකුරෙන් දක්වා ඇති ඡේදවලින් ප්‍රධාන මූලධර්ම සඳහන් කර ඇත. අ පරිශිෂ්ඨයේ නිර්වචනය කර ඇති පද මෙම ප්‍රමිතයේ ප්‍රථම වරට දිස්වෙන විට *ඇල* අකුරු වලින් දක්වේ. අනෙක් පද සඳහා වන නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහාවන පාරිභාෂික ශබ්ද සංග්‍රහයේ දී ඇත. මෙම ප්‍රමිතයේ අරමුණ සහ නිගමන සඳහා වූ පදනම *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට වූ පූර්විකාව සහ මූල්‍ය වාර්තාකරණය සඳහා වූ ආකල්පමය ආකෘතිමය රාමුවද* සම්බන්ධ කොට ගෙන කියවිය යුතු ය. පැහැදිලි මාර්ගෝපදේශ නොමැති අවස්ථාවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සඳහාත් ඒවා භාවිත කිරීම සඳහාත් පදනමක් LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් (නිසා) සහ වැරදි* මගින් සැපයේ.

**පරමාර්ථය**

1. අස්තිත්ත්වයක් *ගාස්තු රෙගුලාසිවලට* යටත්වන මිලකට හෝ ගාස්තුවකට ගණුදෙනුකරුවන්ට භාණ්ඩ හෝ සේවා සපයන විටක දී පැන නගින *නියාමන විලම්බන ගිණුම් ශේෂයන්* සඳහා මූල්‍ය වාර්තාකරන අවශ්‍යතාවයන් නියම කිරීම මෙම ප්‍රමිතයේ පරමාර්ථය වේ.

2. මෙම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා, ප්‍රමිතය මගින් පහත දෑ අවශ්‍ය කෙරේ.

   (අ) නියාමන විලම්බන ගිණුම් ඉදිරිපත් කිරීම සඳහා ප්‍රධාන වශයෙන් සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා කලින් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම (කලින් පොපිගිමු GAAP) ප්‍රකාරව ව්‍යවහාරකළ ගිණුම්කරණ මූල ධර්මවලට කරන ලද සීමිත වෙනස්කම්; සහ

   (ආ) (i) අස්තිත්වයේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ගාස්තු රෙගුලාසි මගින් පැන නගින වටිනාකම් හඳුනාගැනීම සඳහා පැහැදිලි කිරීම; සහ

   (ii) යම් හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂයන්ගෙන් වන අනාගත මුදල් ප්‍රවාහවල ප්‍රමාණය, කාල නියමය සහ අනියතතාවය, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයකුට අවබෝධකර ගැනීමට උපකාරී වීම,

   හෙළිදරව් කිරීම.

3. ඉහත 2 වන ඡේදයේ යොමු කරන ලද සීමිත වෙනස්කම්වලට යටත්ව අස්තිත්ත්වයට එහි විෂයය පථය තුළ, එහි මූල්‍ය ප්‍රකාශනවල නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා එහි කලින් පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම ප්‍රකාරව ගිණුම් ගත කිරීම දිගටම කරගෙන යාමට, එය SLFRS භාවිතා කරන විට, මෙම ප්‍රමිතයේ අවශ්‍යතා අනුව අස්තිත්වයකට ඉඩදේ.

4. මෙයට අමතරව, මෙම ප්‍රමිතය වෙනත් ප්‍රමිතයන් හි ඇති අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමට හෝ බැහැර කිරීමට ඉඩ සළසා ඇත. නියාමන විලම්බන ගිණුම් ශේෂ වාර්තා කිරීම සඳහා විශේෂයෙන් සඳහන් කර ඇති සියලුම නිශ්චිත අවශ්‍යතාවයන් සහ එම ශේෂයන්ට සම්බන්ධිත වෙනත් ප්‍රමිතවල අවශ්‍යතාවයන්ගෙන් යම් ව්‍යතිරේඛයන් කිරීමක් හෝ නිදහස් කිරීමක් එහි වෙනත් ප්‍රමිතවල අඩංගුවනවා වෙනුවට ඒවා මෙම ප්‍රමිතය තුළ අඩංගු වේ.

**විෂය පථය**

**5. අස්තිත්ත්වයක එහි මුල්ම SLFRS මූල්‍ය ප්‍රකාශන තුළ මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට පහත තත්ත්වයන් සපුරාලන්නේ නම් පමණක් අස්තිත්ත්වයට ඉඩ ලැබේ:**

   **(අ) ගාස්තු නියාමන ක්‍රියාකාරකම් පවත්වාගෙන යාමක් සහ**

   **(ආ) එහි කලින් පොපිගිමු (GAAP) ප්‍රකාරව, එහි මූල්‍ය ප්‍රකාශ තුළ නියාමන විලම්බන ගිණුම් ශේෂ ලෙස සුදුසුකම් ලබන හඳුනාගත් වටිනාකම්.**

**6. අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට තෝරා ගනිමින් එහි මුල්ම SLFRS මූල්‍ය ප්‍රකාශනයන්හි එය නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගන්නේ නම් පමණක් වනවිට දී අස්තිත්ත්වය එහි පසුව එන කාලපරිච්ඡේදවල මූල්‍ය ප්‍රකාශනවල මෙම ප්‍රමිතියේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතු ය.**

7. ශාස්තු නියාමන ක්‍රියාකාරකම්වල නිරත වන අස්තිත්ත්වවල වෙනත් පැතිවල ගිණුම්කරණය පිළිබඳව මෙම ප්‍රමිතය අමතන්නේ නැත. මෙම ප්‍රමිතයේ ඇති අවශ්‍යතාවයන් ව්‍යවහාරකරමින්, වෙනත් ප්‍රමිත ප්‍රකාරව වත්කම් හෝ වගකීම් ලෙස හඳුනා ගැනීමට ඉඩදෙන හෝ අවශ්‍ය කරන යම් වටිනාකම් නියාමන විලම්බන ගිණුම් ශේෂ ලෙස වර්ගීකරණය කරන වටිනාකම් තුළ ඇතුළත් නොකළ යුතු ය.

**8. මෙම ප්‍රමිතියේ විෂයය පථය තුළ වන හෝ එය ව්‍යවහාර කිරීමට තෝරාගත් අස්තිත්වයක්, එහි සියලුම ශාස්තු නියාමන ක්‍රියාකාරකම්වලින් පැන නගින සියලුම නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා මෙම ප්‍රමිතයේ සියලුම අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතු ය.**

## හඳුනා ගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනා ගැනීම

### LKAS 8 *ගිණුම්කරණ මූලධර්ම, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි හි* 11 වන ඡේදයෙන් තාවකාලික නිදහස් කිරීම්

**9. ශාස්තු නියාමන ක්‍රියාකාරකම් ඇති සහ මෙම ප්‍රමිතයේ විෂයය පථය තුළවන සහ එය ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්වයක්, නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම, මැනීම හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සංවර්ධනය කරන විට LKAS 8 හි 10 සහ 12 වන ඡේද ව්‍යවහාර කළ යුතු ය.**

10. අයිතමයක් සඳහා පැහැදිලිව ව්‍යවහාර කළ යුතුවන අදාළ ප්‍රමිතයක් නොමැතිවිට එම අයිතමය සඳහා ගිණුම් කරන ප්‍රතිපත්තියක් සංවර්ධනය කිරීමේ දී කළමනාකාරිත්වය විසින් සළකා බැලීම අවශ්‍ය කරන හෝ එයට ඉඩදෙන අවශ්‍යතාවයන් සහ උපදේශනවල ප්‍රභවයන් LKAS 8 හි 11 - 12 පරිච්ඡේදවලින් නියම කරයි. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම මැනීම හානිකරණ සහ ප්‍රතිහඳුනා ගැනීම සඳහා වන එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා LKAS 8 හි 11 ඡේදය අස්තිත්වයක් ව්‍යවහාර කිරීම, මෙම ප්‍රමිතයෙන් නිදහස් කෙරේ.

ඒ නිසාවෙන් ඔවුන්ගේ පෙර පොපිගිමු ප්‍රකාරව එක්කෝ වෙනම අයිතම හෝ වෙනත් වත්කම් හෝ වගකීම්වල ධාරණ වටිනාකමේ කොටසක් ලෙස නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගන්නා අස්තිත්ව මෙම ප්‍රමිතියේ 18 - 19 ඡේදවලින් අවශ්‍ය කරන ඉදිරිපත් කිරීමේ යම් වෙනස්කම්වලට යටත්ව LKAS 8 හි 11 වන ඡේදයෙන් නිදහස් කිරීම් මගින් මෙම ප්‍රමිතය ප්‍රකාරව එම ශේෂ හඳුනාගැනීම දිගටම කරගෙන යෑමට අවසර දේ.

### පවත්නා ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම පවත්වාගෙන යාම

**11. 13 - 15 ඡේදවලින් අවසර දෙන යම් වෙනස් කිරීම් සඳහා හැර මෙම ප්‍රමිතය මුල්වරට භාවිතා කිරීම තුළ නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම, මැනීම, හානිකරණය, ප්‍රති හඳුනාගැනීම සඳහා කලින් පොපිගිමු ගිණුම් ප්‍රතිපත්ති ව්‍යවහාර කිරීම අස්තිත්ත්වයක් විසින් දිගටම කරගෙන යා යුතු ය. කෙසේ වෙතත්, එවැනි වටිනාකම් ඉදිරිපත් කිරීමේ දී මෙම ප්‍රමිතයෙන් ඉදිරිපත් කර ඇති අවශ්‍යතාවයන් සමඟ අනුකූල වීම අවශ්‍ය කරන අතර ඒ සඳහා අස්තිත්ත්වයේ කලින් පොපිගිමු ඉදිරිපත් කිරීමේ ප්‍රතිපත්තිවලට වෙනස්කම් කිරීම අවශ්‍ය කෙරේ (18 - 19 ඡේද බලන්න).**

12. 13 - 15 ඡේද වලින් අවසර දෙන වෙනස් කිරීම් සඳහා හැර අස්තිත්ත්වයක් 11 වන ඡේදය ප්‍රකාරව ස්ථාපනය කරන ලද ප්‍රතිපත්ති පසුව එළඹෙන කාලපරිච්ඡේදවලදී සංගතව ව්‍යවහාර කළ යුතු ය.

### ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

**13. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම පටන් ගැනීම සඳහා අස්තිත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් නොකළ යුතු ය. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රති හඳුනාගැනීම සඳහා එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්කළ යුත්තේ, එම වෙනස් කිරීම් වලින් මූල්‍ය ප්‍රකාශන, පරිශීලකයන්ගේ ආර්ථික තීරණ ගැනීමේ අවශ්‍යතා**

**වඩාත් අදාළ වන විට සහ එම අවශ්‍යතාවයන් වැඩියෙන් විශ්වසනීය නොවන හෝ අඩුවෙන් විශ්වසනීය නොවනවිට සහ අඩුවෙන් අදාළ නොවන විට දී පමණි. අස්තිත්වය විසින් අදාළත්වය සහ විශ්වසනීයත්වය විනිශ්චය කළ යුත්තේ LKAS 8 හි 10 වන ඡේදයේ ඇති නිර්ණායක භාවිත කිරීමෙනි.**

14. ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරිමට LKAS 8 හි ඡේද 10 හෝ 14 - 15 ව්‍යවහාර කිරීමෙන්, අස්තිත්වයන් මෙම ප්‍රමිතය මගින් නිදහස් කරනු නොලැබේ. නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම සාධාරණීය කිරීමට, එම වෙනස් කිරීම් මගින් එහි මූල්‍ය ප්‍රකාශන LKAS 8 හි 10 ඡේදයේ ඇති නිර්නායක සපුරාලීමට ආසන්න කරන බවට අස්තිත්ත්වයක් විසින් නිරූපණය කළ යුතුය. කෙසේ වෙතත් නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනා ගැනීම සඳහා වෙනස් කිරීම් වලින් එම නිර්නායක සමඟ සම්පූර්ණයෙන් අනුකූල වීම අත්කරගැනීම අවශ්‍ය නොවේ.

15. මෙම ප්‍රමිතය මුල් වරට ව්‍යවහාර කිරීම මත වන කරන ලද වෙනස්කම්වලට සහ පසුව එන වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා කරන ලද වෙනස්කම් යන දෙකම සඳහා 13 - 14 ඡේද ව්‍යවහාර වේ.

**වෙනත් ප්‍රමිත සමග අන්තර් ක්‍රියාකාරිත්වය**

16. **වෙනත් ප්‍රමිත සමග මෙම ප්‍රමිතයේ අන්තර් ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් කිසියම් නිශ්චිත බැහැර කිරීමක්, නිදහස් කිරීමක් හෝ අතිරේක අවශ්‍යතාවයන් මෙම ප්‍රමිතය තුළම අන්තර්ගත වී ඇත. (ආ 7 - ආ 28 ඡේද බලන්න). එවැනි කිසියම් බැහැර කිරීමක්, නිදහස් කිරීමක් හෝ අතිරේක අවශ්‍යතාවයන් නොමැති විටකදී වෙනත් ප්‍රමිත ප්‍රකාරව හඳුන්නා ගන්නා වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් වලට ව්‍යවහාර වන අන්දමට හා සමානව වෙනත් ප්‍රමිත නියාමන විලම්බන ගිණුම් ශේෂයන් සඳහා ද ව්‍යවහාර විය යුතුය.**

17. සමහර අවස්ථාවලදී නියාමන විලම්බන ගිණුමක ශේෂය මූල්‍ය ප්‍රකාශනවල උචිත අන්දමින් පිළිඹිබු වීම සඳහා 11 - 12 ඡේද ප්‍රකාරව ස්ථාපනය කරන ලද අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව මනින ලද එම ශේෂය සඳහා වෙනත් ප්‍රමිතයක් ව්‍යවහාර කිරීම අවශ්‍ය විය හැකිය. උදාහරණයක් වශයෙන් අස්තිත්වයකට ගාස්තු නියාමන ක්‍රියාකාරකම් විදේශ රටක තිබිය හැකි අතර ඒ සඳහාවන ගණුදෙනු සහ නියාමන විලම්බන ගිණුම් ශේෂයන් වාර්තා කරන අස්තිත්ත්වයේ භාවිත ව්‍යවහාර මුදල් නොවන ව්‍යවහාර මුදලකින් නම්කර තිබිය හැකිය. නියාමන විලම්බන ගිණුම් ශේෂයන් සහ එම ශේෂයන්ගේ සංචලන LKAS 21 *විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීමෙහි බලපෑම* ව්‍යවහාර කරමින් පරිවර්තනය කරනු ලැබේ.

## ඉදිරිපත් කිරීම

**ඉදිරිපත් කිරීම වෙනස්වීම්**

18. 11 - 12 ඡේද ප්‍රකාරව හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා 20 - 26 ඡේදවල සාරාංශ ගත කර ඇති ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයන් මෙම ප්‍රමිතය හඳුන්වාදේ.

මෙම ප්‍රමිතය ව්‍යවහාර කරන විටදී, වෙනත් ප්‍රමිත ප්‍රකාරව හඳුනා ගන්නා වත්කම් සහ වගකීම් වලට අමතරව නියාමන විලම්බන ගිණුම් ශේෂ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගනු ලැබේ. මෙම ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවලින්, වෙනත් ප්‍රමිතවල මූල්‍ය වාර්තා කරන අවශ්‍යතාවයන්ගෙන් නියාමන විලම්බන ශේෂයන් හඳුනා ගැනීමේ බලපෑම වෙන් කරයි.

19. LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම ප්‍රකාරව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සහ ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ(යන්) වල ඉදිරිපත් කිරීම අවශ්‍ය කරන අයිතමයනට අමතරව, මෙම ප්‍රමිතය ව්‍යවහාර කරන අස්තිත්වයක් 20 - 26 ඡේද ප්‍රකාරව සියළුම නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල සංචලන ඉදිරිපත් කළ යුතුය.

**නියාමන විලම්බන ගිණුම් ශේෂ වර්ගීකරණය**

20. **පහත දෑ සඳහා අස්තිත්වයක් වෙන් වෙන් වූ පේළි අයිතම මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා ඉදිරිපත් කළ යුතුය:**

(*අ*) **සියළුම නියාමන විලම්බන ගිණුම්වල හර ශේෂයන්ගේ එකතුව; සහ**

(*ආ*) **සියළුම නියාමන විලම්බන ගිණුම්වල බැර ශේෂයන්ගේ එකතුව.**

21. අස්තිත්ත්වයක් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම සහ ජංගම - නොවන වත්කම් සහ ජංගම සහ ජංගම - නොවන වගකීම් ලෙස වෙන් වෙන්ව වර්ගීකරණයක් ඉදිරිපත් කරන විටකදී නියාමන විලම්බන ගිණුම් ශේෂයන්ගේ එකතුව ජංගම හෝ ජංගම - නොවන ලෙස වර්ගීකරණය නොකළ යුතුය. ඒ වෙනුවට, නියාමන විලම්බන ගිණුම් ශේෂ ඉදිරිපත් කිරීමට පෙර ලබා ගන්නා, උප එකතුන් භාවිතා කිරීම මගින් වෙනත් ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කරන වත්කම් සහ වගකීම් වලින් 20 වන ඡේදයෙන් අවශ්‍ය කරන වෙන් වෙන් වූ පේළි අයිතම වෙන් කොට හඳුනා ගත යුතුය.

**නියාමන විලම්බන ගිණුම් ශේෂයන්හි සංචලනයන් වර්ගීකරණය කිරීම.**

22. වාර්තා කරන කාලපරිච්ඡේදය සඳහා වන වෙනත් විස්තීරණ ආදායමේ හඳුනාගත් අයිතමවලට සම්බන්ධිත සියළුම නියාමන විලම්බන ගිණුම් ශේෂ තුළවන ශුද්ධ සංචලනය අස්තිත්වයක් විසින් ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, වෙනත් විස්තීර්ණ ආදායම් කොටස තුළ ඉදිරිපත් කළ යුතුය. වෙනත් ප්‍රමිත ප්‍රකාරව පහත දැක්වෙන අයිතම වලට සම්බන්ධිත ශුද්ධ සංචලන සඳහා වෙන් වෙන් වූ පේළි අයිතම භාවිතා කළ යුතුය.

(අ) ලාභ හෝ අලාභ ගිණුමට පසුව වර්ගීකරණය කරනු නොලබන; සහ

(ආ) නිශ්චිත කොන්දේසි සපුරාලන විට ලාභ හෝ අලාභ ගිණුමට යළි වර්ගීකරනු ලබන

23. අත්කරගත් වටිනාකම් වැනි ලාභ හෝ අලාභවල පිළිඹිබු නොවන සංචලනයන් හැර වාර්තා කරන ලද කාලපරිච්ඡේදය සඳහා සියළුම නියාමන විලම්බන ගිණුම් ශේෂයන් තුළ ඉතිරිව ඇති ශුද්ධ සංචලනය ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ලාභ හෝ අලාභ කොටසේ හෝ වෙන්ව වූ ලාභ හෝ අලාභ ප්‍රකාශනයේ වෙන්ව වූ පේළි අයිතමයක් ලෙස අස්තිත්වයක් ඉදිරිපත් කළ යුතුය. නියාමන විලම්බන ගිණුම් ශේෂවල ශුද්ධ සංචලනයට පෙර ලබාගන්නා උප එකතුන් භාවිතා කිරීම මගින් වෙනත් ප්‍රමිත ප්‍රකාරව ඉදිරිපත් කරන ආදායම් සහ වියදම් වලින් මෙම වෙන් වූ පේළි අයිතම වෙන් කොට හඳුනා ගත යුතුය.

24. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයක් විලම්බිත බදු වත්කමක් හෝ බදු වගකීමක් හඳුනා ගන්නා විට, එහි ප්‍රතිඵලය මත විලම්බිත බදු වත්කම (වගකීම) සහ එම විලම්බිත බදු වත්කම (වගකීම) සම්බන්ධිත සංචලනයන් සමඟ සම්බන්ධිත නියාමන විලම්බිත බදු ශේෂයන් අස්තිත්වය විසින්, LKAS 12 *ආදායම් බදු* ප්‍රකාරව විලම්බිත බදු වත්කම් (වගකීම්) සහ බදු වියදම් (ආදායම්) ((අ) 9 - ආ 12 ඡේද බලන්න) සඳහා ඉදිරිපත් කළ එකතුව තුළ එය වෙනුවට ඉදිරිපත් කළ යුතුය.

25. SLFRS 5 *විකිණීම සඳහා තබා ගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්* ප්‍රකාරව අස්තිත්වයක් අසන්තතික මෙහෙයුමක් හෝ අපහරණ කණ්ඩායමක් ඉදිරිපත් කරන විට අපහරණ කණ්ඩායම හෝ අසන්තතික මෙහෙයුම් තුළ ඉදිරිපත් කරනවා වෙනුවට අස්තිත්වය විසින් අදාළ වන පරිදි යම් සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල ශුද්ධ සංචලනය නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල සංචලන සමඟ ඉදිරිපත් කළ යුතුය (ආ 19 - ආ 22 ඡේද බලන්න).

26. LKAS 33 *කොටසක ඉපයුම* ප්‍රකාරව අස්තිත්වයක් කොටසක ඉපයුම ඉදිරිපත් කරන විට, නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනයන් බැහැර කර LKAS 33 මගින් අවශ්‍ය කරන ඉපයීම් වටිනාකම් භාවිතා කර ගණනය කරන අමතර මූලික සහ තනුක කොටසක ඉපයීම අස්තිත්වයක් විසින් ඉදිරිපත් කළ යුතුය. (ආ 13 - ආ 14 ඡේද බලන්න)

## හෙළිදරව් කිරීම

### පරමාර්ථය

27. මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්වයක් පරිශීලකයනට එය තක්සේරු කිරීම පහසු වීමේ කාර්ය සඳහා පහත තොරතුරු හෙළිදරව් කළ යුතුය.

(අ) අස්තිත්වයක් සපයන භාණ්ඩ හෝ ලබාදෙන සේවා සඳහා ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගත හැකි මිල (මිල ගණන) ස්ථාපනය කරන ගාස්තු රෙගුලාසිවල ස්වභාවය සහ ඒ හා ආශ්‍රිත අවදානම්; සහ

(ආ) එහි මූල්‍ය තත්ත්වයට, මූල්‍ය කාර්ය සාධනයට, සහ මුදල් ප්‍රවාහවලට එම ගාස්තු රෙගුලාසි නිසාවන බලපෑම්

28. 27 වන ඡේදයේ පරමාර්ථ ඉෂ්ඨ කර ගැනීමට, 30 - 36 ඡේදවල නියම කර ඇති හෙළිදරව් කිරීම්වලින් යම් කිසිවක් අදාළ යයි සැළකිල්ලට නොගන්නේ නම් ඒවා මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරිය හැකිය. 27 වන ඡේදයේ වන පරමාරථය ඉටු කර ගැනීමට 30 - 36 ඡේද ප්‍රකාරව ලබාදී ඇති හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම්, එම පරමාර්ථය ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය කරන අතිරේක තොරතුරු අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

29. 27 වන ඡේදයේ හෙළිදරව් කිරීමේ පරමාර්ථය ඉටුකර ගැනීමට, අස්තිත්වයක් විසින් පහත දැක්වෙන සියල්ලම සැලකිල්ලට ගත යුතුය.

(අ) හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය කරන විස්තරවල මට්ටම;

(ආ) විවිධ අවශ්‍යතාවයන් ගෙන් සෑම එකක් මත කොපමණ ප්‍රමාණයකට අවධාරණය තැබිය හැකි ද;

(ඇ) කොපමණ ප්‍රමාණයකට සමාහරණය හෝ කොටස්වලට විසුරුවා හැරීම භාර ගත යුතු ද; සහ

(ඈ) හෙළිදරව් කරන ලද ප්‍රමාණාත්මක තොරතුරු ඇගයීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට අමතර තොරතුරු අවශ්‍ය වේ ද?

**ගාස්තු නියාමනයට යටත් ක්‍රියාකාරකම් පහදා දීම**

30. අස්තිත්වයේ ගාස්තු රෙගුලාසි ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ඒ හා ආශ්‍රිත අවදානම් තක්සේරු කිරීමට, මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට උපකාරී වීමට අස්තිත්වයක් සෑම වර්ගයකම ගාස්තු නියාමන ක්‍රියාකාරකම් සඳහා පහත දෑ හෙළිදරව් කළ යුතුය;

(අ) ගාස්තු නියාමන ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ ප්‍රමාණය, සහ නියාමන ගාස්තු නියම කිරීමේ ක්‍රියාවලියේ ස්වභාවය පිළිබඳව කෙටි විස්තරයක්,

(ආ) ගාස්තු නියමකරන්නා (නන්) හඳුනා ගැනීම. ගාස්තු නියමකරන්නා සම්බන්ධිත පාර්ශවයක් නම් (LKAS 24 *සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීමෙහි නිර්වචනය කර ඇති පරිදි*) එම කරුණ, සම්බන්ධිත පාර්ශවයක් වන්නේ කෙසේ ද යන්නත් සමඟ අස්තිත්වය හෙළිදරව් කළ යුතුය,

(ඇ) සෑම පන්තියකම (එනම් සෑම වර්ගයකම පිරිවැය හෝ ආදායම) නියාමන විලම්බන ගිණුම්වල හර ශේෂය අනාගතයේදී අයකර ගැනීම හෝ සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම්වල බැර ශේෂය ප්‍රතිවර්ත්‍ය කිරීමේ අවදානම් සහ අනියතාවය කෙසේ බලපාන්නේද? උදාහරණ වශයෙන් ;

(i) ඉල්ලුමේ අවදානම (උදාහරණ වශයෙන් පාරිභෝගිකයන්ගේ ආකල්පවල වෙනස්වීම, විකල්ප සැපයුම් ප්‍රභවයන් තිබීම හෝ තරඟකාරීත්වයේ මට්ටම)

(ii) නියාමන අවදානම (උදාහරණ වශයෙන්, ගාස්තු නියම කිරීමේ අයදුම්පත් ඉදිරිපත් කිරීම හෝ අනුමැතිය හෝ අපේක්ෂිත අනාගත නියාමන ක්‍රියාකාරකම් පිළිබඳ අස්තිත්වයේ තක්සේරුව); සහ

(iii) වෙනත් අවදානම් (උදාහරණ වශයෙන්, ව්‍යවහාර මුදල් හෝ වෙනත් වෙළඳපොළ අවදානම්)

31. 30 වන ඡේදයෙන් අවශ්‍ය කරන හෙළිදරව් කිරීම් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීම එක්කෝ මූල්‍ය ප්‍රකාශන සටහන්වල ඍජුව හෝ මූල්‍ය ප්‍රකාශන වල භාෂිතය හා සමාන භාෂිතයක් ඇති එම වේලාවටම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට ලබාගත හැකි කළමනාකාරීත්ව විවරණ හෝ අවදානම් වාර්තා වැනි හරස් යොමු වලින් මූල්‍ය ප්‍රකාශනවල සිට වෙනත් සමහර ප්‍රකාශනයක අන්තර්ගත කර දිය යුතුය. තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල ඍජුව හෝ හරස් යොමු මගින් අන්තර්ගත කර නොමැති නම් මූල්‍ය ප්‍රකාශන අසම්පූර්ණය.

**හඳුනාගත් වටිනාකම් පැහැදිලි කිරීම**

32. නියාමන විලම්බන ගිණුම් ශේෂ අයකර ගැනීම සඳහා තක්සේරු කළේ සහ යම් හානිකරන අලාභයක් වෙන් කරනු ලැබුවේ කෙසේද යන්න ඇතුළුව නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම සහ ප්‍රතිහඳුනා ගැනීමේ පදනම සහ මුල් වරට සහ පසුව ඒවා මනිනු ලැබුයේ කෙසේද යන්න අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය.

33. සෑම වර්ගයකම ගාස්තු නියාමන ක්‍රියාකාරකමක් සඳහා, සෑම පන්තියක නියාමන විලම්බන ගිණුම් ශේෂය සඳහා අස්තිත්වයක් පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතුය;

(අ) වෙනත් ආකෘතියක් වඩා යෝග්‍ය වන්නේ නම් හැර, වගුවක ආකාරයෙන් කාල පරිච්ඡේදය ආරම්භයේ සහ අවසානයේ ධාරන වටිනාකම්වල සැසඳුමක් අවශ්‍ය කරන විස්තර වල මට්ටම තීරණය කිරීමේදී අස්තිත්ත්වය විසින් විචාර බුද්ධිය ව්‍යවහාර කළ යුතුය (28- 29 ඡේද බලන්න) එහෙත් පහත සඳහන් සංරචක සාමාන්‍යයෙන් අදාළ වනු ඇත.

(i) ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ නියාමන විලම්බන ගිණුම් ශේෂ ලෙස හඳුනාගෙන ඇති වටිනාකම්;

(ii) ප්‍රවර්තන කාලපරිච්ඡේදය තුළදී ශේෂයන්ට සම්බන්ධිත අය කරගත් (සමහර විට ක්‍රම ක්‍ෂය ලෙස විස්තර කරන) හෝ ප්‍රතිවර්ත්‍ය කළ, ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ (යන්හි) හඳුනාගත් වටිනාකම්; සහ

(iii) හානිකරණය, ව්‍යාපාර සංයෝජනයකදී අත්කර ගත් හෝ භාරගත්, බැහැර කරන ලද අයිතම්, හෝ විදේශ විනිමය අනුපාතික හෝ වට්ටම් අනුපාතිකවල වෙනස්වීම්වල බලපෑම් වැනි නියාමන විලම්බන ගිණුම් ශේෂ ආරූඪ කරගත් වෙන්ව හඳුනාගනු ලැබූ අනෙකුත් වටිනාකම්.

(ආ) සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම් ශේෂවලට සුදුසු මුදලේ කාලවටිනාකම පිළිඹිබු වීමට භාවිතා කළ ප්‍රතිලාභ අනුපාතිකය හෝ වට්ටම් අනුපාතිකය (ව්‍යවහාර වන කල්හි, ශූන්‍ය අනුපාතිකය හෝ අනුපාතික පරාසයක් ඇතුළුව); සහ

(ඇ) සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම්වල හර ශේෂයන්ගේ ධාරන වටිනාකම අය කර ගැනීමට (හෝ ක්‍රම ක්‍ෂය කිරීමට) හෝ සෑම පන්තියකම නියාමන විලම්බන ගිණුම්වල බැර ශේෂ ප්‍රතිවර්ත්‍ය කිරීමට අස්තිත්වය අපේක්‍ෂා කරන කාලය මත ඉතිරිව ඇති කාලපරිච්ඡේදය.

34. අස්තිත්ත්වයේ ආදායම් බදු වියදමේ (ආදායම) වටිනාකමට සහ කාල සැකසුමට ගාස්තු නියාමනය බලපානවිට, ප්‍රවර්තන හා විලම්බිත බද්දේ හඳුනාගත් වටිනාකම් මත ගාස්තු නියාමනයේ තද බලපෑම අස්තිත්ත්වය විසින් හෙළිදරව් කළ යුතුයි.

එම බදුකරණයට සම්බන්ධිත සහ එම ශේෂයට සම්බන්ධිත සංචලනය වන යම් නියාමන විලම්බන ගිණුම් ශේෂ මෙයට අමතරව අස්තිත්ත්වය විසින් වෙන්ව හෙළිදරව් කළ යුතුය.

35. SLFRS 12 *වෙනත් අස්තිත්ත්වවල අයිතිය හෙළිදරව් කිරීම* ප්‍රකාරව ගාස්තු නියාමන ක්‍රියාකාරකම් ඇති පරිපාලිතයක, ආශ්‍රිතයක හෝ බද්ධ ව්‍යාපාරයක අයිතිය සඳහා සහ මෙම ප්‍රමිතය ප්‍රකාරව නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගන්නා අස්තිත්ත්වය හෙළිදරව් කිරීම් ලබාදෙන විට, අස්තිත්ත්වය විසින් හෙළිදරව් කර ඇති අයිතිය සඳහා නියාමන විලම්බන ගිණුම් හර සහ බැර සඳහා සහ එම ශේෂවල ශුද්ධ සංචලනය සඳහා ඇතුළත් කර ඇති වටිනාකම් හෙළිදරව් කළ යුතුය. (ආ 25 - ආ 28 ඡේද බලන්න)

36. නියාමන විලම්බන ගිණුම් ශේෂයක් තවදුරටත් සම්පූර්ණයෙන්ම අයකරගත නොහැකි හෝ ප්‍රතිවර්ත්‍ය කිරීමට නොහැකි යයි අස්තිත්ත්වයක් නිගමනය කරන විට, අස්තිත්ත්වය විසින් එම කරුණ, එසේ අය කර ගැනීමට නොහැකි වීමට හෝ ප්‍රතිවර්ත්‍ය කිරීමට නොහැකිවීමට හේතු සහ කොපමණ වටිනාකමකින් නියාමන විලම්බන ගිණුම් ශේෂ අඩුවී ඇත්දැයි යන්න හෙළිදරව් කළ යුතුය.

**අ පරිශිෂ්ඨය**

**නිර්වචිත පද**

*මෙම පරිශිෂ්ඨය ප්‍රමිතයේ අවශ්‍ය කොටසකි*

| | |
|---|---|
| **මුල් SLFRS මූල්‍ය ප්‍රකාශන** | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS) සමඟ අනුකූලවන බව ඉතා පැහැදිලි සහ කොන්දේසි රහිත ප්‍රකාශනයන් මගින් අස්තිත්ත්වයක් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත භාවිත කරමින් ඉදිරිපත් කරන මුල් වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, |

| | |
|---|---|
| **මුල් වරට භාවිත කරන්නා** | **එහි මුල් SLFRS මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අස්තිත්ත්වය** |
| **කලින් පොපිගිමු** | SLFRS භාවිතා කිරීමට වහාම පෙර මුල්වරට **භාවිතා කරන්නෙක්** භාවිත කළ ගිණුම් කරන පදනම |
| **ගාස්තු නියාමන ක්‍රියාකාරකම්** | **ගාස්තු රෙගුලාසි** වලට යටත් අස්තිත්වයක ක්‍රියාකාරකම් |
| **ගාස්තු රෙගුලාසි** | භාණ්ඩ හෝ සේවා සඳහා ගනුදෙනුකරුවෙකුගෙන් අයකරගත හැකි මිල ගණන් ස්ථාපනය කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවක්, සහ එම ආකෘතිමය රාමුව **ගාස්තු නියාමක** මගින් අනුමැතියට සහ/ හෝ සුපරීක්ෂණයට යටත් වේ. |
| **ගාස්තු නියාමක** | අස්තිත්වයක් බැඳෙන ගාස්තුව හෝ ගාස්තු පරාසයක් ස්ථාපනය කරන ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් බලගැන්වෙන අනුමත මණ්ඩලයක්. **ගාස්තු නියාමක** තුන්වන පාර්ශව මණ්ඩලයක් හෝ ගණුදෙනුකරුවන්ගේ යහපත සහ අස්තිත්වයේ සමස්ථ මූල්‍ය ස්වශක්තතාවය තහවුරු කිරීම යන කරුණු දෙකම සඳහා ගාස්තු නියම කිරීමට ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් මණ්ඩලය කළ යුතු වන්නේ නම් අස්තිත්වයේ ස්වකීය පාලන මණ්ඩලයද ඇතුළුව අස්තිත්වයේ සම්බන්ධිත පාර්ශ්වයක් විය හැකිය. |
| **නියාමන විලම්බන ගිණුම් ශේෂය** | වෙනත් ප්‍රමිත ප්‍රකාරව වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනු නොලබන කිසියම් වියදම් (හෝ ආදායමක්) ගිණුමක ශේෂය, එහෙත් එය ගණුදෙනුකරුවන්ගෙන් අය කර ගත හැකි ගාස්තු (ව) **ගාස්තු නියාමක** ස්ථාපනය කිරීමෙන් එය දැනටමත් ඇතුළත් වී හෝ ඇතුලත් කිරීමට අපේක්ෂා කරන නිසා එය විලම්බනය සඳහා සුදුසුකම් ලබයි. |

**ආ පරිශිෂ්ඨය**

**ව්‍යවහාර කිරීමේ උපදේශ**

*මෙම පරිශිෂ්ඨය ප්‍රමිතයේ අවශ්‍ය කොටසකි*

**ගාස්තු - නියාමන ක්‍රියාකාරකම්**

ආ1 ඓතිහාසිකව ගාස්තු රෙගුලාසි අස්තිත්වයක සියළුම ක්‍රියාකාරකම් සඳහා ව්‍යවහාර වේ. කෙසේ වෙතත්, අත්කර ගැනීම, විවිධාංගකරණය, පාලන රීති සහ සීමා ඉවත් කිරීමත් සමඟ නියාමනය වන සහ නියාමනය නොවන යන දෙවර්ගයේම ක්‍රියාකාරකම් අස්තිත්වයකට තිබීමේ ප්‍රතිඵලයක් ලෙස එහි ක්‍රියාකාරකම්වලින් කොටසකට පමණක් දැනට මිල රෙගුලාසි ව්‍යවහාර විය හැකිය. අස්තිත්වය හෝ කර්මාන්තය අයත් වන්නේ කුමන වර්ගයට ද යන්න නොසළකා ව්‍යවස්ථාපිත හෝ නියාමන සීමා කිරීම්වලට යටත්වන ගාස්තු නියාමන ක්‍රියාකාරකම් වලට පමණක් ගාස්තු නියාමකගේ ක්‍රියාමාර්ග මගින් මෙම ප්‍රමිතය ව්‍යවහාර වේ.

ආ2 ස්වයං නියාමනයවන ක්‍රියාකාරකම් සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර නොකළ යුතුය. එනම් මිල නියාමකයකු විසින් අධීක්ෂණය කරන සහ/ හෝ අනුමත කරන මිල නියම කිරීමේ ආකෘතිමය රාමුවකට යටත් නොවන ක්‍රියාකාරකම්. පහත දෑ වෙනුවෙන් අස්තිත්වයකට මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට සුදුසු වීමෙන් වළක්වනු නොලැබේ.

(අ) ගණුදෙනුකරුවන්ගේ යහපත සහ අස්තිත්වයේ සමස්ථ මූල්‍ය ස්වශක්තතාවය තහවුරු කිරීම යන කරුණු දෙක සඳහා නියම කරන ලද මිල කිරීමේ ආකෘතිමය රාමුවක් තුළ අස්තිත්වයේ ස්වකීය පාලක මණ්ඩලය හෝ සම්බන්ධිත පාර්ශවයක් ගාස්තු ස්ථාපනය කිරීම; සහ

(ආ) එම ආකෘතිමය රාමුව ව්‍යවස්ථාවෙන් හෝ රෙගුලාසි මගින් බලගැන්වෙන අනුමත මණ්ඩලයක සුපරීක්ෂණයට සහ/ හෝ අනුමැතියට යටත් වීම.

**පවතින ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම පවත්වාගෙන යාම**

ආ3 මෙම ප්‍රමිතියේ අරමුණු සඳහා නියාමන විලම්බන ගිණුම් ශේෂයන් නිර්වචනය කරන්නේ වෙනත් ප්‍රමිත ප්‍රකාරව වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා නොගනු ලබන කිසියම් වියදම් (හෝ ආදායම්) ගිණුමක ශේෂය, එහෙත් එය ගණුදෙනුකරුවන්ගෙන් අයකර ගත හැකි ගාස්තු(ව) ගාස්තු නියාමක සථාපනය කිරීමෙන් එය දනටමත් ඇතුළත් වී හෝ ඇතුළත් කිරීමට අපේක්ෂාකරන නිසා එය විලම්බන කිරීමට සුදුසුකම් ලබන ලෙසය. සමහර වියදම් (ආදායම්) අයිතම නියාමනය කළ ගාස්තුවෙන් (වලින්) බාහිරවිය හැකිය. උදාහරණ වශයෙන් එම වටිනාකම් මිල නියාමක විසින් පිළිගැනීමට අපේක්ෂා නොකරන නිසා හෝ ඒවා ගාස්තු රෙගුලාසි විෂය පථය තුළ නොවන නිසාවිය හැකිය. ඒ නිසාවෙන් එවැනි අයිතමයක් ධාරණ අගයට වත්කමක් හෝ වගකීමක් ලෙස ඇතුළත් කිරීමට වෙනත් ප්‍රමිතයකින් අවශ්‍ය කරන්නේ නම් හෝ ඉඩ දෙන්නේ නම් හැර ඒවා දරණ ලද ආදායමක් හෝ වියදමක් ලෙස හඳුනා ගැනේ.

ආ4 කලින් පොපිගිමු ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව එක්කෝ වෙනම වූ හෝ වෙනත් පේළි අයිතම් තුළ ඇතුළත් කර ඇති දේපල පිරියත සහ උපකරණ වැනි හඳුනාගත විය හැකි නියාමන විලම්බන ගිණුම් ශේෂ, සමහර අවස්ථාවන්හිදී වෙනත් ප්‍රමිත මගින් අස්තිත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ හඳුනා ගැනීමෙන් පැහැදිලිව වළක්වයි. කෙසේ වෙතත් මෙම ප්‍රමිතයේ 11 වන ඡේදය ප්‍රකාරව එහි මුල් SLFRS මූල්‍ය ප්‍රකාශණයේ මෙම ප්‍රමිතය භාවිතා කිරීමට තෝරාගන්නා අස්තිත්වයක් නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රති-හඳුනාගැනීම සඳහා එහි කලින් පොපිගිමු ව්‍යවහාර කිරීම දිගටම කරගෙන යාම පහසු වීමට LKAS 8 හි 11 වන ඡේදයෙන් නිදහස් කිරීම ව්‍යවහාර කරයි. එවැනි ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට උදාහරණ වශයෙන් පහත පරිචයන් ඇතුළත් විය හැකිය;

(අ) අස්තිත්ත්වයක ඉඩදිය හැකි පිරිවැය (එනම් පිරිවැය අයකර ගැනීමට ලබාදෙන අපේක්ෂා කරන නියාමන ගාස්තුව) අයකර ගැනීමට පහසු වීම සඳහා අනාගත කාලපරිච්ඡේදවලදී මිල නියාමකගේ විද්‍යාමාන හෝ අපේක්ෂිත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස, අස්තිත්ත්වයට අයිතියක් ඇතිවිට නියාමන විලම්බන හර ගිණුම් ශේෂ හඳුනා ගැනීම;

(ආ) අනාගත ගාස්තු මගින් අයකර ගැනීමට හෝ ප්‍රතිවර්ත්‍ය කිරීමට අපේක්ෂිත දේපොළ, පිරියත උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් යන අයිතමයන් දෙකෙහිම බැහැර කිරීමෙන් හෝ විශ්‍රාම ගැනීම මත වන යම් ප්‍රතිලාභයක් හෝ අලාභයකට සමාන වටිනාකමක් නියාමන විලම්භන හර හෝ බැර ගිණුම් ශේෂයක් ලෙස හඳුනා ගැනීම;

(ඇ) අනුමත ඉඩදිය හැකි පිරිවැය වැඩියෙන් අයකර ගැනීම (එනම් මිල නියාමක නියමකරන ලද අයකර ගත හැකි වටිනාකම්වලට වැඩිපුර වන ප්‍රමාණය) ප්‍රතිවර්ත්‍ය කිරීම සඳහා අනාගත කාලපරිච්ඡේදවලදී ගාස්තු අඩු කිරීම, ගාස්තු නියාමකගේ විද්‍යාමාන සහ අපේක්ෂිත ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයක් විසින් හඳුනා ගැනීම අවශ්‍යකරන නියාමන විලම්බන බැර ගිණුම් ශේෂ හඳුනා ගැනීම; සහ

(ඈ) මිල නියාමක විසින් නියම කරන ලබන පොලී හෝ වට්ටම් අනුපාතිකයක් භාවිතා කර; නියාමන විලම්බන ගිණුම් ශේෂ වට්ටම් නොකරන ලද හෝ වට්ටම් කරන ලද පදනමක් මත මැනීම.

ආ5 ගාස්තු නියාමකයන් ගාස්තු - නියම කිරීමේ තීරණයන්හිදී ඉඩදිය හැකි පිරිවැයවල වර්ගයන්ට උදාහරණ පහතවන අතර, එබැවින් අස්තිත්වයක් ඒවා නියාමන විලම්බන ගිණුම් ශේෂයන්වල හඳුනාගනු ලැබිය හැකිය;

(i) පරිමා හෝ ගැණුම් මිල විචලන;

(ii) අනුමත කළ 'හරිත බලශක්ති' මුල පිරීම් (LKAS 16 *දේපළ, පිරියත උපකරණ* ප්‍රකාරව දේපළ පිරියත සහ උපකරණ වල පිරිවැයෙහි කොටසක් ලෙස ප්‍රාග්ධනය කළ වටිනාකමට වඩා අමතර ප්‍රමාණය);

(iii) ගාස්තු නියාමන අරමුණ සඳහා ප්‍රාග්ධන පිරිවැය ලෙස සැලකෙන ඍජුව ආරෝපණය නොවන පිරිවැය (එහෙත් LKAS 16 ප්‍රකාරව දේපළ, පරියත සහ උපකරණ අයිතමයක පිරිවැය ලෙස අඩංගු කිරීමට ඉඩ නොදෙන පිරිවැය)

(iv) ව්‍යාපෘති අවලංගු කිරීමේ පිරිවැය;

(v) කුණාටුවලින් වන හානි පිරිවැය; සහ

(vi) සැලකෙන පොලී (අරමුදල් සඳහා ඉඩදුන් වටිනාකම් ඇතුළුව හිමිකරුවන්ගේ ස්කන්ධය සහ ණයට ගැනීම් සඳහා අස්තිත්ත්වයට ප්‍රතිලාභයක් ගෙන දෙන ඉදිකිරීම් කාලය තුළදී භාවිත කළ අරමුදල).

ආ6 නියාමන අරමුණු සඳහා ආදායම් හෝ වියදම් අයිතම හඳුනා ගැනීම සහ එම අයිතම මූල්‍ය වාර්තාකරන අරමුණු සඳහා හඳුනා ගැනීම අතර කාලය වෙනස්වීම් නියාමන විලම්බන ගිණුම් ශේෂවලින් සාමාන්‍යයෙන් නියෝජනය වේ. මුල් වරට SLFRS භාවිත කිරීම මත හෝ නව හෝ සංශෝධිත ප්‍රමිතයක් මූලිකව ව්‍යවහාරකරණය මත අස්තිත්වයක් ගිණුම් ප්‍රතිපත්ති වෙනස් කරන විට, නව හෝ සංශෝධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ ඇතිකරන නව හෝ සංශෝධිත කාලය වෙනස්වීම් පැනනැගිය හැකිය. නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම ආරම්භ කිරීමට හැකි වීම පිණිස, අස්තිත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීම් වළක්වාලන 13 වන ඡේදයේ තහනම් කිරීම්, SLFRS මගින් අවශ්‍ය කරන ගිණුම් කරන ප්‍රතිපත්තිවල වෙනත් වෙනස් කිරීම් නිසා ඇතිකරවන නව හෝ සංශෝධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම තහනම් නොකෙරේ. මෙසේ වන්නේ එවැනි කාල වෙනස්වීම් සඳහා නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම 11 ඡේදය ප්‍රකාරව ව්‍යවහාර කළ පවතින හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය සමඟ සංගත විය හැකි සහ නව ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදීම නියෝජනය නොවිය හැකි නිසාත්ය. ඒ හා සමානව SLFRS වෙත සංක්‍රාන්ති වීමට වහාම පෙර නොපැවති කාලය වෙනස්වීමෙන් පැන නැගුන නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම 13 ඡේදය තහනම් නොකරන නමුත් 11 වන ඡේදය ප්‍රකාරව ස්ථාපනය කළ අස්තිත්වයේ ගිණුම්කරණ ප්‍රමිත සමඟ සංගත වේ (උදාහරණ වශයෙන් කුණාටු හානි පිරිවැය).

## වෙනත් ප්‍රමිතවල අදාළත්වය

ආ7 මෙම ප්‍රමිතයේ විෂය පථය තුළවන සහ එහි අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්වයකට නියාමන විලම්බන ගිණුම් ශේෂයන් හඳුනා ගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් නොකඩවා පෙර පොපිගිමු ගිණුම් ප්‍රතිපත්ති ව්‍යවහාර කළ යුතුය. කෙසේ වෙතත් සමහර අවස්ථාවන්හිදී නියාමන විලම්බන ගිණුම් ශේෂ උචිත අන්දමින් මූල්‍ය ප්‍රකාශනවල පිළිඹිබු වීමට හැකිවනු පිණිස වෙනත් ප්‍රමිතද ව්‍යවහාර කිරීම අවශ්‍ය විය හැකි බව 16 - 17 ඡේදවල සඳහන් වේ. මෙම ප්‍රමිතයේ අවශ්‍යතාවයන් සමඟ වෙනත් සමහර ප්‍රමිත අන්‍යෝන්‍යව ක්‍රියාකරන්නේ කෙසේද යන්න පහත සඳහන් ඡේද සාරාංශ ගත කරයි. වෙනත් ප්‍රමිත වලට නිශ්චිත බැහැර කිරීම් සහ ඒවායින් නිදහස් කිරීම් සහ අදාළ වේ යයි අපේක්ෂිත අමතර ඉදිරිපත් කිරීම් සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් විශේෂයෙන්ම පහත සඳහන් ඡේදවලින් පැහැදිලි කෙරේ.

### LKAS 10 *වාර්තාකරණ කාල පරිච්ඡේදයෙන් පසුව සිද්ධීන් ව්‍යවහාරකරණය*

ආ8 අස්තිත්වයකට එහි නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැණීමට සහ මැනීමට ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කිරීම අවශ්‍ය විය හැකිය. වාර්තා කරන කාලපරිච්ඡේද අවසානය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමැතිය දෙන දින අතර සිදුවන සිද්ධීන් සඳහා එම සිද්ධීන් පිළිඹිබුවීමට එම ඇස්තමේන්තු සහ උපකල්පන ගැලපිය යුතුද යන්න හඳුනා ගැනීමට අස්තිත්වය LKAS 10 ව්‍යවහාර කළ යුතුය.

### LKAS 12 *ආදායම් බදු ව්‍යවහාරකරණය*

ආ9 සියළුම තාවකාලික වෙනස්කම් සඳහා විලම්බිත බදු වගකීමක් සහ (සමහර කොන්දේසිවලට යටත්ව) විලම්බිත බදු වත්කමක් සමහර සීමිත ව්‍යතිරේක සහිතව අස්තිත්වයක් හඳුනා ගැනීමට LKAS 12 න් අවශ්‍ය කෙරේ. හඳුනා ගතයුතු ආදායම් බදු වටිනාකම හඳුනාගැනීමට එහි ගාස්තු නියාමන ක්‍රියාකාරකම් ඇතුළුව, ගාස්තු නියාමන අස්තිත්වයක් සිය සියළුම ක්‍රියාකාරකම් සඳහා LKAS 12 ව්‍යවහාර කළ යුතුය.

ආ10 සමහර ගාස්තු නියාමන යෝජනා ක්‍රමයන්හි, අස්තිත්වයේ ආදායම් බදු වියදම් කොටසක් හෝ සියල්ලම අයකර ගැනීමට හැකිවීම පිණිස අස්තිත්වයට එහි අනාගත ගාස්තු වැඩි කිරීමට ගාස්තු නියාමක අවසර දීම, හෝ අස්තිත්වයෙන් අපේක්ෂා කෙරේ. එවන් අවස්ථාවලදී 11 - 12 ඡේද ප්‍රකාරව ස්ථාපනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ප්‍රකාරව අස්තිත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ආදායම් බදුවලට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂයක් අස්තිත්වයට හඳුනා ගැනීම මෙහි ප්‍රතිඵලයක් විය හැකිය. ආදායම් බදුවලට සම්බන්ධ මෙම නියාමන විලම්බන ගිණුම් ශේෂය හඳුනා ගැනීම මගින්ම, අමතර තාවකාලික වෙනස්කමක් ඇතිවිය හැකි අතර ඒ සඳහා අමතර විලම්බිත බදු වටිනාකමක් හඳුනාගනු ඇත.

ආ11 LKAS 12 හි ඉදිරිපත් කිරීමේ සහ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්හි කෙසේ සඳහන් වුවද නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් විලම්බිත බදු වත්කමක් හෝ විලම්බිත බදු වගකීමක් අස්තිත්වයක් හඳුනාගන්නා විට එම

විලම්බිත බදු වටිනාකම්, මුළු විලම්බිත බදු වත්කම් (වගකීම) ශේෂ තුළ අස්තිත්වය විසින් ඇතුලත් නොකළ යුතුය. ඒ වෙනුවට, නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පැනනගින විලම්බන බදු වත්කම් (වගකීම) එක්කෝ;

(අ) නියාමන විලම්බන හර හෝ බැර ශේෂ සඳහා ඉදිරිපත් කරන පේළි අයිතම සමඟ; හෝ

(ආ) සම්බන්ධිත නියාමන විලම්බන හර ශේෂ සහ බැර ශේෂ ළඟින් වෙන් වූ පේළි අයිතමයක් ලෙස අස්තිත්වය ඉදිරිපත් කළ යුතුය.

ආ12 ඒ හා සමානව නියාමන විලම්බිත ගිණුම් ශේෂ හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පැන නගින විලම්බිත බදු වත්කමක (වගකීමක්) සංචලනය අස්තිත්වයක් හඳුනා ගන්නා විට LKAS 12 ප්‍රකාරව ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ (වල) ඉදිරිපත්කරන බදු වියදම් (ආදායම්) පේළි අයිතමය තුළ, එම විලම්බිත බදු වටිනාකමේ සංචලනය අස්තිත්වය ඇතුළත් නොකළ යුතුය. ඒ වෙනුවට නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීමේ ප්‍රතිඵලයක් ලෙස පැනනගින විලම්බිත බදු වත්කම් (වගකීම්) වල සංචලනය එක්කෝ;

(අ) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන (යන්) හි ඉදිරිපත් කරන නියාමන විලම්බන ගිණුම්වල සංචලනයන් සඳහා වන පේළි අයිතම සමඟ; හෝ

(ආ) ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන(යන්) හි ඉදිරිපත් කරන විලම්බන ගිණුම්වල සංචලනය, සම්බන්ධ පේළි අයිතම ළඟින් වෙන්ව වූ පේළි අයිතමයක් ලෙස අස්තිත්වය ඉදිරිපත් කළ යුතුය.

### LKAS 33 *කොටසක ඉපයීම ව්‍යවහාර කරණය*

ආ13 අස්තිත්වයක් දිගටම පවත්වා ගෙන යන මෙහෙයුම් සහ පරිපාලක අස්තිත්වය සාමාන්‍ය ස්කන්ධ දරන්නන් හට ආරෝපිත ලාභ හෝ අලාභවලින් යන දෙකෙන්ම වන කොටසක මූලික සහ තනුක ඉපයීම ලාභ හෝ අලාභ හෝ වෙනත් විස්තීරණ ආදායම ප්‍රකාශනයේ ඉදිරිපත් කිරීමට සමහර අස්තිත්වවලට LKAS 33 හි 66 වන ඡේදය ප්‍රකාරව අවශ්‍ය කෙරේ. අමතරව අසන්තතික මෙහෙයුමක් වාර්තා කරන අස්තිත්වයක්, අසන්තතික මෙහෙයුම සඳහා කොටසක මූලික සහ තනුක ප්‍රමාණය එක්කෝ ලාභ හෝ අලාභ හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ හෝ සටහන්වල හෙළිදරව් කිරීම LKAS 33 හි 68 වන ඡේදය අවශ්‍ය කෙරේ.

ආ14 LKAS 33 ප්‍රකාරව ඉදිරිපත්කළ සෑම කොටසක ඉපයීම් වටිනාකම (ප්‍රමාණය) සඳහා නියාමන විලම්බන ගිණුම්වල ශේෂවල ශුද්ධ සංචලනය එම ප්‍රමාණවලින් (වටිනාකම්) ඉවත් කර, ඒහා සමාන ආකාරයටම ගණනය කරන අතිරේක මූලික සහ තනුක කොටසක ඉපයීම් ප්‍රමාණය මෙම ප්‍රමිතය ව්‍යවහාරකරණ අස්තිත්ත්වයක් ඉදිරිපත් කළ යුතුය. LKAS 33, 73 ඡේදයේ ඇති අවශ්‍යතාවයන් සමඟ සංගතව ඉදිරිපත් කළ සෑම කාලපරිච්ඡේදයක් සඳහාම මෙම ප්‍රමිතයේ 26 වන ඡේදයෙන් අවශ්‍ය කරන කොටසක ඉපයීම ඉදිරිපත් කිරීම හා සමාන අන්දමින් කැපී පෙනෙන පරිදි LKAS 33 න් අවශ්‍යකරන කොටසක ඉපයීම අස්තිත්වයක් ඉදිරිපත් කළ යුතුය.

### LKAS 36 *වත්කම් හානිකරණය ව්‍යවහාරකරණය*

ආ15 අස්තිත්ත්වයක් හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ, හඳුනාගැනීම මැනීම සහ යම් හානිකරනයක් ප්‍රතිවර්ත්‍ය කිරීම සඳහා එහි පෙර පොපිගිමු ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම ව්‍යවහාර කිරීම අස්තිත්ත්වයකට 11 - 12 ඡේදවලින් අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් වෙනම වූ හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා LKAS 36 ව්‍යවහාර නොවේ.

ආ16 කෙසේ වෙතත් නියාමන විලම්බන ගිණුම් ශේෂ ඇතුළත් මුදල් උත්පාදන ඒකකයකට මුඋඒ (CGU) හානිකරණ පරීක්ෂණයක් ක්‍රියාත්මක කිරීමට අස්තිත්ත්වයකට LKAS 36 මගින් අවශ්‍ය විය හැකිය. මෙම පරීක්ෂාව අවශ්‍ය විය හැක්කේ මුඋඒ යේ කීර්තිනාමය අඩංගු වීම හෝ LKAS 36 හි විස්තර කර ඇති හඳුනාගත් හානිකරණ දර්ශකයන් එකක් හෝ ඊට වැඩිගණනක් මුඋඒ සම්බන්ධවීම නිසාය. එවන් අවස්ථාවන්හිදී, මුඋඒ අයකරගත හැකි වටිනාකම සහ ධාරණ වටිනාකම හඳුනා ගැනීම සඳහා වන අවශ්‍යතාවයන් LKAS 36 හි 74 - 79 ඡේදවල අඩංගු වේ. හානිකරණ පරීක්ෂණයේ අරමුණ සඳහා නියාමන විලම්බන ගිණුම් ශේෂ ඕනෑම එකක් මුඋඒ ධාරණ වටිනාකමේ අඩංගු දැයි තීරණය කිරීමට අස්තිත්ත්වයක් එම අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය. මෙම පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන් හඳුනාගත් ඕනෑම හානිකර අලාභයක් සඳහා LKAS 36 ඉතිරි අවශ්‍යතාවයන් ඊළඟට ව්‍යවහාර කළ යුතුය.

**SLFRS 3 *ව්‍යාපාර සංයෝජනය ව්‍යවහාරකරණය***

ආ 17 SLFRS 3 හි ප්‍රධාන මූලධර්මය වනුයේ ව්‍යාපාරයක් අත්පත් කරගන්නා, අත්පත්කරගත් වත්කම් සහ භාරගත් වගකීම් හඳුනා ගන්නේ ඒවායේ අත්පත් කරගත් දින සාධාරණ වටිනාකම්වලට ය. SLFRS 3 හි හඳුනාගැනීමේ සහ මැනීමේ මූල ධර්මවලට සීමිත ව්‍යතිරේඛයන් ලබාදෙයි. මෙම ප්‍රමිතයේ ආ 18 ඡේදයෙන් අතිරේක ව්‍යතිරේඛ ලබාදෙයි.

ආ 18 නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම්, මැනීම්, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි පෙර පොපිගිමු ගිණුම්කරණ ප්‍රතිපත්ති අස්තිත්ත්වයන් දිගටම ව්‍යවහාර කිරීම 11-12 ඡේදවලින් අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන්, අස්තිත්ත්වයක් ව්‍යාපාරයක් අත්පත්කර ගන්නේ නම්, එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ, අත්පත් කරගත් දින අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගැනීම සහ මැනීම සඳහා 11 - 12 ඡේද ප්‍රකාර ව ස්ථාපනය කළ එහි ගිණුම් ප්‍රතිපත්ති අස්තිත්ත්වය ව්‍යවහාර කළ යුතු ය. අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ නියාමන විලම්බන ගිණුම ශේෂ සිය ස්වකීය මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගන්නේ ද යන්න නොසළකා අත්පත් කර ගන්නාගේ ප්‍රතිපත්ති ප්‍රකාරව, අත්පත් කරගැනීමට භාජනය වන්නාගේ නියාමන විලම්බන ගිණුම් ශේෂ අත්පත් කරගත්තා සේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගත යුතු ය.

**SLFRS 5 *විකිණීම සඳහා තබාගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම් ව්‍යවහාරකරණය.***

ආ 19 නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා එහි පෙර ගිණුම්කරණ ප්‍රතිපත්ති දිගටම ව්‍යවහාර කිරීමට 11 - 12 ඡේදවලින් අස්තිත්ත්වයට අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන්, හඳුනාගත් නියාමන විලම්බන ගිණුම් ශේෂ සඳහා SLFRS 5 හි මැනීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.

ආ 20 ලාභ හෝ අලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය(යන්) හි අසන්තතික මෙහෙයුම් සඳහා තනි වටිනාකමක් ඉදිරිපත් කළ යුතු බව SLFRS 5 හි 33 ඡේදයෙන් අවශ්‍ය කෙරේ. එම ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේවුව ද, මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරාගත් අස්තිත්වය අසන්තතික මෙහෙයුමක් ඉදිරිපත් කරනවිට, අසන්තතික මෙහෙයුමේ මිල නියාමන ක්‍රියාකාරකම් වලින් පැනනැගි නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය SLFRS 5 හි 33 වන ඡේදයෙන් අවශ්‍යකරණ පරිදි වන පේළි අයිතම් තුළ ඇතුලත් නොකළ යුතු ය. ඒ වෙනුවට අසන්තතික මෙහෙයුම් මිල නියාමන ක්‍රියාකාරකම්වලින් පැනනැගි නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය එක්කෝ;

(අ) ලාභ හෝ අලාභවලට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය සඳහා ඉදිරිපත් කරන පේළි අයිතම තුළ; හෝ

(ආ) ලාභ හෝ අලාභවලට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂවල සංචලනය සඳහා ඉදිරිපත් කරන සම්බන්ධිත පේළි අයිතම ළඟින් වෙන්ව වූ පේළි අයිතමයක් ලෙස

අස්තිත්වය ඉදිරිපත් කළ යුතු ය.

ආ 21 එසේම, SLFRS 5 හි 38 වන ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වුව ද, අස්තිත්වයක් අපහරණ කණ්ඩායමක් ඉදිරිපත් කරනවිට, අපහරණ කණ්ඩායමේ කොටසක්වන නියාමන විලම්බන ගිණුම් හර ශේෂයන්ගේ සහ බැර ශේෂයන්ගේ එකතුව SLFRS 5 හි 38 වන ඡේදයෙන් අවශ්‍ය කරන පරිදිවන පේළි අයිතම තුළ අස්තිත්ත්වය ඇතුළත් නොකළ යුතු ය. ඒ වෙනුවට අපහරණ කණ්ඩායමේ කොටසක්වන නියාමන විලම්බන ගිණුම් හර ශේෂයන්ගේ සහ බැර ශේෂයන්ගේ එකතුව එක්කෝ;

(අ) නියාමන විලම්බන හර ශේෂ සහ බැර ශේෂ සඳහා ඉදිරිපත් කරන පේළි අයිතම තුළ; හෝ

(අ) වෙනත් නියාමන විලම්බන හර ශේෂ සහ බැර ශේෂ ළඟින් වෙන් වූ පේළි අයිතමයක් ලෙස

අස්තිත්වය ඉදිරිපත් කළ යුතු ය.

ආ 22 අපහරණ කණ්ඩායමට හෝ අසන්තතික මෙහෙයුමකට සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් ශේෂ සහ එම ශේෂවල සංචලනයන් සම්බන්ධිත නියාමන විලම්බන ගිණුම් පේළි අයිතමවල ඇතුළත් කිරීමට අස්තිත්වයක් තෝරාගත හොත්, මෙම ප්‍රමිතයේ 33 වන ඡේදය මගින් විස්තර කර ඇති නියාමන විලම්බන පේළි අයිතමවල විශ්ලේෂණයේ කොටසක් ලෙස ඒවා වෙනම හෙළිදරව් කිරීම අවශ්‍ය විය හැකි ය.

**SLFRS 10 *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ* LKAS 28 *ආශ්‍රිතයන්හි ආයෝජන සහ බද්ධ ව්‍යාපාර ව්‍යවහාරකරණය***

ආ 23 SLFR 10 19 වන ඡේදයෙන් "පරිපාලකයක් සමාන ගණුදෙනු සහ ඒ හා සමාන තත්ත්වයන්හි දී වෙනත් සිද්ධීන් සඳහා ඒකාකාර ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිත කර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු ය" යන්න අවශ්‍ය කෙරේ. මෙම ප්‍රමිතයේ විෂය පථය තුළවන සහ එය ව්‍යවහාර කිරීමට තෝරාගත් අස්තිත්වයකට, මෙම ප්‍රමිතයේ 8 වන ඡේදය අස්තිත්ත්වයේ සියලුම මිල නියාමන ක්‍රියාකාරකම්වලින් පැන නගින සියලුම නියාමන විලම්බන ගිණුම් ශේෂවලට එහි සියලුම අවශ්‍යතාවයන් වෙනුවෙන් මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීම අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් මෙම ප්‍රමිතය ප්‍රකාරව පරිපාලකයක් එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගන්නේ නම්, එහි සියළුම පරිපාලිතයන් ගෙන් පැනනගින නියාමන විලම්බන ගිණුම් ශේෂවලට එම ගිණුම්කරණ ප්‍රතිපත්ති ව්‍යවහාර කළ යුතු ය. මෙම ශේෂ පරිපාලිත ඔවුන්ගේ ස්වකීය මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගන්නේ ද යන්න නොසලකා මෙය ව්‍යවහාර කළ යුතු ය.

ආ 24 එලෙස ම ස්කන්ධ ක්‍රමය ව්‍යවහාර කරමින් LKAS 28 හි 35 - 36 ඡේදවලින් ''සමාන ගණුදෙනු සහ ඒ හා සමාන තත්ත්වයන්හි දී වෙනස් සිද්ධීන් සඳහා ඒකාකාර ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර අස්තිත්තවයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම'' අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනාගැනීම, මැනීම, හානිකරණය සහ ප්‍රතිහඳුනාගැනීම සඳහා, ආයෝජනය කරනු ලබන අස්තිත්වය ඒ දැ සමඟ අනුගත වීමට ස්කන්ධ ක්‍රමය ව්‍යවහාරකරන ආශ්‍රිතයේ හෝ බද්ධ ව්‍යාපාරයේ ඒවා බවට පත් කිරීමට ඒවායේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට ගැළපුම් කළ යුතු ය.

**SLFRS 12 *වෙනත් අස්තිත්ත්වවල අයිතිය හෙළිදරව් කිරීම ව්‍යවහාරකරණය***

ආ 25 වාර්තා කරන අස්තිත්වයට ප්‍රමාණාත්මකවන එහි පාලනය නොවන හිමිකම ඇති සෑම පරිපාලිතයක් සඳහා ම වාර්තා කරන කාලපරිච්ඡේදය තුළ පරිපාලිතයේ පාලනය නොවන හිමිකමට වෙන්කළ ලාභය හෝ අලාභය අස්තිත්වයක් හෙළිදරව් කිරීම SLFRS 12 හි 12 (ඉ) ඡේදයෙන් අවශ්‍ය කෙරේ. මෙම ප්‍රමිතය ප්‍රකාරව විලම්බන නියාමන ගිණුම් ශේෂ හඳුනාගන්නා අස්තිත්වයක් SLFRS 12 හි 12 (ඉ) ඡේදයෙන් හෙළිදරව් කිරීමට අවශ්‍ය කරන වටිනාකම් තුළ වන නියාමන විලම්බන ගිණුම් ශේෂවල ශුද්ධ සංචලනය හෙළිදරව් කළ යුතු ය.

ආ 26 වාර්තාකරණ අස්තිත්වයට ප්‍රමාණාත්මකවන එහි පාලනය නොවන හිමිකම ඇති සෑම පරිපාලිතයක් සඳහා ම SLFRS 12 ආ 10 ඡේදයේ නිශ්චය කර ඇති පරිදි පරිපාලිතය සම්බන්ධ සාරාංශගත කළ මූල්‍ය තොරතුරු අස්තිත්වය හෙළිදරව් කිරීම SLFRS 12 හි 12(උ) ඡේදයෙන් අවශ්‍ය කෙරේ. එමෙන් ම වාර්තා කරන අස්තිත්ත්වයට ප්‍රමාණාත්මක සෑම බද්ධ ව්‍යාපාරයක් සහ ආශ්‍රිතයක් සඳහා SLFRS 12, ආ 12 - ආ 13 ඡේදවල නිශ්චය කර ඇති පරිදි සාරාංශ ගත කළ මූල්‍ය තොරතුරු අස්තිත්ත්වයක් හෙළිදරව් කිරීමට SLFRS 12 හි 21 (ආ)(ii) ඡේදයෙන් අවශ්‍ය කෙරේ. SLFRS 12 හි 21 (ඇ) ඡේදය ප්‍රකාර ව තනි තනිව ගත් කළ ප්‍රමාණාත්මක නොවන සියළු වෙනත් ආශ්‍රිත සහ බද්ධ ව්‍යාපාර සඳහා අස්තිත්වය හෙළිදරව් කළ යුතු සාරාංශගත මූල්‍ය තොරතුරු SLFRS 12 හි ආ 16 ඡේදයෙන් නියම කෙරේ.

ආ 27 SLFRS 12 හි 12, 21, ආ 10, ආ 12- ආ 13 සහ ආ 16 ඡේදවලින් පැහැදිලි ව සඳහන් කර ඇති තොරතුරුවලට අමතර ව, මෙම ප්‍රමිතය ප්‍රකාර ව නියාමන විලම්බන ගිණුම් ශේෂ හඳුනා ගන්නා අස්තිත්ත්වයක්, නියාමන විලම්බන ගිණුම් හර ශේෂවල එකතුව, නියාමන විලම්බන ගිණුම් බැර ශේෂවල එකතුව සහ SLFRS 12 හෙළිදරව් කිරීම් අවශ්‍යකරණ සෑම අස්තිත්ත්වයක් සඳහා ලාභ හෝ අලාභවල හඳුනාගත් වටිනාකම් සහ වෙනත් විස්තීරණ ලාභයේ හඳුනාගත් වටිනාකම් අතර කඩා වෙන්කර එම ශේෂවල ශුද්ධ සංචලනය ද හෙළිදරව් කළ යුතු ය.

ආ 28 පරිපාලිතයක පාලනය අහිමිවීම මත SLFRS 10 හි 25 ඡේදය ප්‍රකාර ව ගණනය කළ ප්‍රතිලාභයක් හෝ අලාභයක් අස්තිත්ත්වයක් හඳුනා ගන්නා විට, අස්තිත්ත්වය හෙළිදරව් කිරීමට අවශ්‍ය කරන තොරතුරු SLFRS 12 , 19 වන ඡේදයේ පැහැදිලි ව සඳහන් කර ඇත. SLFRS 12 හි 19 වන ඡේදයෙන් අවශ්‍ය කරන තොරතුරුවලට අමතර ව, මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරා ගන්නා අස්තිත්ත්වයක් කලින් පරිපාලිතයේ පාලනය අහිමිවන දින නියාමන විලම්බන ගිණුම් ශේෂ ප්‍රතිහඳුනාගැනීමේ දී එයට ආරෝපණය වූ එම ප්‍රතිලාභය සහ අලාභවල කොටස හෙළිදරව් කළ යුතු ය.

**ඇ පරිශිෂ්ඨය**

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

*මෙම පරිශිෂ්ඨය මෙම ප්‍රමිතයේ අවශ්‍ය කොටසකි*

***බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය***

**බලාත්මක දිනය**

ඇ1 අස්තිත්ත්වයක් එහි මුල් වාර්ෂික SLFRS මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ 2016 ජනවාරි 1 වන දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේදයක් සඳහා නම් මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතු ය. ඊට කලින් ව්‍යවහාරයට අවසර දේ. ඊට කලින් කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතය එහි මුල් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවලට ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතු ය.

**ඈ පරිශිෂ්ඨය**

**SLFRS 1 *මුල් වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීමට ආනුෂංගික සංශෝධන***

*පාලක මණ්ඩලය* SLFRS 14 *විලම්බන නියාමන ගිණුම්, නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස* SLFRS 1 *මුල්වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම වෙත මෙම පරිශිෂ්ඨය සංශෝධනයක් නියම කරයි. සංශෝධිත ඡේදය නව පාඨය සහිත ව යටින් ඉරක් ඇඳ සහ ඉවත් කළ පාඨය ඉරක් මගින් කපා හැර ඇත. අස්තිත්වයක් SLFRS 1 ව්‍යවහාර කරන විට එය එම සංශෝධනය ව්‍යවහාර කළ යුතු ය.*

**SLFRS 1 මුල් වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම**

| |
|---|
| 39අඹ ඡේදය එකතු කර ඇත. |

39අඹ 2014 ජූනිවල දී නිකුත් කළ SLFRS 14 *නියාමන විලම්බන ගිණුම්* ඈ 8 ආ ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් එම සංශෝධනය 2016 ජනවරි 1 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළ යුතු ය. ඊට කලින් ව්‍යවහාරකරණයට ඉඩදේ. අස්තිත්වයක් SLFRS 14 කලින් කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කරන්නේ නම්, මෙම සංශෝධන එම කලින් කාලපරිච්ඡේදයට ද ව්‍යවහාර කළ යුතු ය.

| |
|---|
| ඈ පරිශිෂ්ඨයට ඈ 8 ආ සංශෝධනය කර ඇත. නව පාඨයට යට ඉරක් ඇඳ ඇති අතර, ඉවත් කළ පාඨය ඉරක් මගින් කපා හැර ඇත. |

ඈ8ආ මෙහෙයුම්වලට භාවිතා කරන හෝ, කලින් භාවිත කළ ගාස්තු නියාමනයට යටත් දේපොළ, පිරියත සහ උපකරණ හෝ අස්පෘශ්‍ය වත්කම් අයිතම සමහර ආයතන තබා ගනී. එවැනි අයිතමවල ධාරණ වටිනාකමට පෙර පොපිගිමු යටතේ නිර්ණය කළ වටිනාකම් ඇතුළත්විය හැකි අතර, එහෙත් ඒවා SLFRS 5 ප්‍රකාර ව ප්‍රාග්ධනගත කිරීම සඳහා සුදුසුකම් නොලබයි. කාරණය මෙය නම් මුල් වරට SLFRS 5 භාවිත කරන්නෙක් ඒවාට සංක්‍රාන්ති වූ දින සැලකෙන පිරිවැය ලෙස එවැනි අයිතමයක පෙර පොපිගිමු ධාරණ වටිනාකම භාවිත කිරීම තෝරාගත හැකි ය. අස්තිත්වය අයිතමයකට මෙම නිදහස් වීම ව්‍යවහාර කරන්නේ නම්, සියලුම අයිතම සඳහා එය ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ. මෙම නිදහස් කිරීම භාවිත කළ සෑම අයිතමයකට ම LKAS 36 ප්‍රකාර ව SLFRSs වලට සංක්‍රාන්ති වූ දින, අස්තිත්වය හානිකරණය සඳහා පරීක්ෂා කළ යුතු ය.

<u>භාණ්ඩ හෝ සේවා සඳහා ගණුදෙනු කරුවෙකුගෙන් අය කරගත හැකි මිල ස්ථාපනය කිරීම සඳහා වූ ආකෘතිමය රාමුවකින් පාලනයවන සහ එම ආකෘතිමය රාමුව ගාස්තුද නියාමක (SLFRS *නියාමන විලම්බන ගිණුම්හි නිර්වචනය කර ඇති පරිදි*) යේ අනුමැතියට සහ සුපරීක්ෂණයට යටත්වන්නේ නම් ඒවා මෙම ඡේදයේ අරමුණ සඳහා ගාස්තු රෙගුලාසිවලට යටත් මෙහෙයුම් වේ.</u> ~~ගනුදෙනුකරුවන් බැඳෙන මිල ගණන් ස්ථාපිත කිරීමට බලගැන්වෙන අනුමත ආයතනයක් මගින් පිහිට වූ මිල ගණන්වලට (එනම් ගාස්තු) ගනුදෙනුකරුවනට භාණ්ඩ හෝ සේවා සැලසීම සහ එම මිල ගණන් සැලසුම්කර ඇත්තේ නියාමනය කළ භාණ්ඩ හෝ සේවා සැලසීමට අස්තිත්ත්වය දරන නිශ්චය කරන ලද පිරිවැය සහ නිශ්චය කරනලද ප්‍රතිලාභයක් උපදවන පිරිවැය අයකර ගැනීමට ය. නිශ්චය කරන ලද ප්‍රතිලාභය අවමයක් හෝ පරාසයක් විය හැකිය සහ එය ස්ථාවර හෝ සහතික කළ ප්‍රතිලාභයක් වීම අවශ්‍ය නොවේ.~~

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත -SLFRS 15**

*ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වලින් වන අයභාරය*


| පටුන | ඡේද |
|---|---|
| **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත** - SLFRS 15 | |
| ***ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වලින් වන අයභාරය*** | |
| **පරමාර්ථය** | 1 |
| **පරමාර්ථය ඉටුකර ගැනීම** | **2** |
| **විෂය පථය** | **5** |
| **හඳුනා ගැනීම** | **9** |
| **ගිවිසුමක් හඳුනාගැනීම** | **9** |
| **ගිවිසුම් සංයෝජනය** | 17 |
| **ගිවිසුම් වෙනස් කිරීම** | 18 |
| **ඉටු කිරීම් බැඳීම් හඳුනා ගැනීම** | **22** |
| ගිවිසුම්වල ගණුදෙනුකරුවන් සමග පොරොන්දු | 24 |
| නිශ්චිත භාණ්ඩ හෝ සේවාවන් | 26 |
| ඉටු කිරීම් බැඳීම් සැහීමට පත්වීම | 31 |
| කාලයක් පුරා ඉටු කිරීම් බැඳීම් අපේක්ෂා සපුරාලීම | 35 |
| කාලයේ එක්තරා අවස්ථාවක ඉටු කිරීම බැඳීම් අපේක්ෂා සපුරාලීම | 38 |
| ඉටු කිරීම් බැඳීමක පූර්ණ අපේක්ෂා සපුරාලීම සම්බන්ධයෙන් ප්‍රගතිය මැනීම | 39 |
| **මැනීම** | **46** |
| **ගණුදෙනු මිල නීර්ණය කිරීම** | **47** |
| විචල්‍ය ප්‍රතිෂ්ඨාව | 50 |
| ගිවිසුමේ සැළකිය යුතු අන්දමේ මුල්‍යකරණ සංරචකයක පැවැත්ම | 60 |
| මුදල් - නොවන ප්‍රතිෂ්ඨාව | 66 |
| ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව | 70 |
| **ගණුදෙනු මිල ඉටු කිරීම් බැඳීම්වලට වෙන් කිරීම** | 73 |
| තනි තනි විකුණුම් මිල පදනම මත වෙන් කිරීම | 76 |
| වට්ටමක් වෙන් කිරීම | 81 |
| විචල්‍ය ප්‍රතිෂ්ඨාවක් වෙන් කිරීම | 84 |

| පටුන | ඡේද |
|---|---|
| **ගණුදෙනු මිලේ වෙනස්වීම්** | **87** |
| **ගිවිසුම් පිරිවැය** | **91** |
| **ගිවිසුමක් ලබා ගැනීමේ දී වන වර්ධන පිරිවැය** | **91** |
| **ගිවිසුමක් සම්පූර්ණ කිරීමට වන පිරිවැය** | **95** |
| **ක්‍රම ක්ෂය සහ හානිකරණය** | **99** |
| **ඉදිරිපත් කිරීම** | **105** |
| **හෙළිදරව් කිරීම** | **110** |
| **ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්** | **113** |
| අයහාරය කොටස්වලට විසුරුවීම | 114 |
| ගිවිසුම් ශේෂයන් | 116 |
| ඉටුකිරීමේ කොන්දේසි | 119 |
| ඉතිරිව ඇති ඉටු කිරීම් බැඳීම්වලට ගණුදෙනු මිල වෙන් කිරීම | 120 |
| **මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේ දී වැදගත් විනිශ්චයන්** | **123** |
| ඉටු කිරීම් බැඳීම්වල සෑහීමට පත්වීමේ කාල සැකසුම නීර්ණය කිරීම | 124 |
| ගණුදෙනු මිල සහ ඉටු කිරීමේ බැඳීම්වලට වෙන් කළ වටිනාකම් නීර්ණය කිරීම | 126 |
| **ගණුදෙනුකරුවකු සමඟ වූ ගිවිසුම ලබා ගැනීමට හෝ සම්පූර්ණ කිරීමට වන පිරිවැයෙන් හඳුනාගත් වත්කම්** | **127** |
| **ප්‍රායෝගික ක්‍රියාමාර්ග** | **129** |
| **පරිශිෂ්ඨ** | |
| **අ. නිර්වචිත පද** | |
| **ආ. ව්‍යවහාරකරණ උපදේශන** | |
| **ඇ. බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය** | |
| **ඈ. වෙනත් ප්‍රමිතවලට සංශෝධන** | |

## ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත -SLFRS 15

### *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින්වන අයභාරය*

ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිත 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින් වන අය භාරය* (SLFRS 15) මෙහි 1-129 ඡේදවල සහ පරිශිෂ්ඨ අ - ඈ හි දක්වා ඇත. සෑම ඡේදයකටම එක හා සමාන අධිකාරියක් ඇත. **තද කළු** අකුරෙන් දක්වා ඇති ඡේදවලින් ප්‍රධාන මූලධර්ම ප්‍රකාශ කෙරේ. අ පරිශිෂ්ඨයේ නිර්වචනය කර ඇති පද මෙම ප්‍රමිතයේ ප්‍රථම වරට සඳහන් කරන විට *ඇල අකුරු* වලින් දැක්වේ. අනෙක් පද සඳහාවන නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහාවන පාරිභාෂික ශබ්ද මාලාවේ දී ඇත. ප්‍රමිතය එහි අරමුණ සහ නිගමන සඳහා වූ පදනම *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට වූ පූර්විකාව සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා වූ ආකල්පමය ආකෘතිමය රාමුව* ද සම්බන්ධ කොට ගෙන කියවිය යුතුය. පැහැදිලි මාර්ගෝපදේශ නොමැති අවස්ථාවල දී ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සඳහාත් ඒවා භාවිතා කිරීම සඳහාත් පදනමක් LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* මගින් සැපයේ.

#### පරමාර්ථය

1. **ගණුදෙනුකරුවකු සමඟවන ගිවිසුමකින් පැන නගින අයභාරය සහ මුදල් ප්‍රවාහවල ස්වභාවය, වටිනාකම, කාල සැලැස්ම සහ අනියතාවය පිළිබඳව මූල්‍ය ප්‍රකාශන පරිශීලකයනට ප්‍රයෝජනවත් තොරතුරු වාර්තා කිරීමට අස්තිත්ත්වය විසින් ව්‍යවහාර කළ යුතු මූලධර්ම ස්ථාපනය කිරීම මෙම ප්‍රමිතයේ පරමාර්ථය වේ.**

**පරමාර්ථය ඉටු කර ගැනීම**

2. 1 වන ඡේදයේ අරමුණ ඉටු කර ගැනීමට මෙම ප්‍රමිතයේ හරාත්මක මූලධර්මය වනුයේ පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීමේ දී අස්තිත්ත්වය විසින් හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාව පිළිඹිබු වන වටිනාකමකට ගණුදෙනුකරුවකුට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පැවරීම නිරූපණය වන අයභාරය, අස්තිත්ත්වය හඳුනා ගනු ලැබිය යුතු ය.

3. මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේ ගිවිසුමේ කොන්දේසි සහ වෙනත් සියලු අදාළ කරුණු සහ තත්ත්වයන් අස්තිත්ත්වය විසින් සළකා බැලිය යුතු ය. අස්තිත්ත්වයක් විසින් මෙම ප්‍රමිතය, යම් ප්‍රායෝගික ක්‍රියාමාර්ග භාවිතා කිරීම ඇතුළුව සමාන ගති ලක්ෂණ සහිත සහ සමාන තත්ත්වයන්හි ව්‍යවහාර කළ යුතු ය.

4. ගණුදෙනුකරුවන් සමග වන තනි ගිවිසුමක් ගිණුම්කරණය කිරීම මෙම ප්‍රමිතයෙන් පැහැදිලි කර දේ. ගිවිසුම් කළඹකට මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේ මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම, මෙම ප්‍රමිතය එම කළඹ තුළවන තනි ගිවිසුම් වලට (හෝ *ඉටු කිරීම් බැඳීම් වලට*) ව්‍යවහාර කිරීම මගින් වන බලපෑමට ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවේ යයි අස්තිත්ත්වය සාධාරණ ලෙස අපේක්ෂා කරන්නේ නම්, කෙසේ වෙතත් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස අස්තිත්ත්වයක් සමාන ගතිලක්ෂණ ඇති ගිවිසුම් කළඹකට (හෝ ඉටු කිරීමේ බැඳීම්වලට) මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ හැකිය. කළඹක් සඳහා ගිණුම් තබන කල්හි, එම කළඹෙහි ප්‍රමාණය සහ සංයුතිය පිළිබඳවන ඇස්තමේන්තු සහ උපසල් හා අස්තීත්වය පිණිස භාවිත කළ යුතුය.

#### විෂය පථය

5. අස්තිත්ත්වයක් විසින් පහත දැ හැරෙන්නට අන් සියලු ගිවිසුම් සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතු ය.

   (අ) LKAS 17 *කල් බදු* හි විෂය පථය තුළවන කල්බදු ගිවිසුම්;

   (ආ) SLFRS 4 *රක්ෂණ ගිවිසුම්* විෂය පථය යටතේ වන රක්ෂණ ගිවිසුම්

   (ඇ) SLFRS 9 *මූල්‍ය සාධන පත්‍ර*,SLFRS 10 *ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන*,SLFRS 11 *බද්ධ විධිවිධාන*, LKAS 27 *වෙන් වූ මූල්‍ය ප්‍රකාශන* සහ LKAS 28 *ආශ්‍රිතයන්හි සහ බද්ධ ව්‍යාපාරවල ආයෝජන* විෂය පථයන් තුළ වන මූල්‍ය සාධන පත්‍ර සහ වෙනත් ගිවිසුම්ගත හිමිකම් හෝ බැඳීම්; සහ

   (ඈ) ගණුදෙනුකරුවන්ට හෝ අනාගත ගණුදෙනුකරුවන් වෙත කරන විකුණුම් පහසු කිරීමට එකම පෙළේ ව්‍යාපාරවල නියුතු සමාගම් අතර මූල්‍ය නොවන හුවමාරු කර ගැනීම්. උදාහරණ වශයෙන් ඔවුන්ගේ ගණුදෙනුකරුවන්ගෙන් වන ඉල්ලුම සපුරාලීමට නිශ්චය කරන ලද වෙනස් ස්ථාන තුළ දී කාලෝචිත පදනමක් මත ඉන්ධන හුවමාරුකර ගැනීම සඳහා එකඟවන ඉන්ධන සමාගම් දෙකක් අතර වන ගිවිසුමකට මෙම ප්‍රමිතය ව්‍යවහාර නොවිය හැකි ය.

6. ගිවිසුමේ ප්‍රතිපාර්ශවකරු ගනුදෙනුකරුවකු වන්නේ නම් පමණක් අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතය ගිවිසුමකට (5 වන ඡේදයේ ලැසිස්තුගත කර ඇති ගිවිසුමකට හැර) ව්‍යවහාර කළ යුතුය. ප්‍රතිෂ්ඨාවකට හුවමාරු කර ගැනීම සඳහා අස්තිත්ත්වයක සාමාන්‍ය ක්‍රියාකාරකම්වල නිමැයුම් වන භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමට අස්තිත්ත්වය සමග ගිවිසුමකට එළඹෙන පාර්ශ්වයක් ගණුදෙනුකරුවෙක් වේ. අස්තිත්ත්වයේ සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් වන නිමැයුමක් ලබා ගැනීම වෙනුවට, එම ක්‍රියාකාරකමෙන් හෝ ක්‍රියාවලියෙන් (උදාඃ එක්ව කටයුතු කරන එකග වීමක දී වත්කමක් සංවර්ධනය කිරීම වැනි) ප්‍රතිඵලයක් වන අවදානම් සහ ප්‍රතිලාභ බෙදාගැනීමට ගිවිසුමට වන පාර්ශ්වයන් වන ක්‍රියාකාරකමට හෝ ක්‍රියාවලියට අස්තිත්ත්වය සමග සහභාගීවීමට ගිවිසුම් ගත ප්‍රතිපාර්ශ්වය උදාහරණ වශයෙන් වන්නේ නම්, ගිවිසුමට වන ප්‍රතිපාර්ශ්වකරු ගණුදෙනුකරුවන් විය නොහැකිය.

7. ගණුදෙනුකරුවෙක් සමග වන ගිවිසුමක් අර්ධ වශයෙන් මෙම ප්‍රමිතයේ විෂය පථය තුළත් අර්ධ වශයෙන් 5 වන ඡේදයේ ලැයිස්තුගත වෙනත් ප්‍රමිතවලත් විෂය පථ තුළත් විය හැකිය.

(අ) වෙනත් ප්‍රමිතවල ගිවිසුමක එක් හෝ ඊට වැඩි කොටස් වෙන් කරමින් සහ/ හෝ මූලිකව මනින්නේ කෙසේ ද යන්න පැහැදිලිව සඳහන් කර ඇත්නම් එවිට අස්තිත්ත්වය විසින් මුලින්ම එම ප්‍රමිතවල වෙන් කිරීමේ සහ/ හෝ මැනීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය. අස්තිත්ත්වයක් විසින් වෙනත් ප්‍රමිතවලට අනුකූලව මූලික වශයෙන් මැනීම් සිදුකරන ලද ගිවිසුමක කොටසේ (හෝ කොටස්) වල ප්‍රමාණය ගනුදෙනු මිලෙන් බැහැර කරනු ලබන අතර මෙම ප්‍රමිතයේ විෂය ක්ෂේත්‍රය තුළ ගැනෙන එක් එක් කාර්ය වල බැඳීමකට සහ 7(ආ) ඡේදය පරිදි හඳුනාගනු ලබන ගිවිසුමේ වෙනත් කොටස් වෙතොත් ඒවාට ගනුදෙනු මිලෙන් ඉතිරිය වෙන් කිරීම සඳහා (ඉතිරියක් තිබේනම්) 73 - 86 ඡේද ව්‍යවහාර කළ යුතුය.

(ආ) වෙනත් ප්‍රමිතවල ගිවිසුමක එක් හෝ ඊට වැඩි කොටසක් වෙන් කරන්නේ සහ/ හෝ මූලිකව මනින්නේ කෙසේ ද යන්න පැහැදිලිව සඳහන් කර නොමැති නම් එවිට ගිවිසුමේ කොටසක (හෝ කොටස්වල) වෙන් කිරීමට සහ/හෝ මූලිකව මැනීමට අස්තිත්ත්වයක් විසින් මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතු ය.

8. ගණුදෙනුකරුවෙක් සමග ගිවිසුමක් ලබා ගැනිමේ දී වන වර්ධක පිරිවැය සහ ගණුදෙනුකරුවෙක් සමගවන ගිවිසුම් ඉටු කිරීමේ දී දරණ පිරිවැයත් එම පිරිවැය වෙනත් ප්‍රමිතයක (91-104 ඡේද බලන්න) විෂය පථය තුළ නොවේ නම් ඒවා සඳහා ගිණුම්කරණය කරන අන්දම මෙම ප්‍රමිතයෙන් පැහැදිලි කෙරේ.

## හඳුනා ගැනීම

### ගිවිසුම හඳුනා ගැනීම

**9. මෙම ප්‍රමිතයේ විෂය පථය තුළවන ගණුදෙනුකරුවකු සමගවන ගිවිසුමක් සඳහා පහත සඳහන් නිර්නායක සියල්ලම ඉටුවන විට අස්තිත්ත්වයක් ගිණුම්ගත කළ යුතුය.**

**(අ) ගිවිසුමක් සඳහා වන පාර්ශව ගිවිසුම අනුමත කර තිබීම (ලිඛිතව, වාචිකව හෝ වෙනත් චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුද්දෙන්) සහ ඔවුන්ගේ අදාළ බැඳීම් ඉටු කිරීමේ කැපවීම;**

**(ආ) අයිතිය පැවැරිය යුතු භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් සෑම පාර්ශ්වයකට හිමිකම් අස්තිත්ත්වයට හඳුනා ගැනීමට පුළුවන් වීම;**

**(ඇ) අයිතිය පැවරිය යුතු භාණ්ඩ හෝ සේවා සඳහා ගෙවීම් කොන්දේසි අස්තිත්ත්වයට හඳුනාගැනීමට පුළුවන් වීම;**

**(ඈ) ගිවිසුමට වාණිජ හරයක් තිබීම (එනම් ගිවිසුමේ, ප්‍රතිඵලයක් වශයෙන් අවදානම, කාල සැකසුම හෝ අස්තිත්වයේ අනාගත මුදල් ප්‍රවාහ වෙනස්වීමට අපේක්ෂා කරන ප්‍රමාණය); සහ**

**(ඉ) ගණුදෙනුකරුවකුට පවරනු ලැබිය හැකි භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවක් ලෙස මාරු කරනු ලැබිය හැකි ප්‍රතිෂ්ඨාවේ හිමිකම අස්තිත්ත්වය අයකර ගනු ලැබීම අපේක්ෂා කළ හැකිවීම. ප්‍රතිෂ්ඨාවේ වටිනාකම අයකර ගත හැකි බව අපේක්ෂා කළ හැකි ද යන්න ඇගයීමේ දී අස්තිත්ත්වය සළකා බැලිය යුත්තේ ප්‍රතිෂ්ඨාවේ එම වටිනාකම ගෙවිය යුතු දින ගෙවීමට ගණුදෙනුකරුගේ ඇති හැකියාව සහ අභිප්‍රාය පමණි. ප්‍රතිෂ්ඨාව විචල්‍ය නම් අස්තිත්ත්වය ගණුදෙනුකරුට පිරිනැමිය හැකි මිල සහන (52 ඡේදය බලන්න) නිසා අස්තිත්ත්වය හිමිකම් කියනු ලබන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම, ගිවිසුමේ සඳහන් මිලට වඩා අඩුවිය හැකි ය.**

10. ගිවිසුමක් යනු පාර්ශව දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර බලාත්මක කළහැකි හිමිකම් සහ බැඳීම් ඇති කරන එකඟවීමකි. ගිවිසුමක හිමිකම සහ බැඳීම් බලාත්මක කිරීමට නීතියට අදාළ කරුණකි. ගිවිසුමක් ලිඛිත, වාචික හෝ අස්තිත්ත්වයේ චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදු වලින් ව්‍යංග වූ හෝ එකක් විය හැකිය. ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම් ස්ථාපනය කිරීමේ පරිචයන් සහ ක්‍රියාවලීන් නෛතික අධිකරණ බල ප්‍රදේශවල, කර්මාන්තයන් සහ අස්තිත්ත්වයන් හරහා විවිධාකාර වේ. මෙයට අමතර ඒවා එකම අස්තිත්ත්ව තුළදීත් විවිධාකාර විය හැකි ය. (උදාහරණ වශයෙන් ඒවා ගණුදෙනුකරුවන්ගේ පන්තිය මත හෝ එකඟ වූ භාණ්ඩ හෝ සේවාවල ස්වභාවය මත රදා පැවතිය හැකිය), ගණුදෙනුකරුවකු සමඟවන ගිවිසුමක්, බලාත්මක කළ හැකි හිමිකම් සහ බැඳීම් ඇති කරන්නේ ද සහ කුමන අවස්ථාවක දීද යන්න නිර්ණය කිරීමේ දී අස්තිත්ත්වයක් එම පරිචය සහ ක්‍රියාවලීන් සැලකිල්ලට ගත යුතු ය.

11. ගණුදෙනුකරුවන් සමඟ වන සමහර ගිවිසුම්වල නියම කළ කාලසීමාවන් නොමැති අතර ඕනෑම පාර්ශ්වයකට ඕනෑම වේලාවක ඒවා අවසන් කිරීම හෝ වෙනස් කිරීම් කළ හැකිය. වෙනත් ගිවිසුම් ගිවිසුමේ පැහැදිලිව සඳහන් කර ඇති පරිදි ස්වයංක්‍රියව වාරානුකූල පදනම මත අලුත් කළ හැකිය. ප්‍රස්තුත කාලය තුළ නීති ප්‍රකාරව බලාත්මක කිරීමේ හිමිකම් සහ බැඳීම් තිබෙන ගිවිසුමකට සම්බන්ධ පාර්ශ්වයන්ට ගිවිසුම පවතින කාලය තුළ (එනම් ගිවිසුම්ගත කාලච්ඡේදය තුළ) අස්තිත්වයක් විසින් මෙම ප්‍රමිතය අදාළ කරගත යුතු වන්නේ ය.

12. අනෙක් පාර්ශ්වයට (පාර්ශවවලට) වන්දි නොගෙවා සම්පූර්ණයෙන් ඉටු නොකළ ගිවිසුමක් අවසන් කිරීමට ගිවිසුම සම්බන්ධ එක් එක් පාර්ශ්වයකට ඒකපාර්ශ්වික බලාත්මක කළ හැකි අයිතියක් ඇත්නම් මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේ අරමුණ සඳහා එවිට ගිවිසුමක් නොපවතී. පහත සඳහන් නිර්නායක දෙකම ඉටුවන විට ගිවිසුමක් සම්පූර්ණයෙන් ඉටු නොකළ ගිවිසුමක් වේ.

(අ) ගණුදෙනුකරුවන්ට, පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා කිසිවක් මේ දක්වා අස්තිත්ත්වය පවරා නොතිබීම ; සහ

(ආ) පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා හුවමාරුව සඳහා වූ කිසිම ප්‍රතිෂ්ඨාවක්, අස්තිත්ත්වයට මෙතෙක් ලැබී නැති හෝ, මෙතෙක් ලැබීමට හිමිකමක් නොමැතිවීම.

13. ගිවිසුම ආරම්භයේ දී ගණුදෙනුකරුවකු සමඟවන ගිවිසුමක දී 9 වන ඡේදයේ වන නිර්ණායක සපුරා ඇත්තේ නම්, එම කරුණුවල සහ තත්ත්වයන්ගේ සැලකිය යුතු වෙනස්වීම් අඟවන්නේ නම් හැර, අස්තිත්ත්වය විසින් එම නිර්නායක යළි තක්සේරු නොකළ යුතු ය. උදාහරණ වශයෙන් ප්‍රතිෂ්ඨාව ගෙවීමට ගණුදෙනුකරුවකුගේ හැකියාව සැළකිය යුතු අන්දමින් හීන වී ඇත්නම්, ගණුදෙනුකරුට පැවරීමට ඉතිරිව ඇති භාණ්ඩ හෝ සේවා හුවමාරු කිරීමෙන් අස්තිත්ත්වයට හිමිකමක් ඇති ප්‍රතිෂ්ඨාව අයකර ගැනීම අපේක්‍ෂා කළ හැකි ද යන්න අස්තිත්වය විසින් යළි තක්සේරු කරනු ඇත.

14. ගණුදෙනුකරුවෙකු සමඟ වන ගිවිසුමක දී 9 වන ඡේදයේ නිර්නායක සපුරාලන්නේ නැති විටක, 9 වන ඡේදයේ නිර්නායක පසුව සපුරා ඇත්දැයි නිර්ණය කිරීමට අස්තිත්ත්වය ගිවිසුම තක්සේරු කිරීම දිගටම කරගෙන යා යුතු ය.

15. ගණුදෙනුකරුවකු සමඟ වන ගිවිසුමක දී 9 වන ඡේදයේ නිර්ණායක සපුරා නොමැති විටෙක දී, අස්තිත්ත්වය ගණුදෙනුකරුගෙන් ලැබුණ ප්‍රතිෂ්ඨාව අයභාරය ලෙස හඳුනාගත යුත්තේ පහත සඳහන් සිද්ධිවලින් එක්කෝ,

(අ) ගණුදෙනුකරුවෙකුට භාණ්ඩ හෝ සේවා පැවරීමට අස්තිත්ත්වයට තවදුරටත් බැඳීමක් නොමැති සහ ගණුදෙනුකරු පොරොන්දු වූ සියළු හෝ සෑහෙනදුරට සියලු ප්‍රතිෂ්ඨාව අස්තිත්ත්වයට ලැබී ඇති සහ ආපසු නොගෙවිය යුතු වන විට ;

හෝ

(ආ) ගිවිසුම අවසන්කර සහ ගනුදෙනුකරුවන්ගෙන් ලැබුණ ප්‍රතිෂ්ඨාව ආපසු නොගෙවිය යුතු වීම.

16. 15 වන ඡේදයේ සඳහන් සිදුවීම් වලින් එකක් සිදුවන තෙක් හෝ 9 වන ඡේදයේ නිර්ණායක පසුව සපුරාලන තෙක් (14 ඡේද බලන්න) ගණුදෙනුකරුවෙකුගෙන් ලැබුණ, ප්‍රතිෂ්ඨාව වගකීමක් ලෙස අස්තිත්ත්වය හඳුනා ගත යුතුය. ගිවිසුමට සම්බන්ධ කරුණු සහ තත්ත්වයන් මත රදා පවතිමින් හඳුනාගත් වගකීම එක්කෝ අනාගතයේදී භාණ්ඩ හෝ සේවා පැවරීමට හෝ ලැබුන ප්‍රතිෂ්ඨාව ආපසු ගෙවීමට අස්තිත්වයේ බැඳීම නියෝජනය කරයි. අවස්ථාවන් දෙකේදීම වගකීම මැනිය යුත්තේ ගණුදෙනුකරුගෙන් ලැබුණ ප්‍රතිෂ්ඨාවේ වටිනාකමට ය.

**ගිවිසුම් සංයෝජනය**

17. පහත සඳහන් නිර්නායකයන් එකක් හෝ ඊට වැඩි ගණනක් ඉටු වන්නේ නම් අස්තිත්ත්වයක් විසින් එළඹුණ හෝ එම වේලාව හා ආසන්න වේලාවේදී එම ගණුදෙනුකරු සමග (ගණුදෙනුකරුගේ අදාළ පාර්ශවයක්) එළඹුණ ගිවිසුම් දෙකක් හෝ ඊට වැඩි ගණනක් සංයෝජනය කළ යුතු අතර ගිවිසුම් තනි ගිවිසුමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

(අ) තනි ව්‍යාපාර අරමුණක් සහිතව ගිවිසුම් පැකේජයක් වශයෙන් ගිවිස ගැනීම ;

(ආ) එක ගිවිසුමක ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවේ වටිනාකම රදා පවතින්නේ අනෙක් ගිවිසුමේ මිල හෝ ඉටු කිරීම මත වීම; හෝ

(ඇ) ගිවිසුමේ පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා (හෝ එක එක ගිවිසුමේ පොරොන්දු වූ සමහර භාණ්ඩ හෝ සේවා) 22 - 30 ප්‍රකාරව තනි ඉටු කිරීමේ බැඳීමක් වීම.

**ගිවිසුම වෙනස් කිරීම**

18. ගිවිසුම වෙනස් කිරීම යනු ගිවිසුමට සම්බන්ධිත පාර්ශව අනුමත ගිවිසුමේ විෂය පථය හෝ මිල (හෝ දෙකම) වෙනස් කිරීමය. සමහර කර්මාන්තවල සහ අධිකරණ බල ප්‍රදේශවල ගිවිසුම වෙනස් කිරීම, වෙනස් කිරීමේ නියාමනයක්, විචලනයක් හෝ සංශෝධනයක් ලෙස විස්තර කළ හැකිය. ගිවිසුමක් වෙනස් කිරීමක් පවත්නේ එක්කෝ පවතින බලාත්මක කළ හැකි හිමිකම් සහ බැඳීම් වෙනස් කිරීම හෝ නව බලාත්මක කළ හැකි හිමිකම් සහ බැඳීම් ඇති කරන ගිවිසුමට සම්බන්ධිත පාර්ශව ගිවිසුමක් වෙනස් කිරීම අනුමත කරන විටදීය. ලිඛිතව වාචික එකඟවීමකින්, හෝ චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදු වලින් ව්‍යංගව ගිවිසුමක් වෙනස් කිරීම අනුමත කළ හැකිය. ගිවිසුමට සම්බන්ධිත පාර්ශව ගිවිසුම වෙනස් කිරීම අනුමත කර නොමැති නම්, ගිවිසුමේ වෙනස් කිරීම් අනුමත කරන තුරු පවතින ගිවිසුමට අස්තිත්ත්වය මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීම දිගටම කරගෙන යා යුතු ය.

19. ගිවිසුමකට සම්න්ධිත පාර්ශවවලට විෂය පථය හෝ මිල වෙනස් කිරීම (හෝ දෙකම) පිළිබඳව මත භේදයක් තිබෙන විට හෝ ගිවිසුමේ විෂය පථයේ වෙනස්වීම් පාර්ශව අනුමත කර එහෙත් අනුරූප මිල වෙනස්වීම් මෙතෙක් නීර්ණය කර නොමැති විටකදී පවා වුවද ගිවිසුම වෙනස් කිරීමක් පැවතිය හැකිය. වෙනස් කිරීම මගින් ඇති කරන ලද හෝ වෙනස් වූ හිමිකම් සහ බැඳීම් බලාත්මක කළ හැකි ද යන්න නීර්ණය කිරීමේ දී ගිවිසුමේ කොන්දේසි සහ වෙනත් සාක්ෂි ඇති විට සියලු අදාළ කරුණු සහ තත්ත්වයන් අස්තිත්ත්වයක් සළකා බැලිය යුතුය. ගිවිසුමකට සම්බන්ධ පාර්ශව ගිවිසුමේ විෂය පථයට කරන ලද වෙනස්කම් අනුමත කර ඇතත් මෙතෙක් මිල ගණන්වල අනුරූපී වෙනස්වීම් මෙතෙක් තීරණය කර නොමැති නම්, අස්තිත්ත්වය 50-54 ඡේදවල විචල්‍ය ප්‍රතිෂ්ඨාව ඇස්තමේන්තු කිරීම සහ 56-58 ඡේදවල විචල්‍ය ප්‍රතිෂ්ඨාව ඇස්තමේන්තු කිරීමේ සීමා කිරීම් ප්‍රකාරව වෙනස් කිරීම්වලින් පැන නගින ගණුදෙනු මිලට වන වෙනස්කම් අස්තිත්ත්වයත් ඇස්තමේන්තු කළ යුතු ය.

20. පහත සඳහන් කොන්දේසි දෙකම විද්‍යාමාන වන්නේ නම් ගිවිසුම වෙනස් කිරීම වෙනම ගිවිසුමක් ලෙස අස්තිත්ත්වයක් ගිණුම් ගත කළ යුතු ය.

(අ) (26-30 ඡේද ප්‍රකාරව) එකඟ වූ භාණ්ඩ හෝ සේවාවලට වෙනත් දෑ එකතු කිරීම නිසා ගිවිසුමේ විෂය පථය විශාල වීම; සහ

(ආ) එකඟ වූ අතිරේක භාණ්ඩවල හෝ සේවාවල අස්තිත්ත්වයේ තනි තනි පදනම මත වූ විකුණුම් මිලක් සහ විශේෂිත ගිවිසුමක තත්ත්වයක් පිළිඹිබු වීමට එම මිලට යම් උචිත ගැලපුමක් පිළිඹිබු වන ප්‍රතිෂ්ඨාවේ වටිනාකමින් ගිවිසුමේ මිල වැඩි වේ. උදාහරණ වශයෙන් ගණුදෙනුකරුවකුට අතිරේක භාණ්ඩ සහ සේවා සඳහා ලැබෙන වට්ටමෙන් අස්තිත්ත්වය එහි තනි තනි පදනම මත වූ විකුණුම් මිල ගැලපිය හැකිය. එසේ වන්නේ ඒ හා සමාන භාණ්ඩයේ හෝ සේවාවක් නව ගණුදෙනුකරුවෙකුට විකුණන විටදී දැරීමට සිදුවිය හැකි විකුණුම් සම්බන්ධිත වියදම් අස්තිත්ත්වයට දැරීමට අවශ්‍ය නොවන නිසාය.

21. ගිවිසුම වෙනස් කිරීම 20 වන ඡේදය ප්‍රකාරව වෙන්ව වූ ගිවිසුමක් ලෙස ගිණුම් ගත නොකරන්නේ නම්, ගිවිසුම වෙනස් කරන දින මෙතෙක් නොපැවරූ (එනම් ඉතිරිව ඇති එකඟ වූ භාණ්ඩ හෝ සේවාවන්) භාණ්ඩ හෝ සේවා සඳහා අස්තිත්ත්වය පහත සඳහන් උචිත ඕනෑම ක්‍රමයකින් ගිණුම්ගත කළ යුතු ය.

(අ) ගිවිසුම වෙනස් කිරීමේ දින හෝ ඊට ප්‍රථම පැවරූ භාණ්ඩ හා සේවාවලින් ඉතිරි භාණ්ඩ හෝ සේවා වෙනස් වන්නේ නම්, පවතින ගිවිසුම අවසන් කිරීම සහ නව ගිවිසුමක් ඇති වීම ලෙස සළකා ගිවිසුමක් වෙනස් කිරීම සඳහා අස්තිත්ත්වයක් ගිණුම් ගත කළ යුතුය. ඉතිරිව ඇති ඉටු කිරීමේ බැඳීම්වලට වෙන් කළයුතු ප්‍රතිෂ්ඨාවේ වටිනාකම (හෝ

22 (ආ) ඡේදය ප්‍රකාරව හඳුනා ගන්නා තනි ඉටු කිරීමේ බැඳීමකට ඉතිරිව ඇති වෙනස් වූ භාණ්ඩ හෝ සේවාවලට වනුයේ පහත සඳහන් දෑ වල එකතුවයි:

(i) ගණුදෙනු මිලේ ඇස්තමේන්තුවේ ඇතුළත් කළ සහ එය අයභාරය ලෙස හඳුනා නොගත් ගණුදෙනුකරු පොරොන්දු වූ ප්‍රතිෂ්ඨාව (දැනටමත් ගණුදෙනුකරුගෙන් ලැබී ඇති වටිනාකම් ඇතුළුව; සහ

(ii) ගිවිසුම වෙනස් කිරීමේ කොටසක් ලෙසඑකඟ වූ ප්‍රතිෂ්ඨාව

(ආ) ඉතිරිව ඇති භාණ්ඩ හෝ සේවාවන් වෙනස් භාණ්ඩ හෝ සේවා නොවන සහ එබැවින් ගිවිසුම වෙනස් කරන දින අර්ධ වශයෙන් සපුරාලන තනි ඉටු කිරීමේ බැඳීමක කොටසක ස්වරූපයේ නම්, එය පවතින ගිවිසුමේ කොටසක් වූවා යයි සලකා අස්තිත්ත්වය විසින් ගිවිසුම වෙනස් කිරීම සඳහා ගිණුම් ගත කළ යුතුය. ගිවිසුම වෙනස් කිරීම නිසා ගණුදෙනු මිළ මත ඇති සහ ඉටු කිරීමේ බැඳීම්වල සම්පූර්ණ සපුරාලීම වෙතට අස්තිත්ත්වයේ ප්‍රගතිය මැනීම, මත බලපෑම, ගිවිසුම වෙනස් කරන දින (එනම් අය භාරයට ගැලපුම් කළ යුත්තේ සමුච්චිත සම්පවන පදනම මත) අය භාරයට ගැළපුමක් ලෙස හඳුනා ගැනේ. (එක්කෝ අය භාරයේ වැඩි වීමක් හෝ අඩුවීමක් ලෙස)

(ඇ) ඉතිරිව ඇති භාණ්ඩ හෝ සේවා අයිතම (අ) සහ (ආ) වල සංයෝජනයක් නම් එවිට, මෙම ඡේදයේ අරමුණු හා සංගතවන අකාරයට වෙනස් කළ ගිවිසුමේ වන ඉටු කිරීමේ බැඳීම් සපුරා නොමැති (අර්ධ වශයෙන් සපුරාලීම් ඇතුලුව) වෙනස් කිරීම් මතවන ප්‍රතිඵල අස්තිත්ත්වය විසින් ගිණුම්ගත කළ යුතු ය.

**ඉටු කිරීමේ බැඳීමේ හඳුනා ගැනීම**

**22. ගිවිසුමක් ආරම්භයේදී ගණුදෙනුකරුවෙක් සමග එළඹුණ ගිවිසුමේ පොරොන්දු වී ඇති භාණ්ඩ හා සේවා අස්තිත්ත්වය විසින් ඇස්තමේන්තු කළ යුතු අතර ගණුදෙනුකරුට පැවරීමට වූ සෑම පොරොන්දුවකටම එක්කෝ ;**

**(අ) එය නිශ්චිතවන භාණ්ඩයක් හෝ සේවාවක් (හෝ භාණ්ඩ හෝ සේවා පොදියක්) ; හෝ**

**(ආ) සැලකිය යුතු අන්දමින් සමානවන සහ ගණුදෙනුකරුවෙකුට එකම රටාවකට පැවරිය හැකි වෙනස් වූ භාණ්ඩ හෝ සේවා පෙළක් (23 ඡේද බලන්න)**

**ඉටු කිරීමේ බැඳීම් ලෙස අස්තිත්ත්වය හඳුනා ගත යුතුය.**

23. පහත සඳහන් නිර්නායක දෙකේම අවශ්‍යතාවයන් ඉටු කරන්නේ නම් ගණුදෙනුකරුවෙකුට එකම රටාවට පැවරිය හැකි නිශ්චිත භාණ්ඩ හෝ සේවා පෙළකි.

(අ) ගණුදෙනුකරුට පැවරීමට අස්තිත්වය පොරොන්දු වූ පෙළ තුළවන සෑම නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් ඉටු කළ යුතු බැඳීම් කාලයක් පුරා සපුරාලීමට 35 වන ඡේදයේ වන නිර්ණායක සපුරාලීම ; සහ

(ආ) පෙළ තුළවන සෑම නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් ගණුදෙනුකරුට පැවරීමට ඉටුකළ යුතු බැඳීම් සම්පූර්ණයෙන් සපුරාලීමේ දෙසට අස්තිත්ත්වයේ ප්‍රගතිය මැනීමට 39-40 ඡේද ප්‍රකාරව එම ක්‍රමයම භාවිතා කරනු ඇත.

**ගණුදෙනුකරු සමඟවන ගිවිසුම්වල පොරොන්දු**

24. ගණුදෙනුකරුවකු සමඟ වන ගිවිසුමකදී, අස්තිත්ත්වය ගණුදෙනුකරුට පැවරීමට පොරොන්දුවන භාණ්ඩ හෝ සේවා සාමාන්‍යයෙන් පැහැදිලිව එහි සඳහන් වේ. කෙසේ වෙතත් ගණුදෙනුකරු සමඟවන ගිවිසුමේ හඳුනාගත් ඉටු කිරීමේ බැඳීම්වල ගිවිසුමේ පැහැදිලිව සඳහන් කර ඇති භාණ්ඩ හෝ සේවාවලට පමණක් සීමා නොවිය හැකිය. මෙයට හේතුවන්නේ ගණුදෙනුකරු සමඟ වන ගිවිසුමක අස්තිත්ත්වයේ චාරිත්‍රානුකූල පළපුරුදු, ප්‍රකාශයට පත් කළ ප්‍රතිපත්ති, හෝ පැහැදිලි සඳහන් කළ ප්‍රකාශන වේ නම් ඒවායින් ව්‍යංගවන එකඟවීම්ද, ගිවිසුමට එළඹෙන අවස්ථාවේ එහි ඇතුළත් විය හැකි අතර එම එකඟවීම් අස්තිත්ත්වය භාණ්ඩයක් හෝ සේවාවක් ගණුදෙනුකරුට පවරනු ඇතැයි ගණුදෙනුකරුගේ වලංගු අපේක්ෂාවක් ඇති කරයි.

25. යම් ක්‍රියාකාරකමකින් ගණුදෙනුකරුවෙකුට භාණ්ඩයක් හෝ සේවාවක් පැවරෙන්නේ නම් මිස හැර ඉටු කළ යුතු බැඳීම් වලට අස්තිත්ත්වයක් විසින් කළ යුතු වන ක්‍රියාකාරකම් භාරගැනීම ඇතුළත් නොවේ.

උදාහරණ වශයෙන් සේවා සපයන්නෙකුට ගිවිසුමක් සූදානම් කිරීමට විවිධ පරිපාලන කාර්යයන් ඉටු කිරීමට අවශ්‍ය විය හැකිය. එම කාර්යය ඉටු කිරීමෙන් ගණුදෙනුකරුට භාණ්ඩයක් හෝ සේවාවක් හුවමාරු කිරීම සිදුනොවේ. ඒ අනුව එම සූදානම් කිරීමේ ක්‍රියාකාරකම් ඉටු කිරීම් බැඳීමක් නොවේ.

**නිශ්චිත භාණ්ඩ හෝ සේවා**

26. ගිවිසුම මත රඳා පවතමින් නිශ්චිත භාණ්ඩ හෝ සේවාවලට පහත දෑ ඇතුළත්විය හැකිය. එහෙත් ඒවාට පමණක් සීමා නොවේ.

(අ) අස්තිත්ත්වයක් විසින් නිපදවන විකුණූ භාණ්ඩ (උදාහරණ වශයෙන් නිෂ්පාදකයකුගේ තොග);

(ආ) අස්තිත්ත්වයන් විසින් මිලට ගත් යළි විකුණන භාණ්ඩ (උදාහරණ වශයෙන් සිල්ලර වෙළෙන්දෙකුගේ වෙළඳ භාණ්ඩ);

(ඇ) අස්තිත්ත්වයක් මිලට ගත් භාණ්ඩ හෝ සේවාවල යළි විකිණීමේ හිමිකම් (උදාහරණ වශයෙන් ආ 34-38 ඡේදවල විස්තර කරන පරිදි ප්‍රධානියා ලෙස ක්‍රියාකරමින් අස්තිත්ත්වයක් නැවත විකුණන ප්‍රවේශ පත්‍ර);

(ඈ) ගණුදෙනුකරුවකුට ගිවිසුමකින් එකඟ වූ කාර්යයක් (කාර්යයන්) ඉටු කිරීම;

(ඉ) භාණ්ඩ හෝ සේවා සැපයීමට සූදානම් කීර්තිමත් සේවයක් සැපයීම (උදාහරණ වශයෙන්, තිබෙන්නේනම් සැපයීමේ පදනම මත විශේෂ ලෙස නියම නොකළ මෘදුකාංග යාවත්කාලීන කිරීම හෝ අවශ්‍යවන විට ගණුදෙනුකරු තීරණය කරන ගණුදෙනුකරුගේ භාවිතය සඳහා ලබාගත හැකි භාණ්ඩ හෝ සේවා තැනීම;

(ඊ) ගණුදෙනුකරුවෙකුට භාණ්ඩයක් හෝ සේවාවක් පැවරීමට වෙනත් පාර්ශවයක් සඳහා, සේවාවන් ලබාදීමට සැලැස්වීම (උදාහරණයක් ලෙස ආ34- ආ38 ඡේදවල විස්තර කර ඇති පරිදි වෙනත් පාර්ශවයක නියෝජිතයකු ලෙස කටයුතු කිරීම);

(උ) අනාගතයේදී ගණුදෙනුකරුවකුට නැවත විකිණිය හැකි හෝ එහි ගණුදෙනුකරුවකුට සැපයිය හැකි භාණ්ඩ හෝ සේවා ලබාදීම සඳහා හිමිකම් ප්‍රදානය (උදාහරණයක් වශයෙන් සිල්ලර වෙළෙන්දෙකුට නිෂ්පාදනයක් විකුණන අස්තිත්ත්වයක්, සිල්ලර වෙළෙන්දාගෙන් නිෂ්පාදන මිලදී ගන්නා පුද්ගලයෙකුට අමතර භාණ්ඩ හෝ සේවා පැවරීමට අස්තිත්ත්වය එකඟවීම);

(ඌ) ගණුදෙනුකරුවෙක් වෙනුවෙන් වත්කමක් නිර්මාණය කිරීම, නිෂ්පාදනය කිරීම හෝ සංවර්ධනය කිරීම;

(එ) බලපත්‍ර ප්‍රදානය කිරීම (ආ 52- ආ 63 ඡේද බලන්න); සහ

(ඒ) අමතර භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට විකල්ප ප්‍රදානය (ආ 39 - ආ 43 ඡේදවල විස්තර කර ඇති පරිදි එම විකල්ප ගණුදෙනුකරුට ප්‍රමාණාත්මක හිමිකම් ලබාදෙන විට)

27. පහත සඳහන් නිර්නායක දෙකේම අවශ්‍යතාවයන් ඉටු වන්නේ නම් එම පොරොන්දු වූ භාණ්ඩය හෝ සේවය නිශ්චිත වේ.

(අ) භාණ්ඩ හෝ සේවාවලින් එක්කෝ එමගින්ම හෝ ගණුදෙනුකරුට පහසුවෙන් ලබාගත හැකි වෙනත් සම්පත් සමඟ එක්ව ගණුදෙනුකරුට ප්‍රයෝජනවත් විය හැකි (එනම් නිශ්චිත පැවැත්මක් තිබිය හැකි භාණ්ඩ හෝ සේවා); සහ

(ආ) ගිවිසුමේ වෙනත් එකඟවීම්වලින් වෙන්ව හඳුනාගත හැකි භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට පැවරීමට අස්තිත්ත්වයේ එකඟවීම් (එනම් ගිවිසුම සම්බන්ධයෙන් ගත්කළ නිශ්චිත භාණ්ඩ හෝ සේවා)

28. භාණ්ඩය හෝ සේවාව භාවිත, පරිභෝජනය, හෝ සුන්බුන් අගයට වඩා වැඩි වටිනාකමකට විකිණිය හැකි නම් හෝ වෙනත් ලෙසකින් ආර්ථික ප්‍රතිලාභ ජනනය වන ආකාරයකට රඳවා තබා ගත හැකිනම්, එනම් භාණ්ඩය 27 (අ) ඡේදය ප්‍රකාරව ගණුදෙනුකරුවෙකුට ප්‍රයෝජනවත් විය හැකි භාණ්ඩයක් හෝ සේවාවකි. ඇතැම් භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් භාණ්ඩයේ හෝ සේවාවේ ප්‍රයෝජනය තුළින්ම තනිවම ලබාගැනීමට ගනුදෙනුකරුවෙකුට හැකිවීමට ඉඩ තිබිය හැකිය.වෙනත් භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුවකට ප්‍රයෝජනවත් වීමට හැකිවන්නේ එම භාණ්ඩය හෝ සේවාව පහසුවෙන් ලබාගත හැකි වෙනත් සම්පත් සමඟ එකඟ බැඳුනහොත් පමණි. පහසුවෙන් ලබාගත හැකි සම්පතක් යනු වෙන්ව විකුණනු ලබන භාණ්ඩ හෝ සේවා (අස්තිත්ත්වය හෝ වෙනත් අස්තිත්ත්ව මගින්) හෝ ගණුදෙනුකරුවෙකු දැනටමත් අස්තිත්ත්වයෙන් ලබාගෙන ඇති සම්පතක්

(ගිවිසුම යටතේ ගණුදෙනුකරුට අස්තිත්ත්වය දනටමත් පවරා තිබිය හැකි භාණ්ඩ හෝ සේවාවන් ඇතුළුව) හෝ වෙනත් ගණුදෙනුවලින් හා සිද්ධිවලින් වන සම්පතකි. භාණ්ඩයකින් හෝ සේවාවකින් එක්කෝ එමගින්ම හෝ වෙනත් පහසුවෙන් ලබාගත හැකි සම්පත් සමග එකට බැඳීමෙන් ගණුදෙනුකරුවකුට ප්‍රයෝජනවත් විය හැකි බවට විවිධ සාධක සාක්ෂි සපයනු ලැබීය හැකිය. උදාහරණයක් ලෙස ඇත්ත වනුයේ භාණ්ඩයක් හෝ සේවාවක් මගින්ම හෝ වෙනත් පහසුවෙන් ලබාගත හැකි සම්පත්වලින් ගණුදෙනුකරුවකුට ප්‍රයෝජනවත් විය හැකි බව භාණ්ඩ හෝ සේවා නිතිපතා විකුණනු ලබන අස්තිත්ත්වය විසින් සඳහන් කරනු ලැබිය හැකිය.

29. ගණුදෙනුකරුවකුට භාණ්ඩ හෝ සේවා පැවරීමට වන අස්තිත්වයේ එකඟවීමත් වෙනම හඳුනාගත හැකිය යන්න (27 (අ)) ඡේදය ප්‍රකාරව) ඉගිකෙරෙන සාධකවලට පහත දැ ඇතුළත් වන අතර, එහෙත් ඒවාට පමණක් සීමා නොවේ.

(අ) ගණුදෙනුකරු විසින් ගිවිසගත් සංයෝජිත කළ නිමවුම නියෝජනය කරන භාණ්ඩ හෝ සේවා පොදියකට ගිවිසුමක් තුළ එකඟ වී ඇති භාණ්ඩ හෝ සේවා වෙනත් භාණ්ඩ හෝ සේවා සමඟ එකට එකතු කිරීමේ සැලකිය යුතු අන්දමේ, සේවයක් අස්තිත්ත්වය නොසපයයි. වෙනත් වචනවලින් නම් ගණුදෙනුකරු පිරිවිතරයේ ඇතුළත්කළ සංයෝජිත නිමවුම නිෂ්පාදනය කර හෝ භාරදීමට අස්තිත්ත්වය භාණ්ඩ හෝ සේවා යෙදවුමක් ලෙස භාවිතා නොකරයි.

(ආ) ගිවිසුමේ පොරොන්දු වී ඇති වෙනත් භාණ්ඩය හෝ සේවාවක් සමග සැලකිය යුතු අන්දමේ වෙනස් කිරීමක් හෝ ගණුදෙනුකරුට වුවමනා පරිදි භාණ්ඩ හෝ සේවා සිදු නොකෙරේ.

(ඇ) ගිවිසුමේ එකඟ වූ වෙනත් භාණ්ඩ හෝ සේවා සමඟ බොහෝ සේ යැපෙන හෝ බොහෝ සේ එකිනෙකට සම්බන්ධ වූ භාණ්ඩ හෝ සේවා නොවීම. උදාහරණයක් වශයෙන් සත්‍යවනුයේ ගිවිසුමේ ඇති වෙනත් භාණ්ඩ හෝ සේවාවන් වලට සැලකිය යුතු අන්දමේ බලපෑමක් නොවන පරිදි භාණ්ඩ හෝ සේවා මිලදී නොගැනීමට ගණුදෙනුකරු තීරණය කළ හැකිවීම, පොරොන්දු වූ එම වෙනත් භාණ්ඩ හෝ සේවාවන් සමග භාණ්ඩ හෝ සේවාව බොහෝ සේ යැපෙන හෝ බොහෝ සේ එකිනෙකට සම්බන්ධ නොවන බව ඇඟවිය හැකිය.

30. පොරොන්දු වූ භාණ්ඩයක් හෝ සේවාවක් නිශ්චිත නොවන්නේ නම්, අස්තිත්ත්වයට නිශ්චිත භාණ්ඩයක් සේවා පොදියක් හඳුනා ගන්නා තුරු එම භාණ්ඩය හෝ සේවාව වෙනත් පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා සමග සංයෝජනය කළ යුතුය. සමහර අවස්ථාවලදී ගිවිසුමක් තුළ වන පොරොන්දු වූ සියලුම භාණ්ඩ හෝ සේවා තනි ඉටු කිරීමේ බැඳීමක් ලෙස සළකා එය අස්තිත්ත්වය ගිණුම් ගත කිරීම ප්‍රතිඵලයක් විය හැකිය.

**ඉටු කිරීමේ බැඳීම් සපුරාලීම**

**31. ගණුදෙනුකරුවෙකුට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාව (එනම් වත්කම) පැවරීම මගින් ඉටු කිරීමේ බැඳීම අස්තිත්වයක් සපුරාලන විට (හෝ මෙන්) අස්තිත්ත්වය අයභාරය හඳුනාගත යුතුය. ගණුදෙනුකරු වත්කමේ පාලනය ලබා ගත්විට (හෝ මෙන්) වත්කම් පැවරීම සිදුවනු ඇත.**

32. 22-30 ඡේද ප්‍රකාරව හඳුනාගත් සෑම ඉටු කිරීමේ බැඳීමක්ම සඳහා කාලයක් පුරා (35 - 37 ඡේද ප්‍රකාරව) සපුරාලන්නේද යන්න හෝ කාලයේ එක්තරා අවස්ථාවක (38 වන ඡේදයට ප්‍රකාරව) ඉටුකිරීම් බැඳීම් සපුරාලන්නේද යන්න ගිවිසුම ආරම්භයේදී අස්තිත්ත්වය විසින් නිර්ණය කළ යුතුය. අස්තිත්ත්වයක් කාලයක් පුරා ඉටු කිරීමේ බැඳීම් සපුරාලන්නේ නැත්නම්, කාලයේ එක්තරා අවස්ථාවක ඉටු කිරීමේ බැඳීම් සපුරාලනු ඇත.

33. ඒවා ලැබ භාවිත කළේ ක්ෂණිකව පමණක් වූයේ වුවද භාණ්ඩ සහ සේවා වත්කම් වේ (බොහෝ සේවා සඳහාවන සිද්ධිවලදී මෙන්) වත්කමක් පාලනය කිරීම ලෙස හැඳින්වෙන්නේ එහි භාවිතය මෙහෙයවීමට ඇති සහ වත්කමෙන් ලැබෙන සියලුම ඉතිරි ප්‍රතිලාභ බොහෝදුරට ලබා ගැනීමට ඇති හැකියාවය. වෙනත් අස්තිත්ත්ව වත්කම භාවිත කිරීම සහ එමගින් ප්‍රතිලාභ ලබා ගැනීමෙන් වැළැක්වීමට ඇති හැකියාවද පාලනයට ඇතුළත් වේ.වත්කමකින් වන ප්‍රතිලාභ වනුයේ පහත දක්වෙන දැ වැනි බොහෝ ක්‍රමවලින් සෘජුව හෝ වක්‍රව අනාගතයේ ලබා ගත හැකි මුදල් ප්‍රවාහ වේ. (ගලාඒම් හෝ ගලායෑම්වල ඉතිරි වීම්);

(අ) භාණ්ඩ නිෂ්පාදනයට හෝ සේවා සැපයීමට වත්කම භාවිතය (පොදු සේවාවන්ද ඇතුළුව) ;

(ආ) වෙනත් වත්කම්වල අගය උසස් කිරීමට වත්කම භාවිතය ;

(ඇ) වගකීම් නිරවුල් කිරීමට හෝ වියදම් අඩු කිරීමට වත්කම භාවිතය ;

(ඈ) වත්කම විකිණීම හෝ හුවමාරු කර ගැනීම ;

(ඉ) ණයක් සඳහා සුරැකුමක් ලෙස වත්කම ඔඩපනය කිරීම ;

(ඊ) වත්කම රඳවා තබා ගැනීම.

34. ගණුදෙනුකරුවකු වත්කමක පාලනය ලබා ගන්නේද යන්න ඇගැයීමේදී අස්තිත්ත්වය විසින් යම් ප්‍රති මිලදී ගැනීමේ එකගවීමක් තිබේදයි සැළකිල්ලට ගත යුතුය. (ආ 64 - ආ 76 ඡේද)

**කාල සීමාවක් පුරා ඉටු කිරීමේ බැඳීම් සපුරාලීම**

35. පහත සඳහන් නිර්ණායකවලින් එකක් ඉටු කරන්නේ නම් කාලයක් පුරා භාණ්ඩයක හෝ සේවාවක පාලනය පවරන අස්තිත්ත්වයක් එම නිසා ඉටු කිරීමේ බැඳීමක් සපුරා සහ කාලය පුරා අයභාරය හඳුනා ගනී.

(අ) අස්තිත්ත්වයේ ඉටු කිරීම්, ඉටුකිරීම් මගින් සැපයෙන ප්‍රතිලාභයේ ප්‍රයෝජනය ගනුදෙනුකරුවෙත ලැබීමත් පරිභෝජනය කිරීමත් එකවර සිදුවේ (ආ3-ආ 4 ඡේදබලන්න).

(ආ) අස්තිත්වයේ ඉටු කිරීමෙන් වත්කම උපද්දවීම හෝ අගය උසස් කිරීමක් වේ. උදාහරණ වශයෙන් නොනිමි වැඩ) අගය උපද්දවූ හෝ උසස් කළවිට වත්කම ගනුදෙනුකරු පාලනය කරයි. (ආ5 ඡේදය බලන්න.)

(ඇ) අස්තිත්වයේ ක්‍රියාකාරකම් වලින් අස්තිත්ත්වයට විකල්ප භාවිතයක් ඇති වත්කම් ඇති නොවන විට (36 ඡේද බලන්න) සහ එම දින දක්වා නිම කළ ඉටු කිරීම සඳහා වන ගෙවීම්වලට අස්තිත්ත්වයට බලාත්මක කළ හැකි අයිතියක් තිබීම.

36. අස්තිත්ත්වයට එම වත්කම උපද්දවීම හෝ අගය උසස් කරන කාලසීමාව තුළදී වෙනත් භාවිතයන් සඳහා එය ක්‍ෂණිකව වත්කම මෙහෙයවීමට එක්කෝ අස්තිත්ත්වයට ගිවිසුම මගින් සීමා කිරීම හෝ වත්කම එහි නිමකළ ස්වරූපයෙන් වන විට එය වෙනත් භාවිතයක් සඳහා ක්‍ෂණිකව වෙනස් කිරීමට ප්‍රායෝගික සිමාවක් වී නම්, අස්තිත්ත්වයේ ඉටු කිරීමෙන් ඇති කරන ලද වත්කමෙන්, අස්තිත්ත්වයට විකල්ප ප්‍රයෝජනයක් නොමැත. වත්කමකින් අස්තිත්ත්වයකට විකල්ප භාවිතයක් තිබේද යන්න තක්සේරු කරනු ලබන්නේ ගිවිසුම ආරම්භයේදීය. ඉටු කිරීම් බැඳීම් සැළකිය යුතු අන්දමින් වෙනස් වන ලෙස ගිවිසුම වෙනස් කිරීම ගිවිසුමට වන පාර්ශ්ව අනුමත කරන්නේ නම් හැර, ගිවිසුම ආරම්භයෙන් පසුව වත්කමක විකල්ප භාවිත තක්සේරු කිරීම අස්තිත්වයක් යාවත් කාලීන නොකළ යුතුය. වත්කමකින් අස්තිත්ත්වයට විකල්ප භාවිතා කිරීමක් තිබේද යන්න තක්සේරු කිරීම සඳහා උපදේශන ආ 6 ආ 8 ඡේද සළසයි.

37. 35 (ඇ) ඡේදය ප්‍රකාරව නිම කළ ඉටු කිරීම් දින දක්වා වන ගෙවීමකට අස්තිත්ත්වයට බලාත්මක කළ හැකි අයිතියක් තිබේද යන්න, අගය කිරීමේදී, අස්තිත්ත්වය විසින් ගිවිසුමේ කොන්දේසි මෙන්ම, ගිවිසුමට ව්‍යවහාරවන යම් නීති සැළකිල්ලට ගත යුතුය. නිම කළ ඉටු කිරීමේ දින දක්වා ගෙවීමකට ඇති හිමිකම ස්ථාවර අගයක් සඳහා වීම අවශ්‍ය නොවේ. කෙසේ වෙතත් ගණුදෙනුකරුගේ වෙනත් පාර්ශ්වයන් විසින් ගිවිසුම අවසන් කළේ එකඟ වූ පරිදි අස්තිත්ත්වය ඉටු කිරීමට අපොහොසත් වීමේ හේතුව නිසා නම් හැර ගිවිසුමේ කාලපරිච්ඡේදය පුරාම සෑම අවස්ථාවකදීම ඉටු කිරීම නිම කළ දින දක්වා අඩු තරමෙන්වත් වූ වටිනාකමෙන් අස්තිත්ත්වය හානි පූර්ණය කිරීමට හිමිකමක් තිබිය යුතුය, ගෙවීමට ඇති හිමිකමේ පැවැත්ම සහ ගෙවීමට තනි අයිතිය බලාත්මක කලහැකි බව සහ අස්තීත්තවයේ ගෙවීමට ඇති හිමිකම ඉටු කිරීමේ නිම කිරීම දක්වා ද අයිතියද යන්න තක්සේරු කිරීම, ආ සඳහා 9 ආ 13 ඡේද උපදේශන සපයයි.

**ඉටු කිරීමේ බැඳීම් කාලයේ එක්තරා අවස්ථාවක සපුරාලීම**

38. 35 - 37 ඡේද ප්‍රකාරව අස්තිත්වයක් ඉටු කිරීමේ බැඳීම් කාලසීමාවක් පුරා සපුරාලන්නේ නොමැති නම්, කාලසීමාවේ එක්තරා අවස්ථාවක ඉටු කිරීමේ බැඳීම් සපුරාලයි. කාලසීමාවේ කුමන අවස්ථාවක එකඟ වූ වත්කමේ පාලනය ගණුදෙනුකරු ලබා ගන්නේ ද සහ අස්තිත්වය ඉටු කිරීමේ බැඳීමක් සපුරාලීම නිර්ණය කිරීමට අස්තිත්ත්වය විසින් 31 - 34 ඡේදවල පාලනය සඳහා වන අවශ්‍යතාවයන් සළකා බැලිය යුතුය. මෙයට අමතරව අස්තිත්ත්වය විසින් පාලනය පැවරීමේ දර්ශක සලකා බැලිය යුතුය. පහත දැ දර්ශකවලට ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ.

(අ) වත්කම සඳහා ගෙවීමට අස්තිත්ත්වයට විද්‍යමාන හිමිකමක් තිබීම - ගණුදෙනුකරුට වත්කමක් සඳහා දැනටමත් වත්කම සඳහා ගෙවීමට බැඳී ඇති නම්, එවිට එය ගණුදෙනුකරු එය භාවිතය මෙහෙයවීමේ හැකියාව ලබාගත් බව සහ වත්කම හුවමාරුවෙන් සියලු ඉතිරි ප්‍රතිලාභ බොහෝ දුරට ලබාගෙන ඇති බව ඇඟවිය හැකිය.

(ආ) ගණුදෙනුකරුට වත්කමට නිත්‍යානුකූල හිමිකමක් තිබේ - එය භාවිත කිරීම මෙහෙයවීම හැකියාව ඇත්තේ ගිවිසුමේ කුමන පර්ශ්වයටද සහ වත්කමින් වන සියලු ඉතිරි ප්‍රතිලාභ බොහෝ දුරට ලබා ගැනීම හෝ එම ප්‍රතිලාභ සඳහා

වෙනත් අස්තිත්ත්වයකට ප්‍රවේශය සීමා කිරීමට,නිත්‍යානුකූල හිමිකමකින් ඇඟවිය හැකිය. ඒ අනුව වත්කමක නිත්‍යානුකූල අයිතිය පැවරීමෙන් වත්කමේ පාලනය ගණුදෙනුකරු ලබාගත් බව ඇඟවේ. ගණුදෙනුකරුවෙකු ගෙවීමට අපොහොසත්වීමට හානිපූරක සුරක්‍ෂණයක් වශයෙන් අස්තිත්ත්වයට හුදු නෛතික හිමිකම රදවාගන්නේ නම්, අස්තිත්ත්වයේ එම හිමිකම් ගණුදෙනුකරුවෙක් වත්කමේ පාලනය ලබා ගැනීමෙන් වළක්වාලනු නොලැබේ.

(ඇ) වත්කමක භෞතික භුක්තිය අස්තිත්ත්වය පැවරීම - වත්කමක ගණුදෙනුකරුගේ භෞතික භුක්තියෙන් ගණුදෙනුකරුට එය භාවිත කිරිම මෙහෙයවීමේ හැකියාව ඇති බව, සියලු ඉතිරි ප්‍රතිලාභ බොහෝ දුරට ලබා ගැනීම හෝ එම ප්‍රතිලාභ සඳහා වෙනත් අස්තිත්ත්වයකට ප්‍රවේශය සීමා කිරීමට ගණුදෙනුකරුට ඇති හැකියාව ඉඟිකළ හැකිය. කෙසේ වෙතත් වත්කමක භෞතික භුක්තිය සමඟ වත්කමේ පාලනය එක වේලාවට සිදු නොවේ. උදාහරණ වශයෙන් සමහර ප්‍රතිමිලදී ගැණුම් එකඟවීම්වල සහ සමහර නියෝජන එකඟවීම්වලදී අස්තිත්ත්වය පාලනය කරන වත්කමක භෞතික භුක්තිය ගණුදෙනුකරුට හෝ නියෝජ්‍යයාට තිබිය හැකිය. මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන්, සමහර බිල්කර සහ රඳවා ගැනීමේ එකඟවීම් වලදී ගණුදෙනුකරු පාලනය කරන වත්කමක භෞතික භුක්තිය අස්තිත්ත්වයට තිබිය හැකිය. ප්‍රතිමිලදී ගැනීමේ එකඟවීම්, නියෝජන එකඟවීම් සහ බිල්කර සහ රඳවා ගැනීමේ එකඟවීම් ගිණුම්කරණය සඳහා වන උපදේශන පිළිවෙළින් ආ 64 - ආ 76, ආ 77 - ආ 78 සහ ආ 79 - ආ 82 ඡේදවල දක්වා ඇත.

(ඈ) වත්කමේ අයිතියේ සැළකිය යුතු අන්දමේ අවදානම් සහ ප්‍රතිලාභ ගණුදෙනුකරුට තිබීම, වත්කමේ අයිතියෙන් සැළකිය යුතු අන්දමේ අවදානම් සහ ප්‍රතිලාභ ගණුදෙනුකරුට පැවරීමෙන් වත්කම භාවිත කිරීම මෙහෙයවීම් හැකියාව ගණුදෙනුකරු ලබාගෙන ඇති බව, සහ වත්කමෙන් සියලු ඉතිරි ප්‍රතිලාභ බොහෝ දුරට ලබාගෙන ඇති බව ඇඟවිය හැකිය. කෙසේ වෙතත් එකඟ වූ වත්කමක හිමිකමේ අවදානම් සහ ප්‍රතිලාභ අගය කරන විටකදී වත්කම පැවරීමකට වන ඉටු කිරීම් බැඳීමට වෙන්වූ අමතර ඉටු කිරීමකින් ඇති විය හැකි යම් අවදානමක් අස්තිත්ත්වය බැහැර කළ යුතුය. උදාහරණ වශයෙන් අස්තිත්ත්වයක් වත්කමක පාලනය ගණුදනුකරුවකුට පැවරුවා විය හැකිය. එහෙත් පැවරූ වත්කමට සම්බන්ධිත නඩත්තු සේවා සැපයීමට වන අමතර ඉටු කිරීමේ බැඳීම තවමත් සපුරා නැති විය හැකිය.

(ඉ) ගණුදෙනුකරු වත්කම භාර ගෙන ඇත - ගණුදෙනුකරු විසින් වත්කම භාර ගැනීමෙන් එය භාවිත කිරීම මෙහෙයවීමේ හැකියාව ගණුදෙනුකරු ලබා ගෙන ඇති බව සහ වත්කමේ සියලු ඉතිරි ප්‍රතිලාභ බොහෝ දුරට ලබගෙන ඇති බව ඇඟවිය හැකිය. වත්කමක පාලනය පැවරුනේ කුමන අවස්ථාවකද යන්න මත වන ගිවිසුම ගත ගණුදෙනුකරුවකුගේ පිළිගැනීම නිසාවන බලපෑම අගය කිරීමට අස්තිත්ත්වය ආ83 - ආ86 ඡේදවල උපදේශන සලකා බැලිය යුතුය.

**ඉටු කිරීම් බැඳීමක් සම්පූර්ණයෙන් සපුරාලීම දෙසට ප්‍රගතිය මැනීම**

39. 35 -37 ඡේද ප්‍රකාරව කාලයක් පුරා සපුරාලන ලද සෑම ඉටු කිරීමේ බැඳීමක් සඳහා එම ඉටු කිරීම් බැඳීම් සම්පූර්ණ සපුරාලන දෙසට ප්‍රගතිය මැනීම මගින් අස්තිත්ත්වය විසින් කාලය පුරා අයභාරය හඳුනාගත යුතුය. ප්‍රගතිය මනින විට එහි අරමුණු වන්නේ ගණුදෙනුකරුවෙකුට එකඟ වූ භාණ්ඩ හෝ සේවා සඳහා පාලනය පැවරීමේදී අස්තිත්ත්වය ඉටු කිරීම නිරූපණය කිරීමය. (එනම් අස්තිත්ත්වයේ ඉටු කිරීම් බැඳීම සපුරාලීමය)

40. කාලසීමාවක් පුරා සපුරාලන ලද සෑම ඉටු කිරීමේ වගකීමක් සඳහා ප්‍රගතිය මැනීමේදී තනි ක්‍රමයක් අස්තිත්ත්වයක් ව්‍යවහාර කළ යුතු සහ සමාන ඉටු කිරීම් බැඳීම එක සමාන තත්ත්වයන්හි එම ක්‍රමය සංගතව අස්තිත්ත්වය ව්‍යවහාර කළ යුතුය. කාල සීමාවක් පුරා ඉටු කිරීම් වගකීමක සම්පූර්ණ සපුරාලීම දෙසට එහි ප්‍රගතිය, සෑම වාර්තා කරන ලද ප්‍රගතිය කාලපරිච්ඡේදය අවසානයේ අස්තිත්ත්වය විසින් යළි මැනිය යුතුය.

*ප්‍රගතිය මැනීම සඳහා ඇති ක්‍රම*

41. ප්‍රගතිය මැනීමේ උචිත ක්‍රමවලට යෙදවුම් ක්‍රම සහ නිමවුම් ක්‍රම ඇතුළත් වේ. ඉටු කිරීමේ වගකීමක් සම්පූර්ණ සපුරාලීම දෙසට අස්තිත්ත්වයේ ප්‍රගතිය මැනීමට නිමවුම් ක්‍රම සහ යෙදවුම් ක්‍රම සඳහා වන උපදේශන ආ 14 - ආ 19 ඡේද ලබාදෙයි. ප්‍රගතිය මැනීමක් සඳහා වන උචිත ක්‍රමය තීර්ණය කිරීමේදී, ගණුදෙනුකරුට පැවරීමට අස්තිත්ත්වය පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවල ස්වභාවය අස්තිත්ත්වය විසින් සළකා බැලිය යුතුය.

42. ප්‍රගතිය මැනීමට ක්‍රමයක් ව්‍යවහාර කරන විට, අස්තිත්ත්වය ගණුදෙනුකරුවකට පාලනය පවරනු නොලබන යම් භාණ්ඩ හෝ සේවා ප්‍රගතිය මැනීමෙන් අස්තිත්ත්වය බැහැර කළ යුතුය. එයට ප්‍රතිවිරුද්ධව ඉටු කිරීමේ බැඳීම සපුරාලන විට අස්තීත්ත්වය ගණුදෙනුකරුවන්ට පාලනය පවරනු ලබන යම් භාණ්ඩ හෝ සේවා ප්‍රගතිය මැනීමේද අස්තිත්ත්වය ඇතුළත් කළ යුතුය.

43. කාලයක් පුරා තත්ත්වයන් වෙනස් වන විට, ඉටු කිරීමේ බැඳීම්වල ප්‍රතිඵලයට යම් වෙනසක් පිළිබිඹු වීමට එහි ප්‍රගතිය මැනීම අස්තිත්ත්වය යාවත්කාලීන කළ යුතුය. අස්තිත්වයේ ප්‍රගතිය මැනීමේ එවන් වෙනස්කම් LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි* ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්වීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

*සාධාරණව ප්‍රගතිය මැනීම*

44. ඉටු කිරීමේ බැඳීමක් සම්පූර්ණයෙන් සපුරාලීම දෙසට එහි ප්‍රගතිය සාධාරණ ලෙස අස්තිත්ත්වයට මැනිය හැක්කේ නම් පමණක්, කාලය පුරා සපුරාලන ලද ඉටු කිරීම් බැඳීමක් සඳහා අයභාරය අස්තිත්වය හඳුනාගත යුතුය. ප්‍රගතිය මැනීමේ උචිත ක්‍රමයක් ව්‍යවහාර කිරීමට අවශ්‍ය කරන විශ්වසනීය තොරතුරු එයට නොමැති නම්, ඉටු කිරීමේ බැඳීමක් සම්පූර්ණයෙන් සපුරාලීම දෙසට එහි ප්‍රගතිය සාධාරණ ලෙස මැනීමට අස්තිත්ත්වයට නොහැකිවනු ඇත.

45. සමහර තත්ත්වයන්හිදී (උදාහරණ වශයෙන් ගිවිසුමේ මුල් පියවරවල් තුළදී) ඉටු කිරීමේ බැඳීමක ප්‍රතිඵලය සතුටුදායක ලෙස මැනීමට අස්තිත්ත්වයකට නොහැකි වීමට පුළුවන. එහෙත් ඉටු කිරීම බැඳීම සපුරාලීමේදී දැරූ පිරිවැය අය කර ගැනීමට අස්තිත්ත්වය අපේක්ෂා කෙරේ. එවැනි තත්ත්වයන්හිදී, ඉටු කිරීම් බැඳීම්වල ප්‍රතිඵල සාධාරණ ලෙස මැනීමට හැකිවන තෙක් අයභාරය ලෙස අස්තිත්ත්වය ලෙස හඳුනාගත යුත්තේ පිරිවැය දැරූ ප්‍රමාණයට පමණි.

## මැනීම

**46. ඉටු කිරීමේ බැඳීමක් සපුරාලන විට (හෝ ලෙස) අස්තිත්ත්වය අයභාරය ලෙස හඳුනාගත යුත්තේ එම ඉටු කිරීමේ බැඳීමට වෙන් කරන ලද ගණුදෙනු මිලේ වටිනාකමටය.(එයට 56-58 ඡේද ප්‍රකාරව තදින්සීමා කෙරූ විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තු බැහැර කිරීමෙන්)**

### ගණුදෙනු මිල නිර්ණය කිරීම

**47. ගණුදෙනු මිල නියම කිරීමට අස්තිත්ත්වයක් ගිවිසුමේ කොන්දේසි සහ එහි චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදු සැලකිල්ලට ගත යුතුය. ගණුදෙනු මිල වනුයේ තුන්වන පාර්ශව වෙනුවෙන් එකතු කරගත් වටිනාකම් හැර (උදාහරණ වශයෙන් සමහර විකුණුම් බදු) ගණුදෙනුකරුවකුට එකඟ වූ භාණ්ඩ හෝ සේවා පැවරීම සඳහා හුවමාරු කර ගැනීම තුළින් අස්තිත්ත්වය හිමිකම් ලැබීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාවේ වටිනාකමය. ගණුදෙනුකරුවකු සමඟවන ගිවිසුමක් තුළ එකඟ වූ ප්‍රතිෂ්ඨාවට ස්ථාවර වටිනාකම්, විචල්‍ය වටිනාකම් හෝ දෙකම ඇතුළත් විය හැකිය.**

48. ස්වභාවය, කාල සැලැස්ම සහ ගණුදෙනුකරුවකු විසින් එකඟ වූ ප්‍රතිෂ්ඨාවේ ගණුදෙනු මිල ඇස්මේන්තුවට බලපායි. ගණුදෙනු මිල නිර්ණය කිරීමේදී අස්තිත්ත්වයක් විසින් පහත දැක්වෙන සියල්ලේම ප්‍රතිඵල සළකා බැලිය යුතුය.

(අ) විචල්‍ය ප්‍රතිෂ්ඨාව (50 - 55 සහ 59 වන ඡේද බලන්න)

(ආ) විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ බල කෙරුනු ඇස්තමේන්තු (56 - 58 ඡේද බලන්න)

(ඇ) ගිවිසුමේ සැලකිය යුතු අන්දමේ මූල්‍ය සංරචකයක පැවැත්ම (60-65 ඡේද බලන්න)

(ඈ) මූල්‍ය නොවන ප්‍රතිෂ්ඨා (66 - 69 ඡේද බලන්න); සහ

(ඉ) ගණුදෙනුකරුවකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව (70-72 ඡේද බලන්න)

49. ගණුදෙනු මිල නිර්ණය කිරීමේ අරමුණ සඳහා පවතින ගිවිසුම ප්‍රකාරව එකඟ වූ භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට පවරනු ලබන බව සහ ගිවිසුම අවලංගු කිරීම, අළුත් නොකිරීම හෝ වෙනස් කිරීම සිදු නොකරන ලබන බවත් අස්තිත්ත්වය විසින් උපකල්පනය කළ යුතුය.

**විචල්‍ය ප්‍රතිෂ්ඨාව**

50. ගිවිසුමක එකඟවූ ප්‍රතිෂ්ඨාවක විචල්‍ය වටිනාකමක් ඇතුළත් නම්, ගණුදෙනුකරුට එකඟ වූ භාණ්ඩ හෝ සේවා පැවරුම සඳහා හුවමාරුවක් වන අස්තිත්වය හිමිකම් ලැබිය හැකි ප්‍රතිෂ්ඨාවේ වටිනාකම අස්තිත්ත්වය විසින් ඇස්තමේන්තු කළ යුතුය.

51. වට්ටම්, ප්‍රතිදාන, ආපසු ගෙවීම්, බැර කිරීම්, මිල සහන, දිරිදීමනා, කාර්ය සාධන ප්‍රසාද දීමනා, දඩ වෙනත් ඒ හා සමාන අයිතම නිසා ප්‍රතිෂ්ඨාවේ වටිනාකම වෙනස් වීමට භාජනය විය හැකිය. අනාගත සිද්ධියක් සිදුවීම හෝ සිදු නොවීම මත අස්තිත්ත්වයේ ප්‍රතිෂ්ඨාවට හිමිකම අසම්භාව්‍ය නම්, එකඟ වූ ප්‍රතිෂ්ඨාව වෙනස් වීමට භාජනය විය හැකිය. උදාහරණ වශයෙන් නිෂ්පාදනයක් එක්කෝ ආපසු එවීමේ අයිතියක් ඇතුව හෝ පැහැදිලිව සඳහන් කර, ඇති වැදගත් අවස්ථාවක් මුදුන්පත් කර ගැනීම මත කාර්ය සාධන ප්‍රසාද දීමනාවක් ලෙස එකඟ වී ඇතිව විකුණා ඇති විටක ප්‍රතිෂ්ඨාවේ වටිනාකම විචල්‍ය විය හැකිය.

52. ගණුදෙනුකරුවෙක් එකඟ වූ විචල්‍යතාවයට සම්බන්ධිතව ප්‍රතිෂ්ඨාව ගිවිසුමේ පැහැදිලිව සඳහන් විය හැකිය. ගිවිසුමේ කොන්දේසිවලට අමතරව, පහත සඳහන් තත්ත්වයන් දෙකෙන් එකක් හෝ පවතී නම්, එකඟ වූ ප්‍රතිෂ්ඨාව විචල්‍ය වේ.

(අ) ගිවිසුමේ සඳහන් කර ඇති මිලට වඩා අඩු වටිනාකමක ප්‍රතිෂ්ඨාවක් අස්තිත්ත්වය භාරගනු ඇතැයි, අස්තිත්ත්වයේ චාරිත්‍රානුකූල ව්‍යාපාරිකවල පළපුරුදුවලින්, ප්‍රකාශයට පත් කළ ප්‍රතිපත්ති හෝ පැහැදිලිව සඳහන් කළ ප්‍රකාශනයන්ගෙන් පැන නැගුන වලංගු අපේක්ෂාවක් ගණුදෙනුකරුට තිබීම. එනම් අස්තිත්ත්වයට මිල සහනයක් පිරිනමනු ඇතැයි අපේක්ෂා කිරීම. අධිකරණ බල ප්‍රදේශය, කර්මාන්තය, හෝ ගණුදෙනුකරුගේ රඳාපැවැත්ම මත මෙම පිරිනැමීම වට්ටමක්, ප්‍රතිදානයක්, ආපසු ගෙවීමක් හෝ බැර කිරීමක් ලෙස හැඳින්විය හැකිය.

(ආ) ගණුදෙනුකරු සමඟ ගිවිසුමකට එළඹෙන විට ගණුදෙනුකරුට මිල සහනයක් පිරිනැමීම අස්තිත්ත්වයේ අභිප්‍රාය බව වෙනත් කරුණු සහ තත්ත්වයන් ඉඟි කෙරේ.

53. අස්තිත්වය හිමිකම් කියනු ලැබිය හැකි ප්‍රතිෂ්ඨාවේ වටිනාකම් වඩාත් හොඳින් පුරෝකථනය කිරීමට, අස්තිත්ත්වය අපේක්ෂා කරන්නේ කුමන ක්‍රමය මත රඳා පවතිමින්ද යන්න පහත සඳහන් ක්‍රමවලින් එකක් භාවිත කර විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ඇස්තමේන්තු කළ යුතුය.

(අ) අපේක්ෂිත අගය - අපේක්ෂිත අගය යනු ප්‍රතිෂ්ඨා වටිනාකම් පරාසයක් තුළ වන සම්භාව්‍යතා හරිත වටිනාකම්වල එකතුවයි. එක හා සමාන ගතිලක්ෂණ ඇති විශාල සංඛ්‍යාවක ගිවිසුම් අස්තිත්ත්වයකට ඇත්නම්, විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකම උචිත ඇස්තමේන්තුව අපේක්ෂිත අගය විය හැකිය.

(ආ) වැඩියෙන්ම විය හැකි වටිනාකම - වැඩියෙන්ම විය හැකි වටිනාකම වනුයේ විය හැකි ප්‍රතිෂ්ඨා වටිනාකම් පරාසයක තනි වඩාත්ම විය හැකි වටිනාකම්ය (එනම් ගිවිසුමක තනි වඩාත්මක විය හැකි ප්‍රතිඵලයයි) ගිවිසුමක විය හැකි ප්‍රතිඵල දෙකක් පමණක් ඇති විට වැඩියෙන්ම විය හැකි වටිනාකම විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකමේ උචිත ඇස්තමේන්තුවක් විය හැකිය. (උදාහරණ ලෙස අස්තිත්ත්වයක් එක්කෝ ඉටු කිරීමේ ප්‍රසාද මුදල් මුදුන් පමුණුවා ගනී හෝ එසේ නොකරයි).

54. අස්තිත්ත්වය හිමිකම් කියනු ලබන විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකම මත අනියතාවේ බලපෑම ඇස්තමේන්තු කිරීමේදී, අස්තිත්ත්වය විසින් ගිවිසුම පුරාවටම සංගතව එක ක්‍රමයක් ව්‍යවහාර කළ යුතුය. මෙයට අමතරව අස්තිත්ත්වයට සාධාරණව ලබාගත හැකි සියලුම තොරතුරු (ඓතිහාසික, ප්‍රවර්තන සහ පුරෝකථන) සැලකිල්ලට ගත යුතු සහ විය හැකි ප්‍රතිෂ්ඨා වටිනාකම්වල සාධාරණ සංඛ්‍යාවක් හඳුනාගත යුතුය. විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ඇස්තමේන්තු කිරීමට අස්තිත්ත්වය භාවිත කරන තොරතුරු, අස්තිත්ත්වයේ කළමනාකාරීත්වය ලංසු සහ යෝජනා ක්‍රියාවලිය තුළදී සහ එකඟ වූ භාණ්ඩ හෝ සේවා සඳහා මිල ගණන් ස්ථාපනය කිරීමේ භාවිත කරන තොරතුරුවලට සමාන වේ.

*ආපසු ගෙවීමේ වගකීම්*

55. අස්තිත්ත්වයට ගණුදෙනුකරුවෙකුගෙන් ප්‍රතිෂ්ඨාවක් ලැබී එම ප්‍රතිෂ්ඨාවෙන් කොටසක් හෝ සියල්ලම ආපසු ගෙවීමට අස්තිත්ත්වය අපේක්ෂාකරන්නේ නම් අස්තිත්ත්වය ආපසු ගෙවීමේ වගකීමක් හඳුනාගත යුතුය. ආපසු ගෙවීමේ වගකීම් මනිනුයේ අස්තිත්ත්වය හිමිකම් කීමට අපේක්ෂා නොකරන (එනම් ගණුදෙනු මිලේ ඇතුළත් කර නැති වටිනාකම්) ලැබුණ (හෝ ලැබිය යුතු) ප්‍රතිෂ්ඨාවේ

වටිනාකමටය. ආපසු ගෙවීමේ වගකීම (සහ ගණුදෙනු මිලේ අනුරූප වෙනස්වීම සහ ඒ අනුව ගිවිසුම් වගකීම) වාර්තා කරන සෑම කාලපරිච්ඡේදයක් අවසානයේ තත්ත්වයන්ගේ වෙනස්වීම් සඳහා යාවත් කාලීන කළ යුතුය. ආපසු එවීමේ හිමිකමක් සහිත විකුණුමක් සඳහා ආපසු එවීමේ වගකීම ගිණුම්ගත කිරීම සඳහා ආ20 - ආ27 ඡේදවල උපදේශන අස්තිත්ත්වයක් ව්‍යවහාර කළ යුතුය.

*විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ තදින් සීමාකර ඇති ඇස්තමේන්තු :*

56. විචල්‍ය ප්‍රතිෂ්ඨාව ආශ්‍රිත අඩමානබව පසුව විසඳූවිට, හඳුනාගත් සමුච්චිත අයහාරයේ වටිනාකම් සැලකිය යුතු අන්දමින් ප්‍රතිවර්ත්‍ය කිරීමක් සිදු නොවන බව බොහෝදුරට අපේක්‍ෂා කළ හැකි වටිනාකමකට පමණක්, 53 ඡේදය ප්‍රකාරව ඇස්තමේන්තු කළ විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ සමහර හෝ සියළු වටිනාකම් අස්තිත්ත්වය විසින් ගණුදෙනු මිලේ ඇතුළත් කළ යුතුය.

57. විචල්‍ය ප්‍රතිෂ්ඨාවට සම්බන්ධිත අඩමානබව පසුව විසඳූ විට, හඳුනාගත් සමුච්චිත අයහාරයේ වටිනාකමේ සැලකිය යුතු අන්දමේ ප්‍රතිවර්ත්‍ය කිරීමක් සිදු නොවීම බොහෝදුරට අපේක්‍ෂා කළ හැකිද යන්න තක්සේරු කිරීමේදී, අස්තිත්ත්වය විසින් අයහාරය ප්‍රතිවර්ත්‍ය කිරීමේ හැකියාව සහ විශාලත්වය යන කරුණු දෙකම සළකා බැලිය යුතුය. අයහාරය ප්‍රතිවර්ත්‍ය කිරීමේ හැකියාව හෝ විශාලත්වය වැඩි කළ හැකි සාධක වලට පහත දෑ වලින් ඕනෑම එකක් ඇතුළත් විය හැක, එහෙත් ඒවාට පමණක් සීමා නොවේ.

(අ) ප්‍රතිෂ්ඨාවේ වටිනාකම අස්තිත්වයේ බලපෑමෙන් බාහිර සාධකවලට බොහෝ ලෙසට නැඹුරුවීම, එම සාධක වලට වෙළඳපොලේ ඉක්මණින් වෙනස් වීම, තුන්වන පාර්ශවවල තීන්දු සහ ක්‍රියාකාරකම්, දේශගුණික තත්ත්වයන්, සහ එකඟ වූ භාණ්ඩ හෝ සේවාවල යල් පැනීමේ විශාල අවදානම ඇතුළත් විය හැකිය.

(ආ) ප්‍රතිෂ්ඨාවේ වටිනාකම පිළිබඳ අඩමානබව දිගු කාලයක් ගත වනතුරු විසඳෙණු ඇතැයි අපේක්ෂා නොකිරීම.

(ඇ) සමාන අන්දමේ වර්ගවල ගිවිසුම් සඳහා අස්තිත්ත්වයේ පළපුරුද්ද (හෝ වෙනත් සාක්‍ෂි) සීමිතවීම හෝ එම පළපුරුද්දට (හෝ වෙනස් සාක්‍ෂි) අනාවැකි පළකිරීමේ සීමිත වටිනාකම.

(ඈ) එක්කෝ පුළුල් පරාසයක මිල සහනයන් පිරිනැමීම හෝ සමාන ගිවිසුම් සඳහා සමාන තත්ත්වයන්හි දී ගෙවීම් කිරීමේ රීති සහ කොන්දේසි වෙනස් කිරීමේ පුරුද්දක් අස්තිත්වයට තිබීම.

(ඉ) ගිවිසුමකට විශාල සංඛ්‍යාවක් සහ පුළුල් පරාසයක විය හැකි ප්‍රතිෂ්ඨාවේ වටිනාකම් තිබීම.

58. බුද්ධිමය දේපළක බලපත්‍රයක් සඳහා හුවමාරුවක් ලෙස එකඟ වූ විකුණුම්-පදනම හෝ භාවිත පදනම ස්වරූපයේ පුරස්කාරයක ප්‍රතිෂ්ඨාව ගිණුම්ගත කිරීමට ආ63 ඡේදය අස්තිත්ත්වයන් ව්‍යවහාර කළ යුතුය.

*විචල්‍ය ප්‍රතිෂ්ඨාව යළි තක්සේරු කිරීම :*

59. සෑම වාර්තා කරන කාලපරිච්ඡේදයක් අවසානයේ දී වාර්තා කරන ලද කාලපරිච්ඡේදය අවසන පැවති තත්ත්වයන් සහ වාර්තා කරන ලද කාලය තුළ තත්ත්වයන්ගේ වෙනස්වීම් විශ්වසනීය ලෙස නියෝජනය කිරීම ඇස්තමේන්තු කළ ගණුදෙනු මිල (විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තුව තදින් සීමාකරනු ලැබුවේද යන්න පිළිබඳ එහි තක්සේරුව යාවත් කාලීන කිරීම ඇතුළුව) අස්තිත්ත්වය යාවත්කාලීන කළ යුතුය. ගණුදෙනු මිලේ වෙනස්වීම් සඳහා අස්තිත්ත්වය 87 - 90 ඡේද පරිදි ගිණුම්ගත කළ යුතුය.

**සැළකිය යුතු අන්දමේ මුල්‍යකරණ සංරචකයක් ගිවිසුමේ තිබීම**

60. ගණුදෙනුකරුට භාණ්ඩ හෝ සේවා පැවරීමේ දී මුල්‍යනය කිරීමේ ප්‍රතිලාභ ගණුදෙනුකරුට හෝ අස්තිත්ත්වයට සැළසෙන ගිවිසුමකට (පැහැදිලි හෝ ව්‍යංගව) වන පාර්ශව විසින් ගෙවීම් කිරීම්වලට කාල යෙදුමක් සඳහා එකඟ වී ඇත්නම් එකඟ වූ ප්‍රතිෂ්ඨාවේ වටිනාකම නිර්ණය කිරීමේදී මුදලේ කාල වටිනාකම සඳහා වන බලපෑම් සඳහා ගණුදෙනු මිල අස්තිත්ත්වය ගැළපිය යුතුය. එවැනි තත්ත්වයන්හි දී ගිවිසුමේ සැළකිය යුතු අන්දමේ මුල්‍යන සංරචකයන් අන්තර්ගත වේ. මුල්‍යනය කිරීමේ එකඟවීම් පැහැදිලිව ගිවිසුමේ සඳහන් කර තිබේ ද හෝ ගිවිසුමට වන පාර්ශව එකඟ වූ ගෙවීම් කොන්දේසිවලින් ව්‍යංග වන්නේද යන්න නොසළකා, සැළකිය යුතු අන්දමේ මුල්‍යන සංරචකයක් පැවතිය හැකිය.

61. සැළකිය යුතු අන්දමේ මුල්‍යන සංරචකයන් සඳහා එකඟ වූ ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ගළපන අවස්ථාවේ අරමුණ වන්නේ, ගණුදෙනුකරුට එම භාණ්ඩ හෝ සේවා පවරන විට (හෝ ලෙස) ඒවා සඳහා ගණුදෙනුකරු මුදල් (අත්පිට විකුණුම් මිල)

ගෙවූයේ නම්, එකඟ වූ භාණ්ඩ හෝ සේවා සඳහා ගණුදෙනුකරු ගෙවිය යුතු වූ මිලෙන් පිළිඹිබුවන වට්නාකමක් අයභාරය ලෙස අස්තිත්ත්වය හඳුනා ගැනීම. ගිවිසුමකට මුල්‍යාන සංරචකයන් අන්තර්ගත ද සහ එම මුල්‍යාන සංරචකය ගිවිසුමට වැදගත්ද යන්න තක්සේරු කිරීමේදී අස්තිත්ත්වය විසින් පහත සඳහන් කරුණු දෙකම ඇතුළුව සියළු අදාළ කරුණු සහ තත්ත්වයන් සළකා බැලිය යුතුය.

(අ) එකඟ වූ භාණ්ඩ හෝ සේවාවල එකඟ වූ ප්‍රතිෂ්ඨාව සහ අත්පිට විකුණුම් මිල අතර වට්නාකමේ යම් වෙනසක් වේ නම්; සහ

(ආ) පහත සඳහන් කරුණු දෙකෙහිම එකතු කළ බලපෑම,

(i) ගණුදෙනුකරුට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා අස්තිත්ත්වය පවරන අවස්ථාව සහ එම භාණ්ඩ හෝ සේවා සඳහා ගණුදෙනුකරු ගෙවන අවස්ථාව අතර අපේක්ෂිත කාලසීමාවේ දිග (කාලය) ; සහ

(ii) අදාළ වෙළඳපොළේ පවතින පොලී අනුපාතික.

62. 61 වන ඡේදයේ තක්සේරු කිරීම එසේ වුවද, පහත සඳහන් සාධක වලින් ඕනෑම එකක් පවතී නම් ගණුදෙනුකරුවෙක් සමඟවන ගිවිසුමක දී සැළකිය යුතු අන්දමේ මුල්‍ය සංරචකයන් තිබිය නොහැක ;

(අ) භාණ්ඩ හෝ සේවා සඳහා ගණුදෙනුකරු කලින් මුදල් ගෙවා තිබීම හා එම භාණ්ඩ හෝ සේවා පැවරීමේ කාල නිර්ණය ගණුදෙනුකරුගේ අභිමතය අනුව වීම.

(ආ) ගණුදෙනුකරු එකඟ වූ ප්‍රතිෂ්ඨාවෙන් සැළකිය යුතු අන්දමේ වට්නාකමක් විචල්‍ය හා එම ප්‍රතිෂ්ඨාවේ වට්නාකම හෝ කල් යෙදුම ගණුදෙනුකරුගේ හෝ අස්තිත්ත්වයේ සැළකිය යුතු අන්දමේ පාලනයක් තුළ නොමැති අනාගත සිද්ධියක් සිදුවීම හෝ නොසිදුවීමේ පදනම මත වෙනස්වීම (උදාහරණ ප්‍රතිෂ්ඨාව විකුණුම් - පදනම් පුරස්කාරයක් නම්)

(ඇ) භාණ්ඩ හෝ සේවාවල (61 ඡේදයේ විස්තරකර ඇති පරිදි) එකඟ වූ ප්‍රතිෂ්ඨාව සහ අත්පිට විකුණුම් මිල අතර වෙනස පැන නගින්නේ, එක්කෝ ගණුදෙනුකරුට හෝ අස්තිත්ත්වයට මුල්‍ය සැපයීමට වන හේතුවලට හැර වෙනත් හේතු නිසාද සහ එම වට්නාකම් අතර වෙනස සඳහාවන හේතුවට සමානුපාතිකද. උදාහරණ වශයෙන් ගිවිසුම යටතේ එහි සමහර හෝ සියලු බැඳීම් ප්‍රමාණවත් ලෙස සම්පූර්ණ කිරීමේ අනෙක් පාර්ශවයේ නොහැකියාවෙන් ගණුදෙනුකරු හෝ අස්තිත්ත්වයට ආරක්ෂාවක් සමඟ ගෙවීමේ කොන්දේසි සළසා දියහැකිය.

63. ගිවිසුම ආරම්භයේ දී ගණුදෙනුකරුවකුට එකඟ වූ භාණ්ඩ හෝ සේවා අස්තිත්ත්වය පවරන අවස්ථාව සහ එම භාණ්ඩ හෝ සේවා සඳහා ගණුදෙනුකරු ගෙවීම් කරන අවස්ථාව අතර කාල පරිච්ඡේදය වසරක් හෝ ඊට අඩුවනු ඇතැයි අස්තිත්ත්වය අපේක්ෂා කරන්නේ නම් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස සැළකිය යුතු අන්දමේ මුල්‍යාන සංරචකයක බලපෑම් සඳහා එකඟ වූ ප්‍රතිෂ්ඨාවේ වට්නාකම සඳහා අස්තිත්ත්වය ගැලපීම අවශ්‍ය නොවේ.

64. සැලකිය යුතු අන්දමේ මුල්‍යාන සංරචකයක් සඳහා එකඟ වූ ප්‍රතිෂ්ඨාවේ වට්නාකමට ගැළපුම් කරන විට, 61 වන ඡේදයේ පරමාර්ථය ඉටුකර ගැනීමට ගිවිසුම ආරම්භයේ දී අස්තිත්ත්වය සහ එහි ගණුදෙනුකරු අතර, වෙනම වූ මුල්‍යාන ගණුදෙනුවකදී පිළිබිඹුවිය හැකි වට්ටම් අනුපාතිකය අස්තිත්ත්වය භාවිත කළ යුතුය. එම අනුපාතිකය ගිවිසුමෙන් මුල්‍යාන කිරීම ලබන පාර්ශවයේ ණය ගතිලක්ෂණ පිළිබිඹු වියහැකිවා මෙන්ම ගිවිසුමේ වන වත්කම් පැවරීම ඇතුළුව ගණුදෙනුකරු හෝ අස්තිත්ත්වය සළසන ලද යම් අතිරේක ඇපයක් හෝ ඇපයකින් පිළිබිඹු විය හැකිය. ඔවුන් ගණුදෙනුකරුට භාණ්ඩ හෝ සේවා පවරන විට (හෝ වන) ඒ සඳහා ගණුදෙනුකරු මුදලින් ගෙවනු ලබන මිලට එකඟ වූ ප්‍රතිෂ්ඨාවේ නාම මාත්‍ර වට්නාකම වට්ටම් කරන අනුපාතිකය හඳුනා ගැනීම මගින් එම අනුපාතිකය නිර්ණය කිරීමට අස්තිත්ත්වය සමත් විය හැකිය. ගිවිසුම ආරම්භ වීමෙන් පසු පොලී අනුපාතිකවල වෙනස්වීම හෝ වෙනත් තත්ත්වයන් (ගණුදෙනුකරුගේ ණය තක්සේරුව වෙනස්වීම වැනි දෑ) සඳහා අස්තිත්ත්වය විසින් වට්ටම් අනුපාතිකය යාවත් කාලීන කිරීම නොකළ යුතුය.

65. මුල්‍යානය කිරීමේ බලපෑම (පොලී ආදායම සහ පොලී වියදම) ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වල එවැනි අයභාරයෙන් වෙන් කර අස්තිත්ත්වය විසින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ඉදිරිපත් කළ යුතුය. පොලී ආදායම හෝ පොලී වියදම් හඳුනා ගත යුත්තේ ගණුදෙනුකරුවකු සමග වන ගිවිසුමක් ගිණුම්කරණයේ දී හඳුනාගත් ගිවිසුම් වත්කමේ (හෝ ලැබිය යුතු දෑ) හෝ ගිවිසුම් වගකීම මත ප්‍රමාණය දක්වා පමණි.

**මුල්‍ය නොවන ප්‍රතිෂ්ඨාව**

66. ගණුදෙනුකරුවෙකු ප්‍රතිෂ්ඨාව මුදලින් හැර වෙනත් ආකාරයකට එකඟවන විට ගිවිසුම් සඳහා ගණුදෙනු මිල නිර්ණය කිරීමට මුදල් නොවන ප්‍රතිෂ්ඨාව (හෝ මුදල් නොවන ප්‍රතිෂ්ඨාව එකඟවීම) එහි සාධාරණ අගයට අස්තිත්ත්වය මැනිය යුතුය.

67. මුදල් නොවන ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය අස්තිත්ත්වයට සාධාරණ ලෙස ඇස්තමේන්තු කළ නොහැකි නම්, ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවක් ලෙස ගණුදෙනුකරුට (හෝ ගණුදෙනුකරුවන් පන්තියක්ම)එකග වූ භාණ්ඩ හෝ සේවාවල තනි, තනි පදනමේ විකුණුම් මිලට යොමු කිරීම මගින් අස්තිත්ත්වය ප්‍රතිෂ්ඨාව වක්‍රව මැනිය යුතුය.

68. මුදල් නොවන ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය ප්‍රතිෂ්ඨාවේ (උදාහරණ ලෙස ගණුදෙනුකරුවෙකුගෙන් අස්තිත්වය ලැබීමට හිමිකම් කියන කොටසක මිල වෙනස් වීම) ආකාරය නිසා වෙනස් විය හැකිය. ගණුදෙනුකරුවෙක් එකග වූ මුදල් නොවන ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය, ප්‍රතිෂ්ඨාවේ ආකාරය පමණක් හැර වන හේතු නිසා වෙනස් වන්නේ නම් (උදාහරණ වශයෙන් අස්තිත්ත්වයේ කාර්ය සාධනය නිසා සාධාරණ අගය වෙනස් විය හැකිය) අස්තිත්ත්වය 56-58 ඡේදවල අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය.

69. අස්තිත්ත්වයේ ගිවිසුම සම්පූර්ණ කිරීම පහසු වීම සඳහා ගණුදෙනුකරුවෙකු භාණ්ඩ හෝ සේවාවලින් දායක වන්නේ නම් (උදාහරණ ලෙස ද්‍රව්‍ය, උපකරණ හෝ ශ්‍රමය) එලෙස දායක වූ භාණ්ඩ හෝ සේවාවල පාලනය එය ලබා ගන්නේද යන්න අස්තිත්ත්වය තක්සේරු කළ යුතුය. එය එසේ නම් අස්තිත්ත්වය විසින් දායක වූ භාණ්ඩ හෝ සේවා වල වටිනාකම ගණුදෙනුකරුගෙන් ලැබුණ මුදල් නොවන ප්‍රතිෂ්ඨාවක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

**ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව**

70. ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවට අස්තිත්ත්වය ගණුදෙනුකරුට ගෙවන හෝ අපේක්ෂා කරන මුදල් ප්‍රමාණය ඇතුළත් වේ. (හෝ ගණුදෙනුකරුගෙන් අස්තිත්වයේ භාණ්ඩ හෝ සේවා මිලදී ගන්නා වෙනත් පාර්ශවවලට). ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවකට බැර කිරීමේ හෝ වෙනත් අයිතම් ඇතුළත් අතර (උදාහරණ ලෙස කූපනයක් හෝ වවුචරයක්) ඒවා අස්තිත්ත්වයට ගෙවීමට ඇති වටිනාකම්වලට හිලව් කිරීමට ව්‍යවහාර කළ හැකිය. (හෝ ගණුදෙනුකරුගෙන් අස්තිත්ත්වයේ භාණ්ඩ හෝ සේවා මිලදී ගන්නා වෙනත් පාර්ශව වෙත). ගණුදෙනුකරු වෙත ගෙවීම, ගණුදෙනුකරු විසින් අස්තිත්ත්වයට මාරු කරනු ලැබූ නිශ්චිත භාණ්ඩ හෝ සේවාව (26 - 30 ඡේදවල විස්තර කර ඇති පරිදි) සඳහා හුවමාරුවක් ලෙස ගැනෙන්නේ නම් පමණක් ගනුදෙනුකරුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවෙන් අඩු කිරීමත් ලෙස සහ එම නිසා අයභාරයක් ලෙස අස්තිත්ත්වයක් ගිණුම් කරණු ලැබිය යුතුය.ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව විචල්‍ය වටිනාකමක් ඇතුළත් නම්, අස්තිත්වය ගණුදෙනු මිල ඇස්තමේන්තු කළ යුත්තේ (විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තුව තදින් සීමාකර ඇතිදැයි තක්සේරු කිරීම ඇතුළුව) ඡේද 50 - 58 ප්‍රකාරවය.

71. ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව, ගණුදෙනුකරුවෙකු ගෙන් වූ නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් සඳහා වන ගෙවීමක් නම්, එවිට එම භාණ්ඩ හා සේවා මිලදී ගැනීම් සඳහා අස්තිත්ත්වය ගිණුම්ගත කළ යුත්තේ සැපයුම්කරුවෙකුගෙන් කරනු ලබන වෙනත් මිලදී ගැනීම් සඳහා ගිණුම්ගතකරණ ආකාරයටමය. ගණුදෙනුකරුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවේ වටිනාකම, අස්තිත්ත්වයට ගණුදෙනුකරුගෙන් ලැබුණ නිශ්චිත භාණ්ඩවල හෝ සේවාවල සාධාරණ අගය ඉක්මවා යන්නේ නම් එවිට එම ඉක්මවා යන වටිනාකම ගණුදෙනු මිලෙන් අඩු කිරීමක් ලෙස අස්තිත්ත්වය ගිණුම්ගත කළ යුතුය. ගණුදෙනුකරුගෙන් ලැබුණ භාණ්ඩවල හෝ සේවාවල සාධාරණ අගය, අස්තිත්ත්වයට ඇස්තමේන්තු කළ නොහැකි නම් ගණුදෙනුකරුට ගෙවිය යුතු සියලුම ප්‍රතිෂ්ඨාව ගණුදෙනු මිලෙන් අඩු කිරීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

72. ඒ අනුව ගණුදෙනුකරුවෙකුට ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාව ගණුදෙනු මිලෙන් අඩු කිරීමක් ලෙස ගිණුම්ගත කළහොත් පහත දක්වා ඇති සිදුවීම් අතුරෙන් පසුව යෙදෙන සිදුවීමක් යෙදෙනවිට හෝ යෙදෙන අතරතුර දී ආදායමේ අඩුවීමක් ලෙස අස්තිත්ත්වය විසින් හඳුනාගත යුතුය.

(අ) ගණුදෙනුකරුට පැවරූ සම්බන්ධිත භාණ්ඩ හෝ සේවා සඳහා අයභාරය අස්තිත්ත්වය හඳුනා ගැනීම; සහ

(ආ) අස්තිත්ත්වය ප්‍රතිෂ්ඨාව ගෙවීම හෝ ගෙවීමට එකඟවීම (අනාගත සිද්ධීන් මත ගෙවීම කොන්දේසි සහිත වූයේ වුවද) එම එකඟවීම අස්තිත්ත්වයේ චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදු වලින් ව්‍යංගවිය හැකිය.

**ගණුදෙනු මිල ඉටුකිරීමේ බැඳීම්වලට වෙන්කිරීම**

73. **ගණුදෙනුව කොටස්කර වෙන්කිරීමේ අරමුණ වන්නේ එක් එක් ඉටුකිරීම් බැඳීම් (හෝ නිශ්චිත භාණ්ඩ හෝ සේවා) අතර ගණුදෙනුකරු වෙත පොරොන්දු පරිදි හුවමාරු කෙරෙන භාණ්ඩ හෝ සේවා සඳහා හිලව්වට අස්තිත්ත්වය අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාවේ හිමිකමේ ප්‍රමාණය පෙන්නුම් කරන ආකාරයෙන් ගනුදෙනු මිල වෙන්කර දක්වීමය.**

74. 81 -83 ඡේදවල පැහැදිලි කර ඇති (වට්ටම් වෙන්කිරීම) සහ 84-86 ඡේද (විචල්‍ය වටිනාකම් ඇතුළත් ප්‍රතිෂ්ඨාවේ වෙන් කිරීම සඳහා) හැර වෙන්කිරීමේ අරමුණ සපුරා ගැනීමට ගිවිසුමක් තුළවන හඳුනාගත් සෑම ඉටු කිරීම් බැඳීමකටම, අස්තිත්ත්වය විසින් ගණුදෙනු මිල වෙන් කළ යුත්තේ 76 - 80 ඡේද ප්‍රකාරව සාපේක්ෂ තනි තනි වශයෙන් ගත් විකුණුම් මිල පදනමටය.

75. ගිවිසුමට ඇත්තේ එක් ඉටු කිරීම් බැඳීමක් පමණක් නම් 76-86 ඡේද ව්‍යවහාර නොවේ. 22 (ආ) ඡේදය ප්‍රකාරව තනි ඉටු කිරීම් බැඳීමක් ලෙස හඳුනාගත් නිශ්චිත භාණ්ඩ හෝ සේවා පෙළක් පැවරීමට අස්තිත්ත්වය එකඟ වන්නේ නම් සහ එකඟ වූ ප්‍රතිෂ්ඨාවට විචල්‍ය වටිනාකම් ඇතුළත් නම්, කෙසේ වෙතත් 84-86 ඡේද ව්‍යවහාර කළ හැකිය.

**තනි තනි විකුණුම් මිල පදනම මත වෙන්කිරීම**

76. සෑම ඉටුකිරීමේ බැඳීමකට ගණුදෙනු මිල සාපේක්ෂ තනි තනි විකුණුම් මිල පදනම මත වෙන් කිරීමට, අස්තිත්ත්වය විසින් ගිවිසුමේ ඇති සෑම ඉටු කිරීමේ බැඳීමක පාදක වන නිශ්චිත භාණ්ඩ හෝ සේවාවල තනි තනි පදනමේ විකුණුම් මිල ගිවිසුම ආරම්භයේ නිර්ණය කළ යුතු සහ එම ගණුදෙනු මිල එම තනි තනි පදනමේ විකුණුම් මිල ගණන්වලට සමානුපාතිකව වෙන් කළ යුතුය.

77. තනි තනි පදනමේ විකුණුම් මිල වනුයේ, පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා වෙන්ව අස්තිත්වය විසින් ගණුදෙනුකරුවකුට විකුණනු ලබන මිලය. තනි තනි පදනමේ භාණ්ඩයක හෝ සේවාවක විකුණුම් මිල සඳහා හොඳම සාක්ෂිය වනුයේ, අස්තිත්ත්වය විසින් සමාන තත්ත්වයන්හි දී සහ සමාන ගණුදෙනුකරුවන්ට එම භාණ්ඩ හා සේවා වෙනම විකුණන විට නිරීක්ෂණය කළහැකි මිලය. භාණ්ඩයක හෝ සේවාවක ගිවිසුම් ප්‍රකාරව සඳහන් කළ මිල හෝ ලැයිස්තු (එහෙත් අනුමාන නොකළ යුතු)මිල එම භාණ්ඩයේ හෝ සේවාවේ තනි තනි පදනමේ විකුණුම් මිල විය හැකිය.

78. තනි තනි පදනම මත විකුණුම් මිල සෘජුව නිරීක්ෂණය කළ නොහැකි නම් 73 වන ඡේදයේ වන ගණුදෙනු මිල වෙන් කරන වෙන් කිරීමේ අරමුණේ අවශ්‍යතා ඉටු කර ගැනීම ප්‍රතිඵලයක් වියහැකි වටිනාකමකට අස්තිත්ත්වය විසින් තනි තනි පදනමේ විකුණුම් මිල ඇස්තමේන්තු කළ යුතුය. තනි තනි පදනමේ විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමේ දී අස්තිත්ත්වයට සාධාරණව ලබාගත හැකි සියලුම තොරතුරු (වෙළඳපොල තත්ත්වයන්, ගණුදෙනුකරු හෝ ගණුදෙනුකරු පන්තියක් පිළිබඳව තොරතුරු සහ අස්තිත්වයට විශේෂිත කරුණු ඇතුළුව) අස්තිත්වය සළකා බැලිය යුතුය. එසේ කිරීමේ දී අස්තිත්ත්වය විසින් නිරීක්ෂණය කළ හැකි යෙදවුම් භාවිතය උපරිම කළ යුතු සහ ඒ හා සමාන තත්ත්වයන්හි දී ඇස්තමේන්තු කිරීමේ ක්‍රම සංගතව ව්‍යවහාර කළ යුතුය.

79. භාණ්ඩයක හෝ සේවාවක තනි තනි පදනමේ විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමට සුදුසු ක්‍රමවලට පහත දෑ ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමිත නොවේ.

(අ) ගළපන ලද වෙළඳපොල තක්සේරු කිරීමේ ප්‍රවේශය - අස්තිත්තවයක් භාණ්ඩ හෝ සේවා විකුණනු ලබන වෙළඳපොළ ඇගයීම් කර වෙළඳපොලේ එම භාණ්ඩ සහ සේවා සඳහා ගණුදෙනුකරුවකු ගෙවීමට කැමති විය හැකි මිල ඇස්තමේන්තු හැකිය. අස්තිත්ත්වයේ භාණ්ඩ සහ සේවා හා සමාන දෑ සඳහා එහි තරගකරුවන්ගේ මිල ගණන් වලට යොමු කිරීම සහ එමගින් අස්තිත්ත්වයේ පිරිවැය සහ ආන්තික පිළිබිඹු වීමට අවශ්‍ය පරිදි එම මිල ගණන් වලට ගැලපුම් කිරීම මෙම ප්‍රවේශයට ඇතුළත් විය හැකිය.

(ආ) අපේක්ෂිත පිරිවැයට ආන්තිකයක් එකතු කිරීමේ ප්‍රවේශය - ඉටු කිරීමේ බැඳීමක් තෘප්ත කිරීමේ එහි අපේක්ෂිත පිරිවැය අස්තිත්ත්වය පුරෝකථනය කළ හැකි සහ ඉන් පසු එම භාණ්ඩ හෝ සේවා සඳහා උචිත ආන්තිකයක් එකතු කිරීම.

(ඇ) අවශේෂ ප්‍රවේශය - ගිවිසුමේ එකඟ වූ වෙනත් භාණ්ඩවල හෝ සේවාවල නිරීක්ෂණය කළ හැකි තනි තනි මිල ගණන්වල එකතුව අඩු කිරීමෙන් පසුව වූ සම්පූර්ණ ගණුදෙනු මිලට යොමු කිරීමෙන් තනි තනි පදනමේ විකුණුම් මිල අස්තිත්ත්වයට ඇස්තමේන්තු කළ හැකිය. කෙසේ වෙතත් පහත සඳහන් නිර්ණායකයන් ගෙන් එකක් ඉටු වන්නේ

නම් පමණක් 78 වන ඡේදය ප්‍රකාරව භාණ්ඩයක හෝ සේවාවක තනි තනි පදනමේ විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමට අවශේෂ ප්‍රවේශය අස්තිත්ත්වයන් භාවිතා කළ හැකිය.

(i) අස්තිත්ත්වය එකම භාණ්ඩය හෝ සේවාව වෙනස් ගණුදෙනුකරුවනට (එකම හෝ ආසන්න වේලාවට) පුළුල් පරාසයක වටිනාකම්වලට විකිණීම (එනම් ආදර්ශක වන තනි තනි පදනමේ විකුණුම් මිල පසුගිය ගණුදෙනු හෝ වෙනත් නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලින් තීක්ෂණව දකිය නොහැකි නිසා විකුණුම් මිල විශාල ලෙස විචල්‍යවේ); හෝ

(ii) එම භාණ්ඩ හෝ සේවා සඳහා අස්තිත්ත්වය තවමත් මිල ස්ථාපනය කර නොතිබීම සහ කලින් භාණ්ඩ හෝ සේවාව තනි තනි පදනම මත විකුණා නොතිබීම (එනම් විකුණුම් මිල අනියත වීම)

80. ගිවිසුමේ එකඟ වූ එම භාණ්ඩ හෝ සේවා වල දෙකක් හෝ ඊට වැඩි ගණනකට අධික ලෙස විචල්‍ය හෝ අනියත තනි තනි පදනමේ විකුණුම් මිල ගණන් තිබේ නම් ගිවිසුමේ එකඟ වූ භාණ්ඩ හෝ සේවා සඳහා තනි තනි පදනමේ විකුණුම් මිල ගණන් ඇස්තමේන්තු කිරීමට ක්‍රමවල සංයෝජනයක් භාවිතා කිරීමට අවශ්‍ය විය හැකිය. උදාහරණයක් වශයෙන් අධික ලෙස විචල්‍ය හෝ අනියත තනි තනි පදනමේ විකුණුම් මිලක් සහිත පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා සඳහා තනි තනි පදනමේ විකුණුම් මිලක් ඇස්තමේන්තු කිරීමට අස්තිත්වයක් අවශේෂ ප්‍රවේශය භාවිත කළ හැකි අතර ඊට පසුව අවශේෂ ප්‍රවේශයෙන් නිර්ණය කළ එම සමාහාර කළ තනි තනි පදනමේ ඇස්තමේන්තු කළ විකුණුම් මිලට සාපේක්ෂව එක් එක් භාණ්ඩ හෝ සේවාවල තනි තනි පදනමේ විකුණුම් මිල ගණන් ඇස්තමේන්තු කිරීමට වෙනත් ක්‍රමයක් භාවිතා කළ හැකිය. ගිවිසුමේ ඇති සෑම පොරොන්දු වූ භාණ්ඩයකටම හෝ සේවාවකට තනි තනි පදනමේ විකුණුම් මිලක් ඇස්තමේන්තු කිරීමට අස්තිත්වය එම ක්‍රමවල සංයෝජනයන් භාවිත කරන විට එම ඇස්තමේන්තු කළ තනි තනි පදනමේ විකුණුම් මිල ගණන් වලට ගණුදෙනු මිල වෙන් කිරීමට 73 වන ඡේදයේ වෙන් කිරීම් අරමුණු සමග, සහ 78 වන ඡේදයේ තනි තනි පදනමේ විකුණුම් මිල ගණන් ඇස්තමේන්තු කිරීමේ අවශ්‍යතාවයන් සමග සංගත වන්නේද යන්නත් අස්තිත්ත්වය විසින් අගය කළ යුතුය.

**වට්ටමක් වෙන්කිරීම**

81. ගණුදෙනුකරුවෙක් භාණ්ඩ හෝ සේවා පොදියක් මිලදී ගැනීම වෙනුවෙන් එම එකඟ වූ භාණ්ඩ හෝ සේවාවල ගිවිසුමේ වන තනි තනි පදනමේ විකුණුම් මිලේ එකතුව ගිවිසුමේ ඇති එකඟ වූ ප්‍රතිෂ්ඨාව ඉක්මවන්නේ නම් ගණුදෙනුකරුට වට්ටමක් ලැබේ. 82 ඡේදය ප්‍රකාරව සම්පූර්ණ වට්ටම සම්බන්ධ වන්නේ ගිවිසුමේ ඇති ඉටු කිරීමේ බැඳීම්වල එකක් හෝ ඊට වැඩි ගණනක් නමුත් සියල්ලටම නොවන බවට නිරීක්ෂණය කළ හැකි සාධක අස්තිත්ත්වයට ඇතිවන විට හැර, අස්තිත්වය විසින් ගිවිසුමේ ඇති සියලු ඉටුකිරීමේ බැඳීම්වලට වට්ටම සමානුපාතිකව වෙන් කළ යුතුය. එම තත්ත්වයන්හිදී වට්ටම් සමානුපාතිකව වෙන් කිරීම, පාදක නිශ්චිත භාණ්ඩ හෝ සේවාවල සාපේක්ෂ තනි තනි පදනමේ විකුණුම් මිල ගණන් පදනම මත සෑම ඉටු කිරීමේ බැඳීමකට ගණුදෙනු මිල අස්තිත්ත්වය වෙන් කිරීමේ ප්‍රතිඵලයකි.

82. පහත සඳහන් නිර්ණායක ඉටු වන්නේ නම් අස්තිත්වය විසින් ගිවිසුමේ ඇති ඉටු කිරීමේ බැඳීම් වල සියල්ලම නොව එකක් හෝ ඊට වැඩි ගණනකට පමණක් වට්ටමක් සම්පූර්ණයෙන්ම වෙන් කළ යුතුය :-

(අ) අස්තිත්ත්වය ගිවිසුමේ ඇති සෑම නිශ්චිත භාණ්ඩයක් හෝ සේවාවක් (හෝ නිශ්චිත භාණ්ඩ හෝ වේවා සෑම පොදියක්) තනි තනි පදනම මත නිතිපතා විකිණීම;

(ආ) තනි තනි පදනම මත එම සමහර නිශ්චිත භාණ්ඩ හෝ සේවාවලින් පොදියක් (පොදි) සෑම පොදියක ඇති භාණ්ඩ හෝ සේවාවල තනි තනි පදනමේ විකුණුම් මිලෙන් වන වට්ටමකට අස්තිත්වය විසින් එලෙස නිතිපතා විකිණීම.

(ඇ) 82 (ආ) ඡේදයේ විස්තර කර ඇති භාණ්ඩ හෝ සේවා සෑම පොදියකටම ආරෝපිත වට්ටම බොහෝදුරට ගිවිසුමේ ඇති වට්ටමට සමාන සහ සෑම පොදියකට ඇති භාණ්ඩ හෝ සේවාවල විශ්ලේෂණය ගිවිසුමට අයිති සම්පූර්ණ වට්ටම ඉටු කිරීම් බැඳීමේ (හෝ ඉටු කිරීම් බැඳීම් වල) නිරීක්ෂණය කළ හැකි සාක්ෂි සපයයි.

83. 82 වන ඡේදය ප්‍රකාරව ගිවිසුමක වන එකක් හෝ ඊට වැඩි ඉටු කිරීම් බැඳීම් වලට වට්ටම මුළුමනින්ම වෙන් කළ හොත් 79 (ඇ) ඡේදය ප්‍රකාරව භාණ්ඩයක් හෝ සේවාවක තනි තනි පදනමේ විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමට අවශේෂ ප්‍රවේශය භාවිත කිරීමට පෙර අස්තිත්වය විසින් වට්ටම වෙන් කළ යුතුය.

**විචල්‍ය ප්‍රතිෂ්ඨාව වෙන් කිරීම**

84. ගිවිසුමක එකඟවී ඇති විචල්‍ය ප්‍රතිෂ්ඨාව පහත දක්වෙන දෑ වලින් එකක් ලෙස වැනි මුළු ගිවිසුමට හෝ ගිවිසුමේ නිශ්චිත කොටසක ආරෝපණය කළ හැකිය ඃ-

(අ) සියල්ලටම නොවන එහෙත් එකක් හෝ ඊට වැඩි ගිවිසුම්වල ඉටු කිරීමේ බැඳීම් (උදාහරණ වශයෙන් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුළදී එකඟ වූ භාණ්ඩ හෝ සේවා අස්තිත්වය පැවරීම මත ප්‍රසාද දීමනා අසම්භව්‍ය විය හැකිය);

හෝ

(ආ) සියල්ලටම නොවන එහෙත් එකක් හෝ ඊට වැඩි 22 (ආ) ඡේදය ප්‍රකාරව තනි ඉටු කිරීමේ බැඳීමක කොටසක ස්වරූප ගන්නා එකඟ වූ භාණ්ඩ හෝ සේවා පෙළක නිශ්චිත භාණ්ඩ හෝ සේවාවන් (උදාහරණ වශයෙන් වසර දෙකක පවිත්‍ර කිරීමේ සේවා ගිවිසුමක් සඳහා දෙවන වසර සඳහා එකඟ වූ ප්‍රතිෂ්ඨාව කලින් නියම කරන ලද උද්ධමන දර්ශකයක සංචලනය පදනම මත වැඩි කරනු ලැබේ.)

85. පහත සඳහන් නිර්නායකයන් දෙකම ඉටු වන්නේ නම් විචල්‍ය වටිනාකම (සහ පසුව එම වටිනාකමට කරන වෙනස්කම්) මුළුමනින්ම ඉටු කිරීමේ බැඳීමකට හෝ 22(ආ) ඡේදය ප්‍රකාරව වන තනි ඉටු කිරීමේ බැඳීමක කොටසක ස්වරූපය ගන්නා නිශ්චිත භාණ්ඩයකට හෝ සේවාවකට අස්තිත්ත්වය විසින් වෙන් කළ යුතුය ඃ-

(අ) විචල්‍ය ගෙවීම් කොන්දේසි පැහැදිලිවම සම්බන්ධ වන්නේ ඉටු කිරීම් බැඳීම් සපුරාලීම හෝ නිශ්චිත භාණ්ඩ හෝ සේවා පැවරීමේ (හෝ ඉටු කිරීමේ බැඳීම සපුරාලීම මෙන් වන නිශ්චිත ප්‍රතිඵලයකට හෝ නිශ්චිත භාණ්ඩ හෝ සේවා පැවරීමෙන්) අස්තිත්ත්වයේ ප්‍රයත්නයටය ; සහ

(ආ) ගිවිසුමේ ඇති සියලු ඉටු කිරීමේ බැඳීම් සහ ගෙවීම් කොන්දේසි සළකා බලන විට, ප්‍රතිෂ්ඨාවේ විචල්‍ය වටිනාකම මුළුමනින්ම ඉටු කිරීමේ බැඳීමට හෝ නිශ්චිත භාණ්ඩයකට හෝ සේවාවකට වෙන් කිරීම 73 ඡේදයේ වෙන් කිරීමේ අරමුණ සමඟ සංගතවීම.

86. 85 වන ඡේදයේ වන නිර්නායක සපුරා නොමැති ගණුදෙනු මිලේ ඉතිරි වටිනාකම වෙන් කිරීමට 73-83 ඡේදවල වන වෙන් කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය.

**ගණුදෙනු මිලේ වෙනසක් වීම**

87. අනියත සිද්ධියක් නිශ්චය කිරීම හෝ එකඟ වූ භාණ්ඩ හෝ සේවාවන් හුවමාරුව සඳහා අස්තිත්වය හිමිකම් කීමට අපේක්‍ෂා කරන ප්‍රතිෂ්ඨාව වටිනාකම වෙනස් කරන තත්ත්වයන්ගේ වෙනත් වෙනස්වීම් ඇතුළුව විවිධ හේතු නිසා ගිවිසුම ආරම්භ කිරීමෙන් පසු ගණුදෙනු මිල වෙනස් විය හැකිය.

88. ගණුදෙනු මිලට පසුව කරන ලබන යම් වෙනස්කම් ගිවිසුමේ ඇති ඉටු කිරීමේ බැඳීම්වලට අස්තිත්ත්වය විසින් වෙන් කළ යුත්තේ ගිවිසුම ආරම්භයේ දී තිබූ පදනම මතය. ඒ නිසාවෙන් ගිවිසුම ආරම්භ කිරීමෙන් පසු තනි තනි පදනමේ විකුණුම් මිලේ වෙනස්කම් පිළිබිඹුවීමට අස්තිත්ත්වය විසින් ගණුදෙනු මිල යළි වෙන් නොකළ යුතුය. ගණුදෙනු මිල වෙනස් වන කාලපරිච්ඡේදයේදී, සපුරාලන ලද ඉටු කිරීමේ බැඳීමකට වෙන් කළ වටිනාකම් අයභාරය ලෙස හෝ අයභාරයෙන් අඩු කිරීමක් ලෙස හඳුනාගත යුතුය.

89. 85 වන ඡේදයේ විචල්‍ය ප්‍රතිෂ්ඨාව මත වෙන් කිරීමේ නිර්ණායක සපුරාලන්නේ නම් පමණක්, ගණුදෙනු මිලේ වෙනස් වීම මුලුමනින්ම සියල්ලම නොවන එහෙත් එකක් හෝ ඊට වැඩි ඉටු කිරීම් බැඳීම් වලට හෝ 22 (ආ) ඡේදය ප්‍රකාරව වන තනි ඉටු කිරීමේ බැඳීමක් වන කොටසක ස්වරූපය ගන්නා එකඟ වූ නිශ්චිත භාණ්ඩ හෝ සේවා පෙළකට අස්තිත්ත්වය වෙන්කළ යුතුය.

90. ගිවිසුමක් වෙනස් කිරීමෙන් ප්‍රතිඵලයක් ලෙස පැනනගින ගණුදෙනු මිලේ වෙනස්වීම සඳහා අස්තිත්ත්වය 18 - 21 ඡේද ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය. කෙසේ වෙතත් ගිවිසුම වෙනස් කිරීමෙන් පසුව ඇතිවන ගණුදෙනු මිලේ වෙනස්වීම සඳහා අස්තිත්ත්වය

විසින් ගණුදෙනු මිලේ වෙනස්වීම වෙන් කිරීමට උචිතවන පරිදි පහත සඳහන් ක්‍රම වලින් එකක් 87 - 89 ඡේද පරිදි ව්‍යවහාර කළ යුතුය :-

(අ) ගිවිසුම වෙනස් කිරීමට පෙර එහි හඳුනාගත් ඉටු කිරීම් බැඳීම් ඇත්නම්, ඒ වෙත ගණුදෙනු මිලේ වෙනස්වීම අස්තිත්වය වෙන් කළ යුතු අතර වෙනස් කිරීමට පෙර එකග වූ විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ආරෝපිත ගණුදෙනු මිලේ වෙනස්වීමේ සහ වෙනස් කිරීමේ ප්‍රමාණය දක්වා 21 (අ) ඡේදය පරිදි ගිණුම්ගත කළ යුතුය.

(ආ) 20 වන ඡේදය ප්‍රකාරව වෙන්ව වූ ගිවිසුමක් ලෙස වෙන් කිරීම ගිණුම්ගත නොකළ සියළුම වෙනත් අවස්ථාවලට ගණුදෙනු මිලේ වෙනස අස්තිත්ත්වය වෙනස් කළ ගිවිසුමේ ඉටු කිරීම් බැඳීම්වලට වෙන් කළ යුතුය. (එනම් වෙනස් කිරීමට පසුව වහාම සපුරාලනු නොලැබූ හෝ අර්ධ වශයෙන් සපුරාලනු නොලැබූ ඉටු කිරීමේ බැඳීම්).

## ගිවිසුම් පිරිවැය

### ගිවිසුමක් ලබා ගැනීමේ වර්ධන පිරිවැය

**91. ගණුදෙනුකරුවෙකු සමඟ වන ගිවිසුමක් ලබා ගැනීම සඳහාවන වර්ධනය පිරිවැය, එම පිරිවැය අයකර ගැනීමට අස්තිත්ත්වය අපේක්‍ෂා කරන්නේ නම් එය වත්කමක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත යුතුය.**

92. ගිවිසුමක් ලබා ගැනීමේදී වන වර්ධනය පිරිවැය වනුයේ ගණුදෙනුකරුවකු සමඟ ගිවිසුමක් ලබා ගැනීමේදී අස්තිත්ත්වය වැය කරන, එම පිරිවැය ගිවිසුම ලබා නොගත්තේ නම් දැරීමට සිදු නොවනු විය හැකිය. (උදාහරණ වශයෙන් විකුණුම් කොමිස්)

93. ගිවිසුම ලබා ගත්තේද යන්න නොසළකා ගිවිසුමක් ලබා ගැනීමට වන එම පිරිවැය පැහැදිලිවම ගණුදෙනුකරුගෙන් අයකරගත හැකි වන්නේ නම් හැර ගිවිසුමක් ලබා ගැනීමේදී දැරීමට සිදුවන පිරිවැය ගිවිසුම ලබා ගත්තේ ද යන්න නොසළකා දැරූ අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගත යුතුය.

94. අස්තිත්ත්වය වත්කමේ ක්‍රම ක්‍ෂය කිරීමේ කාලය වසරක් හෝ ඊට අඩු ලෙස වෙනත් ලෙසකින් හඳුනාගන්නේ නම්, ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස ගිවිසුමක් ලබාගැනීමේ වර්ධන පිරිවැය, එම පිරිවැය දරන අවස්ථාවේ වියදමක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත හැකිය.

## ගිවිසුමක් සම්පූර්ණ කිරීමට වන පිරිවැය

**95. ගණුදෙනුකරුවෙක් සමඟවන ගිවිසුමක් සම්පූර්ණ කිරීමේදී දරණ පිරිවැය වෙනත් ප්‍රමිතයක විෂය පථයක් තුළ නොවන්නේ නම් (*උදාහරණ වශයෙන් LKAS 2 තොග, LKAS 16, දේපළ, පිරියත සහ උපකරණ* හෝ LKAS 38 *අස්පෘශ්‍ය වත්කම්*) එම පිරිවැය පහත සඳහන් නිර්ණායක සියල්ලම ඉටු කරන්නේ නම් පමණක් ගිවිසුම සම්පූර්ණ කිරීමට දැරූ පිරිවැයෙන් අස්තිත්ත්වය වත්කමක් හඳුනාගත යුතුය :**

**(අ) අස්තිත්ත්වයට පැහැදිලිව හඳුනාගත හැකි ගිවිසුමකට හෝ අපේක්‍ෂිත ගිවිසුමකට පිරිවැය සෘජුව සම්බන්ධවීම. (උදාහරණ වශයෙන් පවතින ගිවිසුමක අලුත් කිරීමක් යටතේ සැලසිය යුතු සේවා වලට සම්බන්ධිත පිරිවැය හෝ මෙතෙක් අනුමත නොකළ නිශ්චිත ගිවිසුමක් යටතේ පැවරිය යුතු වත්කමක් සැලසුම් කිරීමේ පිරිවැය);**

**(ආ) අනාගතයේදී ඉටු කිරීම් බැඳීම් සපුරාලීමට භාවිත කරනු ලැබිය හැකි (හෝ අඛණ්ඩව සපුරාලීමට) අස්තිත්ත්වය සම්පත් ජනනය කිරීමට හෝ වැඩි කිරීමට වන පිරිවැය;සහ**

**(ඇ) අයකරගැනීමට අපේක්‍ෂා කරන පිරිවැය**

96. වෙනත් ප්‍රමිතයක විෂය පථය තුළවන ගණුදෙනුකරුවකු සමඟ වන ගිවිසුමක් සම්පූර්ණ කිරීමේදී දැරීමට වන පිරිවැය සඳහා, අස්තිත්ත්වය එම පිරිවැය සඳහා ගිණුම්ගත කළ යුත්තේ එම වෙනත් ප්‍රමිත ප්‍රකාරවය.

97. ගිවිසුමකට සෘජුව සම්බන්ධ විය හැකි පිරිවැයට (හෝ අපේක්ෂිත නිශ්චිත ගිවිසුමකට) පහත දෑ වලින් ඕනෑම දෙයක් ඇතුළත් විය හැකිය ඃ-

(අ) සෘජු ශ්‍රමය (උදාහරණ ලෙස පොරොන්දු වූ සේවාවන් ගණුදෙනුකරුට සෘජුව ලබාදෙන සේවකයන්ගේ වැටුප් සහ වේතන)

(ආ) සෘජු ද්‍රව්‍ය (පොරොන්දු වූ සේවාවන් ගණුදෙනුකරුට සැලසීමේදී භාවිතකරන සැපයුම්)

(ඇ) ගිවිසුමට හෝ ගිවිසුම් ක්‍රියාකාරකම් වලට සෘජුව සම්බන්ධිත පිරිවැය වෙන් කිරීම් (උදාහරණ ගිවිසුම් කළමනාකරණය සහ අධීක්ෂණය, රක්ෂණය සහ ගිවිසුම සම්පූර්ණ කිරීමේදී භාවිත කරන මෙවලම් සහ උපකරණවල ක්ෂය කිරීම)

(ඈ) ගිවිසුම යටතේ ගණුදෙනුකරුවෙකුට පැහැදිලිව අයකළ යුතු පිරිවැය; සහ

(ඉ) අස්තිත්ත්වය ගිවිසුමට එළඹීම නිසා පමණක් දරණ වෙනත් පිරිවැය (උදාහරණ වශයෙන්, උප කොන්ත්‍රාත්කරුවනට කරන ගෙවීම්)

98. දරණ අවස්ථාවේ පහත පිරිවැය අස්තිත්ත්වය වියදම් ලෙස හඳුනාගත යුතුය ඃ-

(අ) සාමාන්‍ය සහ පරිපාලන වියදම් (ගිවිසුම යටතේ එම පිරිවැය පැහැදිලිවම ගණුදෙනුකරුට අයකළ හැකි වන්නේ නම් හැර, එවැනි අවස්ථාවකදී එම පිරිවැය 97 ඡේදය ප්‍රකාරව අස්තිත්ත්වය අගය කළ යුතුය).

(ආ) ගිවිසුම් මිලේ පිළිබිඹු නොවන ගිවිසුම නිම කිරීමේදී වන අපතේ යන ද්‍රව්‍ය ශ්‍රමය හෝ වෙනත් සම්පත්.

(ඇ) ගිවිසුමේ වන (එනම් අතීත ඉටු කිරීම් වලට සම්බන්ධ පිරිවැය) ඉටු කිරීමේ බැදීම් සපුරාලීමට (හෝ අර්ධ වශයෙන් සපුරාලන ලද ඉටු කිරීමේ බැඳීම්) සම්බන්ධිත පිරිවැය.

(ඈ) පිරිවැය සම්බන්ධ වන්නේ සපුරාලීමට නොහැකි වූ ඉටු කිරීම් බැඳීම් වලටද හෝ සපුරාලන ලද ඉටු කිරීම් බැඳීම්වලටද (හෝ අර්ධ වශයෙන් සපුරාලන ලද ඉටු කිරීම් බැඳීම්) යන්න අස්තිත්ත්වයට වෙන් කොට හඳුනාගත නොහැකි දෑ සඳහා වන පිරිවැය.

**ක්‍රමක්ෂය සහ හානිකරණය**

99. 91 හෝ 95 ඡේද ප්‍රකාරව හඳුනාගත් වත්කමක් ක්‍රමානුකූල පදනමක් මත ගණුදෙනුකරුට පැවරූ භාණ්ඩ හෝ සේවා සමඟ සම්බන්ධවන වත්කම සංගතව ක්‍රමක්ෂය කළ යුතුය. වත්කම නිශ්චිත අපේක්ෂිත (95 (අ) ඡේදයේ විස්තරකර ඇති පරිදි) ගිවිසුමක් යටතේ පැවරීමට ඇති භාණ්ඩ හෝ සේවා වලට සම්බන්ධ විය හැකිය.

100. වත්කම සම්බන්ධිත භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට පැවරීමට අස්තිත්ත්වයේ අපේක්ෂිත කාල නිර්ණයේ සැළකිය යුතු වෙනසක් පිළිබිඹු වීමට අස්තිත්ත්වය ක්‍රම ක්ෂය කිරීම යාවත් කාලීන කළ යුතුය. එවැනි වෙනස් වීමක් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස LKAS 8 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය.

101. අස්තිත්වයක් විසින් 91 හෝ 95 ඡේදය ප්‍රකාරව හඳුනාගත් වත්කමක ධාරණ වටිනාකමේ අගය පහත දක්වෙන කරුණු අනුව ඉක්මවන ප්‍රමාණය තෙක් හානිකරණ අලාභයක් ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත යුතුය.

(අ) වත්කම් සම්බන්ධ භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවක් තුළ අස්තිත්ත්වයට ලැබීමට අපේක්ෂිත ප්‍රතිෂ්ඨාවේ ඉතිරි වටිනාකම අඩු කිරීම ;

(ආ) එම භාණ්ඩ හෝ සේවා සැලසීමට සෘජුව සම්බන්ධ වූ සහ වියදම් ලෙස මෙතෙක් හඳුනා නොගත් එම පිරිවැය (97 ඡේදය බලන්න)

102. අස්තිත්ත්වය ලැබීමට අපේක්ෂාකරණ ප්‍රතිෂ්ඨාවේ වටිනාකම නිර්ණය කිරීමට 101 ඡේදය ව්‍යවහාර කිරීමේ අරමුණ සඳහා ගණුදෙනු මිල තීර්ණය කිරීම සඳහා වන මූලධර්ම අස්තිත්වය විසින් භාවිතා කළ යුතුය. (විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ තදින් සීමාකළ ඇස්තමේන්තු 56 -58 ඡේදවල අවශ්‍යතාවයන් සඳහා හැර) සහ ගණුදෙනුකරුගේ ණය අවදානමේ බලපෑම් පිළිබිඹු වීමට එම වටිනාකම ගැළපිය යුතුය.

103. 91 හෝ 95 ඡේදය ප්‍රකාරව හඳුනාගත් වත්කමක් සඳහා අස්තිත්ත්වයක් හානිකරණ අලාභයක් හඳුනා ගැනීමට පෙර, වෙනත් ප්‍රමිතයක් (උදාහරණ වශයෙන් LKAS 2, LKAS 16 සහ LKAS 38) ප්‍රකාරව ගිවිසුමට සම්බන්ධ වත්කම් සඳහා හඳුනාගත් යම් හානිකරණ අලාභයක් අස්තිත්ත්වය විසින් හඳුනාගත යුතුය. 101 වන ඡේදයේ හානිකරණ පරීක්ෂාව ව්‍යවහාර කිරීමෙන් පසුව ප්‍රතිඵලයක් ලෙස හටගන්නා 91 හෝ 95 ඡේද ප්‍රකාරව එය අඩංගු මුදල් උත්පාදන ඒකකයේ ධාරණ වටිනාකම එම මුදල් ඒකකයට LKAS 36 වත්කම් හානිකරණය ව්‍යවහාර කිරීම සඳහා හඳුනාගත් වත්කම්වල ධාරණ අගය අස්තිත්ත්වය ඇතුළත් කළ යුතුය.

104. හානිකරණ තත්ත්වය තවදුරටත් නොපතින හෝ වඩා යහපත් බවට පත් වී ඇති අවස්ථාවක අස්තිත්ත්වය විසින් 101 ඡේදය ප්‍රකාරව කලින් හඳුනාගත් හානිකරණ අලාභයේ මුළු ප්‍රමාණය හෝ කොටසක් ප්‍රතිවර්ත්‍ය කිරීම ලාභ හෝ අලාභ ගිණුමේ හඳුනාගත යුතුය. වත්කමේ වැඩි වූ ධාරණ වටිනාකම, කලින් හානිකරණ අලාභයක් හඳුනා ගෙන නොමැති නම් නිර්ණය කරනු ලැබිය හැකි වන වටිනාකම (ක්‍රම ක්‍ෂයෙන් පසු ශුද්ධ) ඉක්ම නොවිය යුතුය.

## ඉදිරිපත් කිරීම

**105. ගිවිසුමකට සම්බන්ධ ඕනෑම පාර්ශවයක් එය ඉටු කර ඇති අවස්ථාවකදී අස්තිත්වයේ ඉටු කිරීම සහ ගණුදෙනුකරුගේ ගෙවීම් අතර සම්බන්ධතාවය මත රඳා පවතිමින් ගිවිසුම අස්තිත්ත්වයේ මුල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ගිවිසුම් වත්කමක් හෝ ගිවිසුම් වගකීමක් ලෙස අස්තිත්ත්වය ඉදිරිපත් කළ යුතුය; අස්තිත්ත්වයක් ප්‍රතිෂ්ඨාවට යම් කොන්දේසි රහිත හිමිකමක් ලැබිය යුතු දෑ ලෙස වෙන්ව අස්තිත්ත්වය ඉදිරිපත් කළ යුතුය.**

106. ගණුදෙනුකරුවෙක් ප්‍රතිෂ්ඨාව ගෙවයි හෝ අස්තිත්ත්වයකට කොන්දේසි රහිත වන (එනම් ලැබිය යුතු දෙයක්) ප්‍රතිෂ්ඨාවක වටිනාකමක් හිමිකමක් ඇති නම්, ගනුදෙනුකරුට අස්තිත්වය භාණ්ඩ හෝ සේවා පැවරීමට පෙර ගෙවීම කරන විට හෝ ගෙවීම ලැබිය යුතු වන විට (කලින් වන කුමක් හෝ) අස්තිත්ත්වය විසින් ගිවිසුම, ගිවිසුම් වගකීම් ලෙස ඉදිරිපත් කළ යුතුය. ගිවිසුම් වගකීමක් යනු, අස්තිත්ත්වයට ගණුදෙනුකරුවෙකුගෙන් ලැබුණ ප්‍රතිෂ්ඨාව (හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ වටිනාකම) සඳහා භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට පැවරීමට ඇති අස්තිත්ත්වයේ බැඳීමයි.

107. ගණුදෙනුකරු ප්‍රතිෂ්ඨාව ගෙවීමට පෙර හෝ ගෙවීමට නියමිත කාලයට පෙර අස්තිත්ත්වයේ ගණුදෙනුකරුට භාණ්ඩ හෝ සේවා පවරමින් කරන ඉටු කිරීමකදී ඉදිරිපත් කළ යම් ලැබිය යුතු වටිනාකමක් හැර අස්තිත්වය, ගිවිසුම, ගිවිසුම් වත්කමක් ලෙස ඉදිරිපත් කළ යුතුය. ගිවිසුම් වත්කමක් යනු ගණුදෙනුකරුවකුට අස්තිත්වය පවරනු ලැබූ භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවන ප්‍රතිෂ්ඨාවට ඇති අස්තිත්ත්වයේ හිමිකමය. අස්තිත්ත්වයක් SLFRS 9 ප්‍රකාරව ගිවිසුම් වත්කමක් හානිකරණය සඳහා තක්සේරු කළ යුතුය. ගිවිසුම් වත්කමක් හානිකරණය සඳහා මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කළ යුත්තේ SLFRS 9 විෂය පථය තුළ මුල්‍ය වත්කමක් හා සමාන පදනමක් මතය (113 (ආ) ඡේදය ද බලන්න).

108. ලැබිය යුතු දෑ අස්තිත්ත්වයක ප්‍රතිෂ්ඨාවට හිමිකමය. එය කොන්දේසි රහිතය. ප්‍රතිෂ්ඨාවක හිමිකමක් කොන්දේසි රහිත වන්නේ එම ප්‍රතිෂ්ඨාව ගෙවීමට නියමිතවීමට පෙර කාලයක් අවශ්‍ය වන්නේ නම් පමණි. උදාහරණයක් ලෙස අනාගතයේ දී ආපසු ගෙවීමට යටත් විය හැකි වටිනාකමක් වූයේ වුවද වර්තමානයෙහි එයට ගෙවීමට අයිතියක් ඇත්නම් අස්තිත්වයක් ලැබිය යුතු දෑ දෙයක් ලෙස හඳුනාගන්නවා ඇත. අස්තිත්ත්වයක ලැබිය යුතු දෑ SLFRS 9 ප්‍රකාරවය. ගණුදෙනුකරුවෙකුගෙන්වන ගිවිසුමක් මගින් ලැබිය යුතු දෑ මූලික හඳුනා ගැනීම මත, SLFRS 9 ප්‍රකාරව ලැබිය යුතු දෑ මැනීම සහ අනුරූපී හඳුනාගත් අයභාර වටිනාකම අතර යම් වෙනසක් වියදමක් ලෙස ඉදිරිපත් කළ යුතුය. (උදාහරණ ලෙස, හානිකරණ අලාභයක් ලෙස)

109. මෙම ප්‍රමිතය 'ගිවිසුම් වත්කම්' සහ 'ගිවිසුම් වගකීම්' යන පද භාවිත කරයි. එහෙත් එම අයිතම සඳහා මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය විකල්ප විස්තර කිරීමක් භාවිත කිරීම අස්තිත්ත්වය වළක්වාගනු නොලබයි. ගිවිසුම් වත්කමක් සඳහා විකල්ප විස්තරයක් අස්තිත්ත්වය භාවිතා කරන්නේ නම් ලැබිය යුතු දෑ සහ ගිවිසුම් වත්කම් අතර වෙනස පැහැදිලිව වෙන් කර හඳුනා ගැනීම සඳහා අස්තිත්ත්වය මුල්‍ය ප්‍රකාශන පරිශීලකයනට ප්‍රමාණවත් තොරතුරු ලබාදිය යුතුය.

## හෙළිදරව් කිරීම

**110. හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්ගේ අරමුණ වන්නේ, ගනුදෙනුකරුවන් සමග වන ගිවිසුම්වලින් පැන නගින අයභාරයේ සහ මුදල් ප්‍රවාහවල අනියතතාවය සහ කාල නිර්ණය ප්‍රමාණය සහ ස්වභාවය මුල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්හට අවබෝධ**

**කර ගැනීමට හැකිවනු පිණිස අස්තිත්ත්වය ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කිරීමය. එම අරමුණ මුදුන්පත් කරගැනීමට අස්තිත්ත්වයක් විසින් පහත දෑ පිළිබඳව ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතුය.**

**(අ) එහි ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් (113 - 122 ඡේද බලන්න)**

**(ආ) එම ගිවිසුම සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේදී එළඹී වැදගත් විනිශ්වයන් සහ විනිශ්වයන්ගේ වෙනස් කිරීම් (123-126 ඡේද බලන්න); සහ**

**(ඇ) 91 හෝ 95 ඡේදය ප්‍රකාරව ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුමක් ලබා ගැනිමට හෝ සම්පූර්ණ කිරීම පිරිවැයෙන් හඳුනාගත් යම් වත්කම් (127 - 128 ඡේද බලන්න)**

111. හෙළිදරව් කිරීමේ අරමුණ සපුරාලීමට විස්තර අවශ්‍ය කරන මට්ටම සහ විවිධ අවශ්‍යතාවයන් ගෙන් සෑම එකක් සඳහාම කොපමණ ප්‍රමාණයකට අවධාරණයක් තැබිය යුතු ද යන්න අස්තිත්ත්වය සළකා බැලිය යුතුය. අස්තිත්ත්වයක් විසින් හෙළිදරව් කිරීම් සමාහරණ කිරීම හෝ කොටස්වලට විසුරුවා හැරීම කළ යුතුය. ඒ නිසා එක්කෝ විශාල ප්‍රමාණයක නොවැදගත් විස්තර ඇතුළත් කිරීමෙන් හෝ සැළකිය යුතු අන්දමින් වෙනස් ගති ලක්ෂණ ඇති අයිතම් සමාහරණය කිරීමෙන් වැදගත් තොරතුරු අපැහැදිලි බවට පත් නොවේ.

112. අස්තිත්ත්වයත් වෙනත් ප්‍රමිතයක් ප්‍රකාරව අවශ්‍ය තොරතුරු ලබාදී ඇත්නම් මෙම ප්‍රමිතය ප්‍රකාරව එම තොරතුරු හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ.

**ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්**

113. වෙනත් ප්‍රමිත ප්‍රකාරව විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙන්ව එම වටිනාකම් ඉදිරිපත් කර ඇත්නම් මිස වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා පහත සඳහන් සියළු වටිනාකම් අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය.

(අ) ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම්වලින් හඳුනාගත් අයභාරය, එය එහි වෙනත් ප්‍රභවයන්ගෙන් වන අයභාරවලින් වෙනම හෙළිදරව් කළ යුතුය;

සහ

(ආ) අස්තිත්ත්වයට ගණුදෙනුකරුවන් සමග වූ ගිවිසුම්වලින් පැනනගින යම් ලැබිය යුතු දෑ හෝ ගිවිසුම් වත්කම් මත හඳුනාගත් යම් හානිකරණ අලාභයන් (SLFRS 9 ප්‍රකාරව) එය අස්තිත්ත්වය වෙනත් ගිවිසුම්වලින් වන හානිකරණ අලාභවලින් වෙන්ව අස්තිත්ත්වයක් හෙළිදරව් කළ යුතුය.

**අයභාරය කොටස්වලට විසුරුවා හැරීම**

114. ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම්වලින් හඳුනාගත් අයභාරයේ ස්වභාවය, ප්‍රමාණය, කාල නීර්ණය සහ අයභාරයේ සහ මුදල් ප්‍රවාහවල අනියතාවන්ට ආර්ථික සාධක කෙසේ බලපාන්නේද යන්න නිරූපණය වන අන්දමට අස්තිත්ත්වය අයභාර ප්‍රභේදනය කර කොටස්වලට විසුරුවා හැරිය යුතුය. අයභාරය කොටස් වලට විසුරුවා හැරීම භාවිතා කරන ප්‍රභේද තෝරා ගැනීමේදී ආ 87 - ආ 89 ඡේදවල උපදේශන අස්තිත්ත්වය ව්‍යවහාර කළ යුතුය.

115. ඊට අමරතව අස්තිත්ත්වය SLFRS 8 *මෙහෙයුම් ඛණ්ඩ* ව්‍යවහාර කරයි නම්, කොටස්වලට විසුරුවාහැරි අයභාරය හෙළිදරව් කිරීම (114 වන ඡේදය ප්‍රකාරව) සහ සෑම වාර්තාකළ යුතු ඛණ්ඩයකට හෙළිදරව් කළයුතු වන අයභාර තොරතුරු අතර සම්බන්ධතාවය මුල්‍ය ප්‍රකාශන පරිශීලකයන්ට අවබෝධ කර ගැනීමට හැකිවනු පිණිස අස්තිත්ත්වයක් ප්‍රමාණවත් තොරතුරු හෙළිදරව් කළ යුතුය.

**ගිවිසුම් ශේෂ**

116. අස්තිත්ත්වයක් විසින් පහත දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) වෙනත් ලෙසකින් වෙනම ඉදිරිපත් කර හෝ හෙළිදරව් කර නොමැති නම් ලැබිය යුතු දෑවල, ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින් ගිවිසුම් වත්කම සහ ගිවිසුම් වගකීම්වල ආරම්භක හා අවසාන ශේෂයන් ;

(ආ) කාලපරිච්ඡේදය ආරම්භයේදී ගිවිසුම් වගකීම් ශේෂයන්හි ඇතුළත් කර ඇති වාර්තාකරණ කාලපරිච්ඡේදයේ හඳුනාගත් අයභාරය ; සහ

(ඇ) කලින් කාලපරිච්ඡේදවල (උදාහරණ වශයෙන් ගණුදෙනු මිලේ වෙනස්වීම්) සපුරාලන ලද ඉටු කිරීම් බැඳීම් (හෝ අර්ධ වශයෙන් සපුරාලනලද) වලින් වාර්තා කරන කාලපරිච්ඡේදයේ හඳුනාගත් අයභාරය

117. අස්තිත්ත්වයක ඉටු කිරීම් බැඳීම් (119 (අ) ඡේදය බලන්න) සපුරාලීමේ කාලනීර්ණය ගෙවීම්වල නියම කාලනීර්ණයට සම්බන්ධ වන්නේ කෙසේද (119(අ) ඡේදය බලන්න) සහ ගිවිසුම් වත්කමක සහ ගිවිසුම් වගකීමක ශේෂ මත ඇති එම සාධකවල බලපෑම අස්තිත්ත්වය පැහැදිලි කළ යුතුය. ලබාදෙන පැහැදිලි කිරීම් ගුණාත්මක තොරතුරු භාවිතා කළ හැකිය.

118. වාර්තා කරන ලද කාලපරිච්ඡේදය තුළදී ගිවිසුම් වත්කම් සහ ගිවිසුම් වගකීම් ශේෂ තුළ සැලකිය යුතු අන්දමේ වෙනස්වීම්වල පැහැදිලි කිරීමක් අස්තිත්ත්වය සැළසිය යුතුය. මෙම පැහැදිලි කිරීමට ගුණාත්මක සහ ප්‍රමාණාත්මක තොරතුරු ඇතුළත් විය යුතුය. පහත සඳහන් ඕනෑම දෙයක් අස්තිත්ත්වයේ ගිවිසුම් වත්කම් සහ ගිවිසුම් වගකීම්වල ශේෂයන්ගේ වෙනස්වීම් පිළිබඳ උදාහරණයන්ට ඇතුළත්ය.

(අ) ව්‍යාපාර සංයෝජනය නිසා වෙනස්වීම්.

(ආ) ප්‍රගතිය මැනීමේදී වන වෙනසකින් පැන නගින ගැළපුම්, ගණුදෙනු මිලේ ඇස්තමේන්තුව වෙනස්වීම (විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තුව බලකරන ලද්දේ දැයි ඇස්තමේන්තුවේ යම් වෙනසක් ඇතුළුව) හෝ ගිවිසුම වෙනස් කිරීම ඇතුළුව අනුරූපී ගිවිසුම් වත්කමට හෝ ගිවිසුම් වගකීමට බලපාන අයභාරයට සමුච්චිත සම්පවීමේ ගැළපුම්,

(ඇ) ගිවිසුමේ වත්කම් හානිකරණය

(ඈ) ප්‍රතිෂ්ඨාවකට හිමිකමක් කොන්දේසි රහිත වීමට බලපාන කාලරාමුවේ වෙනසක් (එනම් ගිවිසුම් වත්කමක්, ලැබිය යුතු දෑ ලෙස ප්‍රතිවර්ගීකරණය කිරීම); සහ

(ඉ) ඉටු කිරීමේ බැඳීමක් සපුරාලීමට කාලරාමුවේ වෙනසක් (එනම් ගිවිසුම් වගකීමකින් පැන නගින අයභාරය හඳුනා ගැනීම සඳහා).

**ඉටු කිරීමේ බැඳීම්**

119. පහත සියලු දේවල් විස්තරයක් සහිතව ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වල එහි ඉටු කිරීම් බැඳීම් පිළිබඳව තොරතුරු අස්තිත්ත්වයක් විසින් හෙළිදරව් කළ යුතුය.

(අ) බිල්කර - රඳවා ගැනීමේ එකගවීම ඉටු කිරීම බැඳීම් සපුරාලීම ඇතුළත්ව නියම වශයෙන් එහි ඉටුකිරීම් බැඳීම් සපුරාලන ලද්දේ කුමන විටකදී (උදාහරණ වශයෙන් නැවෙන් බඩු යැවීම මත, භාරදීම මත, සේවා ලබා දුන් විට හෝ සේවාව සම්පූර්ණ කිරීම මත) ;

(ආ) වැදගත් ගෙවීම් කොන්දේසි (උදාහරණ වශයෙන්, නියම වශයෙන් ගෙවීම ගෙවිය යුතු වන්නේ කවදාද, ගිවිසුමට සැළකිය යුතු අන්දමේ මුල්‍යන සංරචකයක් තිබේද, ප්‍රතිෂ්ඨාවේ වටිනාකම විචල්‍යද, සහ 56 - 58 ඡේද ප්‍රකාරව විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තුව නියම වශයෙන් බල කරන ලද්දේ);

(ඇ) භාණ්ඩ හෝ සේවා හුවමාරුව සඳහා වෙනත් පාර්ශවයක් සමඟ එකගවීමක් (එනම් අස්තිත්ත්වය නියෝජිතයකු ලෙස ක්‍රියාකිරීම) යම් ඉටු කිරීමේ බැඳීම් මතු කර දක්වමින් අස්තිත්ත්වය විසින් පැවරීමට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවාවල ස්වභාවය

(ඈ) ආපසු එවුම් සඳහා බැඳීම් සහ ආපසු ගෙවීම් හා සමාන වෙනත් බැඳීම්; සහ

(ඉ) ප්‍රතිඥාභාරවල වර්ග සහ සම්බන්ධිත බැඳීම්

**ඉතිරි ඉටුකිරීමේ බැඳීම්වලට ගණුදෙනු මිල වෙන් කිරීම**

120. අස්තිත්ත්වයක් එහි ඉතිරි බැඳීම් ඉටු කිරීම් සම්බන්ධයෙන් පහත සඳහන් තොරතුරු හෙළිදරව් කළ යුතුය.

(අ) වාර්තාකරණ කාල පරිච්ඡේදය අවසානයේදී සපුරා නොමැති (හෝ අර්ධ වශයෙන් සපුරා නොමැති) ඉටු කිරීමේ බැඳීම්වලට වෙන් කළ ගණුදෙනු මිලේ සමාහාර වටිනාකම; සහ

(ආ) 120 (අ) ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ වට්නාකම් අයහාරයක් ලෙස අස්තිත්ත්වය හඳුනා ගැනීමට අපේක්ෂා කරන්නේ කවර විටකද යන්න පිළිබඳ පැහැදිලි කිරීමක්, එය අස්තිත්ත්වය පහත සඳහන් ඕනෑම ආකාරයකට හෙළිදරව් කළ යුතුය.

(i) ඉතිරි බැඳීම් ඉටු කිරීම සඳහා වඩාත් උචිත වියහැකි කාල සමූහ භාවිත කරමින් ප්‍රමාණාත්මක පදනම මත; හෝ

(ii) ගුණාත්මක තොරතුරු භාවිත කරමින්

121. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස පහත දක්වෙන කොන්දේසිවලින් එකක් හො සපුරා ලන්නේ නම් අස්තිත්ත්වයන් ඉටු කිරීමේ බැඳීමක් සඳහා 120වන ඡේදයේ වන තොරතුරු හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ.

(අ) ඉටු කිරීමේ බැඳීම අවුරුද්දක් හෝ ඊට අඩු මුල් අපේක්ෂිත කාලසීමාව ඇති ගිවිසුමක කොටසක්වීම; හෝ

(ආ) ඉටු කිරීමේ බැඳීම සපුරාලීමෙන් වන අයහාරය අස්තිත්ත්වය ආ 16 ඡේදය ප්‍රකාරව හඳුනා ගැනීම.

122. 121 ඡේදයේ වන ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගුණාත්මකව එය විසින් ව්‍යවහාර කරන්නේ ද සහ ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම් වලින් යම් ප්‍රතිෂ්ඨාවන් ගණුදෙනු මිලේ ඇතුළත් කර නැද්ද සහ එම නිසා 120 ඡේදය ප්‍රකාරව හෙළිදරව් කළ යුතු තොරතුරු ඇතුළත් නොකර ඇති බව අස්තිත්ත්වය පැහැදිලි කළ යුතුය. උදාහරණ ලෙස ගණුදෙනු මිලේ ඇස්තමේන්තුවක බල කරන ලද විචල්‍යය යම් ඇස්තමේන්තුවක වට්නාකම් ඇතුළත් නොවිය හැකිය. (56 - 58 ඡේද බලන්න)

**මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේදී වන වැදගත් විනිශ්චයන්**

123. ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින් වන අයහාරයේ කාල නිර්ණය සහ වට්නාකම නිර්ණය කිරීමේදී සැලකිය යුතු අන්දමින් බලපෑ, මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේදී ගනු ලැබූ විනිශ්චයන් හෝ විනිශ්චයන්ගේ වෙනස්වීම් අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය. විශේෂයෙන්ම පහත සඳහන් දෑ දෙකම නිර්ණය කිරීමේදී භාවිතා කළ විනිශ්චයන් සහ විනිශ්චයන්ගේ වෙනස්වීම් අස්තිත්ත්වය පැහැදිලි කළ යුතුය.

(අ) ඉටු කිරීමේ බැඳීම් සපුරාලීම් කාල නිර්ණය (124-125 ඡේද බලන්න); සහ

(ආ) ගණුදෙනු මිල සහ ඉටු කිරීමේ බැඳීම්වලට වෙන් කළ වට්නාකම් (126 ඡේද බලන්න)

**ඉටු කිරීම් බැඳීම් සපුරාලීමේ කාල නිර්ණය කිරීම**

124. කාලයක් පුරා අස්තිත්ත්වය සපුරාලන ලද ඉටු කිරීම් බැඳීම් සඳහා අස්තිත්ත්වයක් පහත සඳහන් දෑ දෙකම අස්තිත්ත්වය හෙළිදරව් කළ යුතුය.

(අ) අයහාරය හඳුනාගැනීමට භාවිතාකළ ක්‍රම (උදාහරණ වශයෙන් භාවිත කළ නිමවුම් ක්‍රම හෝ යෙදවුම් ක්‍රම පිළිබඳ විස්තරයක් හා එම ක්‍රම ව්‍යවහාර කළේකෙසේද යන්න පිළිබඳව විස්තරයක්) ; සහ

(ආ) භාවිත කළ ක්‍රම පැවරූ භාණ්ඩ හෝ සේවාවල විශ්වසනීය නිරූපණයක් ලබාදෙන්නේ මන්දැයි පැහැදිලි කර දීමක්

125. නියමිත වේලාවක සපුරාලන ලද ඉටු කිරීමේ බැඳීම් සඳහා එකඟ වූ භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරු පාලනය ලබා ගන්නේ කුමන වේලාවේද යන්න අගය කිරීමේදී ගනු ලැබූ වැදගත් විනිශ්චයක් අස්තිත්ත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

**ගණුදෙනු මිල ඉටු කිරීමේ බැඳීම්වලට වෙන්කළ වට්නාකම නිර්ණය කිරීම**

126. අස්තිත්ත්වය විසින් පහත සඳහන් සියළු දේ සඳහා භාවිතා කළ ක්‍රම, යෙදවුම් සහ උපකල්පන හෙළිදරව් කළ යුතුය.

(අ) ගණුදෙනු පිරිවැය නිර්ණය කිරීම, එයට ඇතුළත්වන, එහෙත් ඒවාට පමණක් සීමා නොවනදෑ වනුයේ විචල්‍ය ප්‍රතිෂ්ඨාව ඇස්තමේන්තු කිරීම, මුදලේ කාල වට්නාකමේ බලපෑම් සඳහා ප්‍රතිෂ්ඨාව ගැළපීම සහ මූල්‍ය නොවන ප්‍රතිෂ්ඨාව මැනීම ;

(ආ) විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තුව බල කරන ලද දැයි නිර්ණය කිරීම ;

(ඇ) පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා සඳහා තනි තනි පදනම් විකුණුම් මිල ගණන් ඇස්තමේන්තු කිරීම සහ වට්ටම් වෙන්කිරීම සහ ගිවිසුමේ නිශ්චිත කොටසකට (අදාළ වත්කමක් පමණක්) විචල්‍ය ප්‍රතිෂ්ඨාව වෙන් කිරීම ඇතුළුව, ගණුදෙනු මිල වෙන් කිරීම;

සහ

(ඈ) ආපසු එවුම්, ආපසු ගෙවීම් සහ වෙනත් සමාන බැඳීම් සඳහා බැඳීම් මැනීම

**ගණුදෙනුකරුවෙක් සමඟවන ගිවිසුමක් ලබාගැනීමට හෝ සම්පූර්ණ කිරීමේ පිරිවැය මගින් වත්කම් හඳුනා ගැනීම**

127. අස්තිත්ත්වය පහත සඳහන් දැවල් දෙකම විස්තර කළ යුතු ය.

(අ) ගණුදෙනුකරුවෙක් සමඟවන ගිවිසුමක් ලබා ගැනීමට හෝ සම්පූර්ණ කිරීමට දරණ පිරිවැයේ වටිනාකම නිර්ණය කිරීමේ දී ගනු ලැබූ විනිශ්චයන් (91 හෝ 95 ඡේදය ප්‍රකාරව); සහ

(ආ) සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් සඳහා ක්‍රම ක්ෂය කිරීමේ දී එය භාවිතා කළක්‍රමය.

128. අස්තිත්ත්වයක් පහත සඳහන් සියල්ලම හෙළිදරව් කළ යුතු ය.

(අ) වත්කමේ ප්‍රධාන ප්‍රභේද මගින් (උදාහරණ වශයෙන් ගණුදෙනුකරු සමඟ ගිවිසුමක් ලබා ගැනීමට වූ පිරිවැය, ගිවිසුමට පෙර පිරිවැය සහ සංවිධානය කිරීමේ පිරිවැය) ගණුදෙනුකරුවකු සමඟවන ගිවිසුමක් ලබා ගැනීමට හෝ සම්පූර්ණ කිරීමට දරූ පිරිවැයෙන් හඳුනාගත් වත්කම්වල අවසාන ශේෂ (91 හෝ 95 ඡේදය ප්‍රකාරව); සහ

(ආ) වාර්තාකරණ ලද කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් ක්‍රම ක්ෂය ප්‍රමාණය සහ යම්හානිකරණ පාඩු.

**ප්‍රායෝගික ක්‍රියාමාර්ග**

129. අස්තිත්ත්වයක් එක්කෝ 63 වන ඡේදය (සැළකිය යුතු අන්දමේ මුල්‍යකරණ සංරචකයක් පැවැත්ම පිළිබඳව) හෝ 94 වන ඡේදයේ (ගිවිසුමක් ලබා ගැනීමේ වර්ධනය වන පිරිවැය පිළිබඳ) ප්‍රායෝගික ක්‍රියාමාර්ග භාවිත කිරීමට තෝරාගතහොත් අස්තිත්ත්වය එම කරුණ හෙළිදරව් කළ යුතු ය.

## අ පරිශිෂ්ඨය

### නිර්වචිත පද

*මෙම පරිශිෂ්ඨය මෙම ප්‍රමිතයේ වැදගත් කොටසකි*

| | |
|---|---|
| **ගිවිසුම** | පාර්ශව දෙකක් හෝ ඊට වැඩි ගණනක් අතර ඇතිවන බලාත්මක කළහැකි හිමිකම් සහ බැඳීම් ඇතිකරන එකඟවීමක්. |
| **ගිවිසුම් වත්කම** | අස්තිත්ත්වය **ගණුදෙනුකරුවෙකුට** මාරු කළ භාණ්ඩ හෝ සේවාවල හිලව්වට හුවමාරුවන ප්‍රතිෂ්ඨාවේ අස්තිත්ත්වයේ අයිතිය කාල ඡේදයේ ඇවෑමෙන් හැර වෙනත් කිසියම් දෙයකින් තත්ත්වාරෝපණය වී තිබෙන කල්හි (උදාහරණ වශයෙන් අස්තිත්ත්වයේ අනාගත කාර්යසාධනය වැනි). |
| **ගිවිසුම් වගකීම්** | ගණුදෙනුකරුවෙකුගෙන් අස්තිත්ත්වයට ලැබුණ ප්‍රතිෂ්ඨාව (හෝ ලැබිය යුතු වටිනාකම) සඳහා **ගණුදෙනුකරුවකුට** පැවරිය යුතු භාණ්ඩ හෝ සේවාවන්ට අස්තිත්ත්වයේ බැඳීම. |
| **ගණුදෙනුකරු** | ප්‍රතිෂ්ඨාවක් සඳහා හුවමාරුවන අස්තිත්ත්වයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් නිමවුම වන භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම සඳහා අස්තිත්වය සමඟ ගිවිසුම් ගත පාර්ශවයක්. |

| | |
|---|---|
| ආදායම | ස්කන්ධ සහභාගීවන්නන්ගෙන් වන දායකවීම්වලට සම්බන්ධවන දේවල් හැර, ස්කන්ධය වැඩිවීම ප්‍රතිඵලයක්වන ගිණුම්කරණ කාලපරිච්ඡේදයක් තුළ ගලා ඒම් හෝ වත්කම් වැඩි කිරීම හෝ වගකීම් අඩුවන ආකාරයෙන් වන ආර්ථික ප්‍රතිලාභවල වැඩිවීම. |
| ඉටු කිරීම් බැඳීම් | **ගණුදෙනුකරුවකු** සමගවන **ගිවිසුමක** ගණුදෙනුකරුට එක්කෝ<br>(අ) නිශ්චිතවන භාණ්ඩ හෝ සේවා (හෝ භාණ්ඩ හෝ සේවා පොදියක්); හෝ<br>(අ) බොහෝ දුරට එක හා සමානවන සහ එකම හැඩයක් ඇති භාණ්ඩ හෝ සේවා පෙළක් ගණුදෙනුකරුට පැවරීමට වන ගිවිසුමක් ඇති පොරොන්දුවකි. |
| අයභාරය | අස්තිත්ත්වයේ ක්‍රියාවලියේ දී සාමාන්‍ය ක්‍රියාකාරකම් වලින් පැන නගින ආදායම |
| තනි තනි පදනමේ විකුණුම් මිල (භාණ්ඩ හෝ සේවා සඳහා) | එකඟ වූ භාණ්ඩයක් හෝ සේවාවක් **ගණුදෙනුකරුවෙකුට** වෙනම විකිණීමේදී අස්තිත්ත්වයට විකිණිය හැකි මිල |
| ගණුදෙනු මිල (ගනුදෙනුකරුවෙක් සමඟ වන ගිවිසුමක් සඳහා) | තුන්වන පාර්ශවය ඒ වෙනුවෙන් එකතුකරගත් වටිනාකම් හැරෙන්නට ගනුදෙනුකරුවෙකුට පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පැවරීම සඳහා වන හුවමාරුවට අස්තිත්ත්වය අපේක්ෂා කළ හැකි හිමිකම සඳහාවන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම. |

**ආ පරිශිෂ්ඨය**

**ව්‍යවහාරකරණ උපදේශන**

*මෙම පරිශිෂ්ඨය ප්‍රමිතයේ වැදගත් කොටසකි. එය ඡේද 1 - 129 දක්වා ව්‍යවහාරකරණය විස්තර කරන අතර ප්‍රමිතයේ වෙනස් කොටස් හා සමාන අධිකාරියක් මෙයටද ඇත.*

ආ1 මෙම ව්‍යවහාරකරණ උපදේශනය පහත සඳහන් ප්‍රභේදවලට සකස් කෙරේ.

(අ) කාලසීමාවක් පුරා සපුරාලන ලද ඉටු කිරීම් බැඳීම් (ආ 2 - ආ 13 ඡේද);

(ආ) බැඳීම් වගකීම් සම්පූර්ණ සපුරාලීම කෙරෙහි ප්‍රගතිය මැනීම සඳහා ක්‍රම (ආ 14 - ආ 19 ඡේද)

(ඇ) ආපසු එවිටම අයිතියක් සහිත විකුණුම් (ආ 20 - ආ 27 ඡේද);

(ඈ) ප්‍රතිඥාභාර (ආ 28 - ආ 33 ඡේද)

(ඉ) ප්‍රධානියාට එරෙහිව නියෝජිත සැළකිල්ලට ගැනීම (ආ 34 - ආ 38 ඡේද);

(ඊ) අමතර භාණ්ඩ හෝ සේවාවන් සඳහා ගණුදෙනුකරු විකල්ප (ආ 39 - ආ 43 ඡේද);

(උ) ගණුදෙනුකරුගේ ක්‍රියාත්මක නොකළ හිමිකම් (ආ 44 - ආ 47 ඡේද)

(ඌ) ආපසු නොගෙවිය යුතු කලින් දෙන ගාස්තු (සහ සම්බන්ධිත සමහර පිරිවැය) (ආ 48 - ආ 51 ඡේද);

(එ) බලපත්‍ර (ආ 52 - ආ 63 ඡේද);

(ඒ) ප්‍රතිමිලදී ගැණුම් ගිවිසුම් (ආ 64 - ආ 76 ඡේද);

(ඔ) නියෝජන පිළිවෙළ (ආ 77 - ආ 78 ඡේද);

(ඕ) බිල්කර රඳවා ගැනීමේ පිළිවෙළ (ආ 79 - ආ 82);

(අආ) ගණුදෙනුකරු පිළිගැනීම (ආ 83 - ආ 86 ඡේද); සහ

(අආ) කොටස්වලට විසුරුවන ලද අයභාරයේ හෙළිදරව් කිරීම (ආ 87 - ආ 89)

**කාල සීමාවන් පුරා ඉටු කිරීම් බැඳීම් සපුරාලීම**

ආ2 35 වන ඡේදය ප්‍රකාරව පහත සඳහන් නිර්ණායක වලින් එකක් ඉටු වන්නේ නම් ඉටු කිරීමේ බැඳීම් කාලසීමාවන් පුරා සපුරාලයි.

(අ) අස්තිත්ත්වය ඉටුකරන විට (ආ 3 - ආ 4 ඡේද බලන්න) අස්තිත්ත්වයේ ඉටු කිරීමෙන් සළසන ප්‍රතිලාභ ගණුදෙනුකරු සමගාමීවලබාගෙන පරිභෝජනය කරයි.

(ආ) වත්කම් ඇතිකළ විට හෝ වැඩි දියුණුකළවිට (ආ 5 ඡේදය බලන්න) ගණුදෙනුකරු පාලනය කරන අස්තිත්ත්වයේ ඉටු කිරීම් ඇතිකරන හෝ වැඩිදියුණු කළ වත්කමක් (උදාහරණ ලෙස නොනිමි වැඩ); හෝ

(ඇ) අස්තිත්ත්වයේ ක්‍රියාකාරකම් අස්තිත්වයට විකල්ප භාවිතයක් ඇති වත්කමක් ඇති නොකිරීම (ආ 6 - ආ 8 ඡේද බලන්න) සහ එම දින දක්වා සම්පූර්ණ කළ ඉටුකිරීම් සඳහා වන ගෙවීමට බලාත්මක කළ හැකි අයිතියක් අස්තිත්වයකට තිබීම (ආ 9 - ආ 13 ඡේද බලන්න)

**අස්තිත්ත්වයේ ඉටු කිරීම්වල ප්‍රතිලාභ සමගාමීව ලැබීම සහ පාරිභෝජනය (35 (අ) ඡේදය)**

ආ3 සමහර වර්ගවල ඉටු කිරීම් බැඳීම් සඳහා අස්තිත්ත්වය ඉටු කරන විට අස්තිත්ත්වයේ ඉටු කිරීමෙන් ගණුදෙනුකරු ප්‍රතිලාභ ලබන්නේද සහ එම ප්‍රතිලාභ ලැබූවිට සමගාමීව පාරිභෝජනය කරන්නේද ඇස්තමේන්තු කිරීම සරල විය හැකිය.

සුපුරුදු පරිදි හෝ යළි සිදුවන (පුනරාවර්තන) (පවිත්‍ර කිරීමේ සේවාවක වැනි) ඒවායේ අස්තිත්ත්වයේ ඉටු කිරීමෙන් වන ප්‍රතිලාභ ගණුදෙනුකරු විසින් ලැබීමට සමගාමීව පාරිභෝජනය කිරීම හඳුනාගත හැකි වීම උදාහරණවලට ඇතුළත් වෙයි.

ආ4 අස්තිත්ත්වයක ඉටු කිරීම් වලින් වන ප්‍රතිලාභ ගණුදෙනුකරු සමගාමීව ලැබීම සහ පාරිභෝජනය කරන්නේද යන්න අස්තිත්ත්වය ඉටු කරන වෙනත් වර්ගවල ඉටුකිරීම් බැඳීම් සඳහා අස්තිත්ත්වයට පහසුවෙන් හඳුනාගත නොහැකි විය හැකිය. ගණුදෙනුකරුවෙකුට ඉතිරි ඉටු කිරීම් බැඳීම් වෙනත් අස්තිත්ත්වයක් විසින් සම්පූර්ණ කිරීමට ඇති විටක අස්තිත්ත්වය මේතාක් නිම කළ වැඩ වෙනත් අස්තිත්ත්වයක් සැහෙන ප්‍රමාණයකට යළි ඉටු කිරීම අවශ්‍ය නොවන්නේ යැයි අස්තිත්ත්වය තීර්ණය කළහොත්, එවැනි තත්ත්වයන්හිදී කාලසීමාවක් පුරා අස්තිත්ත්වය ඉටු කිරීමේ බැඳීම සපුරා ඇත.

අස්තිත්ත්වය මේතාක් නිමකළ වැඩ වෙනත් අස්තිත්ත්වයක් සැහෙන ප්‍රමාණයකට යළි ඉටුකිරීම අවශ්‍ය නොවේ යන්න තීර්ණය කිරීමේදී, අස්තිත්ත්වය විසින් පහත සඳහන් උපකල්පන දෙකම කළ යුතු ය.

(අ) අස්තිත්ත්වයෙන් ඉතිරි ඉටු කිරීම් බැඳීම් වෙනත් අස්තිත්ත්වයටපැවරීම අන්වශයෙන් වළක්වන අනාගතයේදී සිදුවන ගිවිසුම්ගත සීමාවන් හෝ ප්‍රායෝගික සීමාවන් නොසළකා හැරීම.

(ආ) ඉටු කිරීම් බැඳීම් වෙනත් අස්තිත්වයකට පැවරීමට සිදුවන්නේ නම් අස්තිත්ත්වය විසින් වර්තමානයේදී පාලනය කරනු ලබන ඕනෑම වත්කමක ප්‍රතිලාභ ඉටුකිරීම් බැඳීම් ශේෂය සම්පූර්ණකරන එම වෙනත් අස්තිත්ත්වයට නොලැබෙන බව සහ ඒවා දිගටම අස්තිත්ත්වයේ පාලනයේ පවතින බවත් අනුමාන කෙරේ.

**වත්කමක් ඇති කරනවිට හෝ එහි අගය වැඩි දියුණුකරන විට ගණුදෙනුකරු පාලනය කිරීම (35 (ආ) ඡේදය)**

ආ5 35 (ආ) ඡේදය ප්‍රකාරව වත්කම ඇතිකරන විටම හෝ එහි අගය වැඩි කරන විට ගණුදෙනුකරු පාලනය කරයිද යන්න තීර්ණය කිරීමට අස්තිත්ත්වය 31-34 සහ 38 ඡේදවල පාලනය සඳහා අවශ්‍යතාවයන් අස්තිත්ත්වය ව්‍යවහාර කළ යුතුය. ඇති කරන ලද හෝ වැඩි දියුණු කරන ලද වත්කම (උදාහරණ ලෙස නොනිමි වැඩ) එක්කෝ ස්පෘශ්‍ය හෝ අස්පෘශ්‍ය විය හැකිය.

**අස්තිත්ත්වයේ ඉටුකිරීම් විකල්ප භාවිතයක් සහිත වත්කමක් ඇති නොකිරීම (35 (ඇ) ඡේදය)**

ආ6 36 වන ඡේදය ප්‍රකාරව වත්කමකින් අස්තිත්ත්වයට විකල්ප භාවිතයක් ඇද්දැයි තක්සේරු කිරීමේදී ගිවිසුම් ගත සීමා කිරීම්වල බලපෑම් සහ එය වෙනත් ගණුදෙනුකරුවෙකුට විකිණීම වැනි, වෙනත් භාවිතයක් සඳහා පහසුවෙන් එම වත්කම යොමු කිරීමට අස්තිත්වයේ හැකියාව මත වන ප්‍රායෝගික සීමාවන් අස්තිත්ත්වයක් විසින් සළකා බැලිය යුතුය. වත්කම වෙනත් භාවිතයක්

සඳහා පහසුවෙන් මෙහෙයවීම අස්තිත්ත්වයට හැකිවේද යන්න ඇස්තමේන්තු කිරීමේදී ගණුදෙනුකරු සමඟ ඇති ගිවිසුම අවසන් කිරීමේ හැකියාව අදාළ ප්‍රතිෂ්ඨාවක් නොවේ.

ආ7 වත්කමක් වෙනත් භාවිතයක් සඳහා යොමු කිරීමට අස්තිත්ත්වය සතු හැකියාවෙහි ගිවිසුම්ගත සීමා කිරීමක් වෙතොත් එය වත්කම අස්තිත්ත්වය සඳහා විකල්ප භාවිතයකට ගත නොහැකි තරම් සැළකිය යුතු එකක් විය යුතුය. වත්කම වෙනත් භාවිතයක් සඳහා යොමු කිරීමට අස්තිත්ත්වය ඉල්ලා සිටින්නේ නම්, ගණුදෙනුකරුට එහි අයිතීන් සඳහා එකඟ වූ වත්කමට බලාත්මක කිරීමට හැකිනම් ගිවිසුම් ගත සීමා කිරීමක් සැළකිය යුතු තරම් වේ. උදාහරණ ලෙස ගිවිසුම කඩ නොකරමින් වෙනත් ගණුදෙනුකරුවෙකුට අස්තිත්ත්වය පැවරිය හැකි වත්කම විශාල වශයෙන් වෙනස් වත්කම් සමඟ හුවමාරු කරගත හැකි නම් සහ එම ගිවිසුම සම්බන්ධව වෙනත් ලෙසකින් නොදරනු ලැබිය හැකියාවූ, සැළකිය යුතු අන්දමින් පිරිවැය නොදරන්නේ මෙයට ප්‍රතිවිරුද්ධ වශයෙන් ගිවිසුම් ගත සීමා කිරීම සැළකිය යුතුතරම් වේ.

ආ8 වත්කම වෙනත් භාවිතයකට මෙහෙයවීමට අස්තිත්ත්වය සැළකිය යුතු අන්දමේ ආර්ථික පාඩු දැරීමට සිදුවිය හැකිනම් වත්කම වෙනත් භාවිතයක් සඳහා අස්තිත්ත්වයේ මෙහෙයවීමේ හැකියාව මත ප්‍රායෝගික සීමාවක් පවතී. අස්තිත්ත්වය එක්කෝ සැළකිය යුතු අන්දමේ පිරිවැයක් වත්කම අලුතෙන් සකස් කිරීමට දැරීමට වීම හෝ සැළකිය යුතු අන්දමේ පාඩුවකට පමණක් වත්කම විකිණීමට සිදුවිය හැකි හේතුව නිසා සැළකිය යුතු අන්දමේ ආර්ථික පාඩුවක් පැන නැගිය හැකිය. උදාහරණ වශයෙන් වත්කමේ එක්කෝ සැළසුම් පිරිවිතර පිළියෙල කර ඇත්තේ ගණුදෙනුකරුට අනන්‍යවන ලෙස හෝ පිහිටා ඇත්තේ දුරස්ථ ප්‍රදේශවල වීම නිසා වත්කම් වෙනතකට යොමු කිරීමට අස්තිත්ත්වයක් ප්‍රායෝගිකව සීමා සහිත විය හැකිය.

**මෙතෙක් නිමකළ ඉටුකිරීම් සඳහා ගෙවීමට හිමිකම (35 (ඇ) ඡේදය)**

ආ9 එකඟවූ පරිදි ඉටුකිරීමට අස්තිත්ත්වයේ අසමත්කම නිසා හැර අන් හේතුවක් නිසා ගණුදෙනුකරු හෝ වෙනත් පාර්ශවයක් ගිවිසුම අවසන් කරන අවස්ථාවකදී එදින දක්වා එහි සම්පූර්ණ කළ ඉටුකිරීම සඳහා වටිනාකමකට අස්තිත්ත්වය අඩු කරමින් හානිපූර්ණය කිරීම අස්තිත්ත්වය හිමිකම් ලබන්නේ නම්, එදින දක්වා සම්පූර්ණ කළඉටු කිරීම් සඳහා ගෙවීමකට 37 ඡේදය ප්‍රකාර අස්තිත්ත්වයට හිමිකමක් ඇත. ගිවිසුම අවසන් කරන ලද්දේ නම් අස්තිත්ත්වයට විභව්‍ය වශයෙන් අත්විදීමට සිදුවන ලාභයේ අඩුවීම පමණක් හානිපූර්ණයකට වඩා මේ දක්වා සම්පූර්ණ කළ ඉටු කිරීම වෙනුවෙන් අස්තිත්ත්වය හානිපූර්ණය කරනු ලබන්නේ මේ දක්වා පවරන ලද භාණ්ඩ හා සේවාවන්හි විකුණුම්වලට ආසන්න ප්‍රමාණයකිනි. (උදාහරණ වශයෙන් ඉටුකිරීම් බැඳීම සපුරාලීමෙහිලා අස්තිත්ත්වයක් විසින් දරණ ලැබූ පිරිවැයට සාධාරණ ලාභ ආන්තිකයක් සමඟ අය කර ගැනීම.)

සාධාරණ ලාභ ආන්තිකය සඳහා හානිපූර්ණය එකඟ වූ ලෙස ගිවිසුම නිම කළේ නම් එම අපේක්ෂිත ලාභ ආන්තිකයට සමාන විය යුතු නොවේ. එහෙත් අස්තිත්ත්වය පහත සඳහන් වටිනාකම්වලින් එකක් හානිපූර්ණය සඳහා හිමිකම් ලැබිය යුතුය.

(අ) ගණුදෙනුකරු (හෝ වෙනත් පාර්ශ්වය) ගිවිසුම අවසන් කිරීමට පෙර ඒ යටතේ අස්තිත්ත්වයේ ඉටු කිරීමේ සාධාරණව පිළිබිඹුවන ප්‍රමාණයට, ගිවිසුමේවන අපේක්ෂිත ලාභ ආන්තිකයෙන් සමානුපාතිකයක්; හෝ (ආ) සමාන ගිවිසුම් වලින් සාමාන්‍යයෙන් අස්තිත්වයේ උත්පාදනයවන ප්‍රතිලාභයට වඩා ගිවිසුමේ නිශ්චිත ආන්තිකය වැඩිනම්, ඒ හා සමාන ගිවිසුම් වල අස්තිත්ත්වයේ ප්‍රාග්ධනයේ පිරිවැය මත සාධාරණ ප්‍රතිලාභයක් (හෝ සමාන ගිවිසුම් සඳහා අස්තිත්ත්වයේ නියම මෙහෙයුම් ආන්තිකය)

ආ10 මෙතෙක් සම්පූර්ණ කළ ඉටු කිරීම් සඳහා ගෙවීමට ඇති අස්තිත්ත්වයේ හිමිකම වර්තමානයේ ගෙවීමට වන කොන්දේසි රහිත හිමිකමක් නොවේ. බොහෝ අවස්ථාවලදී ගෙවීමට අස්තිත්ත්වයට කොන්දේසි රහිත හිමිකමක් තිබිය හැක්කේ ගිවිසුමේ එකඟවීම් මත වූ යම් වැදගත් අවස්ථාවක් ඉටු කිරීමට හෝ ඉටු කිරීම් බැඳීම් සම්පූර්ණ සපුරාලීම මත පමණි. මෙතෙක් සම්පූර්ණකළ ඉටු කිරීම් සඳහා ගෙවීම් වලට හිමිකමක් අස්තිත්ත්වයට තිබේදැයි තක්සේරු කිරීමේදී එකඟ වූ පරිදි ඉටු කිරීමට අස්තිත්ත්වය අපොහොසත් වූ කරුණ හැර අන් කරුණු නිසා ගිවිසුම නිම කිරීමට හෝ එය අවසන් කිරීමට සිදුවුවහොත් මෙතෙක් සම්පූර්ණ කළ ඉටු කිරීම සඳහා ගෙවීමක් ඉල්ලීමට හෝ රඳවා ගැනීමට එයට බලාත්මක කළ හැකි අයිතියක් තිබිය හැකිද යන්න අස්තිත්ත්වය විසින් සළකා බැලිය යුතුය.

ආ11 සමහර ගිවිසුම්වල ගිවිසුමේ ජීවකාලය තුළ (සක්‍රීයව පවතිනතාක්) පැහැදිලිව සඳහන් කර ඇති කාල තුළදී පමණක් ගණුදෙනුකරුවකුට ගිවිසුම අවසන් කිරීමේ අයිතිය තිබිය හැකි වීම හෝ ගණුදෙනුකරුට ගිවිසුම අවසන් කිරීමට කිසිදු අයිතියක් නොතිබීමට පුළුවන. එම අවස්ථාවේ (එකඟ වූ පරිදි ගණුදෙනුකරුවෙක් එහි බැඳීම් ඉටුකිරීමට අසමත්වන විට ඇතුළුව) ගිවිසුම අවසන් කිරීමට ගණුදෙනුකරුට අයිතියක් නොමැතිව ගිවිසුමක් අවසන් කිරීමට ගණුදෙනුකරුවෙක් ක්‍රියාකළ

හොත්, ගිවිසුමේ එකග වූ භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට පැවරීම දිගටම පවත්වාගෙන යාමට සහ එම භාණ්ඩ හෝ සේවා හුවමාරුව සඳහා එකගවූ ප්‍රතිෂ්ඨාව ගණුදෙනුකරු ගෙවීමට අවශ්‍ය වීම ගිවිසුමෙන් (හෝ වෙනත් නීතිවලින්) අස්තිත්වයට හිමිකමක් තිබිය හැකිය. එවැනි තත්ත්වයන්හිදී ගිවිසුම ප්‍රකාරව එහි බැඳීම් ඉටු කිරීම් දිගටම කරගෙන යාමට අස්තිත්වයට හිමිකමක් තිබීම සහ ගණුදෙනුකරුට එහි බැඳීම් (එකග වූ ප්‍රතිෂ්ඨාව ගෙවීම එයට ඇතුළුව) ඉටු කිරීම අවශ්‍යකරන නිසාත් මෙතෙක් සම්පූර්ණ කරන ලද ඉටුකිරීම් සඳහා ගෙවීම්වලට හිමිකමක් අස්තිත්වයට ඇත.

ආ12 මේතාක් සම්පූර්ණ කරන ලද ඉටු කිරීම් සඳහා ගෙවීම්වලට හිමිකමේ පැවැත්ම සහ බලාත්මක කිරීම තක්සේරු කිරීමේදී, එම ගිවිසුම්ගත කොන්දේසි පරිපූරක කිරීම හෝ අභිබවා යාහැකි ගිවිසුම්ගත කොන්දේසි මෙන්ම යම් ව්‍යවස්ථාපිත හෝ නෛතික පූර්වාදර්ශ අස්තිත්වය සළකා බැලිය යුතුය.

මෙයට පහත සඳහන් දෑ වන්නේද යන්න තක්සේරු කළ යුතුය.

(අ) ගණුදෙනුකරු සමඟවන ගිවිසුමේ එම හිමිකම පැහැදිලිව සඳහන් කර නැත්තේ නමුදු, මේතාක් ඉටුකිරීම් සඳහා, ව්‍යවස්ථාදායකයෙන්, පරිපාලන පුරුදුවලින්, හෝ ප්‍රදානය කළ නෛතික පූර්වාදර්ශ මත ගෙවීමට අස්තිත්වයේ හිමිකම ;

(ආ) ඒ හා සමාන ගිවිසුම්වල මේතාක් සම්පූර්ණ කළ ඉටුකිරීම් සඳහා ගෙවීම් කිරීමට ඒ හා සමාන බැඳීමක් හා බැඳුණ නෛතික බලපෑමක් නැති බව අදාළ නෛතික පූර්වාදර්ශ ඉඟි කිරීම ; හෝ

(ඇ) අස්තිත්වයේ චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදුවලින් ගෙවීමට ඇති අයිතියක් බලාත්මක නො කිරීමට තෝරා ගැනීමෙන් එම නෛතික පරිසරයේ බලාත්මක නොකර අයිතිවෙන්න හැරීම ප්‍රතිඵලයක් වීම. කෙසේ වෙතත් අස්තිත්වය ඒ හා සමාන ගිවිසුම්වල එහි ගෙවීම් අයිතිය අත්හැරදැමිය හැකිබවේ අස්තිත්වයේ තීරණය නොතකා හැර, ගණුදෙනුකරු සමඟවන ගිවිසුමේ එහි ඉටු කිරීම සඳහා ගෙවීමට ඇති අයිතිය මේ තාක් බලාත්මකව පවතී නම් අස්තිත්වය ඒ දක්වා ගෙවීමට ඇති අයිතිය දිගටම පවත්වාගෙන යා යුතු වීම.

ආ13 ගිවිසුමක පැහැදිලිව සඳහන් කර ඇති ගෙවීම උපලේඛනයේ මේ තාක් සම්පූර්ණ කළ ඉටුකිරීම් සඳහා ගෙවීමට බලාත්මක අයිතියක් අස්තිත්වයකට ඇත්දැයි අවශ්‍යයෙන්ම ගිවිසුමේ සඳහන් නොකෙරේ. ගිවිසුමක ගෙවීම උපලේඛනයේ ගණුදෙනුකරුවකු විසින් ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවේ වටිනාකම සහ කාලනිර්ණය පැහැදිලිව සඳහන් කර ඇති නමුත්, ගෙවීම් උපලේඛනයේ මේ තාක් නිම කළ ඉටුකිරීම් සඳහා ගෙවීම්වලට අස්තිත්වයට ඇති අයිතියට සාක්ෂි අවශ්‍යයෙන්ම ගෙවීම් උපලේඛනය සළසනු නොලබනු විය හැකිය. උදාහරණ වශයෙන් මෙයට හේතු විය හැක්කේ ගණුදෙනුකරුවෙකුගෙන් ලැබුණ ප්‍රතිෂ්ඨාව ගිවිසුමේ එකගවූ පරිදි ඉටු කිරීමට අස්තිත්වය අසමත්වීම හැර අන් හේතු නිසා ආපසු ගෙවිය යුතුයයි ගිවිසුමේ පැහැදිලිව සඳහන් වීම නිසාය.

## ඉටුකිරීමේ බැඳීමක් සම්පූර්ණ සපුරාලීම දෙසට ප්‍රගතිය මැනීම සඳහා ක්‍රම

ආ14 35-37 ඡේද ප්‍රකාරව කාලයක් පුරා සපුරාලන ලද ඉටුකිරීම් බැඳීමක සම්පූර්ණ සපුරාලීම දෙසට අස්තිත්වයේ ප්‍රගතිය මැනීමට භාවිතා කළ හැකි ක්‍රමවලට පහත දෑ ඇතුළත් වේ :-

(අ) නිමවුම් ක්‍රම (ආ 15 -ආ 17 ඡේද බලන්න); සහ

(ආ) යෙදවුම් ක්‍රම (අ 18 - අ 19 ඡේද බලන්න)

### නිමවුම් ක්‍රම

ආ15 ගිවිසුම යටතේ එකග වූ ඉතිරි භාණ්ඩ හෝ සේවාවල සාපේක්ෂව මේ තාක් පැවරූ භාණ්ඩ හෝ සේවාවල ගණුදෙනුකරුට වූ වටිනාකම සෘජුව මැනීමේ පදනම මත නිමවුම් අයභාරය සෘජු ක්‍රම හඳුනා ගනී. නිමවුම් ක්‍රමවලට මේතාක් සම්පූර්ණ කළ ඉටුකිරීම් සමීක්ෂණය කිරීම, අත්කරගත් ප්‍රතිඵල ඇගයීම, ළඟාකරගත් සංවර්ධනයේ වැදගත් අවස්ථාවන්, ගෙවීගිය කාලය, සහ නිෂ්පාදනය කළ ඒකක හෝ භාරදුන් ඒකක වැනි ක්‍රම ඇතුළත් වේ. අස්තිත්වයක ප්‍රගතිය මැනීමට නිමවුම් ක්‍රමය ව්‍යවහාර කළ යුතු දැයි එය අගය කරන විටදී, ඉටු කිරීම් බැඳීම් සම්පූර්ණ සපුරාලීම දෙසට අස්තිත්වයේ ඉටු කිරීම් තෝරාගත් යෙදවුම් විශ්වාසදායක ලෙස නියෝජනය කරනවාද යන්න අස්තිත්වය සළකා බැලිය යුතුය. ගණුදෙනුකරුට පාලනය පැවරූ සමහර භාණ්ඩ හෝ සේවා මැනීමට තෝරාගත් නිමවුම අසමත් වේ නම්, නිමවුම් ක්‍රමය අස්තිත්වය ඉටු කිරීමේ විශ්වාසදායක නිරූපණයක් ලබා නොදෙයි. උදාහරණ වශයෙන් වාර්තා කරන ලද කාල පරිච්ඡේදය අවසානයේදී අස්තිත්වයේ ඉටු කිරීමේ නිෂ්පාදනය කළ ගණුදෙනුකරු විසින් පාලනය කරනු නොලබන නොනිමි වැඩ හෝ නිමි භාණ්ඩ නිමවුම් මැනීමේදී ඇතුළත්

කර නොමැති නම්, නිෂ්පාදනය කළ ඒකක හෝ බෙදාහැරි ඒකක පදනම මත නිමවුම පදනම්, ඉටු කිරිම් බැඳීම් සපුරාලීමේදී අස්තිත්වයේ ඉටුකිරීම සාධාරණ ලෙස නිරූපණය නොවිය හැකිය.

ආ16 ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, මේ තාක් අස්තිත්වය සම්පූර්ණ කළ ඉටු කිරීමට ගණුදෙනුකරුට වන වටිනාකම සමග සෘජුව අනුරූපී වටිනාකමට ගණුදෙනුකරුගෙන් වන ප්‍රතිෂ්ඨාවට අස්තිත්වයට හිමිකමක් ඇත්නම්, (උදාහරණ ලෙස සේවා ගිවිසුමක අස්තිත්වය සෑම පැයකම සපයන ලද සේවාව වෙනුවෙන් ස්ථාවර වටිනාකමක් බිල් කිරීම) අස්තිත්වයට ඉන්වොයිස් කිරීමට අයිතියක් ඇති වටිනාකම අස්තිත්ත්වය අය භාරය ලෙස හඳුනා ගත හැකිය.

ආ17 නිමවුම් ක්‍රමවල අවාසිදායකත්වය වනුයේ ප්‍රගතිය මැනීමට භාවිතා කරන නිමවුම් සෘජුව නිරීක්‍ෂණය කළ නොහැකි වීම සහ ඒවාට ව්‍යවහාර කිරීමට අවශ්‍ය කරන තොරතුරු අධික පිරිවැයක් නොමැතිව අස්තිත්වයට ලබා ගත නොහැකිවීමය. එබැවින් යෙදවුම් ක්‍රමය අවශ්‍ය විය හැකිය.

**යෙදවුම් ක්‍රම**

ආ18 එම ඉටු කිරීම් බැඳීම් සපුරාලීමට අපේක්‍ෂිත මුළු යෙදවුම්වලට සාපේක්‍ෂව ඉටු කිරීමේ බැඳීමක් සපුරාලීමට අස්තිත්වයේ පරිශ්‍රමය හෝ යෙදවුම් පදනම මත යෙදවුම් ක්‍රම අයභාරය හඳුනා ගනී. (උදාහරණ ලෙස පරිභෝජනය කළ සම්පත්, වැය කළ ශ්‍රම පැය, දැරූ පිරිවැය, ගත වූ කාලය හෝ භාවිත කාලය සහ පැය) අස්තිත්ත්වයේ පරිශ්‍රමය හෝ යෙදවුම් ඉටු කිරීමේ කාලය පුරාවටම සමාන ලෙස දැරුවේ නම්, අස්තිත්වය අයභාරය සරල මාර්ගික පදනම මත හඳුනා ගැනීම උචිත විය හැකිය.

ආ19 යෙදවුම් ක්‍රමවල අඩුපාඩුවක් වන්නේ, අස්තිත්වයේ යෙදවුම් සහ භාණ්ඩ හෝ සේවා වල පාලනය ගණුදෙනුකරුවෙකුට පැවරීම අතර සෘජු සම්බන්ධතාවය නොතිබීම විය හැකිය. භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුවෙකුට අස්තිත්වයේ ඉටු කිරීම නිරූපණය නොවන 39 වන ඡේදයේ ප්‍රගතිය මැනීමේ අරමුණ ප්‍රකාරව, යම් යෙදවුම් වල බලපෑම් එමනිසා අස්තිත්වය විසින් යෙදවුම් ක්‍රමයෙන් ඉවත් කළ යුතුය. උදාහරණ ලෙස පිරිවැය - පදනම් යෙදවුම් පදනමක් භාවිතා කරන විට, පහත සඳහන් තත්ත්වයන්හිදී ප්‍රගතිය මැනීමට ගැළපුමක් අවශ්‍ය විය හැකිය.

(අ) ඉටු කිරීම් බැඳීමක් සපුරාලීමේදී, දරණ ලද පිරිවැයක් අස්තිත්වයේ ප්‍රගතියට දායක නොවන විට උදාහරණ ලෙස, ගිවිසුමේ මිළෙහි පිළිබිඹු නොවන අස්තිත්වයේ ඉටුකිරීම්වල සැළකිය යුතු අන්දමේ අකාර්යක්‍ෂමතාවයක් අරෝපණය වන දරණ ලද පිරිවැය මත පදනම්ව අස්තිත්වයක් අයභාරය හඳුනා නොගනී. (උදාහරණ ලෙස ඉටු කිරීමේ බැඳීම් සපුරාලීමට දරන ලද අනපේක්ෂිත වටිනාකම්වල අපතේ යන ද්‍රව්‍ය ශ්‍රම පිරිවැය හෝ වෙනත් සම්පත්)

(ආ) ඉටු කිරීම් බැඳීම් සපුරාලීමේදී අස්තිත්වයේ ප්‍රගතියට දරණ ලද පිරිවැය සමානුපාතික නොවන විට, එවැනි තත්ත්වයන්හිදී අස්තිත්වයේ ඉටු කිරීමේ හොඳම නිරූපණය විය හැක්කේ දරණ ලද පිරිවැය ප්‍රමාණය දක්වා පමණක් අයභාරය හඳුනා ගැනීමට යෙදවුම් ක්‍රමයට ගැලපීම කිරීමය. උදාහරණයක් වශයෙන් පහත සඳහන් සියළුම තත්ත්වයන් ගිවිසුම ආරම්භයේදී අස්තිත්වය සපුරාලනු ඇතැයි අස්තිත්වය අපේක්‍ෂා කරන්නේ නම් අස්තිත්වක් ඉටු කිරීම පිළිබඳව විශ්වාසදායක පිළිබිඹු කිරීම විය හැකි වන්නේ, ඉටු කිරීමේ බැඳීමක් සපුරාලීමට භාවිතා කරන භාණ්ඩවල පිරිවැයට සමාන වටිනාකමක් අයභාරය ලෙස හඳුනා ගැනීමය.

(i) භාණ්ඩ නිශ්චිත නොවීම;

(ii) භාණ්ඩවල සම්බන්ධිත සේවා ලැබීමට පෙර භාණ්ඩවල සැළකිය යුතු අන්දමේ පාලනයක් ගණුදෙනුකරු ලබා ගැනීමට අපේක්‍ෂා කිරීම;

(iii) පැවරූ භාණ්ඩවල පිරිවැය ඉටු කිරීමේ බැඳීම් සම්පූර්ණයෙන් සපුරාලීමට අපේක්‍ෂිත මුළු පිරිවැයට සැහෙන දුරට සාපේක්‍ෂවීම ; සහ

(iv) අස්තිත්වය තුන්වන පාර්ශ්වයකින් භාණ්ඩ ලබාගන්නා අතර එය සැළකිය යුතු අන්දමින් භාණ්ඩ සැළසුම් කිරීමේ සහ නිෂ්පාදනය කිරීම හා සම්බන්ධ නොවේ. (ආ 34 - ආ 38 ඡේද පරිදි අස්තිත්වය ප්‍රධානියකු ලෙස කටයුතු කරයි)

**ආපසු එවීමේ හිමිකම සහිතව විකුණුම්**

ආ20 සමහර ගිවිසුම්වල අස්තිත්වය නිෂ්පාදනයක පාලනය ගණුදෙනුකරුට මාරුකර සහ විවිධ හේතු නිසා නිෂ්පාදනය ආපසු එවීමේ අයිතියද ගණුදෙනුකරුට ප්‍රදානය කරයි. (නිෂ්පාදන සමග තෘප්තිමත් නොවීම වැනි) සහ පහත ඕනෑම සංයෝජනයක් ලබාගනී.

(අ) ගෙවූ ප්‍රතිෂ්ඨාවේ සම්පූර්ණ හෝ අර්ධ ආපසු ගෙවීමක් ;

(ආ) ගෙවීමට බැඳී සිටින ප්‍රමාණවලට හිලව් වශයෙන් හෝ අස්තිත්වයට ගෙවනු ලැබීමට බැඳී ඇති දැට අදාළ කර ගත හැකි බැර කිරීමක් ; සහ

(ඇ) හුවමාරුවක් වශයෙන් වෙනත් නිෂ්පාදනයක්

ආ21 ආපසු එවීමේ අයිතියක් සහිත නිෂ්පාදනයන් හුවමාරුව ගිණුම්ගත කිරීමට සහ (ආපසු එවීමකට යටත්ව සළසනු ලබන සමහර සේවා සඳහා) අස්තිත්වය විසින් පහත සඳහන් සියල්ල හඳුනාගත යුතුය.

(අ) අස්තිත්වය හිමිකම් කීමට අපේක්ෂා කරන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම තුළ වන පැවරූ නිෂ්පාදන සඳහා අයභාරය (එම නිසා ආපසු එවීමට අපේක්ෂා කරන නිෂ්පාදන සඳහා අයභාරය හඳුනා ගත නොලැබිය හැකිය)

(ආ) ආපසු ගෙවීමේ වගකීම ; සහ

(ඇ) ආපසු ගෙවීමේ වගකීම නිදහස් කිරීම මත ගණුදෙනුකරුගෙන් නිෂ්පාදනවල යළි අයිතිය ලබා ගැනීමේ එහි හිමිකම් සඳහා වත්කමක් (සහ විකුණුම් පිරිවැයට අනුරූපී ගැළපුම්)

ආ22 ආපසු එවීමේ කාලය තුළදී ආපසු එවූ නිෂ්පාදනයක් භාර ගැනීමට සූදානම්ව සිටීමට අස්තිත්ත්වයක එකඟවීම, ආපසු ගෙවීම ලබාදීමට වන බැඳීමට අමතරව ඉටු කිරීමේ බැඳීමක් ලෙස ගිණුම්ගත නොකළ යුතුය.

ආ23 අස්තිත්වය හිමිකම් කීමට අපේක්ෂා කරන (එනම් ආපසු එවීමට අපේක්ෂාකරන නිෂ්පාදන හැර) හිමිකමේ වටිනාකම තීර්ණය කිරීමට අස්තිත්වය විසින් 47-72 ඡේදවල අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය. (56 - 58 ඡේදවල විචල්‍ය ප්‍රතිෂ්ඨා ඇස්තමේන්තුවල තදින් සීමා කිරීමේ අවශ්‍යතාවද ඇතුළුව) අස්තිත්වයට හිමිකම් කීමට අපේක්ෂා නොකරන ලැබුණ (ලැබිය යුතු) යම් වටිනාකම් සඳහා ගණුදෙනුකරුට භාණ්ඩ පැවරූ විට අස්තිත්වය අයභාරය හඳුනා නොගත යුතු එහෙත් ලැබුණ (ලැබිය යුතු) එම වටිනාකම් ආපසු ගෙවීමේ වගකීමක් ලෙස අස්තිත්වය හඳුනාගත යුතුය. ඉන් පසුව සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී, පැවරූ නිෂ්පාදන සඳහා හුවාමාරුවක් ලෙස හිමිකම් කීමට අපේක්ෂා කරන වටිනාකම්වල එහි ඇස්තමේන්තුව අස්තිත්වය යාවත්කාලීන කළ යුතු අතර ගණුදෙනු මිලට සහ එමනිසා හඳුනාගත් අයභාරයේ වටිනාකමට අනුරූපී වෙනස්කම් කළ යුතුය.

ආ24 ආපසු ගෙවිය යුතු වටිනාකම්වල අපේක්ෂාවන් පිළිබඳ වෙනස්වීම් සඳහා ආපසු ගෙවීමේ වගකීම මැනීම සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේ අස්තිත්වය යාවත්කාලීන කළ යුතුය. අනුරූපී ගැළපීම් අයභාරය (හෝ අයභාරය අඩුවීමක්) ලෙස අස්තිත්වයට හඳුනාගත යුතුය.

ආ25 ආපසු ගෙවීමේ වගකීමක් නිරවුල් කිරීම මත ගණුදෙනුකරුවෙකුගෙන් නිෂ්පාදන යළි ලබා ගැනීමේ අයිතිය සඳහා අස්තිත්වය හඳුනාගත් වත්කමක් මුලින්ම මැනිය යුත්තේ, එම නිෂ්පාදන (උදාහරණ ලෙස තොග) යළි ලබා ගැනීමේදී යම් අපේක්ෂිත පිරිවැයක් අඩු කළ පසු, එම (අස්තිත්වයට ආපසු භාරදීම නිෂ්පාදනවල වටිනාකමේ භව්‍ය අඩු වීමක්ද ඇතුළුව) නිෂ්පාදනයක් කලින් ධාරණ වටිනාකමට යොමු කිරීමෙනි. ආපසු එවීමට නියමිත නිෂ්පාදන පිළිබඳ අපේක්ෂාවන් වෙනස්වීම මගින් පැනනඟින වත්කම මැනීම සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදී අස්තිත්ත්වය යාවත්කාලීන කළ යුතුය. අස්තිත්වය වත්කම, ආපසු ගෙවීමේ වගකීමෙන් වෙන්කර ඉදිරිපත් කළ යුතුය.

ආ26 ගණුදෙනුකරුවන් විසින් එකම නිෂ්පාදනයේ එකම වර්ගයේ, එම තත්ත්වයේ, එම ගුණාත්මකභාවයේ සහ එම මිලේ (උදාහරණ එකම පාට හෝ එකම ප්‍රමාණය) වෙනත් භාණ්ඩයන් සමඟ හුවමාරු කර ගැනීමේ මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමේ අරමුණ සඳහා ආපසු එවීම් ලෙස සලකනු නොලැබේ.

ආ27 ගණුදෙනුකරුවන් දෝෂ සහිත නිෂ්පාදනයන් ක්‍රියාකරන නිෂ්පාදනයන් සඳහා හුවමාරුවක් ලෙස ආපසු එවිය හැකි බව ගිවිසුමක් තුළවන විට ඒවා අගය කළ යුත්තේ ආ 28 - ආ 33 ඡේදවල ප්‍රතිඥාහාර මත වන උපදේශන ප්‍රකාරවය.

**ප්‍රතිඥාහාර**

ආ28 නිෂ්පාදනයක් (භාණ්ඩ හෝ සේවා හෝ වේවා) විකිණීම සම්බන්ධයෙන් අස්තිත්වයක් ප්‍රතිඥාහාරයක් ලබාදීම නිතර සිදුවන දෙයකි. (ගිවිසුම් සමග නීතිය හෝ අස්තිත්වයේ චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදු ප්‍රකාරව) ප්‍රතිඥාහාරයක ස්වභාවය ගිවිසුම් සහ කර්මාන්ත හරහා බොහෝ දුරට වෙනස්වීමට භාජනය විය හැකිය. පිරිවිතරකරණය සමග එකග වූ නිෂ්පාදනය අනුගතවන නිසා පාර්ශ්වයන් අපේක්ෂා කළ පරිදි ක්‍රියාකරනු ලබන සම්බන්ධිත නිෂ්පාදන සඳහා සමහර ප්‍රතිඥාහාර ගණුදෙනුකරුවන්ට සහතික වීමක් ලබාදේ. වෙනත් ප්‍රතිඥාහාර එකග වූ පිරිවිතර සමග නිෂ්පාදන අනුගතවන බව සහතික වීමට අමතරව, ගණුදෙනුකරුට සේවාවක් ලබාදේ.

ආ29 ප්‍රතිඥාහාරයක් වෙනම මිලට ගැනීමට ගණුදෙනුකරුට විකල්පයක් තිබේ නම් (උදාහරණ වශයෙන් ප්‍රතිඥාහාරය මිල කරන්නේ හෝ කතිකා කරගන්නේ වෙනම නිසා) ප්‍රතිඥාහාරයේ නිශ්චිත සේවාවක් වේ, එයට හේතුවන්නේ ගිවිසුමේ විස්තර කර ඇති නිෂ්පාදනයේ කාර්යබද්ධයට අමතරව අස්තිත්වය ගණුදෙනුකරුට සේවාවක් ලබාදීමට එකගවීම නිසාය. එවැනි තත්ත්වයන්හි දී 22-30 ඡේද ප්‍රකාරව එකග වූ ප්‍රතිඥාහාරයක් ඉටු කිරීමේ බැඳීමක් ලෙස අස්තිත්ත්වය ගිණුම් ගත කළ යුතු අතර ගණුදෙනු මිළේ කොටසක් 73-86 ඡේද ප්‍රකාරව එම ඉටු කිරීම් බැඳීමට වෙන්කළ යුතුය.

ආ30 එකග වූ ප්‍රතිඥාහාරය හෝ එකගවූ ප්‍රතිඥාහාරයේ කොටසක්, නිෂ්පාදනය එකග වූ පිරිවිතර සමග සංගත බවට දී ඇති සහතික වීමට අමතරව සේවයක් ගණුදෙනුකරුට සළසන්නේ නම් හැර, ගණුදෙනුකරුට ප්‍රතිඥාහාරය වෙනම මිලට ගැනිමට විකල්පයක් නොමැති නම් අස්තිත්වය ප්‍රතිඥාහාරය ගිණුම්ගත කළ යුත්තේ LKAS 37 *ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම්, සහ අසම්භව්‍ය වත්කම්* ප්‍රකාරවය.

ආ31 එකගවූ පිරිවිතර සමග සංගත බවට දී ඇති සහතික වීමට අමතරව, ප්‍රතිඥාහාරය අමතරව සේවයන් ගණුදෙනුකරුට සළසන්නේද යන්න තක්සේරු කිරීමේදී අස්තිත්වය පහත දක්වෙන දෑ වැනි කරුණු සළකා බැලිය යුතුය.

(අ) ප්‍රතිඥාහාරය නීතියෙන් අවශ්‍ය කරන්නේද - නීතිය මගින් ප්‍රතිඥාහාරයක් සැළසීමට අස්තිත්වයකට අවශ්‍ය කරන්නේ නම්, එම නීතියේ පැවැත්ම එම එකග වූ ප්‍රතිඥාහාරය ඉටු කිරීමේ බැඳීමක් නොව එවැනි අවශ්‍යතාවයන් නියම වශයෙන් පැවතීමට හේතුව වන්නේ දෝෂ සහිත නිෂ්පාදන මිලදී ගැනීමේ අවදානමෙන් ගණුදෙනුකරුවන් ආරක්ෂා කිරීමට බව ඇගවේ.

(ආ) ප්‍රතිඥාහාරය ආවරණයේ කාල පරිච්ඡේදයේ දිගුව - ආවරණ කාලපරිච්ඡේදය දිගුවන තරමට එය එකග වූ ප්‍රතිඥාහාර ඉටු කිරිමේ බැඳීමක් බොහෝ දුරට විය හැකිය. එයට හේතුවන්නේ නිෂ්පාදනය එකග වූ පිරිවිතර සමග සංගත බවට දී ඇති සහතික වීමට අමතරව සේවයක් සපයන බව බොහෝ දුරට විය හැකි නිසාය.

(ඇ) අස්තිත්ත්වය ඉටු කිරීමට එකගවන කර්තව්‍යයන්ගේ ස්වභාවය නිෂ්පාදනය එකග වූ පිරිවිතර සමග සංගත බවට සහතික විමක් ලබාදීමට, අස්තිත්වයට පැහැදිලිව සඳහන් කර ඇති කර්තව්‍යන් ඉටු කිරීමට අස්තිත්වයට අවශ්‍ය වේ නම්, (උදාහරණ වශයෙන් දෝෂ සහිත නිෂ්පාදනයක් සඳහා ආපසු එවීමේ නැව් සේවා) එවිට එම කර්තව්‍යයන් ඉටු කිරීමේ බැඳීමක් පැන නැගීමට තුඩු නොදිය යුතුය.

ආ32 ප්‍රතිඥාහාරයක් හෝ ප්‍රතිඥාහාරයේ කොටසක් ගණුදෙනුකරුට නිෂ්පාදනය එකග වූ පිරිවිතර සමග සංගතවන බවට සහතික වීමට අමතරව සේවයක් සළසයි නම්, එකග වූ සේවය ඉටු කිරීමේ බැඳීමකි. එම නිසා අස්තිත්ත්වයක් විසින් ගණුදෙනු මිල නිෂ්පාදනයට සහ සේවාවට වෙන් කළ යුතුය. අස්තිත්වයක් සහතික වීමේ වර්ගයේ ප්‍රතිඥාහාරයක් සහ සේවා - වර්ගයේ ප්‍රතිඥාහාරයක් යන දෙකම එකග වන්නේ නම් එහෙත් සාධාරණ ලෙස ඒවා වෙනම ගිණුම් ගත කළ නොහැකි විට අස්තිත්වය විසින් ප්‍රතිඥාහාර දෙකම, එක්ව තනි ඉටු කිරීමේ බැඳීමක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

ආ33 අස්තිත්වයක නිෂ්පාදන වලින් හිංසාවක් හෝ පාඩු ඇති කරන්නේ නම් ඒ සඳහා අස්තිත්වය වන්දි ගෙවීම් නීතියෙන් අවශ්‍යවීම ඉටු කිරීමේ බැඳීමක් හටගැන්වීමට තුඩු නොදේ. උදාහරණ ලෙස එහි අපේක්ෂිත අරමුණ සඳහා පාරිභෝගිකයෙක් නිෂ්පාදනයක් භාවිතා කිරීමෙන් සිදුවිය හැකි යම් හානි (උදාහරණ වශයෙන් පෞද්ගලික දේපළකට) සඳහා නිෂ්පාදක වගකිව යුතුවන නීතිය ක්‍රියාත්මක වන අධිකරණ බල ප්‍රදේශයක නිෂ්පාදකයෙක් භාණ්ඩ අලෙවි කළ හැකිය. ඒ හා සමානව අස්තිත්වයේ නිෂ්පාදන මගින් වන වගකීම් සහ ස්වාධිකාර, ප්‍රකාශන අයිතිය, වෙළඳ ලකුණ සහ වෙනත් ගිවිසුමකට විරුද්ධව කටයුතු කිරීම නිසාවන හිමිකම් ඉල්ලීම්වලින් පැනනගින වන්දි සඳහා ගණුදෙනුකරු හානි පූර්ණය කිරීමට අස්තිත්වයක් එකගවීම, ඉටු කිරීම් බැඳීමක් හට ගැන්වීමට තුඩු නොදේ. එවැනි වගකීමක් සඳහා අස්තිත්වය LKAS 37 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතුය.

**ප්‍රධානියාට එරෙහිව නියෝජිත සැළකිල්ලට ගැනීම**

ආ34 ගණුදෙනුකරුට භාණ්ඩ හෝ සේවා සැපයීමේදී වෙනත් පාර්ශ්වයක් සම්බන්ධ වන විට, එහි එකඟවීමේ ස්වභාවය වනුයේ පැහැදිලිව හඳුනාගත් භාණ්ඩ හෝ සේවා එයම සැපයීම (එනම් අස්තිත්ත්වය ප්‍රධානියාවේ) ඉටු කිරීම් බැඳීමක්ද හෝ භාණ්ඩ හෝ එම සේවා සැපයීමට වෙනත් පාර්ශ්වයක සමග යොදාගත යුතු ද යන්න අස්තිත්ත්වය තීරණය කළ යුතු ය.

ආ35 ගණුදෙනුකරුවකුට අස්තිත්ත්වය භාණ්ඩ හෝ සේවා පැවරීමට පෙර එකඟ වූ භාණ්ඩ හෝ සේවා පාලනය කරන්නේ අස්තිත්ත්වය නම්, අස්තිත්ත්වය ප්‍රධානියාවේ. කෙසේ වෙතත් ගණුදෙනුකරුවකුට නෛතික හිමිකම පැවරීමට පෙර නිෂ්පාදනයක නෛතික හිමිකම අස්තිත්ත්වය මොහොතකට පමණක් ලබා ගන්නේ නම්, අස්තිත්ත්වය අවශ්‍යයෙන්ම ප්‍රධානියා ලෙස කටයුතු නොකරයි. ගිවිසුමකට ප්‍රධානියාවන අස්තිත්ත්වය ඉටු කිරීම් බැඳීමක් එයම සපුරාලිය හැකි හෝ එය ඒ සඳහා වෙනත් පාර්ශ්වයක් (උදාහරණ ෘ උප කොන්ත්‍රාත්කරුවකු) සමහර හෝ සියලු ඉටු කිරීම් බැඳීම් සපුරාලීම සඳහා අස්තිත්ත්වය වෙනුවෙන් සේවයේ යොදාගත හැකිය. ප්‍රධානියාවන අස්තිත්ත්වය ඉටු කිරීම් බැඳීමක් සපුරාලන විට පැවරූ එම භාණ්ඩ හෝ සේවා සඳහා හුවමාරුවක් ලෙස අපේක්ෂාකරණ හිමිකමේ ප්‍රතිෂ්ඨාවේ දළ වටිනාකම අයභාරය ලෙස අස්තිත්ත්වය හඳුනාගනී.

ආ36 අස්තිත්ත්වයේ ඉටු කිරීම් බැඳීම් වනුයේ වෙනත් පාර්ශ්වයක් විසින් භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා සැළසුම් කිරීම නම් අස්තිත්ත්වය නියෝජිතයකු වේ. නියෝජිතයකුවන අස්තිත්ත්වයක් ඉටු කිරීමේ බැඳීමක් සපුරාලන විට, වෙනත් පාර්ශ්වයට එහි භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා සැළසුම් කිරීම වෙනුවෙන් හුවමාරුවක් වන එය හිමිකම් ලැබීමට අපේක්ෂාකරන යම් ගාස්තුවක් කොමිස් මුදලක වටිනාකම අස්තිත්ත්වය අයභාරය ලෙස හඳුනාගනී. අස්තිත්ත්වයක ගාස්තු හෝ කොමිස් මුදල් විය හැක්කේ, වෙනත් පාර්ශ්වය සැළසීමට ඇති භාණ්ඩ හෝ සේවා සඳහා හුවාමරුවක් ලෙස ලැබුණ ප්‍රතිෂ්ඨාව වෙනත් පාර්ශ්වයට ගෙවීමෙන් පසු අස්තිත්ත්වය රඳවා ගන්නා ප්‍රතිෂ්ඨාවේ ශුද්ධ වටිනාකමය.

ආ37 අස්තිත්ත්වය නියෝජිතයකුවන දර්ශකවලට (සහ ඒ අනුව ගණුදෙනුකරුවකුට භාණ්ඩ හෝ සේවා සැපයීමට පෙර පාලනය නොකරන) පහත දෑ ඇතුළත් ය ෘ-

(අ) ගිවිසුම සම්පූර්ණ කිරීම සඳහා වෙනත් පාර්ශ්වයක් මූලිකව වගකිව යුතුවේ ;

(ආ) ගණුදෙනුකරුවෙක් විසින් භාණ්ඩ ඇණවුම් කිරීමට පෙර හෝ පසුව හෝ, නැව් ගත කිරීම් අතර කාලය තුළදී හෝ ආපසු එවීම් මත වන තොග අවදානම අස්තිත්ත්වයට නොමැත ;

(ඇ) වෙනත් පාර්ශ්වයක භාණ්ඩ හෝ සේවා සඳහා මිල ස්ථාපනය කිරීමේ අභිමතය අස්තිත්ත්වයට නොමැත සහ එබැවින් එම භාණ්ඩ හෝ සේවා වලින් අස්තිත්ත්වයට ලබා ගත හැකි ප්‍රතිලාභ සීමාසහිත වේ ;

(ඈ) අස්තිත්ත්වයේ ප්‍රතිෂ්ඨාව කොමිස් මුදලක ස්වරූපයෙන්ය; සහ

(ඉ) වෙනත් පාර්ශ්වයක භාණ්ඩ හෝ සේවා හුවමාරුව සඳහා ගණුදෙනුකරුවකුගෙන් ලැබිය යුතු වටිනාකම් සඳහාවන ණය අවදානමට අස්තිත්ත්වයට අනාවෘත නොවේ.

ආ38 වෙනත් අස්තිත්ත්වයක් අස්තිත්ත්වයේ ඉටු කිරීම් බැඳීම් සහ ගිවිසුමේ ගිවිසුම්ගත අයිතීන් භාරගතහොත් එසේ නම් ගැණුම්කරුට ඉටුකිරීම් බැඳීම් සපුරාලීමට එකඟ වූ භාණ්ඩ හෝ සේවා පැවරීමට අස්තිත්ත්වය තවදුරටත් අනුග්‍රහයක් නොදක්වන, (එනම් අස්තිත්ත්වය තවදුරටත් ප්‍රධානියා ලෙස කටයුතු නොකරයි) අතර, එම ඉටු කිරීම් බැඳීම සඳහා අස්තිත්ත්වය අයභාරය හඳුනා නොගත යුතු ය. ඒ වෙනුවට වෙනත් පාර්ශ්වයක් ගිවිසුම ලබාගැනීම සඳහා (එනම් අස්තිත්ත්වය නියෝජිතයකු ලෙස කටයුතු කරන්නේද යන වග) ඉටු කිරීමේ බැඳීමක් සපුරාලීම සඳහා අයභාරයක් හඳුනාගත යුතුද යන්න, අස්තිත්ත්වය ඇගයිය යුතු ය.

**අමතර භාණ්ඩ හෝ සේවා සඳහා ගණුදෙනුකරුගේ විකල්ප**

ආ39 අමතර භාණ්ඩ හෝ සේවා ගාස්තුවක් නොමැතිව හෝ වට්ටමක් සහිතව අත්කරගැනීමට ගණුදෙනුකරුවකුගේ කැමැත්ත විවිධ ස්වරූපයෙන් ළඟාවිය හැකිය. ඒවාට විකුණුම් දිරිගැන්වීම්, ගනුදෙනුකරු ප්‍රදාන බැර (හෝ ලකුණු) ගිවිසුම් අලුත් කිරීමේ විකල්ප හෝ අනාගත භාණ්ඩ හෝ සේවා සඳහා වෙනත් වට්ටම් වැනි දෑ ඇතුළත් වේ.

ආ40 අතිරේක භාණ්ඩ හෝ සේවා අත්කර ගැනීම ගණුදෙනුකරුට විකල්පය අස්තිත්ත්වය ගිවිසුම තුළ ප්‍රදානය කරන්නේ නම්, එම විකල්පය ඉටු කිරීමේ බැඳීමක් ඇතිකිරීමට තුඩුදිය හැක්කේ, එම ගිවිසුමට නොඑළඹ එය භාර නොගන්නා බවට ගණුදෙනුකරුට

ප්‍රමාණාත්මක හිමිකමක් එම විකල්පය සලසනබව ගිවිසුමේ සඳහන් වන්නේ නම් පමණි. (උදාහරණ වශයෙන් නියම වශයෙන් එම භාණ්ඩ හෝ සේවාවලට, එම භූගෝලීය වපසරියේ හෝ වෙළෙඳපොළේ එම පන්තියේ ගණුදෙනුකරුවකුට දෙන වට්ටම් පරාසයකට වර්ධකවන වට්ටමක්)විකල්පය ගණුදෙනුකරුට ප්‍රමාණාත්මක හිමිකමක් ලබා දෙන්නේ නම්, ගණුදෙනුකරු ඇත්තටම අනාගත භාණ්ඩ හෝ සේවා සඳහා අස්තිත්ත්වයට කලින් ගෙවයි සහ එම අනාගත භාණ්ඩ හෝ සේවා පැවරුවිට හෝ විකල්පය අවසන් වූ විට අස්තිත්ත්වය අයභාරය හඳුනාගනී.

ආ41 ගණුදෙනුකරුවකුට අතිරේක භාණ්ඩ හෝ සේවා, එම භාණ්ඩයේ හෝ සේවාවේ තනි තනි පදනම මත වන මිල පිළිබිඹුවන මිලකට අත්කර ගැනීමට විකල්පයක් තිබේ නම්, කලින් ගිවිසුමට එළඹීමෙන් පමණක් එම විකල්පය ක්‍රියාත්මක කළ හැකිවූයේ වුවද, එම විකල්පය ගණුදෙනුකරුට ප්‍රමාණාත්මක හිමිකමක් ලබා නොදෙයි. එවැනි අවස්ථාවලදී අස්තිත්ත්වය අලෙවි පිරිනැමීමක් කර ඇති අතර, එය මෙම ප්‍රමිතය ප්‍රකාරව ගිණුම්ගත කළ යුත්තේ අමතර භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමට ගණුදෙනුකරු විකල්පය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී පමණය.

ආ42 ගණුදෙනු පිරිවැය, ඉටු කිරීම් බැඳීම් වෙත අස්තිත්ත්වය වෙන් කළ යුත්තේ 74 වන ඡේදයෙන් අවශ්‍යකරන පරිදි සාපේක්ෂ තනි තනි පදනමේ විකුණුම් මිල පදනම මතය. අතිරේක භාණ්ඩ හෝ සේවා අත්කර ගැනීමට ගණුදෙනුකරුගේ විකල්පය සඳහා තනි තනි පදනමේ විකුණුම් මිල සෘජුව නිරීක්ෂණය කළ නොහැකි නම් අස්තිත්ත්වය එය ඇස්තමේන්තු කළ යුතුය. විකල්පය ක්‍රියාත්මක කිරීමේ පහත දක්වෙන දෙකටම ගැළපූ, ගණුදෙනුකරුට ලබාගත හැකි එම වට්ටම එම ඇස්තමේන්තු මගින් නිරූපණය විය යුතු ය :-

(අ) විකල්පය ක්‍රියාත්මක නොකර ගණුදෙනුකරුට ලැබිය හැකි යම් වට්ටමක් ; සහ

(ආ) එම විකල්පය ක්‍රියාත්මක කරනු ඇතැයි සිදුවීමේ හැකියාව.

ආ43 ගණුදෙනුකරුවකුට අනාගත භාණ්ඩ හෝ සේවා අත්කර ගැනීමට ප්‍රමාණාත්මක අයිතියක් සහ එම භාණ්ඩ හෝ සේවාවන් ගිවිසුමේ මුල් භාණ්ඩ හා සේවාවන්ට සමාන සහන ලබාදී ඇත්තේ මුල් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව නම් එවිට අස්තිත්ත්වය විකල්පයේ තනි තනි පදනමේ විකුණුම් මිල ඇස්තමේන්තු කිරීමට ප්‍රායෝගික විකල්පයක් ලෙස සැපයීමට අපේක්ෂා කරණ භාණ්ඩ හෝ සේවා සහ අනුරූපී අපේක්ෂිත ප්‍රතිෂ්ඨාවට යොමු කරමින් ගණුදෙනු මිල විකල්ප භාණ්ඩ හෝ සේවා වලට වෙන්කළ හැකි ය. ඇත්ත වශයෙන්ම එම වර්ගවල විකල්ප ගිවිසුම් අළුත් කිරීම සඳහාය.

**ගණුදෙනුකරුවන් ක්‍රියාත්මක නොකළ හිමිකම්**

ආ44 106 ඡේදය ප්‍රකාරව ගණුදෙනුකරුවකුගෙන් පෙර ගෙවීමක් ලැබීම මත පෙර ගෙවීමේ වටිනාකම සඳහා එහි ඉටු කිරීමේ බැඳීම් පැවරීමට හෝ අනාගතයේදී භාණ්ඩ හෝ සේවා පැවරීමට සූදානම්වසිටීම ගිවිසුම් වගකීමක් ලෙස අස්තිත්ත්වය හඳුනාගත යුතුය. එම භාණ්ඩ හෝ සේවා පවරන විට අස්තිත්ත්වය ගිවිසුම් වගකීම (සහ අයභාරය හඳුනා ගැනීම) ප්‍රතිහඳුනාගත යුතුවීම සහ එම නිසා එහි ඉටු කිරීම් බැඳීම් සපුරාලයි.

ආ45 අස්තිත්ත්වයටක ගණුදෙනුකරුවකුගේ ආපසු නොගෙවිය යුතු පෙර ගෙවීම් අනාගතයේදී භාණ්ඩ හෝ සේවා ලබා ගැනීමට ගණුදෙනුකරුට අයිතියක් ලබා දෙයි. (සහ අස්තිත්ත්ව භාණ්ඩ හෝ සේවා මාරුකිරීමට සූදානම්ව සිටිමට අනුග්‍රහය දක්වයි) කෙසේ වෙතත් ගණුදෙනුකරුවන් ඔවුන්ගේ සියලුම ගිවිසුම්ගත හිමිකම් ක්‍රියාත්මක නොකළ හැකිය. එම ක්‍රියාත්මක නොකළ හිමිකම් බොහෝ විට ඉන් වූ අලාභය ලෙස හැඳින්වේ.

ආ46 ගිවිසුම් වගකීම් මත ඉන්වූ අලාභයේ වටිනාකමට අස්තිත්ත්වයත් හිමිකම් කිරීම අපේක්ෂා කරන්නේ නම්, අස්තිත්ත්වය විසින් ගණුදෙනුකරුවන් විසින් ක්‍රියාත්මක කරන හිමිකම් වල රටාවට සමානුපාතිකව අපේක්ෂිත ඉන්වූ අලාභ වටිනාකම අයභාරය ලෙස හඳුනාගත යුතු ය. ඉන් වූ අලාභයේ වටිනාකමට අස්තිත්ත්වය හිමිකම් කීමට අපේක්ෂා නොකරන්නේ නම්, අස්තිත්ත්වය විසින් ගණුදෙනුකරුට ඉතිරිව ඇති එහි හිමිකම් මඳ වනවිට ක්‍රියාත්මක කිරීමේ හැකියාව අපේක්ෂිත ඉන් වූ අලාභයේ වටිනාකම අයභාරය ලෙස හඳුනාගත යුතු ය. ඉන් වූ අලාභයේ ප්‍රමාණයට අස්තිත්ත්වය හිමිකම් කීමට අපේක්ෂාකරන්නේ ද යන්න නිර්ණය කිරීමට අස්තිත්ත්වය 56-58 වනඡේදවල විචල්‍ය ප්‍රතිෂ්ඨා ඇස්තමේන්තු තදින් සීමාකිරීමේ අවශ්‍යතාවයන් සළකා බැලිය යුතු ය.

ආ47 ගණුදෙනුකරුවකුට ආරෝපණය වූ ක්‍රියාත්මක නොකළ හිමිකම සඳහා ලැබුණ යම් ප්‍රතිෂ්ඨාවක් එය අස්තිත්ත්වය විසින් වෙනත් පාර්ශ්වයක් වෙත ප්‍රේෂණය කිරීම අවශ්‍ය වන්නේ නම් අස්තිත්ත්වය වගකීමක් ලෙස හඳුනා ගත යුතු ය. (අයභාරයක් ලෙස නොව) උදාහරණ ලෙස අදාළ හිමිකම් නොපෑ දේපළ නීති ප්‍රකාරව රජයේ ආයතනයක්.

**ආපසු නොගෙවන ඉදිරියෙන් කළ ගාස්තු (සහ සමහර සම්බන්ධිත පිරිවැය)**

ආ48 සමහර ගිවිසුම්වල අස්තිත්ත්වය ගණුදෙනුකරුගෙන් ආපසු නොගෙවන ඉදිරියෙන් කළ ගාස්තුවක් ගිවිසුම ආරම්භයේදී හෝ ඒ ආසන්නයේදී අය කර ගනී. උදාහරණ වලට සෞඛ්‍ය සාමාජයක සාමාජික ගිවිසුම්වල ඇතුළත් වීමේ ගාස්තු, විදුලි සංදේශ ගිවිසුම්වල සක්‍රියකරණ ගාස්තු, සමහර සේවා ගිවිසුම්වල සංවිධානය කිරීමේ ගාස්තු සහ සමහර සැපයුම් ගිවිසුම්වල මූලික ගාස්තු ඇතුළත් වෙයි.

ආ49 එවැනි ගිවිසුම්වල ඉටුකිරීමේ බැඳීම් හඳුනාගැනීමට,එම ගාස්තුව එකඟ වූ භාණ්ඩ හෝ සේවා පැවරීමට සම්බන්ධදැයි අස්තිත්ත්වය විසින් තක්සේරු කළ යුතු ය. බොහෝ අවස්ථාවලදී ආපසු නොගෙවන ඉදිරියෙන් කළ ගාස්තු ගිවිසුමක් නිම කිරීමට, ගිවිසුම ආරම්භයේදී හෝ ඒ ආසන්නයේදී අස්තිත්ත්වයක් භාරගැනීමට අවශ්‍ය කරන ක්‍රියාකාරිකමකට සම්බන්ධ වූයේ වුවද, එම ක්‍රියාකාරකම එකඟ වූ භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට පැවරීම ප්‍රතිඵලයක් නොවේ. (25 ඡේදය බලන්න) ඒ වෙනුවට ඉදිරියෙන් කළ ගාස්තුව අනාගත භාණ්ඩ හෝ සේවා සඳහා අත්තිකාරම් මුදලක් වන අතර එම නිසා එම අනාගත භාණ්ඩ හෝ සේවා සැළසූවිට අයභාරය ලෙස හඳුනා ගත යුතු ය. ගණුදෙනුකරුට ගිවිසුම අළුත් කිරීමට විකල්පයන් අස්තිත්ත්වය ප්‍රදානය කරන්නේ නම් සහ එම විකල්පය ආ 40 ඡේදයේ විස්තර කර ඇති පරිදි ගණුදෙනුකරුට ප්‍රමාණාත්මක හිමිකම් ලබා දෙන්නේ නම්, අයභාරය හඳුනා ගැනීම් කාලපරිච්ඡේදය මුල් ගිවිසුම්ගත කාලපරිච්ඡේදයෙන් ඔබ්බට දීර්ඝ කරනු ඇත.

ආ50 ආපසු නොගෙවන ඉදිරියෙන් කළ ගාස්තු සම්බන්ධ වන්නේ භාණ්ඩ හෝ සේවාවලට නම්, 22-30 ඡේද ප්‍රකාරව භාණ්ඩ හෝ සේවා වෙනම ඉටු කිරීමේ බැඳීමක් ලෙස ගිණුම් ගත කළ යුතුද යන්න අස්තිත්ත්වය අගය කළ යුතු ය.

ආ51 ගිවිසුමක් සංවිධානය කිරීමේදී දරණ ලද පිරිවැය (හෝ 25 වන ඡේදයේ විස්තර කර ඇති පරිදි වෙනත් පරිපාලන කර්තව්‍යන්) කොටසක් හිලව් කිරීමට ආපසු නොගෙවන ඉදිරියෙන් කළ ගාස්තු අස්තිත්ත්වයට අය කළ හැකි ය. එම සංවිධානය කිරීමේ ක්‍රියාකාරකම් ඉටු කිරීමේ බැඳීමක් සපුරාලන්නේ නැත්නම්, ආ 19 ඡේදය ප්‍රකාරව ප්‍රගතිය මැනීමේදී එම ක්‍රියාකාරකම් (සහ සම්බන්ධිත පිරිවැය) අස්තිත්ත්වයට නොසලකා හැරිය යුතු ය. එයට හේතුවන්නේ සංවිධානය කිරීමේ ක්‍රියාකාරකම් පිරිවැය ගණුදෙනුකරුවකුට සේවා පැවරීමක් නිරූපණය නොවන නිසාය. ගිවිසුමක් සැළසුම්කිරීමේදී දරණ පිරිවැය 95 ඡේදය ප්‍රකාරව හඳුනාගත යුතු වත්කමක් ඇතිවීම ඵලයක් වී දැයි අස්තිත්ත්වය විසින් තක්සේරු කළ යුතු ය.

**බලපත්‍ර**

ආ52 අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළකට ගණුදෙනුකරුවකුගේ අයිතිය බලපත්‍රයකින් ස්ථාපනය කෙරේ. බුද්ධිමය දේපළක බලපත්‍ර වලට පහත සඳහන් ඕනෑම දෙයක් ඇතුළත් විය හැකි අතර, ඒවාට සීමිත නොවේ :-

(අ) මෘදුකාංග සහ තාක්ෂණය ;

(ආ) සලරූ චිත්‍රපට, සංගීතය සහ වෙනත් මාදිලියේ මාධ්‍ය සහ විනෝදජනක සංග්‍රහ ;

(ඇ) බලයලත්තවුන්; සහ

(ඈ) ස්වාධිකාර වෙළෙඳ ලකුණු සහ ප්‍රකාශන අයිතිය.

ආ53 ගණුදෙනුකරුවකුට බලපත්‍රයක් ප්‍රදානය කිරීමට එකඟ වීමට අමතරව අස්තිත්ත්වයක් ගණුදෙනුකරුවකුට වෙනත් භාණ්ඩ හෝ සේවාවන්ද පැවරීමට එකඟ විය හැකිය. එම එකඟවීම් පැහැදිලිව ගිවිසුමේ සඳහන්ව තිබිය හැකි වීම හෝ අස්තිත්ත්වයේ චාරිත්‍රානුකුල ව්‍යාපාරික පළපුරුදු වලින් ප්‍රකාශයට පත්කළ ප්‍රතිපත්ති වලින් හෝ පැහැදිලිව සඳහන් කළ ප්‍රකාශ වලින් ව්‍යංග විය හැකි ය. (24 ඡේදය බලන්න) වෙනත් වර්ගවල ගිවිසුම්වල මෙන්, වෙනත් එකඟ වූ භාණ්ඩ හෝ සේවාවලට අමතරව බලපත්‍රයක් ප්‍රදානය කිරීමට එකඟවීම ගණුදෙනුකරුවෙක් සමඟ එළඹෙන ගිවිසුමක ඇතුළත්වන විට, ගිවිසුමේ සෑම ඉටු කිරීම් බැඳීම් හඳුනා ගැනීමට 22 - 30 ඡේද අස්තිත්ත්වය ව්‍යවහාර කෙරේ.

ආ54 26 - 30 ඡේද ප්‍රකාරව බලපත්‍රය ප්‍රදානය කිරීමට වූ එකඟ වීම ගිවිසුමේ එකඟ වූ වෙනත් භාණ්ඩ හෝ සේවා වලින් නිශ්චිත නොවේ නම්, බලපත්‍රය ප්‍රදානය කිරීමට එකඟවීම සඳහා එකඟ වූ එම වෙනත් භාණ්ඩ සේවා එක්ව ගෙන තනි ඉටු කිරීමේ

බැඳීමක් ලෙස අස්තිත්ත්වය ගිණුම්ගත කළ යුතු ය. ගිවිසුමේ එකඟ වූ වෙනත් භාණ්ඩ හෝ සේවා වලින් නිශ්චිත නොවූ බලපත්‍ර සඳහා උදාහරණ වලට පහත දෑ ඇතුළත් වේ :-

(අ) ස්පෘශ්‍ය භාණ්ඩයක කොටසක ස්වරූපය ගන්නා බලපත්‍රයක් සහ එම භාණ්ඩවලට ක්‍රියාකාරීත්වයට අවශ්‍යම ; සහ

(ආ) ගණුදෙනුකරුට ප්‍රයොජනයක් විය හැක්කේ වෙනත් අදාළ සේවයක් සමග එකට බැඳීමෙන් පමණක්වන බලපත්‍රයක් (අස්තිත්ත්වය විසින් සපයනු ලබන සේවයක් බලපත්‍රයක් ප්‍රදානය කිරීම මගින් ගණුදෙනුකරුට අන්තර්ගත වීම ප්‍රවේශවීමට පහසු වීම)

ආ55 බලපත්‍රය නිශ්චිත නොවේ නම්, ඉටු කිරීමේ බැඳීම (එයට එකඟවූ බලපත්‍රය ඇතුළත්) කාලයක් පුරා සපුරාලිය හැකි හෝ කාලයේ එක්තරා අවස්ථාවක සපුරාලිය හැකි ඉටු කිරීමේ බැඳීමක් දැයි නිර්ණය කිරීමට අස්තිත්ත්වය 31 - 38 ඡේද ව්‍යවහාර කළ යුතු ය.

ආ56 බලපත්‍රය ප්‍රදානය කිරීමට එකඟවීම, ගිවිසුමේ වෙනත් එකඟ වූ භාණ්ඩ හෝ සේවාවලින් නිශ්චිත නම්, සහ ඒ අනුව බලපත්‍රය ප්‍රදානය කිරීමට එකඟවීම වෙනම ඉටු කිරීමේ බැඳීමකි. ගනුදෙනුකරුට එක්කෝ කාලසීමාවේ එක්තරා අවස්ථාවක හෝ කාලයපුරා බලපත්‍රය පැවරෙන්නේද යන්න අස්තිත්ත්වය විසින් තීර්ණය කළ යුතු ය.

මෙම නිර්ණය කිරීමේදී අස්තිත්ත්වය විසින් ගණුදෙනුකරුවකුට බලපත්‍රයක් ප්‍රදානය කිරීමේ අස්තිත්ත්වයේ එකඟවීමේ ස්වභාවය ගණුදෙනුකරුට එක්කෝ -

(අ) එය පවතින බලපත්‍ර කාලසීමාව පුරා අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළ වලට ප්‍රවේශ වීමේ අයිතිය; හෝ

(ආ) එය පවතින බලපත්‍රය ප්‍රදානය කළ කාල සීමාවේ අවස්ථාවක අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළවලට පිවිසීමේ අයිතිය සලසන්නේද යන්න අස්තිත්ත්වය සළකා බැලිය යුතු ය.

**අස්තිත්ත්වයේ පොරොන්දුවීමේ ස්වභාවය නිර්ණය කිරීම**

ආ57 බලපත්‍රයක් ප්‍රදානය කිරීමට අස්තිත්ත්වයේ එකඟවීමට ගණුදෙනුකරුට එක්කෝ අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළවලට ප්‍රවේශ වීමේ අයිතිය හෝ අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළභාවිත කිරීමේ අයිතිය බලපත්‍රයෙන් සලසා ඇත්දැයි නිර්ණය කිරීමට අස්තිත්ත්වය විසින් බලපත්‍රය ප්‍රදානය කළ බලපත්‍රය මගින් ගණුදෙනුකරුට භාවිතා කිරීම මෙහෙය වීමට හැකිද, සහ එයින් සියලු ඉතිරි වාසි සැළසිය යුතු අන්දමේ ප්‍රමාණයකට ලබාගත හැකිද යන්න සළකා බැලිය යුතු ය. ගණුදෙනුකරුවකුට බුද්ධිමය දේපළක් සඳහා ඇති බලපත්‍රයේ අයිතීන් බලපත්‍ර කාලසීමාව පුරා වෙනස් කරන්නේ නම් කාලයේ එක්තරා අවස්ථාවක ප්‍රදානය කළ බලපත්‍රයේ ගණුදෙනුකරුවකුට භාවිතය මෙහෙයවීම සහ එයින් සියලුම ඉතිරි වාසි සැළකිය යුතු අන්දමේ ප්‍රමාණයකට ලබාගත නොහැකිය. අස්තිත්ත්වය එහි බුද්ධිමය දේපල සමග අඛණ්ඩව සහභාගී වීමෙන් සහ බුද්ධිමය දේපළවලට සැළකිය යුතු අන්දමේ බලපෑමක් වන ක්‍රියාකාරකම් අස්තිත්ත්වය භාරගත් විට, එයට ගණුදෙනුකරුවකුට අයිතියක් ඇති බුද්ධිමය දේපොළ වෙනස් වනු ඇත. (සහ ඒ අනුව ගණුදෙනුකරු බුද්ධිමය දේපළ පාලනය කරනවිට අස්තිත්ත්වයේ තක්සේරු කිරීමට බලපායි). මෙවැනි අවස්ථාවලදී අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළවලට ගණුදෙනුකරුවකුට ප්‍රවේශවීමේ අයිතිය බලපත්‍රය සළකා දෙයි. (ආ 58 ඡේදය බලන්න) මෙයට විරුද්ධව, ගණුදෙනුකරුවකුට භාවිත කිරීම මෙහෙයවිය හැකි බුද්ධිමය දේපළක් වෙනස් නොවන්නේ නම් (ආ 61 ඡේදය බලන්න) බලපත්‍රය ප්‍රදානය කරන අවස්ථාවේ කාලයේ එක්තරා අවස්ථාවක බුද්ධිමය දේපළේ භාවිතය මෙහෙයවීම සහ සියළුම ඉතිරි ප්‍රතිලාභ සැළකිය යුතු අන්දමේ ප්‍රමාණයකට ගණුදෙනුකරුට ලබාගත හැකි ය. එවැනි අවස්ථාවලදී අස්තිත්ත්වය භාරගත් ඕනෑම ක්‍රියාකාරකම් එහි ස්වකීය වත්කම් හුදු වෙනස් වේ. (එනම් පාදක බුද්ධිමය දේපළ) එය අනාගත බලපත්‍ර ලබාදීමේ අස්තිත්ත්වයේ හැකියාවට බලපෑ හැකි ය; කෙසේ වෙතත් එම ක්‍රියාකාරකම් බලපත්‍රයෙන් ලබාදෙන්නේ කුමක්ද හෝ ගණුදෙනුකරුවන් පාලනය කරන්නේ කුමක්ද යන්න නිර්ණය කිරීමේදී බලනොපායි.

ආ58 බලපත්‍රයක් ලබාදීමට එකඟවීමේ අස්තිත්ත්වයේ ස්වභාවය වනුයේ, පහත සඳහන් සියළුම නිර්ණායක සපුරාලන්නේ නම් අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළවලට ප්‍රවේශ වීමේ අයිතිය ලබාදීමේ එකඟවීමකි. :-

(අ) ගණුදෙනුකරුට අයිතියක් ඇති (ආ 59 ඡේදය බලන්න) බුද්ධිමය දේපළට සැළකිය යුතු අන්දමේ බලපෑම් ඇති කරන ක්‍රියාකාරකම් අස්තිත්ත්වය විසින් භාරගනු ඇතැයි යන්න ගිවිසුමෙන් අවශ්‍ය කිරීම හෝ ගණුදෙනුකරු සාධාරණව අපේක්ෂා කිරීම;

(ආ) ආ 58 (අ) ඡේදය හඳුනාගත් අස්තිත්ත්වයේ ක්‍රියාකාරකම් වලින් වන යම් ධනාත්මක හෝ ඍණාත්මක බලපෑම්වල බලපත්‍රයේ ප්‍රදානය කර ඇති අයිතීන් මගින් ගණුදෙනුකරු ඍජුව අනාවෘතවීම; සහ

(ඇ) එම ක්‍රියාකාරකම් සිදුවන විට ගණුදෙනුකරුට භාණ්ඩයක් හෝ සේවාවක් පැවරීම එම ක්‍රියාකාරකම් මගින් ප්‍රතිඵලයක් නොවීම. (25 ඡේදය බලන්න)

ආ59 බුද්ධිමය දේපළකට සැළකිය යුතු අන්දමේ බලපෑමක් වන අස්තිත්ත්වය විසින් භාර ගනු ඇතැයි ගණුදෙනුකරු සාධාරණ ලෙස අපේක්ෂාකළ හැකි ක්‍රියාකාරකම් අඟවන සාධකවලට ඇතුළත් විය හැක්කේ අස්තිත්ත්වයේ චාරිත්‍රානුකූල ව්‍යාපාරික පළපුරුදු, ප්‍රකාශනයට පත් කළ ප්‍රතිපත්ති හෝ පැහැදිලිව සඳහන් කළ ප්‍රකාශන වේ. ගණුදෙනුකරුට අයිතියක් ඇති බුද්ධිමය දේපළක් සම්බන්ධයෙන් අස්තිත්ත්වය සහ ගණුදෙනුකරු අතර ඇති බෙදාගත් ආර්ථික ඇල්මක (උදාහරණ වශයෙන් විකුණුම් මත පදනම් වූ පුරස්කාර) පැවැත්ම නිර්ණය කර නොමැති වුවත්, අස්තිත්වය එවැනි ක්‍රියාකාරකම් භාරගනු ඇතැයි ගණුදෙනුකරුට සාධාරණ අපේක්ෂා ඇඟවීමක් කළ හැකිය.

ආ60 ආ 58 ඡේදයේ නිර්ණායක සපුරාලන්නේ නම්, ඉටු කිරීමක් සිදුවන විටදීම (35(අ) ඡේදය බලන්න) එහි බුද්ධිමය දේපළවලට ප්‍රවේශවීමට අස්තිත්වයේ ඉටු කිරීම්වලින් සලසන ප්‍රතිලාභ ගණුදෙනුකරු එකවරම ලබාගෙන පාරිභෝජනය කළ හැකි නිසා කාලයක් පුරා සපුරාලන ලද ඉටු කිරීමේ බැඳීමක් ලෙස බලපත්‍රය ප්‍රදානය කිරීමට වූ එකඟ වීම අස්තිත්ත්වය ගිණුම් ගත කළ යුතුය. ප්‍රවේශය ලබාගැනීමට එම ඉටු කිරීම් බැඳීමේ සම්පූර්ණ සපුරාලීම දෙසට එහි ප්‍රගතිය මැනීමට අස්තිත්ත්වය විසින් උචිත ක්‍රමයක් තෝරා ගැනීමට 39 - 45 ඡේද ව්‍යවහාර කළ යුතුය.

ආ61 ආ58 ඡේදයේ වන නිර්නායක සපුරාලන්නේ නැත්නම්, අස්තිත්ත්වයේ එකඟවීමේ ස්වභාවය වනුයේ ගණුදෙනුකරුට බලපත්‍රය ප්‍රදානය කළ කාලයේ එම අවස්ථාවේ පැවති එම බුද්ධිමය දේපළ (ස්වභාවයේ ක්‍රියාකාරීත්වයේ භාෂිතයෙන්) අස්තිත්වයේ බුද්ධිමය දේපළ ලෙස භාවිත කිරීමට අයිතිය ලබාදීමය. මෙයින් අදහස් කරන්නේ බලපත්‍රය පැවරූ කාලයේ අවස්ථාවේදී බලපත්‍රයේ ගණුදෙනුකරුට භාවිතය මෙහෙයවීමට සහ සියළු ඉතිරි වාසි සැහෙන ප්‍රමාණයකට ලබාගත හැකි බවය. අස්තිත්ත්වයේ බුද්ධිමය දේපළ භාවිතකිරීමේ අයිතිය ලබාදීමට වන එකඟවීම, ඉටු කිරීමේ බැඳීම කළ අවස්ථාවකදී සපුරා ඇති ලෙස සළකා ගිණුම්ගත කළ යුතුය. කාලයේ අවස්ථාවේ කුමන අවස්ථාවක බලපත්‍රය ගණුදෙනුකරුට පැවරුවේ දැයි නිර්ණය කිරීමට අස්තිත්ත්වය 38 වන ඡේදය ව්‍යවහාර කළ යුතුය. කෙසේ වෙතත් අස්තිත්ත්වයක බුද්ධිමය දේපළ භාවිත කිරීමට අයිතිය ලබාදෙන බලපත්‍රයක කාල පරිච්ඡේද ආරම්භවීමට පෙර කාලපරිච්ඡේදය තුළදී ගණුදෙනුකරු බලපත්‍රය භාවිත කර එයින් වාසි ලබාගත හැකි වුවත් අස්තිත්ත්වයට අයභාරය හඳුනාගත නොහැකිය. උදාහරණ වශයෙන් ගණුදෙනුකරුවෙකුට මෘදුකාංගයක් වහාම භාවිතා කිරීමට හැකිවනු පිණිසවන මෘදුකාංග බලපත්‍ර කාල සීමාව ආරම්භ වීමට පෙර අස්තිත්ත්වය ගණුදෙනුකරුට කේතයක් ලබා දෙන්නේ නම් (අන්වශයෙන් ලැබීමට සළස්වන්නේ නම්), එම කේතය ලබාදීමට පෙර (හෝ අන්වශයෙන් ලබාදුන් පසු) අස්තිත්වය අයභාරය හඳුනා නොගනු ඇත.

ආ62 බලපත්‍රය සළසා ඇත්තේ අස්තිත්ත්වයක බුද්ධිමය දේපළ වලට ප්‍රවේශ වීමට ඇති අයිතියද, හෝ බුද්ධිමය දේපළ භාවිත කිරීමට ඇති අයිතියද යන්න නිර්ණය කිරීමේ අස්තිත්වය පහත සඳහන් සාධක නොසළකා හැරිය යුතුය.

(අ) කාලයේ සීමා කිරීම්, භූගෝලීය කලාප හෝ භාවිතය කාලය පුරා හෝ කාලයේ එක්තරා අවස්ථාවක අස්තිත්ත්වය එහි ඉටු කිරීමේ බැඳීම් සපුරාලන්නේද යන්න නිර්වචනය කරනවා වෙනුවට එකඟ වූ බලපත්‍රයේ ගුණාංගයේ එම සීමා කිරීම් නිර්වචනය කරයි.

(ආ) අස්තිත්ත්වයට බුද්ධිමය දේපළ සඳහා වලංගු ස්වාධිකාරයක් ඇති බව සහ එම ස්වාධිකාරය අවසරයකින් තොරව භාවිතා කිරීම ආරක්ෂාකරන බව - ස්වාධිකාර හිමිකමක් ආරක්ෂා කිරීමට එකඟ වීම ඉටු කිරීම් බැඳීමක් නොවේ. එයට හේතුව ස්වාධිකාරය ආරක්ෂා කිරීමේ ක්‍රියාව අස්තිත්ත්වය බුද්ධිමය දේපොළේ වත්කමේ වටිනාකම ආරක්ෂා කිරීම සහ ගිවිසුමේ එකඟ වූ බලපත්‍රයේ ඇති පිරිවිතර, පැවරූ බලපත්‍රයේ ඉටුකරන බවට ගණුදෙනුකරුට සහතිකයක් දෙන නිසාය.

**විකුණුම් පදනම හෝ භාවිත පදනම වූ පුරස්කාර**

ආ63 56-59 ඡේදවල අවශ්‍යතා එසේ වුවත්, බුද්ධිමය දේපොළ බලපත්‍රයක හුවමාරුව සඳහා එකඟ වූ පුරස්කාර විකුණුම් - පදනම හෝ භාවිත පදනම මත අයභාරය අස්තිත්ත්වය හඳුනා ගත යුත්තේ පහත සඳහන් සිදුවීම් අතුරෙන් පසුව සිදුවන දෑ සිදුවන කල්හි හෝ සිදුවන අතරතුරදී පමණි.

(අ) පසුව විකිණීම හෝ භාවිතය සිදු වූ විට; හෝ

(ආ) සමහර හෝ සියලුම විකුණුම් පදනම් හෝ භාවිත පදනම වූ පුරස්කාරය වෙන් කළ ඉටු කිරීමේ බැඳීම සපුරාලීම (හෝ අර්ධ වශයෙන් සපුරාලීම)

**ප්‍රති මිලදී ගැනීමේ පිළිවෙළවල්**

ආ64 ප්‍රතිමිලදී ගැනීමේ පිළිවෙළක් යනු අස්තිත්ත්වයක් වත්කම විකුණා සහ එසේම වත්කම මිලදී ගැනීමට වන එකඟවීමක් හෝ වත්කම ප්‍රතිමිලදී ගැනීමට විකල්පයක් ඇති ගිවිසුමකි. (එක්කෝ එම ගිවිසුමේ හෝ වෙනත් ගිවිසුමක) ප්‍රතිමිලදී ගත් වත්කම ගණුදෙනුකරුට මුලින්ම විකුණු වත්කම, එම වත්කම මෙන් බොහෝදුරට සමාන වත්කමක් හෝ මුලින්ම විකුණු වත්කමේ කොටසක් වන එය සංරචකයකි.

ආ65 ප්‍රති මිලදී ගැනීම් සාමාන්‍යයෙන් තුන් ආකාරයකින් පැවතේ.

(අ) වත්කම ප්‍රතිමිලදී ගැනීමට අස්තිත්ත්වයේ බැඳීම (ඉදිරි) ;

(ආ) වත්කම ප්‍රතිමිලදී ගැනීමට අස්තිත්ත්වයේ හිමිකම (විකුණුම් විකල්පය) ; සහ

(ඇ) ගණුදෙනුකරුගේ ඉල්ලීමකට වත්කම ප්‍රතිමිලදී ගැනීමට අස්තිත්ත්වයේ බැඳීම (ගැණුම් විකල්පය)

**ඉදිරි හෝ විකුණුම් විකල්පයන්**

ආ66 වත්කමක් ප්‍රතිමිලදී ගැනීමට (ඉදිරි හෝ විකුණුම් විකල්පයන්) අස්තිත්ත්වයකට බැඳීමක් හෝ හිමිකමක් ඇත්නම් වත්කම භාවිත කිරීම මෙහෙයවීමට සහ වත්කමේ භෞතික සන්තකය ගණුදෙනුකරුට තිබිය හැකි වුවත් එහි ඉතිරි සියළු වාසි වලින් සැහෙන ප්‍රමාණයක් ලබා ගැනීමට මේ හැකියාව සීමා සහිත නිසා වත්කමේ පාලනය ගණුදෙනුකරු ලබා නොගනී. ඒ නිසාවෙන් අස්තිත්ත්වය ගිවිසුම පහත දක්වෙන දෑ වලින් එකක් අනුව ගිණුම්ගත කළ යුතුය.

(අ) අස්තිත්ත්වයට හැකිනම් හෝ අස්තිත්ත්වය විසින් වත්කම එහි මුල් විකුණුම් මිලට වඩා අඩු වටිනාකමකට ප්‍රති මිලදී ගත යුතු නම් LKAS 17 කල්බදු ප්‍රකාරව කල්බද්දක් ලෙස; හෝ

(ආ) ආ 68 ඡේදය ප්‍රකාරව අස්තිත්වයට හැකි නම් හෝ අස්තිත්ත්වය වත්කම ඒ මුල් විකුණුම් මිල සමාන හෝ ඊට වැඩි වටිනාකමට වත්කම ප්‍රතිමිලදී ගත යුතුනම් මුල්‍යකරණ පිළිවෙළක් ලෙස

ආ67 ප්‍රතිමිලදී ගැනීම් මිල විකුණුම් මිල සමඟ සංසන්දනය කිරීමේදී අස්තිත්ත්වය මුදලේ කාල වටිනාකම සැළකිල්ලට ගත යුතුය.

ආ68 ප්‍රතිමිලදී ගැනීමේ එකඟවීම මුල්‍යනය කිරීමේ පිළිවෙළක් නම් අස්තිත්ත්වය විසින් වත්කම සහ එමෙන්ම ගණුදෙනුකරුවෙකුගෙන් ලැබෙන යම් ප්‍රතිෂ්ඨාව සඳහා මුල්‍ය වගකීම දිගටම හඳුනාගත යුතුය. ගණුදෙනුකරුගෙන් ලැබුන ප්‍රතිෂ්ඨාවේ වටිනාකම සහ ගනුදෙනුකරුට ගෙවීමට ඇති ප්‍රතිෂ්ඨාව අතර වෙනස පොලිය ලෙස සහ අදාල වන්නේ නම් සැකසීමේ සහ රඳවාගැනීමේ පිරිවැය (උදාහරණ වශයෙන් රක්ෂණ) ලෙස, ගනුදෙනුකරුට ගෙවීමට ඇති ප්‍රතිෂ්ඨාව අතර වෙනස අස්තිත්ත්වය විසින් හඳුනාගත යුතුය.

ආ69 ක්‍රියාත්මක නොකර විකල්පයක් අවලංගුවන්නේ නම්, අස්තිත්ත්වය වගකීම ප්‍රතිහඳුනාගෙන අයභාරය හඳුනා ගත යුතුය.

**ගැණුම් විකල්පයක්**

ආ70 ගණුදෙනුකරුවෙකුගේ ඉල්ලීම මත (ගැණුම් විකල්පයක්) වත්කමක එහි මුල් විකුණුම් මිලට වඩා අඩු මිලකදී වත්කම ප්‍රතිමිලදී ගැනීමට අස්තිත්ත්වයට බැඳීමක් තිබේ නම්, එම අයිතිය ක්‍රියාත්මක කිරීමට සැළකිය යුතු අන්දමේ ආර්ථික දිරිගැන්වීමක් ගණුදෙනුකරුට තිබේද යන්න ගිවිසුම ආරම්භයේදී අස්තිත්ත්වය සළකා බැලිය යුතුය. ගණුදෙනුකරුගේ එම අයිතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් වන්නේ පැහැදිලිව සඳහන් කළ වත්කම කාලයේ කාලපරිච්ඡේදයක් සඳහා භාවිතා කිරීමේ අයිතිය සඳහා වූ ප්‍රතිෂ්ඨාවන් ගණුදෙනුකරු ඵලදායීව අස්තිත්ත්වයට ගෙවීමය. එම නිසා එම අයිතිය ක්‍රියාත්මක කිරීමට ගණුදෙනුකරුට සැළකිය යුතු අන්දමේ ආර්ථික දිරිගැන්වීමක් තිබේ නම්, එකග වීම සඳහා අස්තිත්ත්වය ගිණුම්ගත කළ යුත්තේ LKAS 17 ප්‍රකාරව කල් බද්දක් ලෙසය.

ආ71 ගණුදෙනුකරුට එහි හිමිකම් ක්‍රියාත්මක කිරීමට සැළකිය යුතු අන්දමේ ආර්ථික දිරිගැන්වීම් තිබේ දැයි නිර්ණය කිරීමට ප්‍රතිමිලදී ගැනීම් දින වත්කමේ අපේක්ෂිත වෙළඳපළ වටිනාකම ප්‍රති මිලදී ගැනීමේ මිල ට ඇති සම්බන්ධතාවය සහ හිමිකම ඉකුත් වීමට

ඇති කාලයේ ප්‍රමාණය ඇතුළුව විවිධ සාධක අස්තිත්ත්වය සළකා බැලිය යුතුය. උදාහරණයක් වශයෙන් ප්‍රතිමිලදී ගැනීමේ මිල වත්කමේ වෙළඳපොළ වටිනාකමට වඩා සැළකිය යුතු අන්දමින් අභිබවා යන්නේ නම් ගණුදෙනුකරුට ගැණුම් මනාපය ක්‍රියාත්මක කිරීමට සැළකිය යුතු අන්දමේ ආර්ථික දිරිගැන්වීමක් තිබෙන බව එයින් ඇඟවිය හැකිය.

ආ72 වත්කමේ මුල් විකුණුම් මිලට වඩා අඩු මිලකට එහි හිමිකම ක්‍රියාත්මක කිරීමට ගණුදෙනුකරුට සැළකිය යුතු අන්දමේ ආර්ථික දිරිගැන්වීමක් නොමැති නම්, ආ 20 - ආ 27 ඡේදවල විස්තර කර ඇති පරිදි එය ආපසු එවීමට අයිතිය ඇති භාණ්ඩයක් විකුණුවේ යයි ලෙසට සළකා අස්තිත්ත්වය එකගවීම සඳහා ගිණුම්ගත කළ යුතුය.

ආ73 වත්කමේ ප්‍රතිමිලදී ගැනීම් මිල මුල් විකුණුම් මිලට සමාන හෝ ඊට වඩා වැඩිනම් සහ එය වත්කමේ අපේක්ෂිත වෙළඳපොළ අගයට වඩා වැඩිනම් ඇත්ත වශයෙන් ගිවිසුම මූල්‍යකරණය සැළසීමේ ගිවිසුමක්වන අතර, එම නිසා ආ 68 ඡේදයේ විස්තරකර ඇති පරිදි ගිණුම්ගත කළ යුතුය.

ආ74 වත්කමේ ප්‍රතිමිලදී ගැනීම් මිල මුල් විකුණුම් මිලට සමාන හෝ වැඩි නම් සහ වත්කමේ අපේක්ෂිත වෙළඳපොළ අගයට වඩා අඩු හෝ සමාන නම් සහ හිමිකම ක්‍රියාත්මක කිරීමට ගණුදෙනුකරුට සැළකිය යුතු අන්දමේ ආර්ථික දිරිගැන්වීමක් නොමැති නම්, එවිට ගිවිසුම සඳහා අස්තිත්ත්වය ගිණුම්ගතකළ යුත්තේ ආ 20 - ආ 27 ඡේදවල විස්තර කර ඇති පරිදි ආපසු එවීමේ අයිතිය ඇතිව විකුණු නිෂ්පාදනයක් ලෙස සළකාය.

ආ75 ප්‍රතිමිලදී ගැනීම් මිල විකුණුම් මිල සමග සංසන්දනය කිරීමේදී අස්තිත්ත්වය මුදලේ කාලවටිනාකම සැළකිල්ලට ගත යුතුය.

ආ76 ක්‍රියාත්මක නොකර විකල්පයක් අවලංගු වන්නේ නම්, අස්තිත්ත්වය වගකීම ප්‍රතිහඳුනා ගෙන අයභාරය හඳුනාගත යුතුය.

**නියෝජන පිළිවෙළ**

ආ77 අවසාන පාරිභෝගිකයන්ට විකිණීම සඳහා අස්තිත්ත්වයක් වෙනත් පාර්ශ්වයකට නිෂ්පාදනයක් භාරදුන් විට (බෙදා හරින්නෙක් හෝ ගණුදෙනු කරන්නෙක් වැනි) එම වෙලාවේදී වෙනත් පාර්ශ්වය නිෂ්පාදනයේ පාලනය ලබා ගන්නේද යන්න අස්තිත්ත්වය ඇගයිය යුතුය. වෙනත් පාර්ශ්වයක් නිෂ්පාදනයේ පාලනය ලබා නොගන්නේ නම්, වෙනත් පාර්ශ්වයට භාරදුන් නිෂ්පාදන ඔහු නියෝජන එකඟ වීම් මත රඳවා තබාගෙන සිටිනවා විය හැකිය. ඒ අනුව භාරදුන් නිෂ්පාදනය නියෝජනපදනම මත වෙනත් පාර්ශ්වයක් රඳවා ගෙන ඇත්නම්, වෙනත් පාර්ශ්වයකට නිෂ්පාදනයක් භාරදීම මත අස්තිත්ත්වයද අයභාරය හඳුනා නොගත යුතුය.

ආ78 එකඟවීමක් නියෝජන එකඟවීමක්ද යන්නට දර්ශකවලට පහත දක්වෙන දෑ ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ.

(අ) පැහැදිලිව සඳහන් කළ සිද්ධියක් වනතුරු නිෂ්පාදනය අස්තිත්ත්වය මගින් පාලනය කිරීම, ගණුදෙනුකරන්නෙක් නිෂ්පාදනයක් ගණුදෙනුකරුවෙකුට විකිණීම හෝ පැහැදිලිව සඳහන් කළ කාලපරිච්ඡේදයක් අවසන් වනතුරු දෑ වැනි;

(ආ) නිෂ්පාදනය ආපසු එවන ලෙස දැන්වීමට හෝ නිෂ්පාදනය තුන්වන පාර්ශ්වයකට පවරණ ලෙස දැන්වීමට අස්තිත්ත්වයට ඇති හැකියාව (වෙනත් ගණුදෙනු කරන්නෙක් වැනි); සහ

(ඇ) ගණුදෙනුකරන්නාට නිෂ්පාදන සඳහා ගෙවීමට කොන්දේසි රහිත බැඳීමක් නොමැතිවීම (තැන්පතුවක් ගෙවීම අවශ්‍ය විය හැකි වුවද)

**බිල්කර රඳවාතබාගැනීමේ පිළිවෙළ**

ආ79 බිල්කර රඳවා තබා ගැනීමේ පිළිවෙළක් යනු ගිවිසුමක් යටතේ අස්තිත්ත්වය නිෂ්පාදනයක් ගණුදෙනුකරුට බිල්කර එහෙත් නිෂ්පාදනය අනාගතයේ කාලයේ එක්තරා අවස්ථාවකදී ගණුදෙනුකරුට පවරන තෙක්, නිෂ්පාදනයේ භෞතික සන්තකය අස්තිත්ත්වය රඳවා තබා ගැනීමයි.

උදාහරණ වශයෙන්, ගණුදෙනුකරු එවැනි ගිවිසුමකට එළඹෙන ලෙස අස්තිත්ත්වයකින් ඉල්ලුම් කරන්නේ ගණුදෙනුකරුට ප්‍රමාණවත් ඉඩකඩ නොමැතිවීම හෝ ගණුදෙනුකරුගේ සැළසුම්කළ නිෂ්පාදනයේ සිදුවන ප්‍රමාදයන් නිසාය.

ආ80 එම නිෂ්පාදනයේ පාලනය ගණුදෙනුකරු භාරගත්තේ කවර අවස්ථාවේ දැයි අගය කිරීමෙන් (38 ඡේදය බලන්න) නිෂ්පාදනය පැවරීම ඉටු කිරීමේ බැඳීම එය සපුරාලන ලද්දේ කුමන විටකදී ද යන්න අස්තිත්ත්වය නීර්ණය කළ යුතුය. සමහර ගිවිසුම් සඳහා පාලනය පැවරෙන්නේ ගිවිසුමෙ නියමයන් මත රුදෙමින් පවතමින් එක්කෝ ගණුදෙනුකරුගේ වැඩ බිමට නිෂ්පාදනය භාරදුන් විට හෝ නිෂ්පාදනය නැව් ගත කරන අවස්ථාවේදී (භාරදීම සහ නැව්ගත කිරීමේ නියමයන් ඇතුලුව). කෙසේ වෙතත් සමහර ගිවිසුම් සඳහා එම නිෂ්පාදනය අස්තිත්ත්වයේ භෞතික සන්තකයේ තිබුනද ගණුදෙනුකරු පාලනය ලබාගත හැකිය. එවැනි අවස්ථාවකදී එම නිෂ්පාදනයේ භෞතික සන්තකය භාරගැනීමට ඇති හිමිකම ගණුදෙනුකරු ක්‍රියාත්මක කිරීමට තීරණය නොකලා වූවද, ගණුදෙනුකරුට නිෂ්පාදනය භාවිත කිරීම මෙහෙයවීමට සහ වත්කමෙන් ඉතිරි සියළුම වාසි සැළකිය යුතු අන්දමින් ලබා ගැනීමේ හැකියාව ඇත. ඒ නිසාවෙන් අස්තිත්ත්වය වත්කම පාලනය නොකරයි. ඒ වෙනුවට ගණුදෙනුකරුගේ වත්කම මත අස්තිත්ත්වය ගණුදෙනුකරුට භාරකාරීත්ව සේවයක් සළසයි.

ආ81 38 වන ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කිරීමට අමතරව; බිල්කර රඳවා ගැනීමේ එකඟ වීමකදී ගණුදෙනුකරුවෙකුට නිෂ්පාදනයේ පාලනය ලබා ගැනීමට පහත සඳහන් සියලුම නිර්ණායක ඉටු කළ යුතුය.

(අ) බිල්කර රඳවා ගැනීමේ එකඟවීමට හේතු තහවුරු කළ යුතුය. (උදාහරණ වශයෙන් ගණුදෙනුකරු එකඟවීම ඉල්ලීම)

(ආ) නිෂ්පාදනය ගණුදෙනුකරුට අයත් ලෙස වෙනම හඳුනා ගත යුතුය.

(ඇ) වර්තමානයේ නිෂ්පාදනය භෞතිකව ගණුදෙනුකරුට පැවරීමට සූදානම් විය යුතුය.

(ඈ) අස්තිත්වයට නිෂ්පාදනය භාවිත කිරීමට හෝ එය වෙනත් ගණුදෙනුකරුට යොමු කිරීමට හැකියාව නොතිබිය යුතුය.

ආ82 බිල්කර රඳවා ගන්නා පදනම මත නිෂ්පාදනයන් විකිණීම සඳහා අයභාරය අස්තිත්ත්වයක් හඳුනා ගන්නේ නම් 22-30 ඡේද ප්‍රකාරව එයට ඉටු කිරීමේ බැඳීම්වල ඉතිරිවීම් තිබේද (උදාහරණ වශයෙන් භාරකාරීත්ව සේවාවන්) එසේනම් ඒ සඳහා අස්තිත්ත්වය 73 - 86 ඡේද ප්‍රකාරව ගණුදෙනු මිලේ කොටසක් වෙන් කළ යුතුද යන්න අස්තිත්ත්වය සළකා බැලිය යුතුය.

**ගනුදෙනුකරු පිළිගැනීම**

ආ83 38 (ඉ) ඡේදය ප්‍රකාරව ගනුදෙනුකරුගේ පිළිගැනීමෙන් ගනුදෙණුකරු වත්කමේ පාලනය ලබාගත් බව ඇඟවිය හැකිය. භාණ්ඩයක් හෝ සේවාවක් එකඟ වූ පිරිවිතර සමග ගැළපෙන්නේ නැත්නම් ගණුදෙනුකරුගේ එකඟවීම් වගන්ති අනුව ගිවිසුම අවලංගු කිරීමට හෝ අස්තිත්ත්වයට නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සිදුකිරීමට ගණුදෙනුකරුට ඉඩ දේ. ගණුදෙනුකරු කුමන අවස්ථාවේ භාණ්ඩ හෝ සේවාවල පාලනය ලබා ගන්නේද යන්න අගය කිරීමේදී අස්තිත්ත්වය එවැනි වගන්ති සළකා බැලිය යුතුය.

ආ84 ගිවිසුමේ එකඟ වූ පිරිවිතර ප්‍රකාරව භාණ්ඩ හා සේවාවල පාලනය ගණුදෙනුකරුට පවරා ඇති බවට අස්තිත්ත්වයට අරමුණු ගතව (විෂය නිශ්‍රිතව) නීර්ණය කළ හැකි නම්, එවිට ගනුදෙනුකරුගේ පිළිගැනීම විධිමත් එකක් වන අතර, එය ගනුදෙනුකරු භාණ්ඩ හෝ සේවාවල පාලනය කුමන අවස්ථාවේ ලබා ගත්තේද යන්න අස්තිත්ත්වයේ නීර්ණය කිරීමට බලනොපායි. උදාහරණයක් වශයෙන් ගණුදෙනුකරුගේ භාර ගැනීමේ වගන්තිය නිශ්චය කරන ලද ප්‍රමාණය සහ බර ගතිලක්‍ෂණ මත ඉටු කිරීමේ පදනම් වන්නේ නම්, ගණුදෙනුකරුගේ පිළිගැනීම සනාථ කිරීම ලැබීමට පෙර එම නිර්නායක ඉටුකර ඇත්ද යන්න අස්තිත්ත්වයට නීර්ණය කිරීමට හැකිවනු ඇත. ගිවිසුමේ එකඟ වූ පිරිවිතර ප්‍රකාරව එම භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට සපයා ඇති බවට සාක්‍ෂි, ඒ හා සමාන භාණ්ඩ හා සේවා පිළිබඳ අස්තිත්ත්වයේ පළපුරුද්දෙන් ලබා ඇති අත්දැකීම් වලින් සළසනු ලැබිය හැක. ගණුදෙනුකරුගේ පිළිගැනීමට පෙර අයභාරය හඳුනා ගන්නේ නම් අස්තිත්ත්වය ඉතිරි වී ඇති යම් ඉටු කිරීමේ බැඳීමක් තිබේද (උදාහරණ වශයෙන් උපකරණ සවි කිරීම) යන්න සළකා බැලිය යුතු සහ ඒවා වෙනම ගිණුම් ගත කළ යුතු දැයි අගය කළ යුතුය.

ආ85 කෙසේ වෙතත් ගිවිසුමේ එකඟ වූ පිරිවිතර ප්‍රකාරව භාණ්ඩ හෝ සේවා ගණුදෙනුකරුට සළසා ඇතිබවට අස්තිත්ත්වයට අරමුණුගතව නීර්ණය කළ නොහැකි නම් එවිට ගණුදෙනුකරුගේ පිළිගැනීම අස්තිත්ත්වයට ලැබෙන තෙක් ගණුදෙනුකරු පාලනය ලබා ගත් බව යයි අස්තිත්ත්වයට නිගමනය කිරීමට හැකි නොවනු ඇත. එයට හේතු වන්නේ, එම තත්ත්වයේදී ගණුදෙනුකරු භාවිතය මෙහෙයවීමේ හැකියාව තිබේද සහ භාණ්ඩ හා සේවා වලින් ඉතිරි සියලුම වාසි සැළකිය යුතු අන්දමින් ලබාගත හැකිදැයි අස්තිත්ත්වයට නීර්ණය කළ නොහැකි නිසාය.

ආ86 අස්තිත්ත්වයක් ගනුදෙනුකරුවෙකුට අත්හදා බැලීමේ සහ අගය කිරීමේ අරමුණු සඳහා නිෂ්පාදනයන් භාරදුන් විට සහ අත්හදා බැලීමේ කාලය අවසන් වනතුරු යම් ප්‍රතිෂ්ඨාවක් ගෙවීමට ගනුදෙනුකරු බැඳී නැත්නම් එක්කෝ ගනුදෙනුකරු භාණ්ඩ පිළිගත් හෝ අත්හදා බැලීමේ කාලය අවසන් වනතුරු නිෂ්පාදනයේ පාලනය ගණුදෙනුකරුට නොපැවරේ.

**කොටස්වලට විසුරුවන ලද අයභාරය හෙළිදරව් කිරීම**

ආ87 ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින් ලැබෙන අයභාරය ඒවායේ ස්වභාවය, වටිනාකම, කාලනීර්ණය සහ අයභාරය සහ මුදල් ප්‍රවාහවල අනියතාවය, ආර්ථික සාධක මගින් බලපාන්නේ කෙසේද නිරූපණයවන ලෙස ප්‍රභේද කර කොටස් වලට විසුරුවා හැරීමට 114 ඡේදයෙන් අස්තිත්ත්වයකට අවශ්‍ය කෙරේ. ඒ නිසාවෙන් මෙම හෙළිදව් කිරීමේ අරමුණ සඳහා අස්තිත්ත්වයේ අයභාරය කොපමණ ප්‍රමාණයකට කොටස්වලට කඩා විසුරුවා හැරිය යුතුද යන්න රඳා පවත්නේ ගණුදෙනුකරුවන් සමග අස්තිත්ත්වයේ ගිවිසුම් වලට අදාළ කරුණු සහ තත්ත්වයන් මතය. අයභාරය කොටස්වලට කඩා විසුරුවා හැරීමට 114 ඡේදයේ අරමුණ ඉටුකර ගැනීමට සමහර අස්තිත්ව එක වර්ගයට වඩා වැඩි ප්‍රභේද භාවිත කිරීමට සිදුවිය හැකිය. වෙනත් අස්තිත්ත්ව එක වර්ගයක ප්‍රභේද පමණක් භාවිත කර අයභාරයේ කොටස් වලට කඩා විසුරුවා හැරීමේ අරමුණ ඉටුකරගත හැකිය.

ආ88 අයභාරය කොටස්වලට විසුරුවීමට භාවිත කළ යුතු ප්‍රභේදය (ප්‍රභේද) වල වර්ගයතෝරා ගැනීමේදී පහත සඳහන් සියල්ලමද ඇතුලුව, වෙනත් අරමුණු සඳහා අස්තිත්ත්වයේ අයභාරය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන්නේ කෙසේද යන්න අස්තිත්ත්වය සළකා බැලිය යුතුය.

(අ) මූල්‍ය ප්‍රකාශනවලින් බාහිරව ඉදිරිපත්කරන හෙළිදරව් කිරීමේ (උදාහරණ වශයෙන් ඉපයීම් නිවේදනය කිරීම්, වාර්ෂික වාර්තා හෝ ආයෝජකයනට ඉදිරිපත් කිරීම්) ;

(ආ) මෙහෙයුම් ඛණ්ඩ මූල්‍ය කාර්යය සාධනය ඇගයීම සඳහා ප්‍රධාන මෙහෙයුම් තීරණ ගන්නා විසින් නිතිපතා සමාලෝචනය කරන තොරතුරු ;

(ඇ) ආ 88 (අ) සහ (ආ) හි ඡේදයන්හි හඳුනාගත් තොරතුරු වර්ගවලට හා සමාන වෙනත් තොරතුරු සහ අස්තිත්ත්වයේ මූල්‍යකාර්ය සාධනය ඇගයීමට සහ සම්පත් වෙන් කිරීමේ තීරණ ගැනීමට අස්තිත්ත්වය හෝ අස්තිත්ත්වයේ මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් ප්‍රයෝජනයට ගන්නා වෙනත් තොරතුරු.

ආ89 උචිත විය හැකි ප්‍රභේදවලට ඇතුළත් වියහැකි සියලුම පහත දැක්වෙන දේ එහෙත් ඒවාට පමණක් සීමා නොවන උදාහරණ:

(අ) භාණ්ඩ හෝ සේවාවල වර්ගය (උදාහරණ වශයෙන් ප්‍රධාන නිෂ්පාදන පෙළ) ;

(ආ) භූගෝලීය කලාප (උදාහරණ වශයෙන් රට හෝ ප්‍රදේශ) ;

(ඇ) වෙළඳපොල හෝ ගණුදෙනුකරුවන්ගේ මාදිලිය (උදාහරණ වශයෙන් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ගණුදෙනුකරුවන්) ;

(ඈ) ගිවිසුම්වල ආකාරය (උදාහරණ වශයෙන් ස්ථාවර මිල සහ කාලය සහ ද්‍රව්‍ය ගිවිසුම්) ;

(ඉ) ගිවිසුම් කාලසීමාවන් (උදාහරණ වශයෙන් කෙටිකාලීන සහ දිගු කාලීන ගිවිසුම්) ;

(ඊ) භාණ්ඩ හෝ සේවා පැවරීමේ කාල නීරණය (උදාහරණ ලෙස ගණුදෙනුකරුවන්ට පැවරූ භාණ්ඩ හෝ සේවා වලින් අයභාරය කාලයේ එක්තරා අවස්ථාවක සහ කාල සීමාව පුරා පැවරූ භාණ්ඩ හෝ සේවා වලින්වන අයභාරය) ; සහ

(උ) විකුණුම් මාධ්‍යය (උදාහරණ වශයෙන් ඍජුව පාරිභෝගිකයනට අලෙවි කළ භාණ්ඩ සහ අතර මැදියන් හරහා විකුණු භාණ්ඩ).

**ඇ පරිශිෂ්ඨය**

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

*මෙම පරිශිෂ්ඨය ප්‍රමිතයේ වැදගත් කොටසකි සහ ප්‍රමිතයේ වෙනත් කොටස්වලට සමාන අධිකාරියක් මෙයටද ඇත.*

**බලාත්මක දිනය**

ඇ1 2017 ජනවාරි 01 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික වාර්තාකරන කාල පරිච්ඡේද සඳහා අස්තිත්වයේ මෙම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතුය. ඊට කලින් භාවිතය අවසර දේ. අස්තිත්ත්වයන් මෙම ප්‍රමිතය කලින් ව්‍යවහාර කලහොත් එම කරුණ හෙළිදරව් කළ යුතුය.

**සංක්‍රාන්තිය**

ඇ2 ඇ3-ඇ8 ඡේදවල සංක්‍රාන්ති අවශ්‍යතාවයන්ගේ අරමුණු සඳහා;

(අ) අරම්භක ව්‍යවහාරකරන දිනය වන්නේ අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතය ප්‍රථම වරට ව්‍යවහාර කරන වාර්තා කරන කාල පරිච්ඡේදයේ පටන් ගැනීමයි; සහ

(ආ) සම්පූර්ණ කරන ලද ගිවිසුමක් වන්නේ LKAS 11 *ඉදිකිරීම් කොන්ත්‍රාත්* LKAS 18 *අයභාරය* සහ සම්බන්ධිත අර්ථ නිරූපණයන් ප්‍රකාරව හඳුනාගත් අස්තිත්ත්වය පවරන ලද සියළුම භාණ්ඩ හෝ සේවා සඳහාවන ගිවිසුමකි.

ඇ3 අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතය පහත දක්වෙන ක්‍රම දෙකෙන් එකක් භාවිතකර ව්‍යවහාර කළ යුතුය.

(අ) LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව*, ඇ 5 ඡේදයේ ක්‍රියාමාර්ගවලට යටත්ව, අතීතයට බලපාන පරිදි ඉදිරිපත්කරන ලද සෑම පෙර වාර්තාකරන ලද කාලපරිච්ඡේදයකටම; හෝ

(ආ) ඇ 7 - ඇ 8 ඡේද ප්‍රකාරව ආරම්භක ව්‍යවහාර කරන දින ආරම්භකව මෙම ප්‍රමිතය ව්‍යවහාර කරමින් හඳුනාගත් සමුච්චිත වන බලපෑම සමග අතීතයට බලපාන පරිදිය.

ඇ4 LKAS 8 හි වන ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වෙතත්, මෙම ප්‍රමිතය ප්‍රථම වරට ව්‍යවහාරකරණවිට, මෙම ප්‍රමිතය ව්‍යවහාරකරණ ප්‍රථම වාර්ෂික කාල පරිච්ඡේදය (වහාම පූර්වගාමී කාලපරිච්ඡේදය) වහාම පූර්වගාමී වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා සහ ඇ 3(අ) ඡේදය ප්‍රකාරව අස්තිත්ත්වය මෙම ප්‍රමිතය පමණක් අතීතයට බලපාන අයුරින් ව්‍යවහාර කරන්නේ නම් අස්තිත්ත්වය LKAS 8 හි28 (ඊ) ඡේදය ප්‍රකාරව ඉදිපත් කිරීමට අවශ්‍ය වන්නේ ප්‍රමාණාත්මක තොරතුරු පමණකි. අස්තිත්ත්වය මෙම තොරතුරු ප්‍රවර්තන කාලපරිච්ඡේද සඳහා හෝ කලින් තුලනාත්මක කාලපරිච්ඡේද සඳහා ඉදිරිපත් කළ හැකිය. එහෙත් එසේ කිරීම අවශ්‍ය නොවේ.

ඇ5 ඇ3(අ) ඡේදය ප්‍රකාරව මෙම ප්‍රමිතය අතීතයට බලපාන පරිදි ව්‍යවහාර කරන විට අස්තිත්ත්වය පහත සඳහන් ප්‍රායෝගික ක්‍රියාමාර්ග එකක් හෝ ඊට වැඩි ගණනක් භාවිතා කළ හැකිය.

(අ) එකම වාර්ෂික වාර්තා කරන කාලපරිච්ඡේදයක් තුළදී ගිවිසුම් ආරම්භ කර සහ අවසාන කළද සම්පූර්ණ කළ ගිවිසුම් සඳහා අස්තිත්ත්වය යළි ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ.

(ආ) විචල්‍ය ප්‍රතිෂ්ඨාවක් ඇති නිම කළ ගිවිසුම් සඳහා තුලනාත්මක කාල පරිච්ඡේදවලදී විචල්‍ය ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ඇස්තමේන්තු කරනවා වෙනුවට ගිවිසුම නිම කළ දින ගණුදෙනු මිල අස්තිත්ත්වය භාවිත කළ හැකිය ; සහ

(ඇ) ආරම්භක ව්‍යවහාර කරන දිනට පෙර වාර්තා කරන ලද සියළුම කාලපරිච්ඡේද සඳහා ඉතිරි ඉටුකිරීම් බැඳීම් වලට වෙන් කළ ගණුදෙනු මිලේ ප්‍රමාණය සහ එම වටිනාකම අයභාරය (120 ඡේදය බලන්න) ලෙස අස්තිත්ත්වය හඳුනා ගැනීම අපේක්ෂා කරන විට වන පැහැදිලි කිරීම අස්තිත්ත්වය හෙළිදරව් කිරීම අවශ්‍ය නොවේ.

ඇ6 අස්තිත්වය භාවිතකළ ඇ5 ඡේදයේ යම් ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් සඳහා ඉදිරිපත් කරන ලද වාර්තා කරන ලද සෑම කාලපරිච්ඡේදයක් තුළදී වන සියලුම ගිවිසුම් සඳහා අස්තිත්ත්වය එම ක්‍රියාමාර්ගය සංගතව අස්තිත්ත්වය විසින් ව්‍යවහාර කළ යුතුය. එයට අමතරව අස්තිත්ත්වය පහත දක්වෙන සියළු තොරතුරු හෙළිදරව් කළ යුතුය.

(අ) භාවිත කරන ලද ක්‍රියාමාර්ග; සහ

(ආ) එම සෑම ක්‍රියාමාර්ගයක් ව්‍යවහාර කිරීමෙන් ඇස්තමේන්තු කළ හැකි බලපෑමේ ගුණාත්මක තක්සේරුව සාධාරණ ලෙස විය හැකි ප්‍රමාණය

ඇ7 ඇ3 (ආ) ඡේදය ප්‍රකාරව මෙම ප්‍රමිතය අතීතයට බලපාන ලෙස ව්‍යවහාර කිරීමට අස්තිත්ත්වයක් තෝරාගත හොත් ආරම්භක ව්‍යවහාර කරන දින අඩංගුවන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ රඳවා ගත් ඉපයීම්වල (අදාළවන පරිදි ස්කන්ධයේ වෙනත් සංරචකයන්) ආරම්භක ශේෂයට මෙම ප්‍රමිතය ආරම්භ ව්‍යවහාරකරණයේ සමුච්චිත බලපෑම ගැළපුමක් ලෙස අස්තිත්ත්වය හඳුනා ගත යුතුය. මෙම සංක්‍රාන්ති ක්‍රමය යටතේ අස්තිත්ත්වයක් විසින් මෙම ප්‍රමිතය අතීතයට බලපාන පරිදි ව්‍යවහාර කළ යුත්තේ ආරම්භක ව්‍යවහාර කරන දිනට සම්පූර්ණ නොකළ ගිවිසුම්වලට සඳහා පමණි. (උදාහරණ වශයෙන් දෙසැම්බර් 31 දිනෙන් වසර අවසන්වන අස්තිත්ත්වයක් සඳහා 2017 ජනවාරි 01 දින).

ඇ8 ආරම්භක ව්‍යවහාර කරන දිනය ඇතුළත් වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා ඇ3 (ආ) ඡේදය ප්‍රකාරව අතීතයට බලපාන පරිදි මෙම ප්‍රමිතය අස්තිත්ත්වයක් ව්‍යවහාර කරන්නේ නම්, පහත දැක්වෙන අතිරේක හෙළිදරව් කිරීම් දෙකම ලබාදිය යුතුය.

(අ) LKAS 11, LKAS 18 සමග සංසන්දනය කිරීමේ දී මෙම ප්‍රමිතය ව්‍යවහාර කිරීමෙන් ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ සෑම මූල්‍ය ප්‍රකාශනයකම පේළි අයිතම කොපමණ වටිනාකමකින් බලපාන්නේද සහ වෙනස් කිරීමට පෙර බලපැවැත් වූ සම්බන්ධිත අර්ථ කථනයන්; සහ

(ආ) ඇ8 (අ) හි හඳුනාගත් සැළකිය යුතු අන්දමේ වෙනස්වීම් සඳහා හේතු පැහැදිලි කිරීමක්.

**SLFR 9ට යොමු කිරීම්**

ඇ9 අස්තිත්ත්වයක් මෙම ප්‍රමිතය ව්‍යවහාර කරන්නේ නම්, එහෙත් තවමත් SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර ව්‍යවහාර නොකරයි නම්, මෙම ප්‍රමිතයේ SLFRS 9 ට කරන ඕනෑම යොමු කිරීමක් LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම මැණීමට* යොමු කිරීමක් ලෙස කියවිය යුතුය.

**වෙනත් ප්‍රමිත ඉල්ලා අස්කරගැනීම**

ඇ10 මෙම ප්‍රමිතය පහත සඳහන් ප්‍රමිත වෙනුවට යෙදේ :

(අ) LKAS 11 *ඉදිරිකිරීම් කොන්ත්‍රාත්තු*
(ආ) LKAS 18 *අයභාරය*
(ඇ) IFRIC 13 *ගණුදෙනුකරුට පක්ෂපාතී වැඩසටහන්*
(ඈ) IFRIC 15 *නිශ්චල දේපොළ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්*
(ඉ) IFRIC 18 *ගණුදෙනුකරුවන්ගෙන් වත්කම් පැවරුම් ;* සහ
(ඊ) SIC 31 *අයභාර ප්‍රචාරණ සේවා සමග සම්බන්ධිත අයභාර හුවමාරු ගණුදෙනු.*

**ඇ පරිශිෂ්ඨය**

**වෙනත් ප්‍රමිතවලට සංශෝධන**

*SLFRS 15 අවසන් කළ විටදී වෙනත් ප්‍රමිතවලට පාලක මණ්ඩලය විසින් සිදුකරන ලද සංශෝධන මෙම පරිශිෂ්ඨය විස්තර කරයි. සංශෝධනය කරන ලද ඡේද පෙන්වා ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා ඇති සහ නව පාඨය යටින් ඉරක් ඇඳ පෙන්වා ඇත.*

පහත සඳහන් යොමු කිරීම් වෙනත් ප්‍රමිතවල කෙසේ සංශෝධනය කර ඇත්ද යන්න මෙම වගුවෙන් පෙන්නුම් කෙරේ.

| පවතින යොමුව වෙත | ඇතුළත් වන්නේ | තුළ | සංශෝධනය වෙන යොමුව |
|---|---|---|---|
| LKAS 18 *අයභාරය* හෝ LKAS 18 | SLFRS 4 | 4(අ) සහ (ඇ) ආ 18 (ළු) සහ එළ2 ඡේද වගුව තුළ අයිතම | SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම් වලින්වන අයභාරය* හෝ SLFRS 15 |
| | LKAS 16 | 68 අ ඡේදය | |
| | LKAS 39 | අළ 2 ඡේදය | |
| | LKAS 40 | 3(ආ) ඡේදය | |
| | IFRIC 12 | තොරතුරු සටහන් 2 හි වගුව | |
| LKAS 11 *ඉදිකිරීම් කොන්ත්‍රාත්* හෝ LKAS 11 | SIC 32 | 6 ඡේදය | |

**SLFRS 1මුල් වරට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කිරීම**

| |
|---|
| 39 අඹ ඡේදය එකතු කෙරේ. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**බලාත්මක වන දිනය**

.....

39අඹ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින්* වන අයභාරය 2014 ජුනි නිකුත් කර ඇත. ඇ 24 ඡේදය සහ එහි සම්බන්ධිත ශීර්ෂය ඉවත් කර ඇත. සහ ඇ 34 - ඇ 35 සහ එහි සම්බන්ධිත ශීර්ෂ එකතු කර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

| |
|---|
| ඇ පරිශිෂ්ඨයේ ඇ 24 ඡේදය සහ එහි සම්බන්ධිත ශීර්ෂය ඉවත්කර ඇත සහ ඇ34 - ඇ35 ඡේද සහ ඒවායේ සම්බන්ධිත ශීර්ෂ එකතු කර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇත. |

**අයභාරය**

ඇ34 මුල්වරට භාවිත කරන්නෙත් SLFRS 15 හි ඇ 5 ඡේදයේ සංක්‍රාන්ති විධි විධාන ව්‍යවහාර කළ හැකිය. එම ඡේදවල ආරම්භක ව්‍යවහාර කරන දිනය යන්නට කරන යොමු කිරීම් මුල් SLFRS වාර්තාකරන කාලපරිච්ඡේදය පටන් ගන්නා ලෙස අර්ථ නිරූපණය කළ යුතුය. මුල් වරට භාවිත කරන්නෙක් එම සංක්‍රාන්ති විධිවිධාන ව්‍යවහාර කිරීමට තීරණය කළහොත් එය SLFRS 15 ආ 6 ඡේදය ද ව්‍යවහාරකළ යුතුය.

ඇ35 ඉදිරිපත්කළ පෙරතම කාලපරිච්ඡේදයට පෙර සම්පූර්ණ කල ගිවිසුම් වලට මුල්වරට භාවිත කරන්නෙක් නැවත ප්‍රකාශ කිරීම අවශ්‍ය නොවේ. සම්පූර්ණකළ ගිවිසුමක් යනු කලින් පොපිගිමු (GAAP) ප්‍රකාරව හඳුනාගත් සියලුම භාණ්ඩ සහ සේවා අස්තිත්ත්වය පැවරූ ගිවිසුමකි.

**SLFRS 3ව්‍යාපාර සංයෝජන**

| |
|---|
| 56 වන ඡේදය සංශෝධනය කර ඇත සහ 64 ඕ ඡේදය එකතුකර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**අසම්භව්‍ය වගකීම්**

56 ආරම්භක හඳුනාගැනීමෙන් පසු සහ වගකීම නිරවුල් කරන, අවලංගු කරන හෝ කල් ඉකුත් වන තෙක් ව්‍යාපාර සංයෝජනයකදී හඳුනාගත් අසම්භව්‍ය වගකීමක් අත්පත් කර ගන්නා මැනිය යුත්තේ පහත දැ වලින් වඩාත් වැඩි එකටය.

(අ) LKAS 37 ප්‍රකාරව හඳුනාගත හැකිවන වටිනාකම;සහ

(ආ) ආරම්භයේදී හඳුනාගත් වටිනාකමෙන්, අඩුකළ උචිතවන පරිදි ~~LKAS 18 අයභාරයේ~~ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින්* අයභාරයේ මූලධර්ම ප්‍රකාරව හඳුනාගත් සමුච්චිත~~ක්‍රමක්ෂය~~ ආදායමේ ප්‍රමාණය.

LKAS 39 ප්‍රකාරව ගිණුම්ගත කළ ගිවිසුම් සඳහා මෙම අවශ්‍යතාවයන් ව්‍යවහාර නොවේ.

...

**බලාත්මක දිනය**

...

64ඹ 2014 ජුනි තුළ නිකුත් කළSLFRS 15 ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින් අයභාරය සංශෝධනය කළ 56 වන ඡේදය අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාරකරණ විට එම සංශෝධනය ව්‍යවහාර කළ යුතුය.

**SLFRS 4 *රක්ෂණ ගිවිසුම්***

> 41ළ ඡේදය එකතු කර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

...

41ළ 2014 ජුනි තුළ නිකුත් SLFRS 15 ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වලින් අයභාරය සංශෝධනය කළ 4(අ) සහ (ඇ) ආ7, ආ18 (ළු) ආ 21 ඡේද සහ IG2 ඡේදයේ වන වගුවේ 1.16 අයිතමය. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාර කරනවිට එම සංශෝධන ව්‍යවහාර කළ යුතු ය.

ආ පරිශිෂ්ඨයේ ආ 7 සහ ආ 21 ඡේද සංශෝධනය කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරක් ඇඳ කපා ඇත. නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත.

**ද්‍රව්‍යවලින් ගෙවීම**

...

ආ7 ආ 6 ඡේදයේ විස්තර කර ඇති ගිවිසුම් මෙම SLFRS හි විෂයය පථයෙන් බාහිර වූවා නම් අදාළ විය හැකි වූවා වූ SLFRSs ව්‍යවහාර කරනවාට වඩා ඉහත ඡේදයේ විස්තර කර ඇති ගිවිසුම්වලට මෙම SLFRS ව්‍යවහාර කිරීම තවදුරටත් කරදරකාරී විය නොහැකිය.

(අ) ...

(ආ) ~~LKAS 18අයභාරය~~ SLFRS 15 ව්‍යවහාරකරන්නේ නම් සේවා සපයන්නා අයභාරය හඳුනා ගන්නේ ~~නිමකර ඇති අදියරට සොමු කරමින්~~ ගණුදෙනුකරුට සේවාවන් එය පවරන අවස්ථාවේදීය (හෝ ලෙස) (වෙනත් පැහැදිලිව සඳහන් කළ නිර්ණායක වලට යටත්ව). මෙම SLFRS යටතේත් එම ප්‍රවේශය ද පිළිගත හැකිය. (i) 14 වන ඡේදයෙන් තහනම් කර ඇති ක්‍රියාමාර්ගවලට ඔවුන් සම්බන්ධ වන්නේ නම් හැර, එහි පවතින ගිණුම්කරණ ප්‍රතිපත්ති එම ගිවිසුම් සඳහා තවදුරටත් පවත්වාගෙන යාමට සහ (ii) 22 - 30 ඡේදවලින් එසේ කිරීමට එමගින් සේවා සපයන්නෙකුට අවසර දේ.

(ඇ) ...

**රක්ෂණ ගිවිසුම්වලට උදාහරණ**

ආ21 ආ 19 වන ඡේදයේ විස්තර කර ඇති ගිවිසුම්වලින් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් ඇතිකරන්නේ නැත්නම් අස්තිත්ත්වය ~~LKAS 18~~SLFRS 15 ව්‍යවහාර වේ. LKAS 18 SLFRS 15, යටතේ අයභාරය ~~සේවාවන් සම්බන්ධවන ගණුදෙනුවක් සම්බන්ධවන~~ හඳුනා ගන්නේ ~~ගණුදෙනුවේ ප්‍රතිඵලය, ගණුදෙනුවේ නිමකර ඇති අදියරට යොමු කර විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ හැකිනම්~~ අස්තිත්ත්වය හිමිකම් කීමට අපේක්ෂාකරණ ප්‍රතිෂ්ඨාවෙන් පිළිඹිබු වන වටිනාකමට, ගණුදෙනුකරුවෙකුට එකඟ වූ භාණ්ඩ හෝ පැවරීමෙන් ඉටු කිරීමේ බැඳීම අස්තිත්වය සපුරාලනවිට (හෝ ලෙස) යි.

**SLFRS 9 *මූල්‍ය සාධන පත්‍ර***

> 3.1.1 සහ 5.4.5 ඡේද සංශෝධනය කර ඇත සහ 5.1.2, 5.4.1 අ සහ 8.1.5 ඡේද එකතු කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා ඇත සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත.

**3.1 මූල්‍ය වත්කම් ආරම්භක හඳුනාගැනීම**

3.1.1 **මූල්‍ය සාධන පත්‍රයක ගිවිසුම් ගත විධිවිධානවලට අස්තිත්වය පාර්ශ්වයක් වන විටදී පමණක් වන විට අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මූල්‍ය වත්කම අස්තිත්ත්වය විසින් හඳුනා ගත යුතු ය.** (LKAS 39 අළ 34 සහ අළ 35 ඡේද බලන්න) **මූල්‍ය**

**වත්කමක් අස්තිත්ත්වයක් විසින් මුල්වරට හඳුනාගන්නා විට එය 4.1 - 4.5 ඡේද ප්‍රකාරව වර්ගීකරණය කළ යුතු අතර, එය 5.1.1 - 5.1.2 ඡේද ප්‍රකාරව මැනිය යුතුය.**

...

**5.1 ආරම්භක මැනීම**

5.1.1 **5.1.2 ඡේදයේ විෂය පථය තුළවන වෙළඳ ලැබිය යුතු දෑවලට හැරෙන්නට, මූල්‍ය වත්කමක් අස්තිත්ත්වය මැනිය යුත්තේ එහි වඩා හොඳ සාධාරණ අගයටය.ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට නොවන මූල්‍ය වත්කම් සම්බන්ධයෙන් මැනිය යුත්තේ මූල්‍ය වත්කම අත්කර ගැනීමට සෘජුව ආරෝපණයවන ගණුදෙනු පිරිවැයටය.**

5.1.2 5.1.1 ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වෙතත් ආරම්භක හඳුනා ගැනීමේ දී සැළකිය යුතු අන්දමේ මූල්‍ය සංරචකයක් (SLFRS 15 ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින්වන අයභාරය ප්‍රකාරව නිර්ණය කරන ලද) නොමැති වෙළඳ ලැබිය යුතුදෑ අස්තිත්වය මැනිය යුත්තේ ඒවායේ ගණුදෙනු මිලටය. (SLFRS 15 නිර්වචනය කර ඇති පරිදි)

**5.4 ප්‍රතිලාභ සහ අලාභ**

...

5.4.1අ ලාභ හෝ අලාභවල ලාභාංශ හඳුනාගන්නේ පහත දැවන විටදී පමණි.

(අ) අස්තිත්වයට ලාභාංශ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට ;

(ආ) ලාභාංශ හා ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්ත්වයට ප්‍රවාහවන බව අපේක්ෂා කළ හැකි වීම ; සහ

(ඇ) ලාභාංශවල ප්‍රමාණය විශ්වශනීය ලෙස මැනිය හැකිවීම.

...

**ස්කන්ධ සාධණ පත්‍රවල ආයෝජන**

...

5.4.5 අස්තිත්ත්වයක් 5.4.4 ඡේදය තෝරා ගැනීමට සේන්දු වුවහොත් එම ආයෝජනයෙන්වන ලාභාංශ ලාභ හෝ අලාභවල හඳුනා ගත යුත්තේ ~~LKAS 18 අයභාරය ප්‍රකාරව අස්තිත්ත්වයේ ලාභාංශ ගෙවීමට ඇති අයිතිය තහවුරු වූ විට~~ 5.4.1 අ ඡේදය ප්‍රකාරවය.

**8.1 බලාත්මක දිනය**

8.1.5 2014 ජුනි තුලදී නිකුත් කළSLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින් වන අයභාරය* 3.1.1, 5.1.1 සහ ආ 5.12 ඡේද සංශෝධනය කර ඇත සහ ආ 16 ඡේදය සහ එහි ආශ්‍රිත ශීර්ෂය ඉවත් කර ඇත. 5.1.2 සහ 5.4.1 අ ඡේද සහ අ පරිශිෂ්ඨයට නිර්වචනයක් එකතුකර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාරකරණවිට එම සංශෝධන ව්‍යවහාර කළ යුතු ය.

| |
|---|
| අ පරිශිෂ්ඨයේ නිර්වචනයක් එකතු කර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

ලාභාංශ විශේෂ පන්තියක ප්‍රාග්ධනයට ඒවා දරන සමානුපාතිකයට ස්කන්ධ සාධන පත්‍ර දරන්නන්ට ලාභ බෙදාහැරීම

| |
|---|
| ආ පරිශිෂ්ඨයේ ආ 5.12 ඡේදය සංශෝධනය කෙරේ. ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා හැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**ප්‍රතිලාභ සහ අලාභ**

ආ5.12 විකිණීම සඳහා තබාගෙන නොමැති ස්කන්ධ සාධන පත්‍රයක කර ඇති ආයෝජනයක සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායමේ ඉදිරිපත් කිරීමට වෙනස් කළ නොහැකි තෝරා ගැනීමක් අස්තිත්වයට කිරීමට 5.4.4 ඡේදයෙන් අවසර දේ. මෙම තෝරා ගැනීම සාධන පත්‍රයෙන්, සාධන පත්‍රය (එනම් කොටසින් කොටසක් පාසා) පදනම මත කළ හැකිය.

විස්තීර්ණ ආදායමේ ඉදිරිපත් කරන ලද වටිනාකම පසුව ලාභ හෝ අලාභවලට මාරු නොකළ යුතුය. කෙසේ වෙතත් ස්කන්ධය තුළවන සමුච්චිත ප්‍රතිලාභ හෝ අලාභ අස්තිත්ත්වයට මාරු කළ හැකිය. ලාභාංශ ආයෝජන පිරිවැයේ කොටසක් ආපසු අය කර ගැනීමක් ලෙස පැහැදිලිවම නියෝජනය වීම වන්නේ නම් හැර, එවැනි ආයෝජන මත ලාභාංශ ~~LKAS 18 *අයභාරයේ*~~ 5.4.5 ඡේදය ප්‍රකාරව ලාභ හෝ අලාභවල හඳුනාගත යුතුය.

| |
|---|
| ඇ පරිශිෂ්ඨයේ ඇ 16 ඡේදය සහ එහි සම්බන්ධිත ශීර්ෂය ඉවත් කර ඇත. |

**SLFRS 9*මූල්‍ය සාධන පත්‍ර***

| |
|---|
| 3.1.1, 4.2.1, 5.1.1, 5.2.1 සහ 5.7.6 ඡේද සංශෝධනය කර ඇත 5.1.3, 5.7.1 අ සහ 7.1.4 එකතුකර ඇත. ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා හැර ඇත සහ නව පාඨ යටින් ඉරක් ඇඳ ඇත. |

**3.1 ආරම්භක හඳුනා ගැනීම**

3.1.1 **මූල්‍ය සාධන පත්‍රයක ගිවිසුම්ගත විධිවිධානවලට අස්තිත්ත්වය පාර්ශ්වයක් වනවිටදී පමණක් වනවිට අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ මූල්‍යවත්කමක් හෝ මූල්‍ය වගකීමක් හඳුනාගත යුතුය. (ආ 3.1.1 සහ ආ 3.1.2 ඡේද බලන්න) මූල්‍ය වත්කමක් අස්තිත්ත්වයක් විසින් මුල්වරට හඳුනා ගන්නා විට එය 4.1.1 - 4.1.5 ඡේද ප්‍රකාරව වර්ගීකරණය කළ යුතු අතර මැනිය යුත්තේ 5.1.1 ~~සහ 5.1.2~~ -5.1.3 ඡේද ප්‍රකාරවය. මූල්‍ය වගකීමක් අස්තිත්ත්වයක් විසින් මුල්වරට හඳුනා ගන්නා විට එය 4.2.1 සහ 4.2.2 ඡේද ප්‍රකාරව වර්ගීකරණය කළ යුතු අතර මැනිය යුත්තේ 5.1.1 ඡේදය ප්‍රකාරවය.**

...

**4.2 මූල්‍ය වගකීම් වර්ගීකරණය**

4.2.1 **පහත දක්වෙන දෑ වලට හැර සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට පසුව මනින ලැබූ ලෙස සියලු මූල්‍ය වගකීම් අස්තිත්වයක් විසින් වර්ගීකරණය කළ යුතුය.**

(අ) ...

(ආ) **අ පරිශිෂ්ඨයේ නිර්වචනය කළ *මූල්‍ය, ඇපවීම් ගිවිසුම්* මූලික හඳුනා ගැනීමෙන් පසුව එවැනි ගිවිසුමක් නිකුත් කරන්නා විසින් (4.2.1 (අ) හෝ (ආ) ව්‍යවහාර කරන්නේ නම් හැර පසුව මැනිය යුත්තේ පහතදක්වෙන දෑ වලින් වඩා වැඩි වටිනාකමටය.**

(i) LKAS 27 ***ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්* ප්‍රකාරව නිර්ණය කරන ලද වටිනාකම සහ**

(ii) **යෝග්‍යවන කල්හි ~~LKAS 18 අය භාරය~~** SLFRS 15 ***ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින් වන අයභාරය* මූලධර්ම ප්‍රකාරව හඳුනාගත් සමුච්චිත ආදායමේ වටිනාකම අඩු කොට ආරම්භයේ හඳුනාගත් වටිනාකම (5.1.1 ඡේදය බලන්න)**

(ඇ) වෙළඳපොළ පොලී අනුපාතිකවලට වඩා අඩු අනුපාතිකයකට ණය මුදල් සැලසීමට වන බැඳීම්, මූලික හඳුනා ගැනීමෙන් පසුව එවැනි බැඳීමක් නිකුත් කරන්නා විසින් (4.2.1 (අ) ව්‍යවහාර කරන්නේ නම් හැර) පසුව මැනිය යුත්තේ පහත දක්වෙන දෑ වලින් වඩා වැඩි වටිනාකමටය.

(i) LKAS 37 ප්‍රකාරව නිර්ණය කළ වටිනාකම සහ

(ii) ආරම්භක හඳුනාගත් වටිනාකමෙන් (5.1 ඡේදය බලන්න) අඩු කල උචිතවන විට ~~LKAS 18~~, SLFRS 15 හි මූලධර්ම ප්‍රකාරව හඳුනාගත් ආදායමේ සමුච්චිත ~~ක්‍රම ක්ෂය~~ වටිනාකම

(ඉ) ...

**5.1 ආරම්භක මැනීම**

5.1.1 **5.1.3 ඡේදයේ විෂය පථය තුළ වන වෙළඳ ලැබිය යුතු දෑ වලට ආරම්භක හඳුනා ගැනීමේ දී හැරෙන්නට මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් අස්තිත්ත්වයක් මැනිය යුත්තේ ඒවායේ සාධාරණ අගයකට එකතු කළ හෝ අඩු කළ ලාභ හෝ අලාභ හරහා**

**සාධාරණ අගයට නොවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් සම්බන්ධයෙන් මැනිය යුත්තේ මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට ඍජුව ආරෝපණයවන ගණුදෙනු පිරිවැයටය.**

5.1.3 5.1.1 ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වෙතත් ආරම්භක හඳුනා ගැනීමේ දී සැලකිය යුතු අන්දමේ මූල්‍ය සංරචකයක් (SLFRS 15 ප්‍රකාරව නිර්ණය කළ) නොමැති වෙළඳ ලැබිය යුතු දෑ අස්තිත්වය මැනිය යුත්තේ ඒවායේ ගණුදෙනු මිළටය. (SLFRS 15 නිර්වචනය කර ඇති පරිදි)

## 5.2 මූල්‍ය වත්කම් පසුව මැනීම

5.2.1 ආරම්භක මැනීමෙන් පසුව, අස්තිත්වයක් මූල්‍ය වත්කමක් මැනිය යුත්තේ 4.1.1 - 4.1.5 ඡේද ප්‍රකාරව සාධාරණ අගයට හෝ ක්‍රම ක්‍ෂය පිවැයටය.(LKAS 39 හි 9 සහ අළ5 - අළ8 ඡේද බලන්න)

## 5.7 ප්‍රතිලාභ සහ අලාභ

...

5.7.1අ *ලාභ හෝ අලාභවල ලාභාංශ හඳුනාගන්නේ පහත දෑ වන විට දී පමණි;*

(අ) අස්තිත්වයට ලාභාංශ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට,

(ආ) ලාභාංශ සහ ආශ්‍රිත ප්‍රතිලාභ අස්තිත්වයට ප්‍රවාහවන බවට අපේක්ෂාකළ හැකි වීම; සහ

(ඇ) ලාභාංශවල ප්‍රමාණය විශ්වාසනීය ලෙස මැනිය හැකි වීම.

...

### ස්කන්ධ සාධන පත්‍රවල ආයෝජන

...

5.7.6 අස්තිත්ත්වයක් 5.7.5 ඡේදය තෝරා ගැනීමට සේන්දු වුවහොත් එම ආයෝජනයෙන් වන ලාභාංශ ලාභ හෝ අලාභවල හඳුනාගත යුත්තේ ~~LKAS 18 අය භාරය ප්‍රකාරව අස්තිත්වයේ ලාභාංශ ගෙවීමට ඇති අයිතිය තහවුරු වූ විටය~~ 5.7.1 අ ඡේදය ප්‍රකාරවය.

## 7.1 බලාත්මක දිනය

...

7.1.4 2014 ජුනි තුළදී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින්වන අයභාරය* 3.1.1, 4.2.1, 5.1.1, 5.2.1, 5.7.6, ආ 3.2.13, ආ 5.7.1, ඇ 5 සහ ආ 42 ඡේද සංශෝධනය කර ඇත සහ ඇ 16 සහ එහි සම්බන්ධිත ශීර්ෂය ඡේදය, ඉවත් කර ඇත. 5.1.3 සහ 5.7.1 අ ඡේද සහ අ පරිශිෂ්ඨයට නිර්වචනයක් එකතු කර ඇත. අස්තිත්වයක් SLFRS 15 ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

| |
|---|
| අ පරිශිෂ්ඨයේ නිර්වචනයක් එකතු කර ඇත. නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත. |

ලාභාංශ විශේෂ පන්තියක ප්‍රාග්ධනයට ඒවා දරණ සමානුපාතිකයට ස්කන්ධ සාධන පත්‍ර දරන්නන්ට ලාභ බෙදීම්.

| |
|---|
| ආ පරිශිෂ්ඨයේ, ආ 3.2.13 සහ ආ 5.7.1 ඡේද සංශෝධනය කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා හැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

### පැවරූ වත්කම්වල අඛණ්ඩ සහභාගිත්වය

ආ3.2.13 3.2.16 ඡේදය යටතේ පැවරූ වත්කමක් සහ ආශ්‍රිත වගකීමක් අස්තිත්ත්වය මනින්නේ කෙසේද යන්නට උදාහරණ පහත දක්වේ.

*සියළු වත්කම්*

(අ) පැවරූ වත්කම මත පැහැර හැරි අලාභ ගෙවීම් ගෙවීමට අස්තිත්ත්වය සැළසූ සහතිකය අඛණ්ඩ සහභාගීත්වයේ ප්‍රමාණය තෙක් පැවැරූ වත්කම් ප්‍රති හඳුනාගැනීමත් වළක්වාලන්නේ නම් පැවරූ වත්කම පැවරූ දින මැනිය යුත්තේ (i) වත්කමේ ධාරණ වටිනාකම සහ (ii) අස්තිත්ත්වය විසින් ආපසු ගෙවිය යුතු (සහතිකවූ වටිනාකම) වන පැවරුම සඳහා ලැබුණ ප්‍රතිෂ්ඨාවේ උපරිම වටිනාකම යන ඒවායින් අඩු වටිනාකමටය. ආශ්‍රිත වගකීම ආරම්භකව මනිනුයේ සහතික කළ වටිනාකමට සහතිකවීමේ සාධාරණ වටිනාකම එකතු කිරීමෙනි. (සාමාන්‍යයෙන් එය වනුයේ සහතිකය සඳහා වූ ලැබුණ ප්‍රතිෂ්ඨාවය) පසුව සහතිකවීමේ ආරම්භක සාධාරණ අගය ලාභයේ හෝ ~~පාඩුව හඳුනාගන්නේ කාලය හා සමානුපාතික පදනම~~ වගකීම සපුරාලූ විටය (හෝ ලෙස) (~~LKAS 18 බලන්න~~ SLFRS 15 මූලධර්ම ප්‍රකාරව) සහ වත්කමේ ධාරණවටිනාකම යම් හානිකරණ අලාභයකින් අඩු කෙරේ.

...

**ප්‍රතිලාභ සහ අලාභ (5.7 කොටස)**

ආ5.7.1 විකිණීම සඳහා තබා ගෙන නොමැති ස්කන්ධ සාධන පත්‍රයක කර ඇති ආයෝජනයක සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ ආදායමේ ඉදිරිපත් කිරීමට වෙනස් කළ නොහැකි තෝරා ගැනීමක් අස්තිත්ත්වයකට ඉදිරිපත් කිරීමට 5.7.5 ඡේදයෙන් අවසර දේ. මෙම තොරා ගැනීම සාධන පත්‍රයෙන් සාධන පත්‍රයට (එනම් කොටසක් කොටසක් පාසා) පදනම මත කළ හැකිය. විස්තීර්ණ ආදායමේ ඉදිරිපත් කරන ලද වටිනාකම පසුව ලාභ හෝ අලාභවලට මාරු නොකළ යුතුය. කෙසේ වෙතත් ස්කන්ධය තුළවන සමුච්චිත ප්‍රතිලාභ හෝ පාඩු අස්තිත්ත්වයට මාරු කළ හැකිය. ලාභාංශ ආයෝජනය කිරීමේ පිරිවැයේ කොටසක් ආපසු අයකර ගැනීමක් ලෙස පැහැදිලිව නියෝජනය වීම වන්නේ නම් හැර එවැනි ආයෝජනමත ලාභාංශ ~~LKAS 18~~ 5.7.6 ඡේදය ප්‍රකාරව ලාභ හෝ අලාභවල හඳුනාගත යුතුය.

ඇ පරිශිෂ්ටයේ, ඇ 5 සහ ඇ 42 ඡේද සංශෝධන කෙරේ. ඇ 16 ඡේදය සහ එහි සම්බන්ධිත ශීර්ෂය ඉවත් කෙරේ. ඉවත්කළ පාඨ තනි ඉරකින් කපාහැර ඇත, සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**SLFRS 3 *ව්‍යාපාර සංයෝජන***

ඇ5 පහත සඳහන් ලෙස කියවෙන පරිදි 16, 42, 53, 56 සහ 58 6ඇ) ඡේද සංශෝධනය කෙරේ. 64 අ ඡේදය ඉවත් කෙරේ සහ 64 ඈ ඡේදය එකතු කෙරේ.

...

56. ආරම්භක හඳුනාගැනීමෙන් පසු වගකීම නිරවුල් කිරීම, අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම සිදුවනතුරු ව්‍යාපාර සංයෝජනයේදී හඳුනාගත් අසම්භව්‍ය වගකීම අත්පත්කර ගන්නා මැනිය යුත්තේ වටිනාකම වඩා වැඩි දෙයටය.

(අ) LKAS 37 ප්‍රකාරව හඳුනාගන්නා වටිනාකම; සහ

(ආ) හඳුනාගත් ආරම්භක වටිනාකමෙන් අඩු කළ උචිත වන්නේ නම්, LKAS 18 *අයභාරය*, SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වල අයභාරයේ* මූලධර්ම ප්‍රකාරව හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය මගින් ආදායමෙන් වටිනාකම

SLFRS 9 ප්‍රකාරව ගිණුම්ගතකරණ ගිවිසුම් සඳහා මෙම අවශ්‍යතාවයන් අදාළ නොවේ.

...

**LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර : හඳුනාගැනීම සහ මැනීම***

...

ඇ42 අපරිශිෂ්ඨයේ, අළ 23 - අළ 24 ඡේද පහත කියවෙන පරිදි සංශෝධනය කෙරේ.

...

අඋ4 මුල්‍ය සහතික ගිවිසුම්වල පහත වැනි... විවිධ ආකාරයේ නෛතික ස්වරූප තිබිය හැකිය.

(අ) .... නිකුත් කරන්නා එය මනිනුයේ වඩා වැඩි දෙයටය ː

(i) LKAS 37 ප්‍රකාරව නිර්ණය කළ වටිනාකමට; සහ

(ii) ~~LKAS 18~~ SLFRS 15 හි මූලධර්ම (SLFRS 9 හි 4.2.1 (ඇ) ඡේද බලන්න) ප්‍රකාරව හඳුනාගත් සමුච්චිත ~~ක්‍රමක්ෂය~~ ආදායම වටිනාකම උචිතවනවිට අඩුකළ ආරම්භක හඳුනාගත් වටිනාකම

(ආ) ...

**SLFRS 9 මූල්‍ය සාධන පත්‍ර (ඉදිරි රැකුම් ගිණුම්කරණය සහ SLFRS 9, SLFRS 7 සහ LKAS 39 වලට සංශෝධන)**[1]

| |
|---|
| 5.2.1 ඡේදය සංශෝධනය කෙරේ. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**5.2 මූල්‍ය වත්කම් පසුව මැනීම**

**5.2.1 ආරම්භක හඳුනා ගැනීමෙන් පසු අස්තිත්වයක් මූල්‍ය වත්කම් මැනිය යුත්තේ 4.1.1 - 4.1.5 ඡේද ප්‍රකාරව සාධාරණ අගයට හෝ ක්‍රම ක්ෂය පිරිවැයටය. (LKAS 39 හි 9 සහ අඋ 5 - අඋ 8 ඇ ඡේද බලන්න)**

| |
|---|
| අ පරිශිෂ්ඨයේ නිර්වචනයක් එකතු කර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

<u>ලාභාංශ</u> <u>විශේෂ ප්‍රාග්ධනයට ඒවා දරණ සමානුපාතිකයට ස්කන්ධ සාධන පත්‍ර දරන්නන්ට ලාභ බෙදා හැරීම</u>

| |
|---|
| ඇ පරිශිෂ්ඨයේ, ආ 5 සහ ආ 38 ඡේද සංශෝධනය කෙරේ. ඇ 21 ඡේදය සහ එහි සම්බන්ධිත ශීර්ෂය ඉවත් කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා හැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**SLFRS 3** ***ව්‍යාපාර සංයෝජන***

ඇ5 16, 42, 53, 56 සහ 58 (ආ) ඡේද පහත සඳහන් පරිදි කියවෙන ලෙස සංශෝධනය කෙරේ. 64 අ සහ 64 ඇ ඡේද ඉවත් කෙරේ. සහ 64 ඌ ඡේදය එකතු කෙරේ.

...

56 ආරම්භක හඳුනාගැනීමෙන් පසු වගකීම නිරවුල් කිරීම අවලංගු කිරීම හෝ කල් ඉකුත් වීම සිදුවනතුරු ව්‍යාපාර සංයෝජනයේදී හඳුනාගත් අසම්භව්‍ය වගකීම අත්කර ගන්නා මැනිය යුත්තේ

1. SLFRS 15, SLFRS 9 ට කළ එම ආනුෂංගික සංශෝධන (ඉදිරි රැකුම් ගිණුම්කරණය සහ SLFRS 9, SLFRS 7, සහ LKAS 39 ට කළ සංශෝධන)SLFRS 15, SLFRS 9 (2010) කළ එම ආනුෂංගික සංශෝධන සමග එකට බැඳුන ලෙස කියවිය යුතුය. එයට හේතුව වන්නේ SLFRS 9 හි ඇතුළත් වන්නේ SLFRS 9 (ඉදිරි රැකුම් ගිණුම්කරණය සහ SLFRS 9, SLFRS 7 සහ LKAS 39)යෙන්වන එය සංශෝධනය කළ හෝ යොමුකිරීමේ පහසුව සඳහා අවශ්‍ය වූ එම ඡේද පමණක් නිසාය. එම නිසා බලාත්මක දිනය දැක්වෙන ඡේදයක් SLFRS 9 (ඉදිරි රැකුම් ගිණුම්කරණය සහ SLFRS9, SLFRS 7 සහ LKAS 39) කළ සංශෝධන එකතු කර නැති වීමට හේතුව වන්නේ සංක්ෂිප්තකළ බලාත්මක දිනය දැක්වෙන ඡේදය SLFRS 9 ට එකතු කරන නිසාය.

(අ) LKAS 37 ප්‍රකාරව හඳුනාගත් වටිනාකම; සහ

(ආ) හඳුනාගත් ආරම්භක වටිනාකමෙන් අඩු කළ උචිත වන්නේ නම් ~~LKAS 18 අයභාරයේ,~~ SLFRS 15 ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වල අයභාරයේ මූලධර්ම ප්‍රකාරව හඳුනාගත් සමුච්චිත ක්‍රමක්ෂය ආදායමෙන් වටිනාකමෙන් වඩා වැඩි දෙයටය.

SLFRS 9 ප්‍රකාරව ගිවිසුම්ගතකර ඇති ගිවිසුම් සඳහා මෙම අවශ්‍යතාවයන් අදාළ නොවේ.

...

## LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම් සහ මැනීම*

...

ඇ38 අ පරිශිෂ්ඨයේ අළ 3 - අළ 4 ඡේද පහත සඳහන් පරිදි කියවෙන ලෙස සංශෝධනය කර ඇත.

අළ4 මූල්‍ය සහතික ගිවිසුම්වල පහත වැනි.... විවිධ ආකාරයේ නෛතික ස්වරූප තිබිය හැකි ය.

(අ) නිකුත් කරන්නා එය මනිනුයේ;

(i) LKAS 37 ප්‍රකාරව නිර්ණය කළ වටිනාකමට

(ii) SLFRS 15 හි මූලධර්ම (SLFRS 9 හි 4.2.1 (ඇ) ඡේද බලන්න) ප්‍රකාර ව හඳුනාගත් සමුච්චිත ආදායමේ වටිනාකමට උචිතවන විට අඩුකළ ආරම්භක හඳුනාගත් වටිනාකමෙන් වැඩි දෙයට.

(ආ) ...

## LKAS 1 *මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම*

34 ඡේදය සංශෝධනය කෙරේ සහ 139 ආආ ඡේදය එකතුකෙරේ. ඉවත්කළ පාඨය තනි ඉරකින් කපා ඇත. සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

### හිලව් කිරීම

34 ~~LKAS 18~~ *අයභාරයේ* ~~නිර්වචනය කර ඇති සහ~~ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින්වන අයභාරය* පොරොන්දු වූ භාණ්ඩ හෝ සේවා පැවරීම සඳහා හුවමාරුවක් ලෙස අස්තිත්ත්වය හිමිකම් කීමට අපේක්ෂාකරන ප්‍රතිෂ්ඨාවේ වටිනාකමට ~~වටිනාකම සැළකිල්ලට ගෙන ලැබුණ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට~~ ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින් වන අයභාරය අස්තිත්ත්වය මැනීම අවශ්‍ය කෙරේ. *උදාහරණ වශයෙන් හඳුනාගත් අයභාරයේ* වටිනාකමින් අස්තිත්ත්වය ඉඩදෙන යම්වෙළඳ වට්ටමක් සහ පරිමා ප්‍රතිදාන පිළිබිඹුවේ. අස්තිත්ත්වයක ප්‍රධාන අයභාර ජනනය ක්‍රියාකාරකම්වලට ආනුෂංගිකවන එහෙත් ඒවා අයභාරයක් උත්පාදනය නොකරන එහි සාමාන්‍ය ක්‍රියාකාරකම්, ක්‍රියාමාර්ගවලදී වෙනත් ගණුදෙනු අස්තිත්වයක් භාරගනී. මෙම ඉදිරිපත් කිරීමෙන් ගණුදෙනුවේ හරය හෝ වෙනත් සිද්ධියක් පිළිබිඹුවන විට, එම ගණුදෙනුව මත පැන නගින සම්බන්ධිත වියදම් සමඟ යම් ආදායමක් සමඟ හිලව් කිරීමෙන් එවැනි ගණුදෙනුවල ප්‍රතිඵල අස්තිත්ත්වය ඉදිරිපත් කරයි. උදාහරණ වශයෙන්;

(අ) ආයෝජන සහ මෙහෙයුම් වත්කම් ඇතුළුව ජංගම නොවන වත්කම් බැහැර කිරීම් ප්‍රතිලාභ හෝ අලාභ අස්තිත්ත්වය ඉදිරිපත් කරන්නේ බැහැර කිරීම මත වන ~~ලැබුන මුදල~~ ප්‍රතිෂ්ඨාවේ වටිනාකමකින් වත්කමේ ධාරන වටිනාකම සහ සම්බන්ධිත විකුණුම් වියදම් අඩු කිරීමෙන්; සහ

(ආ) ...

### සංක්‍රාන්තිය සහ බලාත්මක දිනය

...

139අආ 2014 ජුනි තුළ දී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින්වන අයභාර,* 34 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාරකරන විට එම සංශෝධනය ව්‍යවහාර කළ යුතු ය.

## LKAS 2 තොග

2,8,29 සහ 37 ඡේද සංශෝධනය කෙරේ. සහ 40 ඉ ඡේදය එකතු කර ඇත. 19 ඡේදය ඉවත් කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා ඇත. සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**විෂය පථය**

2. **පහත තොග හැර සියළුම තොග සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර වේ:**

(අ) ~~සම්බන්ධිත සේවා සමඟ සෘජුව වන කොන්ත්‍රාත් ඇතුළුව ඉදිකිරීම් කොන්ත්‍රාත් යටතේ පැන නගින කෙරීගෙන යන වැඩ (LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත්තු බලන්න)~~

[ඉවත් කර ඇත]

(ආ) ...

**නිර්වචන**

...

8. තොගවලට උදාහරණ වශයෙන් නැවත විකිණීම සඳහා සිල්ලර වෙළෙන්දෙක් මිලට ගෙන රඳවා ගෙන ඇති වෙළඳ භාණ්ඩ, හෝ නැවත විකිණීමට රඳවා ගෙන ඇති ඉඩම් සහ වෙනත් දේපොළ ඇතුලුව නැවත විකිණීම සඳහා මිලදීගත් භාණ්ඩ ආවරණය වේ. අස්තිත්වය විසින් නිෂ්පාදනය කළ නිමි භාණ්ඩ සහ නිෂ්පාදනය කරනු ලබන නොනිමි වැඩ නිෂ්පාදන ක්‍රියාවලියේ භාවිත කිරීමට බලාපොරොත්තුවෙන් ඇති සැපයුම් ද ඇතුළත් ව තොගවලින් ආවරණය වේ. ~~සේවා සැපයුම්කරුවෙකු සමඟවන සිද්ධිය 19 වන ජේදයේ විස්තර කර ඇති පරිදි සම්බන්ධිත අයභාරය (LKAS 18 අයභාරය බලන්න) අස්තිත්ත්වය මෙතෙක් හඳුනාගෙන නැති සේවා පිරිවැය තොගවල ඇතුළත් වේ.~~ <u>ගණුදෙනුකරුවෙකු සමඟවන ගිවිසුමක් සම්පූර්ණ කිරීමට දරණ ලද පිරිවැය තොග හටගැන්වීමට තුඩු නොදෙන විට (හෝ වෙනත් ප්‍රමිතියක විෂය පථය තුළවන) එම පිරිවැය ගිණුම්ගත කළ යුත්තේ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින් වන අයභාරය* ප්‍රකාරව ය.</u>

...

**ශුද්ධ උපලබ්ධි අගය**

...

29 තොග සාමාන්‍යයෙන් අයිතමයෙන් අයිතමයට ශුද්ධ උපලබ්ධි අගයට ලියාහරිනු ලැබේ. කෙසේ වෙතත්, සමහර අවස්ථාවල දී සමාන හෝ සම්බන්ධිත අයිතම කාණ්ඩගත කිරීම උචිත විය හැකි ය. මෙවැනි තත්ත්වයක් වන්නේ එකම නිෂ්පාදන පෙළකට සම්බන්ධිත, එකම අරමුණු සහ එකම අවසන් භාවිතයක් ඇති, එක භූගෝලීය ප්‍රදේශයේ නිෂ්පාදනය කර අලෙවි කරන තොග අයිතම සමඟ සහ එම නිෂ්පාදනපෙලේ වෙනත් අයිතමයන්ගෙන් වෙන් වෙන්ව ඇගයීම ප්‍රායෝගිකව කළ නොහැකි නිසා ය. තොග වර්ගීකරණය පදනම මත තොග ලියා හැරීම උචිත නොවේ. උදාහරණ වශයෙන් නිමි භාණ්ඩ හෝ විශේෂ මෙහෙයුම් ඛණ්ඩයක සියළුම තොග ~~සේවා සපයන්නෙක් වෙනම පිකුණුම් මිලක් අයකරන සෑම සේවාවක් සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් පිරිවැය සමාහරණය කෙරේ. එබැවින් එවැනි සෑම සේවාවක් ම වෙනම වූ අයිතමයක් ලෙස සැලකේ.~~

...

**හෙළිදරව් කිරීම**

...

37 විවිධ වර්ගිකරණයෙන් යටත් රඳවා ගෙන ඇති තොගවල ධාරණ වටිනාකම් සහ මෙම වත්කමවල වෙනස්වීමේ ප්‍රමාණය පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන් ට වැදගත් වේ. තොගවල සුලභව දක්නට ලැබෙන වර්ගීකරණයන් වන්නේ වෙළඳ භාණ්ඩ, නිෂ්පාදන සැපයුම්, ද්‍රව්‍ය, නොනිමි වැඩ සහ නිමි භාණ්ඩය. ~~සේවා සපයන්නෙකුගේ තොග නොනිමි වැඩ ලෙස විස්තර කළ හැකි ය.~~

...

**බලාත්මක දිනය**

...

<u>40ඉ</u> <u>2014 ජුනි තුළ දී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින් වන අයභාරයෙහි* 2, 8, 29 සහ 37 වන ඡේද සංශෝධනය කෙරේ. 19 ඡේදය ඉවත් කර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාරකරනවිට එම සංශෝධනයන් ව්‍යවහාර කළ යුතු ය.</u>

**LKAS 12 *ආදායම් බදු***

| |
|---|
| 59 වන ඡේදය සංශෝධනය කර ඇත. සහ 98 ඉ ඡේදය එකතු කර ඇත. ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා හැර ඇත සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත. |

**ලාභ හෝ අලාභ හඳුනාගන්නා අයිතමයන්**

...

59 බොහෝ විලම්භිත බදු වගකීම් සහ විලම්භිත බදු වත්කම් පැන නගින්නේ එක කාල පරිච්ඡේදයක දී ගිණුම්කරණ ලාභයේ ඇතුළත් ආදායම් හෝ වියදම් බදු අයකළ හැකි ලාභයේ (බදු අලාභ) වෙනත් කාල පරිච්ඡේදයක් ඇතුළත් වීම නිසාය. ප්‍රතිඵලයක්වන විලම්භිත බද්ද ලාභයේ හෝ අලාභවල හඳුනා ගැනේ; උදාහරණ

(අ) පොලිය, පුරස්කාර හෝ ලාභාංශ ආදායම් ලැබෙන්නේ හිඟවය සහ ගිණුම්කරණ ලාභයේ ඇතුළත් වන්නේ ~~LKAS 18 *අයභාරය ප්‍රකාරව කාලයට අනුපාතනය පදනම මතය.*~~SLFRS 15 *ගණුදෙනුකරුවන් සමගවන ගිණුම්වලින් වන අයභාරය*,LKAS 39 *මූල්‍ය සාධන පත්‍ර හඳුනා ගැනීම සහ මැනීම හෝ* SLFRS 9 *මූල්‍ය සාධන පත්‍ර* අදාළ වන පරිදිය, එහෙත් බදු කරන ලාභ (බදු අලාභ) ඇතුළත් වන්නේ මුදල් පදනම් මතය; සහ

(ආ) ...

**බලාත්මක දිනය**

...

<u>98ඉ</u> <u>2014 ජුනි තුළ නිකුත්කළ SLFRS 15 ගණුදෙනුකරුවන් සමගඟ වන ගිවිසුම්වලින් වන අයභාරයෙහි 59 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 15 ව්‍යවහාරකරණ විට එම සංශෝධනය ව්‍යවහාරකළ යුතු ය.</u>

**LKAS 16*දේපළ, පිරියත සහ උපකරණ***

| |
|---|
| හඳුන්වාදීමේ දී IN 13 ඡේදය සංශෝධනය කෙරේ. ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා හැර ඇත. සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**ප්‍රති හඳුනාගැනීම;ප්‍රතිහඳුනා ගන්නා දිනය**

IN13 ~~LKAS 18 අයභාරයේ භාණ්ඩ විකිණීම සඳහා නිර්ණායකය සපුරාලන විට~~ <u>SLFRS 15 ගනුදෙනුකරුවන් සමග වන ගිවිසුම්වලින් වන අයභාරයෙහි ඉටුකිරීමේ බැඳීමක් සපුරාලන්නේ කුමන අවස්ථාවේ දී යන්න නිර්ණය කිරීමේ අවශ්‍යතාවයන් ප්‍රකාරව එම අයිතමයේ ලැබිය යුත්තා පාලනය ලබාගත් විට</u> අස්තිත්ත්වයක් දේපළක්, පිරියතක් උපකරණයක අයිතමයක් බැහැරකරන විට එදින සාධාරණ වටිනාකම ප්‍රතිහඳුනාගැනීම අවශ්‍ය කෙරේ.~~දේපොළ පිරියත සහ උපකරණ වල බැහැර කළ අයිතමයක ධාරන වටිනාකම අස්තිත්ත්වය ප්‍රති හඳුනාගත් දිනය නිර්ණය කිරීමට LKAS 16 පෙර වූ මතයේ එම නිර්ණායක අස්තිත්ත්වය භාවිත කිරීම අවශ්‍ය නොවේ.~~

| |
|---|
| 69 සහ 72 ඡේද සංශෝධනය කෙරේ සහ 81 ඒ ඡේදය එකතු කෙරේ. ඉවත්කළ පාඨය තනි ඉරකින් කපාහැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**ප්‍රතිහඳුනා ගැනීම**

...

69 දේපළ පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීම විවිධ ආකාරයෙන් සිදුවිය හැකිය. (එනම් විකුණුම් මගින්, මූල්‍ය කල් බද්දකට එළඹීම මගින් හෝ ප්‍රදානය කිරීම මගින්) දේපොළ පිරියත සහ උපකරණ අයිතමයක බැහැර කරන දිනය ~~නිර්ණය කිරීමේ දි අස්තිත්ත්වයක් භාණ්ඩ විකිණීමෙන් වන අයභාරය හඳුනා ගැනීම සඳහා LKAS 18 හි නිර්ණායක අස්තිත්ත්වයක් ව්‍යවහාර කරයි.~~ <u>වන්නේ SLFRS 15 හි ඉටු කිරීමේ බැඳීමක් සපුරාලන්නේ කුමන අවස්ථාවේ දී ද යන්න නිර්ණය කිරීමේ</u>

අවශ්‍යතාවයන් ප්‍රකාරව එම අයිතමයේ ලැබිය යුත්තා පාලනය ලබා ගන්නා දිනය වේ. විකිණීමෙන් හෝ යළි කල්බදු ගැනීමෙන්වන බැහැර කිරීම්වලට LKAS 17 ව්‍යවහාර වේ.

...

72 දේපොළ පිරියත සහ උපකරණ අයිතමයක ලැබිය යුතු වටිනාකම ~~මූලිකව හඳුනාගත යුත්තේ එහි සාධාක අගයටය. බැහැර කිරීම මත ලැබිය යුතු ප්‍රතිහඳුනාගැනීමෙන් පැන නගින ප්‍රතිලාභ හෝ අලාභවල ඇතුලත් කළ යුතුය. අයිතමයක් සඳහා වන ගෙවීම විලම්බිත කර ඇත්නම් ලැබුණ ප්‍රතිෂ්ඨාව මූලිකව හඳුනාගන්නේ අත්පිට විකුණුම් මුදල් සමකයකටය. ප්‍රතිෂ්ඨාවේ නාමික වටිනාකම සහ අත්පිට විකුණුම් මිලට වන සමකය අතර වෙනස පොලී අයභාරය ලෙස හඳුනාගන්නේ ලැබිය යුතු දැ මත සඵල ඵලදාව පිළිබිඹු කරමින් LKAS 18 ප්‍රකාරවය.~~ අයිතමය සඳහා ගෙවීම SLFRS 15 හි 47 - 72 ඡේදවල වන ගණුදෙනු මිල නිර්ණය කිරීම සඳහා වන අවශ්‍යතාවයන් ප්‍රකාරව නිර්ණය කෙරේ. ප්‍රතිලාභ හෝ අලාභවල ඇතුළත්ව ඇති ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තු කළ වටිනාකමට පසුව කළ වෙනස්කම්, ගිණුම්ගත කළ යුත්තේ SLFRS 15 හි ගණුදෙනු මිලේ වන වෙනස්කම් සඳහාවන අවශ්‍යතාවයන් ප්‍රකාරවය.

...

**බලාත්මක දිනය**

...

81ඒ 2014 ජුනි තුළ නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම් වලින් වන අයභාරය* 68 අ, 69 සහ 72 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාරකරණ විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතු ය.

**LKAS 32** ***මූල්‍ය සාධන පත්‍ර; ඉදිරිපත් කිරීම***

| |
|---|
| 97 අඉ ඡේදය එකතු කර ඇත. නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත. |

**බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය**

...

97අඉ 2014 ජුනි තුළ නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින්වන අයභාර* අළ 21 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාර කරන විට එම සංශෝධනය ව්‍යවහාරකළ යුතු ය.

| |
|---|
| ව්‍යවහාර කරන උපදේශනයේ අළ 21 ඡේදය සංශෝධනය කෙරේ. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා හැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**මූල්‍ය නොවන අයිතම් මිලදී ගැනීමට හෝ විකිණීමට වන ගිවිසුම් (8 - 10 ඡේද)**

...

අළ21 SLFRS 15 *ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින්වන අයභාරයෙන්* අවශ්‍ය කරන පරිදි හැර භෞතික වත්කම් පැවරූ දිනට පසුව වන දිනක යම් අනුරූපී ගෙවීමක් විලම්බන කරන්නේ නම් හැර භෞතික වත්කම් ලැබීම හෝ භාරදීම සම්බන්ධවන ගිවිසුමක් එක් පාර්ශ්වයක මූල්‍ය වත්කමක් සහ අනෙක් පාර්ශ්වයට මූල්‍ය වගකීමක් හටගැන්වීමට තුඩු දෙන්නේ නැත.

**LKAS 34** ***අතුරු මූල්‍ය වාර්තාකරණය***

| |
|---|
| ප්‍රමුඛ පාඨයේ 1 - 54 ඡේද, 1 - 55 දක්වා සංශෝධනය කෙරේ. |

| |
|---|
| 15 ආ සහ 16 අ සංශෝධනය කර ඇති සහ 55 ඡේදය එකතු කර ඇත. නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත. |

**සැළකිය යුතු අන්දමේ සිද්ධීන් සහ ගණුදෙනු**

...

15ආ ඒවා සැළකිය යුතු අන්දමේ වන්නේ නම් ඒවා සඳහා හෙළිදරව් කිරීම අවශ්‍ය විය හැකි සිද්ධීන් සහ ගණුදෙනුවල ලැයිස්තුවක් පහත දැක්වේ. මෙම ලැයිස්තුවේ පරිපූර්ණ නොවේ.

(අ) ...

(ආ) මූල්‍ය වත්කම්, දේපොළ, පිරියත සහ උපකරණ, ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම් වලින් පැන නැගි වත්කම් අස්පෘශ්‍ය වත්කම් හෝ වෙනත් වත්කම්, වලින් වන හානිකරණ අලාභයක් හඳුනා ගැනීම සහ එවැනි හානිකරණ අලාභයක් ප්‍රතිවර්ත්‍යය කිරීම.

(ඇ) ...

**වෙනත් හෙළිදරව් කිරීම්**

16අ 15- 15 ඇ ඡේද ප්‍රකාරව සැළකිය යුතු අන්දමේ සිද්ධීන් සහ ගණුදෙනු හෙළිදරව් කිරීමට අමතරව, අතුරු මූල්‍ය වාර්තාවේ අන්තැනක හෙළිදරව් කර නොමැති නම්, අස්තිත්ත්වය විසින් පහත සඳහන් තොරතුරු එහි අතුරු මූල්‍ය වාර්තාවන්හි සටහන්වල ඇතුළත් කළ යුතුය. මෙම තොරතුරු සාමාන්‍යයෙන් වර්ෂයක් පාසා දිනය තෙක් පදනම මත වාර්තා කළ යුතුය.

(අ) ...

(1) SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින් වන අයභාරය* 114-115 ඡේදවලින් අවශ්‍යකරන පරිදි ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය කොටස්වලට විසුරුවා හැරීම.

...

**බලාත්මක දිනය**

...

55 2014 ජුනි තුළදී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය* 15 ආ සහ 16 අ ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්ත්වයක් SLFRS 15 ව්‍යවහාරකරණ විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

## LKAS 36 *වත්කම් හානිකරණය*

| |
|---|
| 2 වන ඡේදය සංශෝධනය කෙරේ සහ 140 ඕ ඡේදය එකතුකර ඇත. ඉවත් කළ පාඨය කපා හැර ඇත සහ නව පාඨය යටින් ඉරක් ඇඳ ඇත. |

**විෂය පථය**

2 පහත සඳහන් වත්කම් හැර මෙම ප්‍රමිතය සියලුම වත්කම් හානිකරණය ගිණුම්කරණය සඳහා ව්‍යවහාර කළ යුතුය.

(අ) ...

(ආ) ~~ඉදිකිරීම් කොන්ත්‍රාත්වලින් පැන නගින වත්කම් (LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත් බලන්න)~~ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟවන ගිවිසුම්වලින් වන අයභාරය* ප්‍රකාරව හඳුනාගන්නා ගිවිසුම් වත්කම් සහ ගිවිසුමක් ලබාගැනීමට හෝ සම්පූර්ණ කිරීමට වන පිරිවැයෙන් පැන නගින වත්කම්

(ඇ) ...

**සංක්‍රාන්ති විධිවිධාන සහ බලාත්මක දිනය**

...

140අඕ 2014 ජුනි තුළ දී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම්වලින් වන අයභාරය* 2 වන ඡේදය සංශෝධනය කර ඇත. SLFRS 15 ව්‍යවහාර කරන විට අස්තිත්ත්වය විසින් එම සංශෝධනය ව්‍යවහාර කළ යුතුය.

## LKAS 37 *ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම්*

| |
|---|
| ප්‍රමුඛ පාඨයේ '1 - 99 ඡේද, 1-100 ඡේද තෙක් සංශෝධනය කර ඇත'. |

5 වන ඡේදය සංශෝධනය කරේ. 100 ඡේද එකතු කෙරේ. 6 ඡේදය ඉවත් කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා හැර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**විෂය පථය**

...

5 පැහැදිලිව සඳහන් කළ වර්ගයක ප්‍රතිපාදනයක්, අසම්භව්‍ය වගකීමක් හෝ අසම්භව්‍ය වත්කමක් සම්බන්ධයෙන් වෙනත් ප්‍රමිතයක් කටයුතු කරන විට මෙම ප්‍රමිතය වෙනුවට අස්තිත්ත්වය එම ප්‍රමිතය ව්‍යවහාර කෙරේ. උදාහරණ වශයෙන් ප්‍රමිතවල සමහර වර්ගවල ප්‍රතිපාදන ආමන්ත්‍රණය කරනුයේ;

(අ) ~~ඉදිකිරීම් කොන්ත්‍රාත් (LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත් බලන්න)~~

[<u>ඉවත් කර ඇත</u>]

(ආ) ...

(ඉ) *රක්‍ෂණ ගිවිසුම්* (SLFRS 4 *රක්‍ෂණ ගිවිසුම්* බලන්න)

SLFRS 4 විෂය පථය තුළ වන රක්‍ෂණ ගිවිසුම් යටතේ එහි ගිවිසුම්ගත බැඳීම් සහ හිමිකම්වලින් පැන නගින දෑ හැර කෙසේ වෙතත් මෙම ප්‍රමිතය රක්‍ෂණකරුගේ ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් ~~සහ~~ අසම්භාව්‍ය වත්කම්වලට ව්‍යවහාර වේ.

(ඊ) ව්‍යාපාර සංයෝජනයකදී *අත්පත් කරගන්නාගේ* අසම්භාව්‍ය ප්‍රතිෂ්ඨාව (SLFRS 3 ව්‍යාපාර සංයෝජනය බලන්න); සහ

(උ) <u>*ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වලින් වන අයභාරය* (SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින්වන අයභාරය* බලන්න). කෙසේ වෙතත් ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් දුරිය නොහැකි බවට පත්වූ විට හෝ පත්වෙන විට ගිවිසුම් ඇමතීම සඳහා පැහැදිලිව සඳහන් කළ අවශ්‍යතාවයන් SLFRS 15 හි නොමැති අතර, එවැනි අවස්ථාවන් සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර වේ.</u>

...

**බලාත්මක දිනය**

...

<u>100 2014 ජුනි තුළදී නිකුත් කළSLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම්වලින් වන අයභාරය*. 5 වන ඡේදය සංශෝධනය කර ඇත. සහ 6 වන ඡේදය ඉවත් කර ඇත. එය SLFRS 15 ව්‍යවහාර කරන විට අස්තිත්ත්වයක් එම සංශෝධනය ව්‍යවහාර කළ යුතුය</u>.

## LKAS 38 *අස්පෘශ්‍ය වත්කම්*

3,114 සහ 116 ඡේද සංශෝධනය කර ඇත සහ 130 ඕ ඡේදය එකතු කර ඇත. ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා හැර ඇත. සහ එකතු කළ පාඨ යටින් ඉරක් ඇඳ ඇත.

**විෂය පථය**

...

3 විශේෂයෙන් සඳහන් කර ඇති වර්ගයක අස්පෘශ්‍ය වත්කම් සඳහා ගිණුම්කරණය වෙනත් ප්‍රමිතයකින් නියම කර ඇත්නම්, අස්තිත්ත්වය මෙම ප්‍රමිතය වෙනුවට එම ප්‍රමිතය ව්‍යවහාර කළ යුතුය. උදාහරණ වශයෙන් මෙම ප්‍රමිතය පහත සඳහන් දෑ වලට ව්‍යවහාර නොවේ.

(අ) ව්‍යාපාරයක සාමාන්‍ය ක්‍රියාකාරකම්වලදී විකිණීම සඳහා අස්තිත්ත්වයක් තබා ගෙන ඇති අස්පෘශ්‍ය වත්කම් (LKAS 2 තොග ~~සහ LKAS 11 *ඉදිකිරීම් කොන්ත්‍රාත්* බලන්න~~)

(ආ) ...

(ඕ) SLFRS 15 - *ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වලින් වන අයභාරය ප්‍රකාරව හඳුනාගන්නා ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින් පැන නගින වත්කම්*

...

## විශ්‍රාම යැවීම සහ බැහැර කිරීම්

114 අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීම විවිධ ආකාරයෙන් සිදුවිය හැකිය. (උදාඃ විකිණීමෙන්, මූල්‍ය කල්බද්දට එළඹීමෙන්, හෝ පරිත්‍යාග කිරීමෙන්)~~එවැනි වත්කමක්~~ අස්පෘශ්‍ය වත්කමක් බැහැර කළ දිනය, ~~නිර්ණය කිරීමේදී භාණ්ඩ විකිණීමෙන් වන අයභාර හඳුනා ගැනීම සඳහා LKAS 18 අයභාරයේ නිර්ණායක අස්තිත්වයක් ව්‍යවහාර කරයි.~~ වන්නේ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග ගිවිසුම් වලින්වන අයභාරයෙහි.* ඉටු කිරීමේ බැඳීම සපුරාලන ලද්දේ කුමන අවස්ථාවේදීද යන්න නිර්ණය කිරීම සඳහාවන අවශ්‍යතාවයන් ප්‍රකාරව ලබන්නා එම වත්කමේ පාලනය ලබා ගත් දිනයයි. විකිණීමෙන් හෝ යළි කල්බදු ගැනීමෙන් වනබැහැර කිරීම් වලට LKAS 17 ව්‍යවහාර වේ.

...

116 අස්පෘශ්‍ය වත්කමක ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ~~බැහැර කිරීම මත ලැබිය යුතු~~ ප්‍රතිහඳුනාගැනීමෙන් පැන නගින ප්‍රතිලාභ හෝ අලාභ වල ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ඇතුළත් කළ යුත්තේ ~~මූලිකව හඳුනා ගත යුත්තේ එහි සාධාරණ අගයටය. අස්පෘශ්‍ය වත්කම සඳහා වන ගෙවීම විලම්බන කර ඇත්නම් ලැබුණ ප්‍රතිෂ්ඨාව මූලිකව හඳුනා ගන්නේ අත්පිට විකුණුම් මිලේ සමකයකට. ප්‍රතිෂ්ඨාවේ නාමික වටිනාකම සහ අත්පිට විකුණුම් මිලට වන සමකය අතර වෙනස පොලී අයභාරය ලෙස හඳුනා ගන්නේ ලැබිය යුතු දෑ මත සඵල එළදාව පිළිබිඹු කරමින් LKAS 18 ප්‍රකාරවය.~~

SLFRS 15 හි 47-72 ඡේදවල වන ගනුදෙනු මිල නිර්ණය කිරීම සඳහා වන අවශ්‍යතාවයන් නිර්ණය කිරීම සඳහා වන අවශ්‍යතාවයව නිර්ණය කිරීම ප්‍රකාරවය. ප්‍රතිලාභ හෝ අලාභවල ඇතුළත්ව ඇති ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තු කළ වටිනාකමට පසුව කළ වෙනස්කම් ගිණුම්ගත කළ යුත්තේ SLFRS 15 හි ගණුදෙනු මිලේ වන වෙනස්කම් සඳහා වන අවශ්‍යතාවයන් ප්‍රකාරවය.

....

## සංක්‍රාන්ති විධිවිධාන සහ බලාත්මක දිනය

...

130ඔ 2014 ජුනි තුළ නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම්වලින් වන අයභාරය.* 3, 114 සහ 116 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 15 ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

## LKAS 39මූල්‍ය සාධන පත්‍ර : හඳුනා ගැනීම සහ මැනීම

හඳුන්වාදීමේ ඡේදයේ IN5 - IN 6 ඡේද සංශෝධනය කෙරේ. ඉවත්කළ පාඨය තනි ඉරකින් කපාහැර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

### විෂය පථය

IN5 ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට ලෙස නම් නොකළ ණය බැඳීම්, හිලව් කර නිරවුල් කළ නොහැකි, වෙළඳපොල පොලී අනුපාතිකයට වඩා අඩු අනුපාතිකයකට සම්බන්ධ නොවන ණයක්, සඳහා විෂය පථයෙන් බැහැර කිරීමක් කර ඇත. වෙළඳපොළ පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයට ණය මුදලක් ලබාදීමට වන බැඳීමක් ආරම්භයේදී හඳුනාගනුයේ සාධාරණ වටිනාකමට සහ එය පසුව මනිනුයේ (අ)LKAS 37 ප්‍රතිපාදන, අසම්භව්‍ය වගකීම් සහ අසම්භව්‍ය වත්කම් ප්‍රකාරව හඳුනා ගත විය යුතු වටිනාකමට සහ (ආ) ආරම්භයේදී හඳුනාගත් වටිනාකමෙන් ~~LKAS 18 අයභාරය~~ SLFRS 15*ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින්වන අයභාරයේ* මූලධර්ම ප්‍රකාරව හඳුනා ගත් සමුච්චිත ~~ක්‍රමක්ෂය~~ ආදායම් වටිනාකම උචිතවන විට අඩු කිරීමෙන් වන වටිනාකම් වලින් වැඩි වටිනාකමකටය.

IN6 මෙම ප්‍රමිතයේ විෂය පථයට නිකුත් කළ මූල්‍ය ඇපවීම් ගිවිසුම් ඇතුළත් වේ. කෙසේ වෙතත් මූල්‍ය සහතික වීම් ගිවිසුම් නිකුත් කරන්නෙක් එවැනි ගිවිසුම්, එය සැළකිල්ල ගෙන ඇත්තේ රක්ෂණ ගිවිසුම් ලෙස හා රක්ෂණ ගිවිසුම්වලට අදාළ ගිණුම්කරණය

භාවිත කර ඇති බව කලින් පැහැදිලිව සහතික කර ඇත්නම් නිකුත් කරන්නාට එවැනි මූල්‍ය සහතික වීමේ ගිවිසුම් වලට එක්කෝ මෙම ප්‍රමිතය හෝ SLFRS 4 රක්ෂණ ගිවිසුම් ප්‍රමිතය ව්‍යවහාර කිරීමට තෝරා ගත හැකිය. මෙම ප්‍රමිතය යටතේ මූල්‍ය ඇපවීම් ගිවිසුම් ආරම්භයේදී මනිනුයේ සාධාරණ වටිනාකමටය. එය පසුව මනිනුයේ (අ)LKAS 37 ප්‍රකාරව නිර්ණය කරන වටිනාකමට සහ (ආ) ආරම්භයේදී හඳුනාගත් වටිනාකමෙන් ~~LKAS 18~~ SLFRS 15 හි මූලධර්ම ප්‍රකාරව හඳුනාගත් සමුච්චිත ~~ක්‍රම ක්ෂය~~ ආදායමේ වටිනාකම උචිතවන විට අඩු කිරීමෙන් වන වටිනාකමේ වැඩි වටිනාකමටය. මූල්‍ය වත්කමක් ප්‍රතිහඳුනා ගැනීම හෝ අඛණ්ඩව සම්බන්ධවීම ප්‍රතිඵලයක් වීම වළක්වන මූල්‍ය ඇපවීම් ගිවිසුම් සඳහා පසුව මැනීමේ වෙනස් අවශ්‍යතාවයන් ව්‍යවහාර කෙරේ. තබා ගෙන ඇති මූල්‍ය සහතික වීමේ ගිවිසුම් ඒවා රක්ෂණ ගිවිසුම්වන නිසා ඒවා මෙම ප්‍රමිතයේ විෂය පථය යටතට නොවැටේ සහ ඒ අනුව එවැනි ගිවිසුම් සඳහා පොදු විෂය පථය බැහැරවීම නිසා ඒවා මෙම ප්‍රමිතයේ විෂය පථයෙන් බාහිර වේ.

| |
|---|
| 2, 9, 43, සහ 55 ඡේද සංශෝධනය කෙරේ සහ 2අ, 44අ සහ 103 අළු ඡේද එකතු කර ඇත. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපාහැර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත. |

**විෂය පථය**

2 පහත සඳහන් දෑ හැර සියළු වර්ගවල මූල්‍ය සාධන පත්‍ර සඳහා මෙම ප්‍රමිතය සියලුම අස්තිත්ව විසින් ව්‍යවහාර කළ යුතුය.

(අ) ...

(ආ) SLFRS 9 ප්‍රකාරව ගිණුම්ගත කළ යුතු යැයි SLFRS 15 පැහැදිලිව සඳහන් කරන දේවල් හැර SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින්වන අයභාරයේ* විෂය පථය තුළ වන මූල්‍ය සාධන පත්‍ර මත ඒවායේ හිමිකම් සහ බැඳීම්

2අ හානිකරණ අලාභයෙන් හඳුනා ගැනීමේ අරමුණු සඳහා මෙම ප්‍රමිතය ප්‍රකාරව ගිණුම්ගත කර SLFRS 15 පැහැදිලිව සඳහන් කරන එම හිමිකම්වලට මෙම ප්‍රමිතයේ හානිකරණ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළ යුතුය.

...

**නිර්වචන**

...

9 ...

**හඳුනා ගැනීමට සහ මැනීමට සම්බන්ධිත නිර්වචන**

...

*සඵල පොලී ක්‍රමය* යනු මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක (හෝ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම් සමූහයක) ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීමේ සහ පොලී ආදායම් හෝ පොලී වියදම අදාළ කාල පරිච්ඡේදය පුරා වෙන් කිරීමේ ක්‍රමයකි. මූල්‍ය සාධන පත්‍රයක අපේක්ෂිත ජීව කාලය හෝ උචිතවන විට මූල්‍ය වත්කමක හෝ මූල්‍ය වගකීමක ශුද්ධ ධාරණ වටිනාකමේ කෙටි කාල පරිච්ඡේදයක් හරහා ඇස්තමේන්තු කළ අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් නිවැරදිව වට්ටම් කරණ එම අනුපාතිකය සඵල පොලී අනුපාතිකය වේ. සඵල පොලී අනුපාතිකය ගණනය කිරීමේදී අස්තිත්ත්වය විසින් මුදල් ප්‍රවාහ ඇස්මේන්තු කළ යුත්තේ මූල්‍ය සාධන පත්‍රයේ අනාගත ණය හානි සැළකිල්ලට ගැනීම හැර සියලුම ගිවිසුම් ගත නියමයන් සැළකිල්ලට ගැනීමෙනි (උදාහරණ කලින් ගෙවීම් විකුණුම් හා සමාන විකල්පයන්) සඵලදායක පොලී අනුපාතිකය(~~LKAS 18 අයභාරය~~ අද 8 අ - අ ද 8 ආ ඡේද බලන්න) වැදගත් කොටසක් වන ගිවිසුමට වන පාර්ශව අතර ගෙවූ හෝ ලැබූ සියලුම ලකුණු, ගාස්තු ගණුදෙනු පිරිවැය සහ වෙනත් සියළුම අධිමිල හෝ වට්ටම් ගණනය කිරීම ඇතුළත් ය. එක හා සමාන මූල්‍ය සාධන පත්‍ර සමූහයක මුදල් ප්‍රවාහ සහ අපේක්ෂිත ජීව කාලය විශ්වාසදායක ලෙස ඇස්මේන්තු කළ හැකි යයි පූර්ව කල්පනයක් ඇත. කෙසේ වෙතත් එවැනි විරල අවස්ථාවලදී මූල්‍ය සාධන පත්‍රයක (හෝ මූල්‍ය සාධන පත්‍ර සමූහයක) මුදල් ප්‍රවාහ හෝ අපේක්ෂිත ජීව කාලය විශ්වාසදායක ලෙස ඇස්තමේන්තු කළ නොහැකි වන විට, මූල්‍ය සාධන පත්‍රයේ (හෝ මූල්‍ය සාධන පත්‍ර සමූහයක) සම්පූර්ණ ගිවිසුම්ගත කාලය පුරා වන ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ අස්තිත්ත්වය භාවිතා කළ යුතුය.

*ප්‍රතිහඳුනා ගැනීම* යනු කලින් හඳුනාගත් මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වගකීමක් අස්තිත්ත්වයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කිරීමයි.

*ලාභාංශ යනු විශේෂ පන්තියක ප්‍රාග්ධනයට ඒවා දරණ සමානුපාතිකයකට ස්කන්ධ සාධන පත්‍ර දරන්නන්ට ලාභ බෙදා හැරීමයි.*

සාධාරණ අගය යනු මනින ලබන දින වෙළඳපොළ සහභාගීවන්නන් අතර විධිමත් ගණුදෙනුවකදී වත්කමක් විකිණීමට ලැබිය යුතු වූ සහ වගකීමක් පැවරීමට ගෙවිය යුතු මිලය. (SLFRS 13 බලන්න.)

...

**මුල්‍ය වත්කම් සහ මුල්‍ය වගකීම් ආරම්භක මැනීම**

43 44 අ ඡේදයට විෂය පථය තුළවන වෙළඳ ලැබිය යුතු දෑ හැරෙන්නට මුල්‍ය වත්කමක් හෝ මුල්‍ය වගකීමක් ආරම්භක හඳුනා ගැනීමේදී මැනිය යුත්තේ එහි සාධාරණ අගයට එකතු කළ ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයට නොවන මුල්‍ය වත්කම් හෝ මුල්‍ය වගකීම් සම්බන්ධයෙන් මැනිය යුත්තේ මුල්‍ය වත්කම අඩුකර ගැනීමට හෝ නිකුත් කිරීමට සෘජුව ආරෝපණය වන ගණුදෙනු පිරිවැයටය.

...

44අ 43 ඡේදයේ අවශ්‍යතාවයන් කෙසේ වෙතත් ආරම්භක හඳුනා ගැනීමේදී සැළකිය යුතු අන්දමේ මුල්‍ය සංරචකයක් (SLFRS 15 ප්‍රකාරව නිර්ණය කරන ලද) නොමැති වෙළඳ ලැබිය යුතු දෑ අස්තිත්ත්වය මැනිය යුත්තේ ඒවායේ ගණුදෙනුමිලටය (SLFRS 15 හි එය නිර්වචනය කර ඇති පරිදි)

...

**මුල්‍ය වගකීම් පසුව මැනීම**

47 පහත දෑ හැර ආරම්භක හඳුනා ගැනීමෙන් පසුව අස්තිත්ත්වයක් සියළුම මුල්‍ය වගකීම් මැනිය යුත්තේ සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රම ක්‍ෂය පිරිවැයටය.

(අ) ...

(ඇ) 9 වන ඡේදයේ නිර්වචනය කර ඇති මුල්‍ය ඇපවීම් ගිවිසුම් මූලික හඳුනාගැනීමෙන් පසුව එවැනි ගිවිසුමක් නිකුත් කරන්නෙක් (47(අ) හෝ (ආ) ව්‍යවහාර වන්නේ නම් හැර) මැනිය යුත්තේ පහත දෑ වලින් වඩා වැඩි වටිනාකමකටය;

(i) LKAS 37 ප්‍රකාරව නිර්ණය කළ වටිනාකමට; සහ

(ii) ආරම්භක හඳුනාගත් වටිනාකමෙන් (43 වන ඡේදය බලන්න)

~~LKAS 18,~~ SLFRS 15 මූලධර්ම ප්‍රකාරව හඳුනා ගන්නා සමුච්චිත ~~ක්‍රමක්‍ෂය~~ ආදායමේ වටිනාකමින් උචිත වනවිට අඩුකිරීමෙන්

(ඈ) වෙළඳපොළ පොලී අනුපාතිකවලට වඩා අඩු අනුපාතිකයකට ණය මුදලක් සැලසීමට වන බැඳීම්. මූලික හඳුනා ගැනීමෙන් පසුව එවැනි බැඳීමක් නිකුත් කරන්නෙක් (47අ) ඡේදය ව්‍යවහාර වන්නේ නම් හැර) මැනිය යුත්තේ පහතදෑ වලින් වැඩි වටිනාකමටය.

(i) LKAS 37ප්‍රකාරව නිර්ණය කළ වටිනාකම ; සහ

(ii) ආරම්භක හඳුනාගත් වටිනාකමෙන් (43 වන ඡේදය බලන්න)~~LKAS 18~~SLFRS 15මූලධර්ම ප්‍රකාරව හඳුනාගන්නා සමුච්චිත ~~ක්‍රමක්ෂය~~ආදායම් වටිනාකම උචිත වනවිට අඩු කිරීමෙන්

ඉදිරි රැකුම් අයිතම ලෙස නම් කළ මුල්‍ය වගකීම් අයිතම 89 - 102 ඡේදවල ඉදිරි රැකුම් ගිණුම්කරණ අවශ්‍යතාවයනට යටත් වේ.

...

**ප්‍රතිලාභ සහ අලාභ**

55 ඉදිරි රැකුම්කරණය සම්බන්ධතාවයේ (89-102 ඡේද බලන්න) කොටසක් නොවන මුල්‍ය වත්කමක හෝ මුල්‍ය වගකීමක සාධාරණ අගයේ වෙනස්වීමකින් පැන නගින ප්‍රතිලාභ සහ පාඩු පහත සඳහන් පරිදි හඳුනා ගත යුතු ය.

(අ) ...

(ආ) හානිකරණ අලාභ (67-70 ඡේද බලන්න) සහ විදේශ විනිමය ප්‍රතිලාභ සහ අලාභ (අ පරිශිෂ්ඨයේ අළ 83 ඡේදය බලන්න) සඳහා හැර විකිණීම සඳහා ලබාගත හැකි මූල්‍ය වත්කම් මතවන ප්‍රතිලාභයක් හෝ අලාභ මූල්‍ය වත්කම ප්‍රතිහඳුනාගන්නා තුරු වෙනත් විස්තීර්ණ ආදායමේ හඳුනාගත යුතු ය.

එම අවස්ථාවේ වෙනත් විස්තීර්ණ ආදායමේ කලින් හඳුනාගත් සමුච්චිත ප්‍රතිලාභ හෝ අලාභ යළි වර්ගීකරණය කිරීමේ ගැළපුමක් ලෙස (LKAS 1 *මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම*) ස්කන්ධයෙන් ලාභ හෝ අලාභ වලට යළි වර්ගීකරණය කළ යුතුය. කෙසේ වෙතත් සඵල පොලී ක්‍රමය (9 වන ඡේදය බලන්න) භාවිත කරමින් ගණනය කළපොලිය ලාභ හෝ අලාභවල හඳුනා ගනු ලැබේ. (LKAS 18 බලන්න) විකිණීම සඳහා ලබාගත හැකි ස්කන්ධ සාධන පත්‍රමත ලාභාංශ ලාභ හෝ අලාභවල හඳුනාගන්නේ ~~අස්තිත්වයට ගෙවීමක් ලැබීමට ඇති අයිතිය තහවුරු වූවිටය.~~ (LKAS 18 බලන්න) 55 අ ඡේදය ප්‍රකාරවය

55අ ලාභ හෝ අලාභවල *ලාභාංශ* හඳුනා ගන්නේ පහත දෑ වන විටය

(අ) අස්තිත්වයට ලාභාංශ ගෙවීම් ලැබීමට ඇති අයිතිය තහවුරු වූ විට

(ආ) ලාභාංශ සහ ආශ්‍රිත ප්‍රතිලාභ අස්තිත්වයට ප්‍රවාහවන බවටඅපේක්ෂා කළ හැකිවීම; සහ

(ඇ) ලාභාංශවල ප්‍රමාණය විශ්වශනීය ලෙස මැනිය හැකි වීම.

...

## බලාත්මක දිනය සහ සංක්‍රාන්තිය

...

103අඌ 2014 ජූනි තුළදී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම් වලින්වන අයභාරය* 2, 9, 43, 47, 55, අළ 4 සහ අළ 48 ඡේද සංශෝධනය කර ඇත සහ 2 අ, 44 අ, 55 අ සහ අළ8අ - අළ 8 ඇ ඡේද එකතු කර ඇත. SLFRS 15 අස්තිත්වයන් ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

| |
|---|
| අ පරිශිෂ්ඨයේ අළ 4 සහ අළ 48 ඡේද සංශෝධනය කෙරේ සහ අළ 8 අ - අළ 8 ඇ ඡේද එකතු කර ඇත. ඉවත් කළ පාඨ තනි ඉරකින් කපා හැර ඇත. සහ නව පාඨ යටින් ඉරක් ඇඳ ඇත. |

## විෂය පථය (ඡේද 2 - 7)

අළ4 ඇපයක් ලෙස සමහර වර්ගවල ණයවර ලිපි, ණය පැහැර හැරීමේ ගිවිසුම් හෝ රක්ෂණ ගිවිසුම් දෑ වැනි මූල්‍ය සහතික වීමේ ගිවිසුම්වලට විවිධ නෛතික ස්වරූප තිබිය හැකිය.ඒවා ගිණුම්කරණයේදී සළකන ආකාරය ඒවායේ නෛතික ස්වරූපය මත රඳා පවතින්නේ නැත. උචිත සළකන ආකාරය පිළිබඳ උදාහරණ පහත දැක්වේ. (2 (ඉ) ඡේදය බලන්න)

(අ) ... නිකුත් කරන්නා එය මනිනුයේ පහතදෑ වලින් වැඩිවටිනාකමටය

(i) LKAS 37 ප්‍රකාරව නීර්ණය කළ වටිනාකම; සහ

(ii) ආරම්භක හඳුනාගත් වටිනාකමෙන් ~~LKAS 18~~ SLFRS 15 මූලධර්ම (47 (ඇ) ඡේදය බලන්න) ප්‍රකාරව හඳුනා ගන්නා සමුච්චිත ~~ක්‍රමක්ෂය~~ ආදායමේ වටිනාකම උචිතවිට අඩු කිරීමෙන්

(ආ) ...

(ඇ) මූල්‍ය ඇපවීම් ගිවිසුම් නිකුත් කර ඇත්තේ භාණ්ඩ විකිණීම සම්බන්ධයෙන් නම්, එය ඇපයෙන් සහ භාණ්ඩ විකිණීමෙන් අයභාරය හඳුනා ගැනීම නීර්ණය කිරීමේදී නිකුත් කරන්නා ~~LKAS 18~~SLFRS 15ව්‍යවහාර කරයි.

...

## සඵල පොලී අනුපාතිකය

...

අළ8අ සඵල පොලී ක්‍රමය ව්‍යවහාර කිරීමේදී මූල්‍ය සාධන පත්‍රයක සඵල පොලී අනුපාතිකයට වැදගත්වන කොටසක් වන ගාස්තු ලෙස අස්තිත්වයක් හඳුනා ගනී. මූල්‍ය සේවාවක් සඳහා ගාස්තුවල විස්තරය, සපයන සේවා වල ස්වභාවය හෝ හරය

හඟවන්නක් නොවිය හැකිය. මූල්‍ය සාධන පත්‍රය සාධාරණ අගයට මැන සාධාරණ අගයේ වෙනස් වීම ලාභ හෝ අලාභවල හඳුනා ගන්නේ නම් හැර මූල්‍ය සාධන පත්‍රයක සඵල පොලී අනුපාතිකයේ වැදගත් කොටසක් වන ගාස්තු සඵල පොලී අනුපාතිකයට ගැලපීමක් ලෙස සලකනු ලැබේ. එවැනි අවස්ථාවලදී සාධන පත්‍රය ආරම්භක හඳුනා ගැනීමේදී ගාස්තු අයභාරය ලෙස හඳුනාගනු ලැබේ.

අඋ8ආ මූල්‍ය සාධන පත්‍රයක සඵල පොලී අනුපාතිකයේ වැදගත් කොටසක්වන ගාස්තු වලට ඇතුලත් වනුයේ;

(අ) මූල්‍ය වත්කමක් ඇති කිරීම හෝ අත්පත් කර ගැනීම සම්බන්ධයෙන් අස්තිත්වය ලැබූ ආරම්භ කිරීමේ ගාස්තු ණය ගන්නාගේ මූල්‍ය තත්ත්වය අගය කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා ලැබූ හානි පූර්ණය. ඇප, අතිරේක ඇප සහ වෙනත් සුරක්ෂිත විධි විධාන අගය කිරීම සහ වාර්තා කිරීම, සාධන පත්‍රයේ නියමයන් කතිකා කර ගැනීම, ලිපි ලේඛන පිළියෙළ කිරීම, සැකසීම සහ ගණුදෙනුව අවසන් කිරීම වැනි දේ සඳහා ලැබූ ගාස්තු ඇතුළත් විය හැකිය. මෙම ගාස්තු මූල්‍ය සාධන පත්‍රයක් උත්පාදනය වීම ප්‍රතිඵලයක් වීම සමඟ සම්බන්ධවන වැදගත් කොටසකි.

(ආ) ණය බැඳීමක් මෙම ප්‍රමිතයේ විෂය පථයෙන් බාහිරවන විට, ණය මුදලක් ආරම්භ කිරීමට අස්තිත්වයකට කැපවීමේ ගාස්තුවක් ලැබුණ විට අස්තිත්වය විශේෂිත ණය දීමේ එකඟවීමක් සඳහා ඇතුළත් වීම අපේක්ෂා කළ හැකිය. මෙම ගාස්තු මූල්‍ය සාධන පත්‍රයක් අත්පත් කර ගැනීම සඳහා ගෙන යනු ලබන සහභාගීත්වය සඳහා වන හානිපූර්ණයක් ලෙස සළකනු ලැබේ. අස්ත්ත්වය ණය මුදලක් ලබා නොදී කැපවීම කල් ඉකුත් වුවහොත් කල් පසුවීම මත එම ගාස්තුව අයභාරයක් ලෙස හඳුනා ගනු ලැබේ.

(ඇ) මූල්‍ය වගකීමක් නිකුත් කිරීම මත ලැබුණ කැපවීමේ ගාස්තු මනිනු ලබන්නේ ක්‍රමක්‍ෂය පිරිවැයටයි. මෙම ගාස්තු මූල්‍ය වගකීමක් උත්පාදනය වීමේ සහභාගීත්වයේ වැදගත් කොටසකි. ආයෝජන කළමනාකරණ සේවා වැනි සේවාවන් සැළසීමට වන හිමිකමට සම්බන්ධිත ආරම්භ කිරීමේ ගාස්තු සහ ගණුදෙනු පිරිවැයෙන් මූල්‍ය වගකීමක් සඳහා සඵල පොලී අනුපාතිකයේ වැදගත් කොටසක්වන ගාස්තු සහ පිරිවැය අස්තිත්වයක් වෙන් කොට හඳුනාගනී.

අඋ8ඇ ගාස්තු මූල්‍ය සාධන පත්‍රයක සඵල පොලී අනුපාතිකයේ වැදගත් කොටසක් නොවේ සහ ඒවා SLFRS 15 ප්‍රකාරව ගිණුම්ගත කෙරේ. ඇතුළත් වනුයේ,

(අ) ණය මුදලට සේවා සැපයිම සඳහා ගාස්තු

(ආ) ණය බැඳීමක් මෙම ප්‍රමිතයේ විෂය පථයෙන් බාහිර වන විට සහ විශේෂිත ණය දීමේ එකඟවීම සඳහා ඇතුළුවීමේ ගාස්තු අපේක්ෂා තැබිය නොහැකි වීම, ණයක් ආරම්භ කිරීමට වන කැපවීමේ ගාස්තු ; සහ

(ඇ) අස්තිත්වයක් විසින් ණයක් සැලසුම් කර ණය පැකේජයේ කිසිම කොටසක් තමා සඳහා රඳවා නොගන්නා ණය 'සින්ඩිකේට්'(අරමුණකට එකතු වූ පුද්ගල සමූහයක්) සඳහා වන අස්තිත්වයක් ලැබූ ගාස්තු (හෝ වෙනත් සහභාගී වන්නන් මෙන් සැසඳිය හැකි අවදානම් සඳහා එම සඵල පොලී අනුපාතිකව කොටසක් රඳවා ගැනීම)

...

**පැවරූ වත්කම් වලට අඛණ්ඩ සම්බන්ධතාව**

අඋ48 30 වන ඡේදය යටතේ පැවරූ වත්කමක් සහ ආශ්‍රිත වගකීමක් අස්තිත්වය කෙසේ මනින්නේද යන්නට උදාහරණ පහත දක්වේ :-

*සියළුම වත්කම්*

(අ) පැවරූ වත්කම මත පැහැර හැරී අලාභ ගෙවීම් ගෙවීමට අස්තිත්වය සැළසූ සහතිකයේ අඛණ්ඩ සහභාගීත්වයේ ප්‍රමාණයේ ප්‍රමාණය තෙක් පැවරූ වත්කම් ප්‍රතිහඳුනා ගැනීමෙන් වළක්වාලන්නේ නම් පැවරූ වත්කම පැවරූ දින මැනිය යුත්තේ(i) වත්කමේ ධාරණ වටිනාකම සහ (ii) අස්තිත්වය විසින් ආපසු ගෙවීමට යුතු (සහතික වූ වටිනාකම්) වන පැවරුම් සඳහා ලැබුණ ප්‍රතිෂ්ඨාවේ උපරිම වටිනාකම යන ඒවායින් අඩු වටිනාකමටය. ආශ්‍රිත වගකීම ආරම්භකව මනිනුයේ සහතික කළ වටිනාකමට, සහතික වීමේ සාධාරණ වටිනාකම එකතු කිරීමෙනි. (සාමාන්‍යයෙන් එය වනුයේ සහතිකය සඳහා වූ ලැබුණ ප්‍රතිෂ්ඨාවයි. පසුව, සහතිකවීමේ ආරම්භක සාධාරණ අගය ලාභයේ හෝ අලාභයේ හඳුනාගන්නේ කාලය සමානුපාතික පදනම වගකීම සපුරාලූ කල්හි. (හෝ ලෙස)(~~LKAS 18 බලන්න~~) SLFRS 15 මූලධර්ම ප්‍රකාරව) සහ වත්කමේ ධාරණ වටිනාකම යම් හානිකරණ අලාභයක් අඩු කිරීමෙනි.

...

## LKAS 40 *ආයෝජන දේපළ*

9,67 සහ 70 ඡේද සංශෝධනය කෙරේ සහ 85 ඉ ඡේදය එකතු කෙරේ. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා ඉවත් කර ඇත සහ නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

### දේපළ ආයෝජන දේපල ලෙස හෝ අයිතිකරු පදිංචි වී ඇති දේපළ ලෙස වර්ගීකරණය

...

9 පහත උදාහරණයේ අයිතම් ආයෝජන දේපළ නොවන අතර, එබැවින් ඒවා මෙම ප්‍රමිතයේ විෂය පථයෙන් බාහිර වේ.

(අ) ...

(ආ) ~~තුන්වන පාර්ශ්වයක් වෙනුවෙන් ඉදිකෙරෙමින් හෝ සංවර්ධනය කළ දේපළ (LKAS 11 ඉදිකිරීම් කොන්ත්‍රාත් බලන්න)~~ [ඉවත් කර ඇත]

(ඇ) ...

### බැහැර කිරීම්

...

67 ආයෝජන දේපළක් බැහැර කිරීම විකිණීම මගින් හෝ මූල්‍ය කල්බද්දකට ඇතුළත්වීමෙන් අත්කර ගත හැකිය. ආයෝජන දේපලක් සඳහා බැහැර කළ දිනය ~~නීර්ණය කිරීමේදි භාණ්ඩ විකිනීමෙන් වන අයහාරය හඳුනා ගැනීම සඳහා LKAS 18 හි නිර්ණායක අස්තිත්වයක් ව්‍යවහාර කරයි සහ LKAS 18 සමඟ කැටිව ඇති නිදර්ශනාත්මක උදාහරණයේ ඊට ඇති සම්බන්ධිත උපදේශන සළකා බලයි.~~ වන්නේ SLFRS 15 හි ඉටු කිරීමේ බැඳීම සපුරාලන ලද්දේ කුමන අවස්ථාවේද යන්න නීර්ණය කිරීම සඳහා වන අවශ්‍යතාවයන් ප්‍රකාරව ලබන්නා ආයෝජන දේපළේ පාලනය ලබා ගත් දිනයයි. මූල්‍ය කල් බද්දට සිදුකරන සහ විකිණීම් සහ යළි කල්බදු ගැනීම මතට ඇතුළත් සිදු කරන බැහැර කිරීමකට LKAS 17 ව්‍යවහාර වේ.

...

70 ආයෝජන දේපළක ප්‍රතිෂ්ඨාවේ වටිනාකම ~~බැහැර කිරීම මත ලැබිය යුතු~~ ප්‍රතිහඳුනා ගැනීමෙන් පැන නගින ප්‍රතිලාභ හෝ අලාභවල ඇතුළත් කළ යුත්තේ ~~මූලිකව හඳුනාගත යුත්තේ එහි සාධාරණ අගයටය. විශේෂයෙන්ම ආයෝජන දේපොළ සඳහා වන ගෙවීම විලම්බනය කර ඇත්නම් ලැබුණ ප්‍රතිෂ්ඨාව මූලිකව හඳුනා ගන්නේ අත්පිට විකුණුම් මිලේ සමකයකටය. ප්‍රතිෂ්ඨාවේ නාමික වටිනාකම සහ අත්පිට විකුණුම් මිලට වන සමකය අතර වෙනස පොළී අයහාරය ලෙස හඳුනාගන්නේ සඵල පොළී ක්‍රමය භාවිතා කරමින් LKAS 18 ප්‍රකාරවය.~~ SLFRS 15 හි 47 - 72 ඡේදවල වන ගණුදෙනු මිල නීර්ණය කිරීම සඳහා වන අවශ්‍යතාවයන් නීර්ණය කිරීම ප්‍රකාරවය. ප්‍රතිලාභ හෝ අලාභවල ඇතුළත්ව ඇති ප්‍රතිෂ්ඨාවේ ඇස්තමේන්තුකළ වටිනාකමට පසුව කළ වෙනස්කම් ගිණුම්ගත කළ යුත්තේ SLFRS 15 හි ගණුදෙනු මිලේ වන වෙනස්කම් සඳහා වන අවශ්‍යතාවයන් ප්‍රකාරවය.

...

### බලාත්මක දිනය

...

85ඉ 2014 ජුනි තුළ දී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින් වන අයහාරය* 3 (ආ), 9, 67 සහ 70 වන ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 15 ව්‍යවහාරකරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

## IFRIC 12 සේවා අනුග්‍රහ පිළිවෙළවල්

"යොමු කිරීම්" ශීර්ෂයේ පහල 'යොමු කිරීම්' LKAS 11 *ඉදි කිරීම් කොන්ත්‍රාත්වලට* යොමු කිරීම සහ *LKAS 18 අයහාරයට වන* යොමු කිරීම් ඉවත් කෙරේ. සහ SLFRS 15 ගණුදෙනුකරුවන් සමඟ වන ගිවිසුම් වලින්වන අයහාරයට වන යොමු කිරීම එකතු කෙරේ. 13 - 15, 18 - 20 සහ 27 ඡේද සංශෝධනය කෙරේ. සහ 28 ඇ ඡේදය එකතු කෙරේ. ඉවත් කළ පාඨය තනි ඉරකින් කපා හැර ඇත. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**ප්‍රතිෂ්ඨා පිළිවෙළ හඳුනාගැනීම සහ මැනීම**

...

13 නිරතවන්නා එය ඉටු කරන සේවා සඳහා ~~LKAS 11 සහ 18~~ SLFRS 15 ප්‍රකාරව ආදායම මැනීම සහ හඳුනා ගත යුතුයි. ~~තනි ගිවිසුමක් හෝ පිළිවෙළක් යටතේ නිරතවන්නා එකකට වැඩි සේවා ඉටු කරන්නේ නම් (එනම් ඉදිකිරීම් තැනීම හෝ වැඩිදියුණු කිරීමේ සේවා සහ මෙහෙයුම් සේවා) වටිනාකමේ වෙනම හඳුනා ගැනීමට හැකිවනවිට ලැබුණ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව භාරදුන් සේවාවේ සාපේක්ෂ සාධාරණ අගයට යොමු කරමින් වෙන් කළ යුතුය.~~ ප්‍රතිෂ්ඨාවේ ස්වභාවය එහි පසුව ගිණුම්කරණය සළකන අන්දම නිර්ණය කරයි. මූල්‍ය වත්කමක් සහ අස්පෘශ්‍ය වත්කමක් ලෙස ලැබුණ ප්‍රතිෂ්ඨාව සඳහා පසුව කරනු ලබන ගිණුම්කරණ පහත දැක්වෙන 23 - 26 ඡේදවල විස්තර කෙරේ.

**ඉදිකිරීම් හෝ වැඩිදියුණු කිරීමේ සේවාවන්**

14 තැනීම් හෝ වැඩිදියුණු කිරීමේ සේවාවන්හි ~~සම්බන්ධයෙන් අයභාරය සහ පිරිවැය~~ නිරතවන්නා ගිණුම්ගත කළ යුත්තේ ~~LKAS 11~~ SLFRS 15 ප්‍රකාරවය.

**දීමනාකරු නිරතවන්නාට දෙනු ලබන ප්‍රතිෂ්ඨාව**

15 නිරතවන්නා ඉදිකිරීමක් හෝ සේවා වැඩි දියුණු කිරීමක් ලබාදෙන්නේ නම් නිරතවන්නාට ලැබුණ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව හඳුනාගත යුත්තේ SLFRS 15 ප්‍රකාරවය. ~~එහි සාධාරණ අගයටය.~~ ලැබුණ ප්‍රතිෂ්ඨාව... අයිතියකට විය හැකිය.

(අ) ...

...

18 ඉදිකිරීම් සේවා සඳහා නිරතවන්නාට ගෙවීම් කරනුයේ අර්ධ වශයෙන් මූල්‍ය වත්කමක් සහ අර්ධ වශයෙන් අස්පෘශ්‍ය වත්කමක් මගින් නම් නිරතවන්නාගේ ප්‍රතිෂ්ඨාවේ සෑම සංරචකයක් සඳහාම වෙන් වෙන්ව ගිණුම් ගත කිරීම අවශ්‍ය වේ. සංරචක දෙකම සඳහා ලැබුන හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාව ආරම්භකව හඳුනා ගත යුත්තේ SLFRS 15 ප්‍රකාරවය. ~~ලැබුණ හෝ ලැබිය යුතු ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගටය.~~

19. දීමනාකරුවන් විසින් නිරතවන්නාට දෙනු ලබන ප්‍රතිෂ්ඨාවේ ස්වභාවය නිර්ණය කළ යුත්තේ ගිවිසුමේ නියමයන් සහ එය පවතින විට අදාළ ගිවිසුම් නීතියට යොමු කිරීමෙනි. 23 - 26 ඡේදවල විස්තර කළ පරිදි පසුව කරනු ලබන ගිණුම්කරණය නිර්ණය කරයි. කෙසේ වෙතත් SLFRS 15 ප්‍රකාරව දෙවර්ගයේම ප්‍රතිෂ්ඨාව ඉදිකිරීම හෝ වැඩිදියුණු කිරීම කරන කාලපරිච්ඡේදය තුළදී ගිවිසුම් වත්කම් ප්‍රතිෂ්ඨාවේ ස්වභාවය ලෙස වර්ගීකරණය කෙරේ.

**මෙහෙයුම් සේවාවන්**

20 නිරතවන්නා මෙහෙයුම් සේවාවන් සඳහා සම්බන්ධ අයභාරය සහ පිරිවැය ගිණුම්ගත කළ යුත්තේ ~~LKAS 18~~ SLFRS 15 ප්‍රකාරවය.

...

**දීමනාකරු විසින් නිරතවන්නාට සළසනු ලබන අයිතම**

27 11 වන ඡේදය ප්‍රකාරව සේවා එකඟවීම් අරමුණක් සඳහා දීමනාකරු විසින් නිරතවන්නාට ප්‍රවේශවීමට ලබාදෙන යටිතල අයිතම සඳහා නිරතවන්නාගේ දේපළ පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. දීමනාකරු නිරත වන්නා හට වෙනත් අයිතමද ලබාදිය හැකි අතර, නිරතවන්නාට ඒවා තබා ගැනීම හෝ ඔහුට කැමති අන්දමට කටයුතු කළ හැකිය. එවන් වත්කම් සේවා සඳහා දීමනාකරු විසින් ගෙවිය යුතු ප්‍රතිෂ්ඨාවේ කොටසක ස්වරූපය ගන්නේ නම් LKAS 20 හි නිර්වචනය කර ඇති පරිදි ඒවා රාජ්‍ය ප්‍රදාන නොවේ. ~~ඒවා ආරම්භක හඳුනා ගැනීමේදී සාධාරණ අගයට මනිනු ලැබූ නිරතවන්නාගේ වත්කම් ලෙස හඳුනා ගත යුතුය. වත්කම් හුවමාරුව සඳහා භාරගත් ඉටු නොකරන ලද බැඳීම් සම්බන්ධයෙන් නිරතවන්නා වගකීමක් හඳුනාගත යුතුය.~~ ඒ වෙනුවට SLFRS 15 හි නිර්වචනය කර ඇති පරිදි ඒවා ගණුදෙනු මිලේ කොටසක් ලෙස ගිණුම්ගත කළ යුතුය.

...

**බලාත්මක දිනය**

...

28ඈ 2014 ජුනි තුළදී නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින්වන අයහාරයෙහි* 'යොමුව' කොටස තොරතුරු සටහන් 2 හි වගවේ. සහ 13-15, 18-20 සහ 27 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්ත්වය විසින් SLFRS 15 ව්‍යවහාරකරණ විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

## SIC-27*කල්බද්දක නෛතික ස්වරූපය සම්බන්ධවන ගණුදෙනුවල හරය ඇගයීම*

පහත 'යොමු කිරීම', ශීර්ෂය LKAS 11 *ඉදිකිරීම් කොන්ත්‍රාත්* සහ LKAS 18 *අයහාරයට* වන යොමු කිරීම් ඉවත් කෙරේ සහ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම් වලින් වන අයහාරයට* වන යොමු කිරීම් එකතු කෙරේ. 8 වන ඡේදය සහ 'බලාත්මක දිනය' ට පහළ කොටස සංශෝධනය කෙරේ. නව පාඨයට යටින් ඉරක් ඇඳ ඇත.

**පොදු එකඟතාවය**

...

8 අස්තිත්ත්වයකට ලැබිය හැකි ගාස්තුවක් ආදායමක් ලෙස කුමන අවස්ථාවකදී හඳුනාගත යුතුද යන්න නිර්ණය කිරීමේ ~~LKAS 18 හි 20 වන ඡේදයේ~~ SLFRS 15හි ~~නිර්නායකය~~ අවශ්‍යතාවයන් එකඟවීමේ සෑම කරුණු සහ තත්ත්වයනට ව්‍යවහාර කළ යුතුය. ගාස්තුව ඉපයීමට අවශ්‍ය සැළකිය යුතු අන්දමේ අනාගත ඉටු කිරීම් බැඳීම්වල ස්වරූපයේ අඛණ්ඩ සහභාගීත්වයක් තිබේද යන්න වැනි සාධක, රඳවාගත් අවදානම් තිබේද, යම් ඇප එකඟවීම්වල නියමයන්, සහ ගාස්තුව ආපසු ගෙවීමේ අවදානම සළකා බැලිය යුතුය. ලැබුන අවස්ථාවේදී සම්පූර්ණ ගාස්තුව ආදායම ලෙස හඳුනාගැනීම තනි තනිව කියාපාන එම දර්ශකයන්, එකඟවීම ආරම්භයේදී ලැබුනේ නම්, අනුචිතවීමට ඇතුළත්;

(අ) ...

**බලාත්මක දිනය**

...

2014 තුළ නිකුත් කළSLFRS 15*ගණුදෙනුකරුවන් සමගවන ගිවිසුම් වලින්වන අයහාරයේ* 'යොමු කිරීම්' කොටස සහ 8 වන ඡේදය සංශෝධනය කෙරේ. අස්තිත්ත්වය SLFRS 15 ව්‍යවහාර කරනවිට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

## SIC - 32*අස්පෘශ්‍ය වත්කම් - වෙබ් අඩවි පිරිවැය*

පහත ශීර්ෂය යොමු කිරීම LKAS 11 *ඉදිකිරීම් කොන්ත්‍රාත්* වලට වන යොමු කිරීම් ඉවත් කෙරේ සහ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිවිසුම්වලින් වන අයහාරය* යොමු කිරීම එකතු කෙරේ. බලාත්මක දිනයන්ට පහළ කොටස සංශෝධනය කෙරේ. නව පාඨයට ඉරක් ඇඳ ඇත.

**බලාත්මක දිනය**

...

SLFRSs පුරාවටම භාවිත කළ පාරිභාෂික ශබ්ද සංග්‍රහය LKAS 1 සංශෝධනය කර ඇත. එයට අමතරව 5 ඡේදය සංශෝධනය2009 ජනවාරි 1 දින හෝ ඉන් පසුව ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා අස්තිත්ත්වයක් එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය. අස්තිත්ත්වය LKAS 1 කලින් කාලපරිච්ඡේදයක් සඳහා ව්‍යවහාර කරන්නේ නම් එම කලින් කාලපරිච්ඡේදය සඳහා එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

2014 ජුනි තුළ නිකුත් කළSLFRS 15 *ගණුදෙනුකරුවන් සමග වන ගිණුම් වලින් වූ අයහාරයේ* 'යොමු කිරීම' කොටස සහ 6 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්ත්වය SLFRS 15 ව්‍යවහාර කරන විට එම සංශෝධන ව්‍යවහාර කළ යුතුය.

09-21

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.